**325 වන කාණ්ඩය - 13 වන කලාපය**
**தொகுதி 325 - இல. 13**
**Volume 325 - No. 13**

**2026 මාර්තු 19 වන බ්‍රහස්පතින්දා**
**2026 மார்ச் 19, வியாழக்கிழமை**
**Thursday, 19th March, 2026**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඞ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා ශාඛාව), අන්තර් පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා කණ්ඩායම)සහ "සාර්ක්" පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය (ශ්‍රී ලංකා ශාඛාව) යන සංගම්වල ඒකාබද්ධ විශේෂ මහා සභා රැස්වීම [තීරුව 2297]

කටුපොල් වගාව පිළිබඳ දැනුවත් කිරීමේ සාකච්ඡාව [තීරුව 2298]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 2298]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 2300-2342]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

දුප්පත්කම තුරන් කිරීමේ රජයේ වැඩ පිළිවෙළ [තීරුව 2342]

ශ්‍රී ලංකාවේ ගුවන් ප්‍රවාහන අංශයේ වර්තමාන තත්ත්වය [තීරුව 2344]

**කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත:**

නියෝග [තීරු 2354-2399]

**කල්තැබීමේ යෝජනාව:**

වත්මන් ගෝලීය අර්බුදය හේතුවෙන් දේශීය ආර්ථිකයට වන බලපෑම [තීරු 2400-2474]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරුව 2474]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

பொதுநலவாய பாராளுமன்ற சங்கம் (இலங்கைக் கிளை), அனைத்து பாராளுமன்ற ஒன்றியம் (இலங்கைக் குழு) மற்றும் "சார்க்" பாராளுமன்ற உறுப்பினர்கள் சங்கம் (இலங்கைக் கிளை) என்பவற்றினது இணைந்த விசேட பொதுக் கூட்டம் **[ப:** 2297]

முள்ளுத்தேங்காய் பயிர்ச்செய்கை குறித்த விழிப்புணர்வூட்டும் கலந்துரையாடல் **[ப:** 2298]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை [ப:** 2298]

**வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப:** 2300-2342]

**தனி அறிவித்தல் மூல வினா:**

வறுமையை ஒழிப்பதற்கான அரசாங்கத்தின் வேலைத்திட்டம் **[ப:** 2342]

இலங்கையின் விமானப் போக்குவரத்துத் துறையின் தற்போதைய நிலை **[ப:** 2344]

**கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழுச் சட்டம்:**

ஒழுங்குவிதிகள் **[ப:** 2354-2399]

**ஒத்திவைப்புப் பிரேரணை:**

தற்போதைய உலகளாவிய நெருக்கடியால் உள்நாட்டுப் பொருளாதாரத்துக்கு ஏற்படும் பாதிப்பு **[ப:** 2400-2474]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப:** 2474]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Joint Special General Meeting of Commonwealth Parliamentary Association (Sri Lanka Branch), Inter-Parliamentary Union (Sri Lanka Group) and SAARC Parliamentarians' Association (Sri Lanka Branch) [Col. 2297]

Awareness Discussion on Oil Palm Cultivation [Col. 2298]

AUDITOR-GENERAL'S REPORT [Col. 2298]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2300-2342]

QUESTION BY PRIVATE NOTICE:

Government Initiative for Poverty Alleviation [Col. 2342]

Current Status of Sri Lanka's Aviation Sector [Col. 2344]

COLOMBO PORT CITY ECONOMIC COMMISSION ACT:

Regulations [Cols. 2354-2399]

ADJOURNMENT MOTION:

Effects of Current Global Situation on Our Economy [Cols. 2400-2474]

WRITTEN ANSWERS TO QUESTIONS [Col. 2474]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026* මාර්තු *19*වන බ්‍රහස්පතින්දා**
*2026 மார்ச் 19, வியாழக்கிழமை*
*Thursday, 19th March, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා ශාඛාව), අන්තර් පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා කණ්ඩායම) සහ "සාර්ක්" පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය (ශ්‍රී ලංකා ශාඛාව) යන සංගම්වල ඒකාබද්ධ විශේෂ මහා සභා රැස්වීම
### பொதுநலவாய பாராளுமன்ற சங்கம் (இலங்கைக் கிளை), அனைத்து பாராளுமன்ற ஒன்றியம் (இலங்கைக் குழு) மற்றும் "சார்க்" பாராளுமன்ற உறுப்பினர்கள் சங்கம் (இலங்கைக் கிளை) என்பவற்றினது இணைந்த விசேட பொதுக் கூட்டம்
### JOINT SPECIAL GENERAL MEETING OF COMMONWEALTH PARLIAMENTARY ASSOCIATION (SRI LANKA BRANCH), INTER-PARLIAMENTARY UNION (SRI LANKA GROUP) AND SAARC PARLIAMENTARIANS' ASSOCIATION (SRI LANKA BRANCH)

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 මාර්තු 19වන දා, එනම් අද දින අපර භාග 4.00ට පාර්ලිමේන්තුවේ අංක 1 දරන කාරක සභා කාමරයේ දී පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා ශාඛාව), අන්තර් පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා කණ්ඩායම) සහ "සාර්ක්" පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය (ශ්‍රී ලංකා ශාඛාව) යන සංගම්වල ඒකාබද්ධ විශේෂ මහා සභා රැස්වීමට සහභාගි වන ලෙස සියලු ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමි.



## II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2026 මාර්තු 19 බ්‍රහස්පතින්දා, එනම් අද දින අපර භාග 1.30ට කාරක සභා කාමර අංක 2හිදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලුදෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## III

### කටුපොල් වගාව පිළිබඳ දැනුවත් කිරීමේ සාකච්ඡාව
### முள்ளுத்தேங்காய் பயிர்ச்செய்கை குறித்த விழிப்புணர்வூட்டும் கலந்துரையாடல்
### AWARENESS DISCUSSION ON OIL PALM CULTIVATION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකාවේ කටුපොල් වගාවේ වර්තමාන තත්ත්වය සහ ඉදිරි පියවර පිළිබඳ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ සාකච්ඡාවක් වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් 2026 මාර්තු 19 බ්‍රහස්පතින්දා, එනම් අද දින අපර භාග 2.00ට කාරක සභා කාමර අංක 2හිදී පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින්, එම සාකච්ඡාව සඳහා සහභාගි වන මෙන් සියලු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වෙත දැනුම් දීමට කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLV සහ XLVI කොටස් සහ නවවැනි කාණ්ඩයේ XXX කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 4ඊ වගන්තිය සමඟ කියවිය යුතු 3 වගන්තිය යටතේ සුදුසුකම් නිර්ණායක සහ බදු නිදහස් කිරීම් හෝ බදු දිරි ගැන්වීම් සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2026 පෙබරවාරි 08 දිනැති අංක 2474/66 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය මම ඉදිරිපත් කරමි.

මෙම නියෝගය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා හෝමියෝපති වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා (කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Namal Sudarshana - Deputy Minister of Women and Child Affairs)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පන්ලියද්ද, අක්කර 100 වත්ත යන ලිපිනයෙහි පදිංචි ඊ.එම්.ඒ.ආර්. සරත් ඒකනායක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ඉබ්බාගමුව, කෝන්ගහගෙදර යන ලිපිනයෙහි පදිංචි ජේ.ඒ. හඳා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, කටුගස්තොට, විහාර මාවත, අංක 18/3 යන ලිපිනයෙහි පදිංචි යූ. එස්.කේ. කුලසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1-1455/2025-(1), ගරු කේ. කාදර් මස්තාන් මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

## රත්නපුර දිස්ත්‍රික්කයේ කෙසෙල් වගාකරුවන්: ගැටලු
## இரத்தினபுரி மாவட்ட வாழைச் செய்கையாளர்கள்: பிரச்சினைகள்
## BANANA CULTIVATORS IN RATNAPURA DISTRICT: ISSUES

1502/2025

**2. ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ කෙසෙල් වගාව සිදු කරනු ලබන ප්‍රදේශ කවරේද;

(ii) එම දිස්ත්‍රික්කයේ කෙසෙල් වගාවේ නිරත වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) කෙසෙල් සඳහා සාධාරණ මිලක් ලබා ගැනීමට නොහැකිවීමෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ කෙසෙල් වගාකරුවන් පීඩා විඳින බව දන්නේද;

(iv) රත්නපුර දිස්ත්‍රික්කයේ කෙසෙල් වගාකරුවන් මුහුණ දෙන ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்தில் வாழைச் செய்கை மேற்கொள்ளப்படும் பிரதேசங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி மாவட்டத்தில் வாழைச் செய்கையில் ஈடுபடுகின்ற குடும்பங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) வாழைப்பழங்களுக்கு நியாயமான விலை கிடைக்கப் பெறாமையால் இரத்தினபுரி மாவட்டத்தின் வாழைச் செய்கையாளர்கள் பாதிக்கப் பட்டுள்ளனர் என்பதை அவர் அறிவாரா என்பதையும்;

(iv) இரத்தினபுரி மாவட்டத்தின் வாழைச் செய்கை யாளர்கள் எதிர்நோக்கும் பிரச்சினைகளைத் தீர்ப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the areas in the Ratnapura District where banana cultivation is carried out;

(ii) the number of families engaged in banana cultivation in the said district;

(iii) whether he is aware that banana cultivators in the Ratnapura District are facing difficulties due to their inability to obtain a fair price for bananas; and

(iv) the measures taken to address the issues faced by banana cultivators in the Ratnapura District?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

| ප්‍රදේශය | කෙසෙල් වගා වපසරිය (හෙක්ටෙයාර) |
|---|---|
| ඇඹිලිපිටිය (පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ) | 404.2 |
| ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වලව විශේෂ බලප්‍රදේශයට අයත් චන්ද්‍රිකා වැව කොට්ඨාසය | 1583 |
| එකතුව | 1987.2 |

(ii) ඇඹිලිපිටිය (පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ) - පවුල් 911

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වලව විශේෂ බලප්‍රදේශයට අයත් චන්ද්‍රිකා වැව කොට්ඨාසය - පවුල් 2,108

මුළු පවුල් සංඛ්‍යාව - 3,019

(iii) වෙළෙඳපොළෙහි කෙසෙල් මිල උච්චාවචනය වීම, ස්ථාවර ආදායමක් ලබා ගැනීමට ගැටලුවක්ව පවතී. මෙහිදී විශේෂයෙන් වෙනත් පලතුරු වෙළෙඳ පොළට පැමිණෙන පලතුරු වාරයන්හිදී කෙසෙල් මිල පහළ බැසීම සිදුවේ.

(iv)
- අළෙවි අපහසුතා මගහැරවීම සඳහා කෙසෙල් අපනයනය සහ කෙසෙල් ආශ්‍රිත අගය එකතු කරන ලද නිෂ්පාදන බිහි කිරීමට සුදුසු ව්‍යවසායකයින් බිහි කිරීම.
    - ➢ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ රාජ්‍ය බැංකු හා එක්ව කෘෂි ව්‍යවසායකයින් සඳහා අඩු පොලී ණය පහසුකම් ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක අතර, ආහාර සුරක්ෂිතතා හා තාක්ෂණ වැඩසටහන යටතේ ද සියයට 50ක රජයේ දායකත්වය මත කෙසෙල් වගාව සඳහා සහන ලබාදීම සිදු කරයි.
- මහවැලි අධිකාරිය මඟින් ක්‍රියාත්මක කෘෂි අපනයන ගම්මාන වැඩසටහන යටතේ පෞද්ගලික ආයතන සම්බන්ධීකරණයෙන් - Ceylon Fresh Fields Private Limited සහ Dole Lanka (Pvt.) Limited - ඇඹුල් කෙසෙල් අපනයනයට පියවර ගෙන ඇත.

[ගරු නාමල් කරුණාරත්න මහතා]

➢ දේශීය වෙළඳපොළෙහි අඩු මිලක් පවතින ඇඹුල් කෙසෙල් සඳහා ඉහත අපනයන සමාගම් මේ වන විට කිලෝවක් සඳහා රුපියල් 150ක ප්‍රමාණවත් මිලක් ලබා දීම සිදුකරයි.

- අපනයනයට සුදුසු ගුණාත්මයෙන් යුතු නිෂ්පාදනයන් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන පහසුකම් ප්‍රවර්ධනය වෙනුවෙන් මේ වන විට පහත පරිදි ගොවීන් වෙත දිරි ගැන්වීම් සිදුකර ඇත.

| අනු අංකය | ක්‍රියාකාරකම | ලබා දුන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වැය කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | කෘෂි ළිං ඉදිකිරීම සඳහා රු. 200,000.00 බැගින් සහනාධාර ලබා දීම | 84 | 84 | 16.8 |
| 02 | සියයට 50 මහවැලි දායකත්වය මත කෙසෙල් කැන් ආවරණ ලබා දීම | 2355 | 7 | 0.243375 |
| 03 | සියයට 50 මහවැලි දායකත්වය මත ජල පොම්ප ලබා දීම | 5 | 5 | 0.2242 |
| 04 | පටක රෝපිත කෙසෙල් පැළ/ මොරෙයියන් භාවිත කර වගා කරන ලද ගොවීන්ට සහනාධාර ලබා දීම | පැළ සංඛ්‍යාව 14850 | 33 | 0.7515 |
| 05 | කෙසෙල් කැන් ආවරණ දැමීම පහසු කිරීම සඳහා සියයට 50 මහවැලි දායකත්වය මත ඇලුමිනියම් ඉණිමං ලබා දීම | 40 | 40 | 0.60 |
| | එකතුව | | 169 | 18.62 |

(ආ) අදාළ නොවේ.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, රත්නපුර දිස්ත්‍රික්කය ගත්තොත්, ඇඹිලිපිටිය, මහවැලි කලාපය, වලව කලාපය තුළත්, ඒ වාගේම හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බේගමුව වාගේ ප්‍රදේශවලත් මේ වෙනකොට කෙසෙල් වගාකරුවන් විශාල වශයෙන් ඉන්නවා. ඔබතුමා සඳහන් කළ ආකාරයට මේ වෙනකොට කෙසෙල් කිලෝවක මිල රුපියල් 150කට යන්නේ නැහැ. කෙසෙල් කිලෝව රුපියල් 50ට, රුපියල් 60ට තමයි යන්නේ. පසුගිය දවසක ඉතා සුළු මුදලකට, කිලෝව රුපියල් 20ට බැහැලා තිබුණා. එසේ මිල රුපියල් 20ට බැහැපු අවස්ථාවලදී කෙසෙල් කැපුවේ නැහැ. එහෙම වගාවලම ඉදිලා ගියා. ඒ වාගේ තත්ත්වයකට පත් වුණු කාලයක් තිබුණා. මේ වෙනකොට කෙසෙල් මිල යම් මට්ටමකට ඉහළ ගිහිල්ලා තිබෙනවා. මොකද, සිංහල අලුත් අවුරුද්දට තව සුළු කාලයයි තිබෙන්නේ. හැම අවුරුද්දකම සිංහල අලුත් අවුරුදු කාලයට කෙසෙල් මිල ඉහළ යනවා. කෙසෙල් ගොවියා අනෙක් කාලවලට කෝලිකුට්ටු කිලෝව පවා විකුණන්නේ රුපියල් 60ට, රුපියල් 70ට. ඒ වාගේ තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඉතින්, මේ තත්ත්වය තුළ කෙසෙල් වගා කරලා අවුරුද්දකින් තමයි එළදාව ගන්න පුළුවන් වෙන්නේ. විශේෂයෙන් ඇඹුල් කෙසෙල්, සීනි කෙසෙල්, කෝලිකුට්ටු වාගේ කෙසෙල් වර්ග රාශියක් වගා කරනවා. පසුගිය කාලයේ මේවා අපනයනය කළත්, මේ වනවිට කෙසෙල් ගොවියාට තමන් වගා කරන කෙසෙල් අපනයනය කිරීම සඳහා කිසිම වැඩ පිළිවෙළක් සකස් කරලා නැහැ. ඒ නිසා තමයි කෙසෙල්වල මිල මේ තරමට පහළ බසින්නේ. ඒ වාගේම මිල අඩු කාලයේදී කෙසෙල් ගබඩා කර තබා ගැනීම සඳහා අවශ්‍ය වන ශීතාගාර හදලා, ඒවාට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරලාත් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පසුගිය කාලයේ ඒ ප්‍රදේශයට ගිහිල්ලා කෙසෙල් ගොවියා හමුවෙලා, ඒ අයට තිබෙන ප්‍රශ්න, ගැටලු ගැන කථා කළා. ඔබතුමන්ලා බලයට ඇවිල්ලා දැන් අවුරුද්දයි මාස 6ක් ගතවෙලා තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා ඉදිරියේදීවත් කෙසෙල් ගොවියා වෙනුවෙන් යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න සූදානම් ද කියලා මම අහන්න කැමැතියි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, මම පසුගිය දවසක ඒ ප්‍රදේශයට ගිහිල්ලා කෙසෙල් ගොවියා හමුවුණා. මම ඊයේ දිනයේත් ටෝනි, ජයන්ත, තරංග, සිසිර කියන කෙසෙල් වගා කරන ගොවීන් එක්ක සාකච්ඡා කළා. මේ මොහොත වනවිට ඇඹුල් කෙසෙල් කිලෝවක් රුපියල් 60ටත්, කෝලිකුට්ටු කිලෝවක් රුපියල් 200ටත්, සීනි කෙසෙල් කිලෝවක් රුපියල් 80ටත් පවතිනවා. ඇත්තටම ඇඹුල් කෙසෙල්වල මිල තව වුට්ටක් විතර වෙනස් වුණා නම් හොඳයි. නමුත් කෝලිකුට්ටු සහ සීනි කෙසෙල්වල මිල පිළිබඳව ගොවියා සෑහීමකට පත්වෙනවා.

ඔබතුමා කියපු කාරණයත් හරි. පසුගිය කාලය පුරාවට කෙසෙල් ගොවියා නඟා සිටුවීමට අදාළව නිශ්චිත වැඩ පිළිවෙළක් සකස් වෙලා නැහැ. ඒ වාගේම කෙසෙල්වලට අගය එකතු කිරීමට අදාළ මැදිහත්වීමක් කරලාත් නැහැ. ඒක හරි. පසුගිය ආණ්ඩු කාලයේදී ඒ කටයුත්ත කරලා නැහැ. නමුත් අපි මේ වෙනකොට ඒ කටයුත්තට අදාළව සැලසුම් සකස් කරගෙන යනවා. ඔය ප්‍රදේශයේ තිබෙන ප්‍රධානම කෙසෙල් පොළ තමයි බරවකුඹුක. ඒ වාගේම මයුරපුර, සූරියවැව, තුංකම, මොරකැටිය, පන්නගමුව, කැටගල්ආර, පනාමුර, මීද්දෙනිය, අලිඔළුආර කියන කෙසෙල් පොළවල්වලට පසුගිය කාලය තුළ මම ගිහිල්ලා තිබෙනවා. ඒවායේ කෙසෙල් විකුණාගන්න බැරිව විශාල වශයෙන් ඉවත දමනවා. ඒ තත්ත්වය වෙනස් කිරීමට මේ වනකොට රජය අවධානය යොමු කර තිබෙනවා. විශේෂයෙන්ම මේ වනකොට

රාජාංගනය ප්‍රදේශය පදනම් කරගෙන, පෞද්ගලික අංශය සම්බන්ධ කරගෙන කෙසෙල් අපනයනය කිරීමේ කටයුත්ත ප්‍රවර්ධනය කිරීමට අපි මැදිහත් වෙලා තිබෙනවා. ඒ වාගේම කෙසෙල්වලට අගය එකතු කිරීමට අදාළ පොඩි පොඩි කර්මාන්ත එම ප්‍රදේශය තුළ මේ වනකොටත් ආරම්භ කර තිබෙනවා. පසුගිය දවස්වල අපි ඒවා බලන්නත් ගියා. ණය පහසුකම් ලබා දීම වැනි දේවල් තුළින් අත හිත දෙමින් ඒවා ප්‍රවර්ධනය කරන්නත් අපි කටයුතු කරනවා. ඒ වාගේම රාජ්‍ය මැදිහත් වීම යටතේ කෙසෙල්වල අගය එකතු කිරීමට අදාළ වැඩසටහනකට, කර්මාන්ත පද්ධතියකට යන්න ඕනෑය කියන සාකච්ඡාවත් මේ වනකොට අප අතර සිද්ධ වෙමින් පවතිනවා. ඉදිරි කාලය තුළ අනිවාර්යයෙන්ම කෙසෙල් ගොවියන්ට හොඳ කල දසාවක් ලැබෙන්නත්, අපට ඩොලර් ගෙනෙන්නත් පුළුවන් වන විධියට මේ කටයුත්ත නියාමනය කරන්න ඕනෑය කියන ස්ථාවරයේ අපි ඉන්නවා. මේ වනකොට ඊට අදාළ මැදිහත්වීම් කරමින් ඉන්නවා.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම කෙසෙල් වගාව සඳහා ලොකු පිරිවැයක් යනවා. ඒ නිසා කුඹුරු ගොවියාට ලබා දෙන පොහොර සහනාධාරය කෙසෙල් ගොවියාටත් ලබා දෙන්න කියලා මේ අවස්ථාවේ මම ඉල්ලීමක් කරනවා. මේ වනකොට කෙසෙල් ගොවීන් තමන්ගේ වගාවලට අවශ්‍ය ජලය පාවිච්චි කරන්නේ කෘෂි ළිං මඟින්. QR ක්‍රමය හේතුවෙන් මේ වනකොට ඒ අය ඉන්ධන -පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්- ලබා ගැනීමට නොහැකි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න කියලාත් මම ඉල්ලා සිටිනවා. විශේෂයෙන් කෙසෙල් ප්‍රවාහනය කිරීම සඳහා ලොරි රථ යොදා ගන්නවා, ඔබතුමා සඳහන් කළ සති පොළවලට. මේ වනකොට එම ලොරි රථ පැමිණීමේ විශාල අඩුවක් පවතිනවා. දුර පළාත්වලින් ලොරි රථ පැමිණෙන්නේ නැහැ. ඒ නිසා කෙසෙල් අළෙවි කර ගැනීමේදී ගැටලු මතු වනවා. මේ, යම් මිලක් පවතින අවස්ථාවක්, සිංහල අලුත් අවුරුද්දත් හේතුකොටගෙන. ඒ නිසා මේ සඳහා යම් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා මම මේ අවස්ථාවේදී දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කළේ වැදගත් ප්‍රශ්නයක්. හෙක්ටෙයාර දෙකක් සඳහා වී ගොවියාට රුපියල් 30,000ක් තමයි පොහොර සහනාධාරය විධියට කලින් ලැබුණේ. දැන් රුපියල් 50,000ක් ලැබෙනවා. ඒ වාගේම තමයි කන්න රැස්වීමේදී ගත් තීන්දුවක් අනුව වී වගා කරන ඉඩම්වල අතුරු භෝග වගා කරන ගොවීන්ට මීට කලින් පොහොර සහනාධාරය ලැබුණේ නැහැ. දැන් ඒ ගොවීන්ටත් රුපියල් 30,000ක මුදලක් පොහොර සහනාධාරය විධියට ලබා දෙනවා. ගිය කන්නයේත් එය ලබා දුන්නා. මේ කන්නයේත් ලබා දුන්නා. මම කැමැතියි, ඔබතුමා මේ ප්‍රශ්නය අහපු එකට.

විශේෂයෙන්ම පොහොර සම්බන්ධයෙන් ගත්තාම, ගොවි ජනතාවට අපි මේ කාරණය කියන්න ඕනෑ. පෙරේදා වනකොට පොහොර සමාගම් සියල්ලම අපේ අමාත්‍යාංශයට කැඳෙව්වා. ලංකාවේ ගොවි නායකයින් සියලුදෙනාත් පැමිණියා. එතැනදි ඒගොල්ලන් එක්ක සාකච්ඡා කරලා අපි තීරණයකට ආවා, සමාගම් සතුව තිබෙන පොහොර සම්බන්ධව. ඒ අවස්ථාවේදී යම් මිලක් ඒගොල්ලන් නියම කළා. අපි ඒ මිලට එකඟ වුණේ නැහැ. අපි හැප්පිලා මිල අඩු කරලා ගොවියාට සාධාරණ මිලක් ගත්තා. ගොවීන් හැමෝම ඒකට සතුටු වුණා. ගොවීන් මාධ්‍යවලට ඒ සම්බන්ධව ප්‍රකාශත් නිකුත් කළා. ඒ අනුව සමාගම් සතුව දැනට තිබෙන පොහොර අපි රජය විධියට, අමාත්‍යාංශය විධියට ඒ සමාගම්වලින් මිලදී ගන්නවා. අපි එම පොහොර ලබාගෙන ඒවා ගොවිජන සේවා මධ්‍යස්ථාන සහ ගොවි සංවිධාන හරහා ගොවීන්ට ලබා දෙන වැඩ පිළිවෙළක් සකස් කළා. ඒ අනුව ගොවි සංවිධාන එම පොහොර තොග ප්‍රවාහනය කර ගන්නවා. ප්‍රවාහනය කරගෙන ගොවීන්ගේ අතට ඒ පොහොර ටික ලබා දෙන ක්‍රියාවලිය අපි දියත් කරනවා. මේ වනකොටත් ඒකට අදාළ මැදිහත්වීම් කරනවා. ගොවි ජනතාව ඒකට ඉතාම කැමැතියි. ඒගොල්ලන් ඒ සම්බන්ධව සතුට ප්‍රකාශ කළා. ඒකට සියලුදෙනාම ආණ්ඩුවට ස්තුතිය පළ කළා. ඒ තත්ත්වය ඇතුළේ dealersලා හෝ අතරමැදියෝ කිසිවෙක් නැහැ. කෙළින්ම සමාගමෙන් රජය පොහොර ටික ගන්නවා. රජයේ මැදිහත්වීම යටතේ ගොවීන්ගේ අතට පොහොර ටික ලබා දෙනවා. ඔය ක්‍රියාවලියට දැන් අපි ඇවිල්ලා තිබෙනවා. ඒක ඇතුළේ වෙනත් මාෆියාවන්ට නිර්මාණය වෙන්න අපි ඉඩ තියන්නේ නැහැ.

ඒ වාගේම පසුගිය කාලයේ පොහොර අවශ්‍යතාවක් නැතිව තිබියදීත් යූරියා ටොන් 25,000ක් විතර එළියට ගිහින් තිබෙනවා, TSP ටොන් 5,000ක් විතර එළියට ගිහින් තිබෙනවා, MOP ටොන් 5,000ක් විතර එළියට ගිහින් තිබෙනවා. ඒවාට අදාළ පරීක්ෂණ මේ වනකොටත් අපි ආරම්භ කරලා තිබෙනවා. අපි කොහොමත් ඒ කටයුත්ත නියාමනය කරනවා.

ඊළඟට ඔබතුමා වැදගත් ප්‍රශ්නයක් ඇහුවා, ඉන්ධන සම්බන්ධයෙන්. ගොවි ජනතාවට ඉන්ධන සම්බන්ධයෙන් කිසිම ප්‍රශ්නයක් ඇති වන්න අපි ඉඩ තියන්නේ නැහැ. ඒකට අදාළව රජය මේ වනකොට තීන්දුවක් අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම ගොවියාට අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය ගොවි සංවිධානවල නියෝජිතයින්ට ෂෙඩ්වලට ඇවිල්ලා අරගෙන යන්න පුළුවන්, බැරල්වලට හෝ ඕනෑම එකකට. ඒ සම්බන්ධව තිබුණු නීතිය අපි ලිහිල් කළා. කලින් තිබුණු නීතිය අනුව නම්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරි විසින් සහතික කරන්න ඕනෑ, DO සහතික කරන්න ඕනෑ, ප්‍රාදේශීය ලේකම් සහතික කරන්න ඕනෑ, දිස්ත්‍රික් ලේකම් සහතික කරන්න ඕනෑ, ගොවි සංවිධානය සහතික කරන්න ඕනෑ. අපි ඒක වෙනස් කළා. ඒ අනුව ගොවි සංවිධානය සහතික කළා, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරි සහතික කළා, එච්චරයි; එය ප්‍රමාණවත්. දැන් ඒක සරල කරලා තිබෙනවා. අන්න ඒ තත්ත්වය උඩ යම් ගොවි සංවිධානයක ගොවියෝ 100ක් ඉන්නවා නම් ඒ සියදෙනාට අදාළ ඉන්ධන ප්‍රමාණය ගොවි සංවිධානයේ මැදිහත්වීම හරහා ෂෙඩ් එකට ඇවිල්ලා බැරල්වලට හෝ ඕනෑම එකකට අරගෙන යන්න පුළුවන්. ඒ විධියට තෙල් ටික අරගෙන ගිහිල්ලා ගොවි සංවිධානයේ ගොවීන් අතර බෙදා ගන්න පුළුවන්. එතකොට, ගොවියෝ රස්තියාදු වෙන්නේත් නැහැ, වියදමත් අඩුයි, රණ්ඩු ඇති වෙන්නේත් නැහැ. ඔන්න ඔය විධියට අපි ඒ ක්‍රමවේදය සකස් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, ගොවි ජනතාවට පණිවුඩයක් ලබා දෙන්නත් අපි මෙය අවස්ථාව කර ගන්නවා. කලබල වෙන්න එපා, ඔබේ ඉන්ධන ප්‍රශ්නය ඒ විධියට බේරාගන්න පුළුවන් කියන පණිවුඩය ඒ අයට අපි ලබා දෙනවා. ඒ වාගේම තමයි ඔබට කිසිම පොහොර මාෆියාවකට හසු වෙන්න අපි ඉඩ තියන්නේ නැහැ. ඒ සඳහාත් රජය විධියට අපි මැදිහත් වනවා. ඒ සඳහා සියලු ගොවි ජනතාව, ගොවි සංවිධාන රජයට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම මේ වෙලාවේ මා කරනවා.

## යෝජිත වී ඔය ව්‍යාපෘතිය: විස්තර
## உத்தேச வீ ஓய கருத்திட்டம்: விபரம்
## PROPOSED VEE-OYA PROJECT: DETAILS

1544/2025

**3. ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යටියන්තොට, වී ඔය ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ජලාශ ව්‍යාපෘතිය කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතිය කවර ආයතනයක්/සමාගමක් මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බව හෝ නොකරන බව ජනතාවට නිශ්චිතව දැනුම් නොදීමට හේතු කවරේද;

(ii) එම ව්‍යාපෘතිය හේතුවෙන් ජනතාවට සිදුවන හානිය හා පීඩාව සම්බන්ධයෙන් නිසි අධ්‍යයනයක් සිදු කර තිබේද;

(iii) ව්‍යාපෘතිය හේතුවෙන් සෘජු හා වක්‍ර බලපෑම්වලට ලක්වන පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) නාය යාමේ අධි සංවේදී කලාපයක් ලෙස නම් කර ඇති කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි මෙම ප්‍රදේශයේ පිහිටි කඳු දෙකක් හරස් කර ඉහත ජලාශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් අනාගතයේදී සිදු වන බලපෑම් කවරේද;

(v) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බව හෝ නොකරන බව නිශ්චිතව දැනුම් දෙන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யட்டியாந்தோட்டை, வீ ஓய பிரதேசத்தில் செயற்படுத்துவதற்கு உத்தேசிக்கப்பட்டுள்ள நீர்த் தேக்கக் கருத்திட்டம் யாது என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டத்தின்மூலம் எதிர்பார்க் கப்படும் நோக்கங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி கருத்திட்டம் எந்த நிறுவனம்/கம்பனி மூலம் செயற்படுத்தப்படுவதற்கு எதிர்பார்க்கப் படுகின்றது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி கருத்திட்டம் செயற்படுத்தப்படும் என்றோ அல்லது செயற்படுத்தப்படாதென்றோ மக்களுக்கு உறுதியாக அறிவிக்காமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டம் காரணமாக மக்களுக் கேற்படும் பாதிப்பு மற்றும் சிரமங்கள் தொடர்பாக உரிய ஆய்வு மேற்கொள்ளப் பட்டுள்ளதா என்பதையும்;

(iii) கருத்திட்டம் காரணமாக நேரடி மற்றும் மறைமுக அழுத்தங்களுக்குள்ளாகும் குடும்பங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iv) மண்சரிவு அபாயம் அதிகமாகவுள்ள வலயமாக அறிவிக்கப்பட்டுள்ள கேகாலை மாவட்டத்தின் மேற்படி பிரதேசத்தில் அமைந்துள்ள இரண்டு மலைகளுக்கு குறுக்கே மேற்படி நீர்த்தேக்கக் கருத்திட்டத்தை செயற்படுத்துவதன்மூலம் எதிர் காலத்தில் ஏற்படக்கூடிய தாக்கங்கள் யாவை என்பதையும்;

(v) மேற்படி கருத்திட்டம் செயற்படுத்தப்படும் அல்லது செயற்படுத்தப்படாதென்பது உறுதியாக அறிவிக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) name of the reservoir project that has been proposed to be implemented in the Vee-Oya area in Yatiyantota;

(ii) objectives expected to be achieved through the said project; and

(iii) name of the institution/company through which the above project is expected to be implemented?

(b) Will he also inform this House -

(i) the reasons for not informing the public definitely whether the said project will be implemented or not;

(ii) whether a proper study has been conducted regarding the damage and strain caused to the public by the said project;

(iii) separately, the number of families directly and indirectly affected by the project;

(iv) the impacts that can be made in the future by the implementation of the aforesaid reservoir project by constructing a dam between two mountains in the Kegalle District which has been designated as an area highly susceptible to landslides; and

(v) whether it will definitely be informed if the aforesaid project is implemented or not?

(c) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) කැලණි ගඟේ ප්‍රධාන අතු ගංගාවක් වන වී ඔය හරස් කර වී ඔය ජලාශය ඉදිකිරීමට යෝජිතය. මූලික ශක්‍යතා අධ්‍යයනයේදී යටියන්තොට නගරයේ සිට කිලෝමීටර් 9.5ක පමණ දුරකින් වී ඔය හරස් කර කියුබික් මීටර මිලියන 49.5ක ධාරිතාවකින් යුත් ජලාශයක් ඉදිකිරීමට යෝජනා කර ඇත.

(ii) ඉහළ යන පානීය ජල අවශ්‍යතා සපුරා ගැනීමට,

- අධික වර්ෂා කාලවලදී ගංවතුර කොටසක් ජලාශයේ රඳවා තබා කැලණි ගඟේ පහළ නිම්න ප්‍රදේශවලට සිදු වන ගංවතුර හානි අවම කිරීම. මේ සඳහා ඝන මීටර් මිලියන 24ක ධාරිතාවක් වර්ෂාව අපේක්ෂිත කාලවලට ප්‍රථම හිස් කර තබා ගැනීමට යෝජිතය.
- නියඟ කාලවලදී කොළඹ සහ ඒ අවට වර්ධනය වන නාගරීකරණය සහ ජලය මත පදනම් වූ කර්මාන්තවලට සමගාමීව ජල ඉල්ලුම සඳහා ප්‍රමාණවත් ලෙස බැහැර කිරීම පවත්වා ගැනීමට ගංගා ගලා යාම නියාමනය කිරීම සහ ජලය මුදා හැරීම. මේ සඳහා ඝන මීටර් මිලියන 24ක ධාරිතාවක් වෙන් කිරීමට යෝජිතය.
- ජලාශයේ රඳවා ගත් ජලය හැකි අවස්ථාවලදී විදුලිබල උත්පාදනය සඳහා යොදා ගැනීම.

(iii) දැනට මෙම ජලාශ ව්‍යාපෘතියේ සවිස්තරාත්මක නිර්මාණ කටයුතු - detailed design - CResMPA ව්‍යාපෘතියේ සංරචක 2 යටතේ මෙම වසර තුළ අවසන් කිරීමේ අපේක්ෂාවෙන් සැලසුම් උපදේශන සමාගමක් සමඟ ගිවිසුම්ගත වී ඇති අතර, මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ ඉදිකිරීමට යෝජිතය.

කැලණි ගංගාවේ ගංවතුර පාලනය සඳහා මෙන්ම අනාගත ජල සම්පාදන අවශ්‍යතා සඳහා මෙම ව්‍යාපෘතිය අත්‍යවශ්‍ය වශයෙන් සිදු කළ යුතු බව පූර්ව ශක්‍යතා අධ්‍යයන මඟින් නිර්දේශ කර ඇත. එබැවින් සම්පූර්ණ සවිස්තරාත්මක නිර්මාණ කටයුතු සිදු කිරීමෙන් අනතුරුව 2027 වර්ෂයේ ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

(ආ) (i) ඉදිරියේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා පාරිසරික බලපෑම් තක්සේරුව - EIA - හා සමාජ බලපෑම් තක්සේරුව - SIA - වාර්තා සැකසීම සඳහා උපදේශන සේවා සපයන ආයතන මඟින් ඉටු කර ගැනීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට හැකියාව පවතී.

(iii) මූලික ක්ෂේත්‍ර අධ්‍යයනයේදී පහත සඳහන් තොරතුරු හඳුනා ගන්නා ලදී.

- නිවාස අහිමි වීම් 203 (ජලාශයට යට වන භූමියේ සිටින පවුල් 176ක් සහ නාය යාම් අවදානම් ප්‍රදේශවල සිටින පවුල් 27ක් වශයෙන්)
- ව්‍යාපාරික ස්ථාන අහිමි වීම් 13 (සිල්ලර වෙළෙඳ සැල් 6ක්, ගරාජයක්, කුඩා තේ කඩ 2ක්, වෙළෙඳාම සඳහා භාවිත කරන තාවකාලික මඩුවක්, පොත් සාප්පුවක් සහ කොන්ක්‍රීට් වැඩ සඳහා භාවිත කරන ඉඩමක්)

(iv) නාය යාම් අවදානම පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය මඟින් සිදු කර නාය යාමේ අවදානම් ස්ථාන පිළිබඳව වාර්තාවක් ලබා දී ඇත.

එම වාර්තාව අනුව ජලාශය ඉදිකිරීම නිසා වැඩි විය හැකි අවදානම අවම කර ගැනීමට ව්‍යාපෘතිය මඟින් කටයුතු සිදු කිරීමට අපේක්ෂිතයි.

(v) කැබිනට් තීරණය අනුව දැනුම් දිය හැකිය.

(ඇ) ඉහත පිළිතුරු අනුව අදාළ නොවේ.

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මම මතු කරන වී ඔය ජලාශය පිළිබඳ ව්‍යාපෘතිය 2016 අවුරුද්දේ පමණ සිට ශක්‍යතා අධ්‍යයන සිදු කරමින් තිබෙන ව්‍යාපෘතියක්. ඒ නිසා සෑහෙන්න කාලයක් තිස්සේ මේ පිළිබඳව විවිධ අධ්‍යයන සිදු වෙනවා. ඇත්තටම මේ හා සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන සහ අනෙකුත් අංශ පිළිබඳව යම් අපැහැදිලිතාවක් තිබෙනවා. ඒ හින්දා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, වී ඔය ජලාශය ඉදිකිරීමේදී අමාත්‍යාංශය මඟින් සකසා ඇති ක්‍රියාකාරී සැලැස්ම හා එය ක්‍රියාත්මක කිරීමේ වගකීම භාර අංශ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද කියලා.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමනි, වාරිමාර්ග දෙපාර්තමේන්තුව තමයි මේ පිළිබඳව මූලික සැලසුම් සකස් කරලා තිබෙන්නේ. ඒ වාගේම එම දෙපාර්තමේන්තුවම තමයි මේ පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරන්නේ. ඇත්තටම මේ සඳහා කාලයක් ගත වුණේ ආර්ථික දුෂ්කරතා වාගේම තවත් දේවල් බලපා තිබුණු නිසායි. ඒ වාගේම මේ සඳහා දක්වන අවධානයේ අඩුකමකුත් තිබුණා. හැබැයි, නිලධාරින්ගේ පැත්තෙන් තමන්ට පැවරුණු වගකීම ඉටු කර තිබෙනවා වාගේම ඒ පිළිබඳ අධ්‍යයනයන් කරමින් විවිධ අවස්ථාවල ඒ සම්බන්ධයෙන් වාර්තා සපයලාත් තිබෙනවා.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඒ පිළිබඳව ක්‍රියාකාරී සැලැස්මක් හදා තිබෙනවා. දැන් වනවිට එය පියවරින් පියවර ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. 2027 වර්ෂයේදී අපට මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අදාළ කටයුතු කරන්න පුළුවන් කියන එක තමයි අමාත්‍යාංශය පැත්තෙන් ලබා දීමට හැකි පිළිතුර වන්නේ.

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ යෝජිත ජලාශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ අධ්‍යයනයන් සිදු වෙනකොට, ඒ ප්‍රදේශවල පදිංචි ජනතාවට සැලකිය යුතු ප්‍රශ්න ප්‍රමාණයක් මතු වෙනවා. එකක් තමයි, ඔවුන්ගේ වාසස්ථාන පිළිබඳ ගැටලුව. අනෙක් එක තමයි, ඔවුන්ගේ ආර්ථිකය. තේ ආශ්‍රිත ආර්ථිකය වෙන්න පුළුවන්, රබර් ආශ්‍රිත ආර්ථිකය වෙන්න පුළුවන්, ඒ වාගේ වැවිලි කර්මාන්තය හා සම්බන්ධ ආර්ථිකයක් තමයි ඒ ප්‍රදේශයේ පවතින්නේ. මේ තත්ත්වය හමුවේ මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, මේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ජනතාව මුහුණ දෙන මෙන්න මේ කියන ගැටලුවලට යෝග්‍ය විසඳුම් ක්‍රියාත්මක කරමින් ද, මේ යෝජිත ව්‍යාපෘතිය ආරම්භ කරන්නේ කියලා.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉතාම වැදගත් ප්‍රශ්නයක් ඇහුවේ. එම ප්‍රදේශයේ ජීවත් වන කෘෂිකාර්මික, ව්‍යාපාරික වැනි විවිධ ක්ෂේත්‍රවල නියැළෙන ජනතාව වාගේම සාමාන්‍ය ජනතාවත් මේ ව්‍යාපෘතිය නිසා යම් අර්බුදයකට, ගැටලුවකට මුහුණ දෙනවා නම්, ඒ පිළිබඳව ආණ්ඩුවක් විධියට අපි අවධානය යොමු කරනවා. මේ ව්‍යාපෘතිය පිළිබඳව විතරක් නොවෙයි, රටේ ක්‍රියාත්මක වන ඕනෑම ව්‍යාපෘතියකදී ජනතාවගේ පැත්තෙන් සලකා බලමින්, ජනතාවට අවම හානියක් වන ආකාරයට තමයි අපි ඒවා සැලසුම් කරන්නේ. ඒ අනුව වී ඔය ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙම ව්‍යාපෘතිය නිසා ජනතාවට යම් බාධාවක්, දුෂ්කරතාවක් පැන නඟිනවා නම් ඒ පිළිබඳව මුලින්ම කථා කර, සාකච්ඡා කර ජනතාව එක්ක එකඟතාවක් ඇතුව තමයි එය ක්‍රියාත්මක කරන්නේ.

ඒ නිසා මේ ඉදිකිරීමට - මේ ව්‍යාපෘතියට - අදාළව කිසිදු පුද්ගලයෙකුට අසාධාරණයක් නොවෙන්න ඔවුන් සමඟත් සාකච්ඡා කරලා, ආයතන මට්ටමින් සියලු ආයතන මැදිහත් කරගෙන ඉතාම විනිවිදභාවයකින් යුක්ත ක්‍රියාකාරී සැලැස්මක් යටතේ මෙය ක්‍රියාත්මක කරන්න අමාත්‍යාංශයක් විධියට අපි කටයුතු කරනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රදේශයේ මේ ජලාශ ව්‍යාපෘතියට හසුවෙන, එහෙම නැත්නම් ඒකෙන් පීඩාවට ලක් වෙන ජනතාවට උපරිම සාධාරණයක් කරන්න ආණ්ඩුව විධියට අපි කටයුතු කරනවා.

## අරාබි විද්‍යාල: උත්ශ්‍රේණිගත කිරීම
அரபுக் கல்லூரிகள்: தரமுயர்த்துதல்
ARABIC COLLEGES: UPGRADING

1551/2025

**4. ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල මුස්ලිම් ආගමික විද්වතුන් බිහිකරන අරාබි විද්‍යාල ක්‍රියාත්මක වන බවත්;

(ii) එම විද්‍යාල වර්ගීකරණය මත පදනම්ව කාණ්ඩ 3කට ශ්‍රේණිගත කර ඇති බවත්; එතුමා දන්නේද?

(ආ) (i) එම අරාබි විද්‍යාල වැඩි සංඛ්‍යාවක් පළමු ශ්‍රේණියට අයත් වන බැවින්, ඒවා දෙවැනි සහ තෙවැනි ශ්‍රේණි දක්වා උත්ශ්‍රේණිගත කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එම අරාබි විද්‍යාල උත්ශ්‍රේණිගත කිරීම සඳහා පවතින බාධා සහ කොන්දේසි කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் பல்வேறு பிரதேசங்களில் இஸ்லாம் மார்க்க அறிஞர்களை உருவாக்கு கின்ற அரபுக் கல்லூரிகள் இயங்கி வருகின்றன என்பதையும்;

(ii) மேற்படி கல்லூரிகள் வகைப்படுத்தலுக்கு அமைவாக மூன்று பிரிவுகளாக தரப்படுத்தப் பட்டுள்ளன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி அரபுக் கல்லூரிகளுள் அதிகமானவை முதலாம் தரத்தைச் சார்ந்தவை என்பதனால், அவற்றை இரண்டாம் மற்றும் மூன்றாம் தரத்துக்கு தரமுயர்த்துவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(ii) மேற்படி அரபுக் கல்லூரிகளை தரமுயர்த்துவதில் காணப்படும் தடைகள் மற்றும் நிபந்தனைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Is he aware that -

(i) the Arabic colleges which produce Muslim religious scholars are operating in various regions of Sri Lanka; and

(ii) those colleges have been graded into three categories based on their classification?

(b) Will he inform this House-

(i) since the majority of these Arabic colleges are currently in the first grade, whether steps will be taken to upgrade them to the second and third grades; and

(ii) the existing obstacles and conditions for upgrading these Arabic colleges?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) එම අරාබි විද්‍යාල වර්ග තුනක් අනුව ලියාපදිංචි කෙරේ.

1. තාවකාලික ප්‍රාථමික අරාබි පාසල් (TPAS - Temporary Preliminary Arabic Schools) ලියාපදිංචි කේතය (MRCA/13/1/T/PAS/....)

2. ප්‍රාථමික අරාබි පාසල් (PAS - Preliminary Arabic Schools) ලියාපදිංචි කේතය (MRCA/13/1/PAS/....)

3. අරාබි විද්‍යාල (AC - Arabic Colleges) ලියාපදිංචි කේතය (MRCA/13/1/AC/....)

(ආ) (i) එම අරාබි විද්‍යාලවලින් බොහොමයක් පළමු ශ්‍රේණියට නොව දෙවන ශ්‍රේණියට අයත් වේ. එම විස්තර පහත පරිදි වේ.

- තාවකාලිකව ප්‍රාථමික අරාබි පාසල් - 61
- ප්‍රාථමික අරාබි පාසල් - 148
- අරාබි විද්‍යාල - 112

එකතුව - 321

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මඟින් දැනට තාවකාලිකව ප්‍රාථමික අරාබි පාසලේ සිට ප්‍රාථමික අරාබි පාසල් සඳහා වන උත්ශ්‍රේණිගත කිරීම -upgrading- සිදු කරමින් පවතී.

ප්‍රාථමික අරාබි පාසලේ සිට අරාබි විද්‍යාලය දක්වා වූ ශ්‍රේණිගත කිරීමේ කටයුතු දැනට සිදු නොවේ.

(ii) දෙවන අදියරේ සිට තුන්වන අදියර දක්වා ශ්‍රේණිගත කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත. එය 2019 ඉඳලා තමයි අත්හිටුවා තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

අරාබි විද්‍යාල සඳහා වන පොදු විෂය මාලාව සහ ඊට අනුරූප රාමුවේ කෙටුම්පත් සම්පූර්ණ කර සමාලෝචනය සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයට මේ වන විට ඉදිරිපත් කර ඇත.

එම පියවර ජය ගත්තාට පසුව තමයි අපට නැවත upgrading එක කරන්න පුළුවන් වෙන්නේ. ඒකේ හොඳ පියවර කිහිපයක් අධ්‍යාපන අමාත්‍යාංශය ඉස්සරහට තබා තිබෙනවා.

ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MOD/NID/CD/OUT/01 (VOL 05-428) හා 2025.10.26 දිනැති ලිපිය අනුව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය හා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සමඟ 2025 ඔක්තෝබර් 13 දින පෙර වරු 9.30ට ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවති ජාතික ආරක්ෂක කවුන්සලයේ රැස්වීමේදී ගරු ජනාධිපතිතුමා විසින් පහත පරිදි උපදෙස් ලබා දී ඇත.

1. එක් එක් ආගම් තුළ ඉගැන්වීම් සහ ආගමික අධ්‍යාපනය නියාමනය කිරීම සඳහා පුළුල් යන්ත්‍රණයක් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රධාන ආගම් නියෝජනය කරන ප්‍රමුඛ ආගමික නායකයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම

   මද්‍රසා පාසල්වලට විතරක් නොව, ඊට වඩා පුළුල්ව හිතලායි එය කරන්නේ.

2. ජාතික අධ්‍යාපන ප්‍රමිතීන්ට සහ අධීක්ෂණ අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කරමින්, ඉස්ලාමීය ආගමික නායකයන් සමඟ සාකච්ඡා කර, මද්‍රසා ඇතුළු පෞද්ගලික අධ්‍යාපන ආයතන සඳහා සුදුසු නියාමන රාමුවක් සකස් කිරීම

(එම ලිපියේ පිටපත ඇමුණුම I ලෙස මෙම පිළිතුරට එක් කර ඇත.)

මේ අනුව ඉතා නුදුරු දවසකදී මේ ගැටලුව ජය ගන්න අපට පුළුවන් වනවා. ගරු කථානායකතුමනි, ඉතා වැදගත් වනවා, මවුලවිවරුන් බිහි කරන මේ පාසල් ප්‍රවර්ගය. ඒ ගැන ඉතා පැහැදිලි අදහසක් අපට තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
நன்றி, கௌரவ அமைச்சர் அவர்களே-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමා පිළිතුර සපයා අවසන් ද?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන්, එම පිළිතුරට අදාළව මේ කරුණත් එකතු කරන්න මම කැමැතියි.

ගරු අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ උපදෙස් අනුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට නිලධාරීන් 11දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2026.03.06 දිනැතිව පත් කර ඇත. ඊට අදාළ ලේඛනය ඇමුණුම II ලෙස පිළිතුරට එක් කර ඇත.

ඉහත ඇමුණුම් I සහ II **සභාගත*** කරමි.

ගරු කථානායකතුමනි, ප්‍රධාන කරුණු තුනක් එම කමිටුවට පැවරී තිබෙනවා.

1. මද්‍රසා අධ්‍යාපන පනත කෙටුම්පත් කිරීම
2. මද්‍රසා අධ්‍යාපන ආයතන සඳහා පොදු විෂය මාලාවක් - syllabus එකක් - සකස් කිරීම
3. අල් අලීම් අවසාන විභාගය (I හා II) සඳහා විෂය නිර්දේශය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම

මෙම කරුණු සාකච්ඡා කිරීම සඳහා මෙම කමිටුව 2026.03.25වන දා රැස්වීමට නියමිත ය. අදාළ කමිටුව ගන්නා තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කරනු ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

இலங்கையில் கல்வி கற்கின்ற முஸ்லிம் மாணவர்களுக்கு மார்க்க பாடத்தைக் கற்பிக்கின்ற மௌலவி ஆசிரியர்களுக்கான நியமனமானது கடந்த பல தசாப்த காலமாக இடம்பெறவில்லை ஏன் என்பதையும், அவ்வாறு மௌலவி ஆசிரியர்களை நியமனம் செய்ய இந்தப் புதிய அரசு நடவடிக்கைகளை மேற்கொள்ளுமா என்பதையும், 2015ஆம் ஆண்டுக்கு முன்பு நடைமுறையிலிருந்த Al-Aalim Muthawassitha, Al-Aalim Sanaviyya - பகுதி I, II (பழைய முறை) பரீட்சைகளை நடாத்த நடவடிக்கை மேற்கொள்ள முடியுமா என்பதையும் கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்கின்றேன். ஏனெனில், இப்பரீட்சைகள் நடாத்தப்பட்டு சான்றிதழ் வழங்கப்பட்டால், கல்லூரிகளுக்கு மாணவர்களை அனுமதிக்கும்போது அவர்களுக்குப் புள்ளிகள் வழங்கப்படும்.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු කථානායකතුමනි, ඇත්තටම ඒ කාරණය තමයි මම අන්තිමට සඳහන් කළේ. ගරු අධ්‍යාපන ඇමතිතුමිය පත් කරලා තිබෙන කමිටුවට පැවරුණු ප්‍රධාන කාරණා තුනෙන් තුන්වැනි එක ගැන තමයි ඔබතුමා අහන්නේ, ගරු මන්ත්‍රීතුමනි. ඒ තමයි, අල්-ආලිම් අවසාන විභාගය. ඒකේ කොටස් දෙකක් තිබෙනවා, I සහ II ලෙස. මේ සඳහා විෂය නිර්දේශය පිළිබඳ වාර්තාව ඉදිරිපත් වුණාට පසුව ඔබතුමා අහන මේ ප්‍රශ්නය විසඳෙනවා. ඊට පසුව ඒ වාර්තාව අනුව තමයි විශ්වවිද්‍යාල අධ්‍යාපනයට වලංගු වන විධියට ඒ ලකුණු එකතු කරන්න පුළුවන්ද ආදි වශයෙන් පිළිතුරක් දෙන්න මට පුළුවන් වන්නේ.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

கௌரவ சபாநாயகர் அவர்களே, எனது இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

சஹ்ரான் பிரச்சினை ஏன் ஏற்பட்டது, அதனது சூத்திரதாரிகள் யார் என்பதை முழு நாடுமே தற்போது அறிந்துள்ள நிலையில், ஏன் முஸ்லிம் சமூகத்தினரது உரிமைகள் மட்டும் தடைசெய்யப்பட்டுள்ளன? குறிப்பாக, அல்-குர்ஆன் மொழிபெயர்ப்புப் பிரதிகள் கடந்த ஆட்சி முதல் இன்று வரைக்கும் விடுவிக்கப்படவில்லை. பதிவுகள் சம்பந்தப்பட்ட விடயங்கள் உட்பட அரச காணிகளில் இயங்குகின்ற மத்ரஸாக்கள், பள்ளிவாசல்கள் போன்றவற்றுக்கு குத்தகை அடிப்படையில் நிலத்தைப் பெற்றுக்கொள்ள வேண்டுமெனக் கூறப்படுகின்ற அதேநேரம், ஏனைய மதஸ்தாபனங்களுக்கு பூஜா ஐப்புவ வழங்கப்படுகின்றது. ஏன், இந்தப் பாரபட்சம் எமது சமூகத்துக்குக் காட்டப்படுகின்றது? பதிவுகள், தரமுயர்வுகள் என்பன நிறுத்தப்பட்டு இருக்கையில், முகவரி மற்றும் பெயர் மாற்றம் உட்பட வழமையான நடவடிக்கைகளையும் ஏன் இடைநிறுத்தியுள்ளீர்கள்? என கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்கின்றேன்.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු මන්ත්‍රීතුමනි, එවැනි විශේෂ වෙනස්කමක් කිරීමක් ඇත්තටම නැහැ. අපි දන්නවා, පූජා භූමි විධියට සහ ආගමික ස්ථාන විධියට පන්සල් ලියාපදිංචිය හෝ ඊට ඉඩම් පිරිනැමීම සම්බන්ධයෙන් විශාල අතීතයක් තිබෙන බව. ඒක කරගෙන ආපු විධියක් තිබෙනවා. ඒ විධියටමයි ඒක ඉස්සරහට යන්නේ. නමුත් ඔබතුමා ඉදිරිපත් කරන යෝජනාව අනුව අපට පුළුවන්, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවත් එක්ක, ඒ උපදේශක මණ්ඩලයත් එක්ක සාකච්ඡා කරලා එවැනි විභවතාවක් තිබෙනවාද කියලා බලන්න. කුරානය පිළිබඳව ඔබතුමා විමසුවා. ශුද්ධ වූ අල්-කුරානය පිළිබඳ ප්‍රශ්නය මේ මද්‍රසා පාසල්වලට පරිබාහිරයි කියලා මම හිතන්නේ නැහැ. ඒ නිසා උත්තර දෙන්න අකමැත්තක් නැහැ. මා ඇති තරම් කරුණු දක්වා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි, වරාය සහ ඒ ආශ්‍රිතව මුද්‍රා ගන්න බැරුව තිබෙන ශුද්ධ වූ කුරාන පිටපත් සම්භාරය ගැන. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය තරම් විශේෂඥ කමිටු පත් කරලා තිබෙනවා. ඒ කමිටුවල තීරණය අනුවයි අපට ඒක ක්‍රියාත්මක කරන්න වෙන්නේ. ඒ හැරුණු විට රජය පැත්තෙන් කිසිදු ප්‍රමාදයක් හෝ බාධාවක් නැති බව මා කියන්න ඕනෑ. අපට පුළුවන්, අපේ නියෝජ්‍ය අමාත්‍ය මුනීර් මුලාෆර් මැතිතුමා එක්ක වැඩිදුර තොරතුරු සාකච්ඡා කර ගන්න.

## පළාත් පාලන ආයතන සහ කොට්ඨාස නිර්ණය: ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
## உள்ளூராட்சி மன்றங்கள் மற்றும் வட்டாரங்களின் எல்லை வரையறை: திருகோணமலை மாவட்டம்
## DEMARCATION OF LOCAL AUTHORITY AREAS AND WARDS: TRINCOMALEE DISTRICT

1558/2025

**5. ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන කවරේද;

(iii) එම එක් එක් පළාත් පාලන ආයතනයට අයත් ඡන්ද දායකයන්, කොට්ඨාස සහ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පළාත් පාලන ආයතන සහ පළාත් පාලන කොට්ඨාස බෙදා වෙන් කර ඇති පදනම සහ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව තීරණය කර තිබෙන පදනම කවරේද;

(v) එමඟින්, සමහර සභාවලට මෙන්ම ඡන්ද දායකයන්ටද අසාධාරණයක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා විසඳුමක් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මොරවැව, ගෝමරන්කඩවල, පදවි ශ්‍රීපුර, සේරුවිල සහ වෙරුගල් යන ප්‍රාදේශීය සභා පහට අයත් මුළු ඡන්ද දායකයන් සංඛ්‍යාවට වඩා මූතූර් ප්‍රාදේශීය සභාවේ මුළු ඡන්දදායකයන් සංඛ්‍යාව වැඩි බව දන්නේද;

(ii) ජනගහනය, ග්‍රාම නිලධාරි කොට්ඨාස සංඛ්‍යාව සහ භූමි ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් මූතූර් ප්‍රාදේශීය සභාව පළාත් පාලන ආයතන දෙකකට වෙන් කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திருகோணமலை மாவட்டத்திலுள்ள உள்ளூராட்சி மன்றங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி மன்றங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு உள்ளூராட்சி மன்றத்துக்கும் உரிய வாக்காளர்கள், வட்டாரங்கள் மற்றும் உறுப்பினர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iv) உள்ளூராட்சி மன்றங்கள் மற்றும் உள்ளூராட்சி வட்டாரங்கள் பிரிக்கப்பட்டுள்ள அடிப்படை மற்றும் உறுப்பினர்களின் எண்ணிக்கை தீர்மானிக்கப்பட்டுள்ள அடிப்படை யாது என்பதையும்;

(v) அதன்மூலம், சில சபைகளுக்கும் வாக்காளர் களுக்கும் அநீதி இழைக்கப்பட்டுள்ளதை ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(vi) ஆமெனில், அதற்கான தீர்வுகள் வழங்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மொரவெவ, கோமரன்கடவல, பதவிசிறிபுர, சேருவில மற்றும் வெருகல் ஆகிய ஐந்து பிரதேச சபைகளுக்கும் உரிய மொத்த வாக்காளர்களின் எண்ணிக்கையைவிட, மூதூர் பிரதேச சபையின் மொத்த வாக்காளர்களின் எண்ணிக்கை அதிகம் என்பதை அறிவாரா என்பதையும்;

(ii) மக்கள் தொகை, கிராம உத்தியோகத்தர் பிரிவுகளின் எண்ணிக்கை மற்றும் நிலப்பரப்பு ஆகியவற்றைக் கருத்திற்கொண்டு மூதூர் பிரதேச சபை இரண்டு உள்ளூராட்சி மன்றங்களாகப் பிரிக்கப்படுமா என்பதையும்;

(iii) ஆமெனில், அதற்கான திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the number of local authorities in the Trincomalee District;

(ii) the names of the said local authorities;

(iii) the number of constituents, wards and councillors belonging to each of those local government bodies, separately;

(iv) the basis on which local authorities and wards are demarcated and the number of councillors is determined;

(v) whether he accepts that it has resulted in injustice to certain local government bodies and their constituents; and

(vi) if so, whether the said issue will be addressed?

(b) Will he also inform this House -

(i) whether he is aware that the total number of constituents of the Mutur Pradeshiya Sabha is higher than that of the combined total number of constituents of the five Pradeshiya Sabhas of Morawewa, Gomarankadawala, Padavi Sripura, Seruwila and Verugal;

(ii) whether the Mutur Pradeshiya Sabha will be divided into two local government bodies based on the population, number of Grama Niladhari Divisions and the land area; and

(iii) if so, the date on which the said action will be taken?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
**(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)**

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 13යි.

(ii) ත්‍රිකුණාමලය මහ නගර සභාව
කින්නියා නගර සභාව
වෙරුගල් ප්‍රාදේශීය සභාව
සේරුවිල ප්‍රාදේශීය සභාව
කන්තලේ ප්‍රාදේශීය සභාව
මොරවැව ප්‍රාදේශීය සභාව
ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාව
පදවි ශ්‍රීපුර ප්‍රාදේශීය සභාව
ත්‍රිකුණාමලය නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාව
කුච්චවේලි ප්‍රාදේශීය සභාව
තඹලගමුව ප්‍රාදේශීය සභාව
මුතූර් ප්‍රාදේශීය සභාව
කින්නියා ප්‍රාදේශීය සභාව

(iii)

| පළාත් පාලන ආයතනය | ලියාපදිංචි ඡන්ද ගණන (2025) | කොට්ඨාස ගණන | මන්ත්‍රීවරුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය මහ නගර සභාව | 38,338 | 12 | 25 |
| කින්නියා නගර සභාව | 29,131 | 8 | 15 |
| වෙරුගල් ප්‍රාදේශීය සභාව | 9,840 | 8 | 13 |
| සේරුවිල ප්‍රාදේශීය සභාව | 11,859 | 10 | 16 |
| කන්තලේ ප්‍රාදේශීය සභාව | 39,124 | 13 | 21 |
| මොරවැව ප්‍රාදේශීය සභාව | 6,918 | 9 | 17 |
| ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාව | 6,692 | 10 | 17 |
| පදවි ශ්‍රීපුර ප්‍රාදේශීය සභාව | 9,740 | 10 | 17 |
| ත්‍රිකුණාමලය නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාව | 35,617 | 8 | 20 |
| කුච්චවේලි ප්‍රාදේශීය සභාව | 29,540 | 10 | 17 |
| තඹලගමුව ප්‍රාදේශීය සභාව | 24,761 | 10 | 16 |
| මුතූර් ප්‍රාදේශීය සභාව | 50,671 | 13 | 22 |
| කින්නියා ප්‍රාදේශීය සභාව | 27,168 | 8 | 14 |
| එකතුව | 319,399 | 129 | 230 |

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

(iv) අංක අමප/17/1521/744/015 හා 2017.07.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පළාත් පාලන ආයතන බෙදා වෙන් කිරීම සිදුවන අතර, ඒ සඳහා පහත නිර්ණායක අනුගමනය කරනු ලබයි.

i. ජන සංඛ්‍යාව හා ජන ඝනත්වය

ii. නිවාස ප්‍රමාණය හා ඝනත්වය

iii. සේවා සම්පාදනය හා යටිතල පහසුකම්වල දියුණුව

iv. වාණිජ හා කර්මාන්ත ආයතනවල ව්‍යාප්තිය

v. සේවා නියුක්තිය

vi. යෝජිත ආයතනයේ බල ප්‍රදේශයේ ස්වයං ජනිත ආදායම

ඉහත නිර්ණායක සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව යාවත්කාලීන කරමින් ප්‍රසිද්ධ කරනු ලබන වාර්ෂික සංඛ්‍යාලේඛන දත්ත වාර්තා මඟින් ලබා ගැනීමට උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් උපදෙස් ලබා දී ඇත. තවද, ඉහත දක්වා ඇති මූලික නිර්ණායක මැනීමට පාදක කර ගත යුතු දර්ශක මොනවාද යන්නත්, එකී එක් එක් දර්ශකය අනුව බර තැබිය යුතු ප්‍රතිශතයනුත් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර, ඒ අනුව පළාත් පාලන ආයතන බෙදා වෙන් කිරීම අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් සකස් කර ඇති ක්‍රමයට අනුව සිදු කරනු ලබයි.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) ආඥාපනතෙහි 3ආ.(2) අනුව පළාත් පාලන ආයතනවල කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා පහත නිර්ණායක අදාළ කර ගනී.

(අ) අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ජනවාර්ගික ජනගහන අනුපාතය සහ එම ජනවාර්ගික අනුපාතය මත පදනම් වන්නාවූ නියෝජනයක් සහතික කිරීමේ අවශ්‍යතාව;

(ආ) පළාත් පාලන ආයතනයේ භූගෝලීය ප්‍රදේශය සහ එහි භෞතික ලක්ෂණ;

(ඇ) පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ජනගහනය සහ එහි ජන ඝනත්වය; සහ

(ඈ) පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ආර්ථික සංවර්ධන මට්ටම.

(v) නැත.

(vi) අදාළ නොවේ.

(ආ) (i) ඔව්.

(ii) නැත.

පළාත් පාලන ආයතන සංස්ථාපනය සඳහා සලකා බලන සාධක ජනගහනය, ග්‍රාම නිලධාරි කොට්ඨාස සංඛ්‍යාව හා භූමි ප්‍රමාණය පමණක් නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ அமைச்சர் அவர்களே!

இன்றைய தினம் என்னால் கேட்கப்பட்ட திருகோணமலை மாவட்டத்திலுள்ள உள்ளூராட்சி மன்றங்கள் தொடர்பான கேள்வியின் பிரதான நோக்கம் என்னவெனில், உள்ளூராட்சி மன்றங்கள் பிரிக்கப்பட்டதன் அடிப்படையில், அவற்றுக்குத் தெரிவுசெய்யப்படுகின்ற உறுப்பினர்களின் எண்ணிக்கையில் சில குறைபாடுகள் காணப்படுகின்றமைதான். குறிப்பாக, மொரவெவ, கோமரங்கடவல, பதவிசிறிபுர, சேருவில, வெருகல் ஆகிய ஐந்து உள்ளூராட்சி மன்றங்களுக்குரிய மொத்த வாக்காளர்களின் எண்ணிக்கையைவிட, மூதூர் பிரதேச சபையின் மொத்த வாக்காளர்களின் எண்ணிக்கை அதிகமாகக் காணப்படுகின்றது. அதனால்தான் நான் கேட்கின்றேன், இந்த மூதூர் பிரதேச சபையை இரண்டாகப் பிரிப்பதற்கு நடவடிக்கை எடுக்க முடியுமா? என்று.

கௌரவ அமைச்சர் அவர்களே, அங்கு 50,000க்கும் மேற்பட்ட வாக்காளர்கள் இருப்பதாக நீங்கள் இந்தச் சபையில் கூறினீர்கள். எனினும், அந்தச் சபைக்கு வட்டாரங்களிலிருந்து நேரடியாக 13 உறுப்பினர்கள் தெரிவுசெய்யப்படுகின்ற சூழலே காணப்படுகின்றது. அதேபோல், கிண்ணியா நகர சபை மற்றும் பிரதேச சபைக்கு உட்பட்ட பிரதேசத்திலும் கூடுதலான வாக்காளர்கள் இருக்கின்றார்கள். எனினும், அங்கு 8 வட்டாரங்களே காணப்படுகின்றன. அங்குள்ள வாக்காளர் களின் எண்ணிக்கையைக் கருத்திற்கொண்டு, வட்டாரங்களை அதிகரிப்பதற்கு ஏதாவது வேலைத்திட்டம் இந்த அரசாங் கத்திடம் இருக்கின்றதா? என்பதை என்னுடைய முதலாவது மேலதிக வினாவாகக் கேட்கின்றேன்.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරපු ප්‍රශ්නයට අනුව මම කලින් සඳහන් කළ ආකාරයට නිර්ණායක සකස් කරලා තිබෙන්නේ ජනගහනය පමණක් පදනම් කරගෙන නොවෙයි. එහෙම සැලකිල්ලට ගත්තොත් අපට තවත් ආයතන ගණනාවක් තිබෙනවා වෙන් කරන්න. ඒ නිසා අපි හිතන්නේ නැහැ, මූතූර් ප්‍රාදේශීය සභාව වෙන් කරන්න අවශ්‍යයි කියලා. උදාහරණයක් හැටියට ගත්තොත්, කොටිකාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ ජනගහනය 101,687යි. සීතාවක ප්‍රාදේශීය සභාවේ ජනගහනය 113,000යි. හෝමාගම ප්‍රාදේශීය සභාවේ ජනගහනය 216,000යි. වත්තල ප්‍රාදේශීය සභාවේ ජනගහනය 119,000යි. කටාන ප්‍රාදේශීය සභාවේ ජනගහනය 140,000යි. මහර ප්‍රාදේශීය සභාවේ ජනගහනය 176,000යි. මේ ආකාරයට විශාල ජනගහනයක් ඉන්න ප්‍රාදේශීය සභා බලප්‍රදේශ තිබෙනවා. එම නිසා ජනගහනය පමණක් පදනම් කර ගත්තොත් අපට මේ සභාත් තව සභා ගණනාවකට වෙන් කරන්න වෙනවා. එම නිසා මූතූර් ප්‍රාදේශීය සභාව සභා දෙකක් හැටියට ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවක් පැන නඟින්නේ නැහැ.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கடந்த உள்ளூராட்சி மன்றத் தேர்தலுக்குப் பிறகு, அதன் தவிசாளர்களைத் தெரிவு செய்யும்போது பல பிரச்சினை களுக்கு முகங்கொடுக்கவேண்டி ஏற்பட்டது. இன்று

ஜனநாயகத்துக்கான ஓர் இடம் இல்லாததுபோன்று உள்ளூராட்சி மன்றங்கள் காணப்படுகின்ற காரணத்தால், தேர்தலில் வெல்லும் கட்சிகள் அல்லது கூடுதலான வாக்குகளைப் பெறும் கட்சிகள் அந்தச் சபைகளை அமைப்பதற்கான முறைமையொன்று அறிமுகப்படுத்தப் படுமா? அல்லது இப்போதிருக்கின்ற முறைமையில் ஏதாவது மாற்றத்தைக் கொண்டுவந்து, வெற்றி ஈட்டுகின்ற கட்சி சபையை அமைப்பதற்கான ஏதாவது வேலைத்திட்டம் முன்னெடுக்கப்படுமா? அல்லது புதிய தேர்தல் முறைமையொன்றை உங்களுடைய காலத்தில் அறிமுகப் படுத்துவதற்கான வாய்ப்புகள் இருக்கின்றதா? என கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்கின்றேன்.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළේ ඉතාම වැදගත් ප්‍රශ්නයක්. නව පළාත් පාලන මැතිවරණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සියලු පළාත් පාලන ආයතනවල කොට්ඨාස නිර්ණය කිරීමට 2012 දෙසැම්බර් 07වැනි දින පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් ජාතික සීමානිර්ණ කමිටුවක් පත් කර තිබුණා. ජනගහන අනුපාතය, භූගෝලීය ලක්ෂණ සහ කලින් මා සඳහන් කළ නිර්ණායක පදනම් කරගෙන තමයි මේ කමිටුවට ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම පවරලා තිබුණේ. මෙම ක්‍රියාවලියට සහාය වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව, පළාත් පාලන අමාත්‍යාංශය, මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල දිස්ත්‍රික් නියෝජිතයන් ඇතුළුව දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් යුත් දිස්ත්‍රික් කමිටු ද අමාත්‍යවරයා විසින් 2012දී පත් කර තිබුණා. මෙම කමිටුවේ නිර්දේශ 2015.06.19වැනි දින ගරු පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ අතර, ගරු අමාත්‍යතුමා විසින් එම නිර්දේශ ගරු ජනාධිපතිතුමා වෙත යොමු කළා.

ඒ අනුව, පළාත් පාලන ආයතන ආවරණය වන කොට්ඨාස සීමාවන්, කොට්ඨාස සඳහා නම්, හඳුනාගැනීමේ අංක සහ එක් එක් පළාත් පාලන ආයතනයන්ට අදාළ මුළු සභික සංඛ්‍යාව 2015.08.21 දිනැති අංක 1928/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ නිල වශයෙන් ප්‍රකාශයට පත් කරලා තිබුණා. පසුව ඉදිරිපත් වූ අභියාචනා සැලකිල්ලට ගනිමින් පළාත් පාලන ආයතනවල කොට්ඨාස සීමා නිර්ණය පිළිබඳ අභියාචනා විමර්ශන කමිටුව විසින් යෝජනා කරන ලද සංශෝධන 2017.02.17 දිනැති අංක 2006/44 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර තිබුණා.

ගරු කථානායකතුමනි, ඒ නිසා මේ දැනට පවතින ක්‍රමය දීර්ඝ ක්‍රියාවලියක් ඔස්සේ පුළුල් සංවාදයක් මඟින් නිර්මාණය කරපු එකක්. නමුත් ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු ගැටලු අපිත් හඳුනාගෙන තිබෙනවා. ඒ නිසා, මම හිතන විධියට මේ පාර්ලිමේන්තුවට තමයි ඒ වගකීම පැවරෙන්නේ. අපි පාර්ලිමේන්තුව හැටියට ඉදිරියේදී මේ පිළිබඳව සාකච්ඡා කරලා සුදුසු නව ක්‍රමවේදයක් සකස් කර ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා. ඒ සඳහා මැදිහත් වෙන්න රජය සූදානම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 -1716/2025- (2), ගරු ආර්.ජී. විජේරත්න මහතා.

**ගරු ආර්.ජී. විජේරත්න මහතා**
(மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன)
(The Hon. R.G. Wijerathna)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7 -1721/2025- (1), ගරු ඔෂානි උමංගා මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉහළගම, කඩියංගල්ල සහ මානෑව ග්‍රා.නි. වසම්: නිවාස ව්‍යාපෘති

## அநுராதபுர மாவட்டத்தில் இஹலகம, கடியங்கல்ல மற்றும் மானேவ கிராம உத்தியோகத்தர் பிரிவுகள்: வீடமைப்புக் கருத்திட்டங்கள்

## IHALAGAMA, KADIYANGALLA AND MANEWA GN DIVISIONS IN ANURADHAPURA DISTRICT: HOUSING PROJECTS

1783/2025

**8. ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම සහ කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල, 621-ඉහළගම, 510-කඩියංගල්ල සහ 502-මානෑව ග්‍රාම නිලධාරි වසම් තුළ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ නිවාස ව්‍යාපෘති තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම නිවාස ව්‍යාපෘතිවල නම් සහ ක්‍රියාත්මක කළ දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම නිවාස ව්‍යාපෘති 03හි ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ප්‍රතිලාභීන්ට ප්‍රතිපාදන ලබා දෙන ලද්දේ ආධාරයක් ලෙසද, ණය මුදලක් ලෙසද;

(v) එම ප්‍රතිලාභීන් සඳහා ලබා දුන් මුදල, නිවාස තනා නිම කර ඇති සංඛ්‍යාව සහ මේ වනවිට එම නිවාසවල පදිංචිවී සිටින සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ප්‍රතිලාභීන් තෝරාගත් ආදායම් පදනම කවරේද;

[ගරු තිළිණ සමරකෝන් මහතා]

(vii) එම ප්‍රතිලාභීන් තෝරාගත් අවස්ථාවේදී ඔවුන්ගේ ආදායම් තත්ත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுர மாவட்டத்தின் இபலோகம மற்றும் கெக்கிராவ பிரதேச செயலாளர் பிரிவுகளில், 621 -இஹலகம, 510-கடியங்கல்ல மற்றும் 502-மானேவ கிராம உத்தியோகத்தர் பிரிவுகளிலுள்ள தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையால் நடைமுறைப்படுத்தப்பட்ட வீடமைப்புக் கருத்திட்டங்களைப் பற்றி அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி வீடமைப்புக் கருத்திட்டங்களின் பெயர்கள் மற்றும் அவை நடைமுறைப்படுத்தப்பட்ட திகதிகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி 03 வீடமைப்புக் கருத்திட்டங்களினதும் பயனாளிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி பயனாளிகளுக்கான நிதி ஒதுக்கீடுகள் உதவித் தொகையாக வழங்கப்பட்டனவா அல்லது கடன் தொகையாக வழங்கப்பட்டனவா என்பதையும்;

(v) மேற்படி பயனாளிகளுக்கு வழங்கப்பட்ட தொகை, நிர்மாணிக்கப்பட்ட வீடுகளின் எண்ணிக்கை மற்றும் தற்போது மேற்படி வீடுகளில் வசிப்பவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(vi) பயனாளிகளைத் தெரிவு செய்வதற்காகப் பயன்படுத்தப்பட்ட வருமான அடிப்படை யாது என்பதையும்;

(vii) மேற்படி பயனாளிகள் தெரிவு செய்யப்பட்ட சந்தர்ப்பத்திலிருந்த அவர்களின் வருமான நிலைமை வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House -

(i) whether he is aware that there are housing projects implemented by the National Housing Development Authority in the 621 - Ihalagama, 510 - Kadiyangalla and 502 - Manewa Grama Niladhari Divisions of the Ipalogama and the Kekirawa Divisional Secretaries' Divisions in the Anuradhapura District;

(ii) if so, the names of the said housing projects along with the dates of implementation of those projects, separately;

(iii) the total number of beneficiaries of those three housing projects;

(iv) whether the funds provided to those beneficiaries were provided as an aid or as a loan;

(v) separately, the total amount provided to those beneficiaries, the number of houses that have been completed and the number of people currently residing in those houses;

(vi) the income status that were used as the basis for selecting the beneficiaries; and

(vii) separately, the income status of each of those beneficiaries at the time of selecting them?

(b) If not, why?

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්. නිවාස ව්‍යාපෘති 04ක් ඇත.

(ii) 1. ඉපලෝගම (510) - කඩියන්ගල්ල (2016 වර්ෂය)

2. ඉපලෝගම (502 මානෑව) - ස්වස්තිගම (2016 වර්ෂය)

3. කැකිරාව (621 ඉහළගම) - හිරුකිරණගම (2016 වර්ෂය)

4. කැකිරාව (621 ඉහළගම) - දිවිදිනුගම (2016 වර්ෂය)

(iii) ප්‍රතිලාභීන් ගණන:

| | |
|---|---|
| ඉපලෝගම - කඩියන්ගල්ල නිවාස | 15 |
| ඉපලෝගම - ස්වස්තිගම නිවාස | 25 |
| කැකිරාව - හිරුකිරණගම නිවාස | 25 |
| කැකිරාව - දිවිදිනුගම නිවාස | 25 |

(iv) ණය මුදලක් ලෙස මෙම නිවාස ඉදි කර ඇත.

(v) 1. ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි කඩියන්ගල්ල නිවාස ව්‍යාපෘතිය සඳහා,

අනුමත කළ මුදල - රුපියල් මිලියන 06

නිමකර ඇති නිවාස සංඛ්‍යාව - 15

දැනට පදිංචි නිවාස සංඛ්‍යාව - 05

2. ඉපලෝගමප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි ස්වස්තිගම නිවාස ව්‍යාපෘතිය සඳහා,

අනුමත කළ මුදල - රුපියල් මි. 10

නිමකර ඇති නිවාස සංඛ්‍යාව - 25

දැනට පදිංචි නිවාස සංඛ්‍යාව - 23

3. කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි හිරුකිරණගම නිවාස ව්‍යාපෘතිය සඳහා,

අනුමත කළ මුදල - රුපියල් මි. 10

නිමකර ඇති නිවාස සංඛ්‍යාව - 25

දැනට පදිංචි නිවාස සංඛ්‍යාව - 19

4. කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි දිවිදිනුගම නිවාස ව්‍යාපෘතිය සඳහා,

අනුමත කළ මුදල - රුපියල් මි. 10

නිමකර ඇති නිවාස සංඛ්‍යාව - 25

දැනට පදිංචි නිවාස සංඛ්‍යාව - 18

(vi) ඉපලෝගම (කඩියන්ගල්ල) - අඩු ආදායම්ලාභී නිවාස

ඉපලෝගම (ස්වස්තිගම) - අඩු ආදායම්ලාභී නිවාස

කැකිරාව (දිවිදිනුගම) - අඩු ආදායම්ලාභී නිවාස

කැකිරාව (හිරුකිරණගම) - මධ්‍යම පාන්තික නිවාස

(vii) ග්‍රාම නිලධාරි මඟින් ලබාගත් අඩු ආදායම්ලාභී සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කිරීමෙන් අනතුරුව වාරික මුදල් ගෙවීමට හැකි බවට ණයලාභීන්ගෙන් දිවුරුම් සහතික වෙන් වෙන් වශයෙන් ලබාගෙන ඇත.

මධ්‍යම පාන්තික ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී මසකට රුපියල් 75,000කට අඩු වේතනයක් ලබන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු තැනැත්තන් තෝරාගෙන ඇති අතර, එයින් බොහෝ දෙනෙකු රාජ්‍ය සේවකයින් වේ. ඔවුන්ගේ වැටුප් වාර්තා වෙන් වෙන් වශයෙන් ලබාගෙන ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාට යොමු කරන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

දැන් ඔබතුමා ඉදිරිපත් කරපු ඉලක්කම් අනුව බලනකොටත්, ඊට අමතරව එම නිවාස සංකීර්ණ සහ එම නිවාස ව්‍යාපෘති ගැන ප්‍රායෝගිකව තොරතුරු සොයා බලනකොටත්, නිසි කළමනාකාරිත්වයකින් තොරව තමයි ඒවා ඉදිවෙලා තිබෙන්නේ කියන එක පෙනෙනවා. ඒ වාගේම හොඳට බැලුවාම තේරෙනවා, දේශපාලන හිතවතුන්ට සහ යම් ආර්ථික හැකියාවක් තිබෙන පිරිසකට තමයි ගොඩක් නිවාස ලබා දීලා තිබෙන්නේ කියන එක. සමහර නිවාස මේ වන විට විකුණා තිබෙනවා. ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා හෝ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා මේ නිවාස විකුණන්න යම් අවසරයක් ලබා දී තිබේද?

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

ගරු මන්ත්‍රීතුමනි, සමහර ස්ථානවලට අනුව නම් ඔබතුමා අසන ප්‍රශ්නයේ සත්‍යයක් තිබෙනවා. ඒ කාලයේ දේශපාලන හිතවත්කම් මත තෝරාගත් අයටත් නිවාස ලබා දී තිබෙනවා. සමහර නිවාස විකුණා තිබෙනවා. නමුත්, එවැනි අවසරයක් ලබා දී නැහැ.

2015 සිට 2019 දක්වා නිවාස ලබා දීමේදී සිදු වූ අක්‍රමිකතා, දූෂණ සහ වංචා සෙවීම පිළිබඳව අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කරලා තිබෙනවා. එම වාර්තාව ලැබුණාට පසුව මේ පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ලබා දෙන්න පුළුවන්.

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඉදිරිපත් කරපු සංඛ්‍යාලේඛනය තුළ ඇතුළත් වුණා, නිවාස 15ක් ඉදිකරපු නිවාස ව්‍යාපෘතියක් තුළ දැනට මිනිස්සු පදිංචි නිවාස 5යි තිබෙන්නේ කියලා. ඒ වාගේම නිවාස 25ක් ඉදිකරපු නිවාස ව්‍යාපෘතියක මිනිස්සු පදිංචි නිවාස 23ක් තිබෙනවා කිව්වාට, ප්‍රායෝගිකව නිවාස 10ක පමණයි මිනිස්සු පදිංචිව සිටින්නේ. යම්කිසි තෝරාගැනීමේ පදනමක් භාවිත කරන්නේ නැතිව, ඒ වාගේම නිසි අවසරයක් නොමැතිව තමයි මේ නිවාස ඉදිකරලා තිබෙන්නේ. විශේෂයෙන්ම අලි ගමන් කරන කොරිඩෝව වාගේ තැන්වල තමයි මේ ඉදිකිරීම් කරලා තිබෙන්නේ. ඒ වාගේම තවම ඉදිකිරීම් සම්පූර්ණ කර නැති ව්‍යාපෘතිත් මේ අතර තිබෙනවා. ඉඩමක් නැති, නිවාසයක් නැති අඩු ආදායම්ලාභී මිනිස්සු අපි ළඟට නිතරම එනවා. එම නිසා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා හෝ ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා යම්කිසි කාලවකවානුවක් ඇතුළත ඉක්මන් වැඩ පිළිවෙළක් තුළින් මේ නිවාස හදලා, නිවාස නොමැති ජනතාවට ඒවා ලබා දෙන්න කටයුතු කරන්න පුළුවන්ද?

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

ගරු කථානායකතුමනි, මේවා ණය ලබා දීලා හදපු නිවාස නිසා නැවත ඒ නිවාස ලබා ගැනීමේදී නීතිමය ගැටලු ප්‍රමාණයක් පැන නඟිනවා. ඒ නීතිමය ගැටලු විසඳා ගත්තොත්, පදිංචිවෙලා නැති නිවාස නැවත භාරගන්න පුළුවන්. නමුත් ඔවුන් වියදම් කරපු වියදම පියවන්න ඕනෑ. ඒ නිසා එතැන නීතිමය ගැටලුවක් තිබෙනවා. ඒ නීතිමය ගැටලුව අවසන් කර ගත්තාට පස්සේ පදිංචි නැති නිවාස නැවත ලබාගෙන, ඇත්තටම නිවාස වුවමනාව තිබෙන අයට එම නිවාස ලබා දෙන්න අපට පුළුවන්. ඒ වාගේම මේ මොහොතේ අමාත්‍යාංශය හරහා අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් නිවාස 10,000කට වැඩි ප්‍රමාණයක් ඉදිකරමින් සිටිනවා. ඒ වාගේම ඉදිරියේදී මධ්‍යම පාන්තික සහ අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් රජය විසින් නිවාස සංකීර්ණ ස්ථාපිත කරනවා. ඒ අනුව ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන අයට නිවාස ලබා දීමට හැකියාව තිබෙනවා.

## මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව: වාහන ලියාපදිංචි කිරීම

மோட்டார் போக்குவரத்துத் திணைக்களம்: வாகனங்களின் பதிவு

DEPARTMENT OF MOTOR TRAFFIC: REGISTRATION OF VEHICLES

1822/2026

**9. ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලද වර්ෂය කවරේද;

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා]

(ii) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමට පෙර, මෝටර් රථයක් ලියාපදිංචි කිරීමේ වගකීම භාරව සිටි ආයතනය කවරේද;

(iii) ශ්‍රී ලංකාව තුළ පළමුවැනි වරට මෝටර් රථයක් ලියාපදිංචි කරන ලද වර්ෂය කවරේද;

(iv) එම වර්ෂයේ සිට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන තෙක් ලියාපදිංචි කළ වාහන සංඛ්‍යාව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2025 දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කර ඇති මෝටර් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෝටර් රථ සඳහා වායු විමෝචන දූම සහතික නිකුත් කිරීම තුළින් රජය වාර්ෂිකව ආදායමක් උපයන්නේද;

(iii) එසේ නම්, 2025 වර්ෂයේදී උපයන ලද ආදායම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மோட்டார் போக்குவரத்துத் திணைக்களம் தாபிக்கப்பட்ட வருடம் யாது என்பதையும்;

(ii) மோட்டார் போக்குவரத்துத் திணைக்களம் தாபிக்கப்படுவதற்கு முன்னர், மோட்டார் வண்டியொன்றைப் பதிவுசெய்யும் பொறுப்புடைய நிறுவனமாகச் செயலாற்றிய நிறுவனம் யாது என்பதையும்;

(iii) இலங்கையில் முதன்முதலாக மோட்டார் வாகனமொன்று பதிவு செய்யப்பட்ட வருடம் யாது என்பதையும்;

(iv) மேற்படி வருடத்திலிருந்து மோட்டார் போக்குவரத்துத் திணைக்களம் தாபிக்கப்படும் வரை பதிவு செய்யப்பட்ட வாகனங்களின் எண்ணிக்கை ஆண்டுவாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) 2025ஆம் ஆண்டு டிசம்பர் 31ஆம் திகதியாகின்றபோது, இலங்கையில் பதிவு செய்யப்பட்டுள்ள மோட்டார் வாகனங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மோட்டார் வாகனங்களுக்குப் புகை உமிழ்வுச் சான்றிதழ் வழங்கும் நடவடிக்கைமூலம் அரசாங்கம் ஏதேனும் வருமானத்தை வருடாந்தம் ஈட்டுகின்றதா என்பதையும்;

(iii) ஆமெனில், 2025ஆம் ஆண்டில் ஈட்டிய வருமானம் எவ்வளவு என்பதையும்;

அவர் மேலும் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House the -

(i) year in which the Department of Motor Traffic was established;

(ii) institution that was responsible for registering motor vehicles prior to the establishment of the Department of Motor Traffic;

(iii) year in which a motor vehicle was registered for the first time in Sri Lanka; and,

(iv) number of motor vehicles registered each year from that first registration until the establishment of the Department of Motor Traffic, separately?

(b) Will he also inform this House -

(i) the number of motor vehicles registered in Sri Lanka as at 31st December, 2025, separately;

(ii) whether the Government earns annual revenue from issuing vehicle emission certificates for motor vehicles; and

(iii) if so, the revenue earned for the year 2025?

(c) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 1928.

(ii) 1916 අංක 14 දරන පනත මඟින් පොලිස්පතිවරයා යටතේ වාහන ලියාපදිංචි කිරීම හා රියැදුරු බලපත් නිකුත් කිරීම ආරම්භ කර ඇත.

(iii) 1902.

(iv) තොරතුරු සොයාගත නොහැක.

ගරු මන්ත්‍රීතුමා අහන්නේ, 1902 වර්ෂයේ සිට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන තෙක් ලියාපදිංචි කළ වාහන සංඛ්‍යාව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද කියලා. ගරු මන්ත්‍රීතුමනි, එම තොරතුරු සොයා ගන්න නැහැ.

(ආ) (i)

| වාහන ගහනය - **Vehicle Population** | |
|---|---|
| වාහන පන්තිය - **Class of Vehicle** | ලියාපදිංචි කර ඇති මෝටර් රථ සංඛ්‍යාව |
| මෝටර් කාර් - Motor cars | 973,376 |
| මෝටර් ට්‍රයිසිකල් - Motor | 1,201,842 |
| මෝටර් සයිකල් - Motorcycles | 5,177,085 |
| බස් - Buses | 116,195 |
| ද්විත්ව කාර්යය වාහන - Dual-purpose vehicles | 458,632 |
| මෝටර් ලොරි - Motor lorries | 353,214 |
| ප්‍රයිම් මූවර් - Prime movers | 7,921 |
| මෝටර් ලොරි ට්‍රේලර් - Lorry | 10,400 |
| විශේෂ කාර්යය වාහන - Special-purpose vehicles | 15,546 |

| වාහන ගහනය - Vehicle Population | |
|---|---|
| වාහන පන්තිය - Class of Vehicle | ලියාපදිංචි කර ඇති මෝටර් රථ සංඛ්‍යාව |
| ගිලන් රථ - Ambulances | 3,687 |
| අවමඟුල් රථ - Hearses | 493 |
| ඉඩම් වාහන - Land vehicles | 407,306 |
| කෘෂිකාර්මික නොවන ට්‍රැක්ටර් - N.A. Tractors | 958 |
| ට්‍රේලර් හා බවුසර් - Trailers & bowsers | 87,464 |
| කොඩ්‍රිසයිකල් - Quadricycles | 2,444 |
| මෝටර් නිවස - Motor homes | 6 |
| වෙනත් විශේෂ කාර්යය වාහන - Other Special-purpose vehicles | 44 |
| **Total** | **8,816,613** |

(ii) දුම් පරීක්ෂණ ක්‍රියාවලිය රජයට ආදායම් ඉපැයීමේ ප්‍රභවයක් නොවන අතර, එය හුදෙක් නෛතික අවශ්‍යතා හා පිරිසිදු වාතය ආඝ්‍රාණයට පවතින මූලික අයිතිය ආරක්ෂා කිරීමට රජයේ ඇති වගවීමේ ක්‍රියාවලියකි.

දුම් පරීක්ෂණ ක්‍රියාවලිය සඳහා රජයේ කිසිදු මූල්‍ය දායකත්වයක් ලබා නොදෙන අතර, දුම් පරීක්ෂණ ක්‍රියාවලිය හරහා ජනනය වන ඉපැයීමෙන් කොන්ත්‍රාත්කරුගේ ආදායමෙන් සියයට 10කට සමාන මුදලක් වායු විමෝචන භාරයක් වශයෙන් අරමුදලකට රැස් කරනු ලැබේ.

(iii) 2025 වර්ෂය තුළ ක්ලීන්කෝ ලංකා සමාගම රුපියල් මිලියන 179ක් හා ලාෆ්ස් එකෝ ශ්‍රී සමාගම රුපියල් මිලියන 210ක් ලෙස රුපියල් මිලියන 389ක මුදලක් වායු විමෝචන භාරකාර අරමුදල වෙත ලබා දී ඇත.

තවද, 2025 වර්ෂයේදී ක්ලීන්කෝ ලංකා සමාගම හා ලාෆ්ස් එකෝ ශ්‍රී සමාගම විසින් VAT ලෙස රුපියල් මිලියන 792ක්ද, සමාජ ආරක්ෂණ බද්ද ලෙස රුපියල් මිලියන 110ක්ද වශයෙන් රුපියල් මිලියන 902ක් භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

පිළිතුර ලබා දීම පිළිබඳව ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, පළමුවෙනි අතුරු ප්‍රශ්නය විධියට මම ගරු අමාත්‍යතුමාට කාලීන ප්‍රශ්නයක් යොමු කරන්න කැමැතියි.

අපි හැමෝම දන්නවා, මැද පෙරදිග කලාපයේ ඇති වෙලා තිබෙන යුද්ධමය තත්ත්වය මත මුළු ලෝකයම බලශක්ති අර්බුදයකට මුහුණ දීලා ඉන්න බව. විශේෂයෙන්ම ඉන්ධන භාවිත කිරීමේදී යම් යම් සීමාවන්ට ලක් කරන්න රටවල් කටයුතු කරමින් සිටිනවා. ඒ අනුව අපේ රටේත් QR කේත අංකය හඳුන්වා දීලා, ඉන්ධන ලබා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර තිබෙනවා. නමුත්, මේ වන විට අපට දැනගන්න ලැබී තිබෙනවා, විශේෂයෙන්ම වාහන අළෙවි කළාට පස්සේ ඒ අළෙවි කරපු වාහනවල කලින් හිමිකරුවන් QR කේත අංක මකා නොදැමීම මතත්, ඒ වාගේම ජංගම දුරකථන අංක වෙනස් වීම මතත් විශාල පිරිසක් අපහසුතාවන්ට පත් වෙලා ඉන්නවා කියලා, QR කේත අංක ක්‍රමයට ඉන්ධන ලබා ගැනීමේදී. විශේෂයෙන්ම අද උදෑසන මට එක්තරා මහත්මයෙකු කථා කරලා කිව්වා, QR කේත අංකය නොමැතිව වාහනයට ඉන්ධන ලබා දීමට වැඩිපුර මුදලක් - රුපියල් 3,000ක් - ඉල්ලනවා කියලා තිඹිරිගස්යායේ එක්තරා ඉන්ධන පිරවුම්හලකින්.

පළමුවෙනි අතුරු ප්‍රශ්නය විධියට මම ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් අහන්න කැමැතියි, තවමත් විසඳී නොමැති QR කේත අංකය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය වශයෙන් ඔබතුමන්ලාගේ මැදිහත්වීම කොහොමද, ඒකට විසඳුමක් කොයි ආකාරයෙන්ද ලබා දෙන්නේ කියලා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය ඇසීම පිළිබඳව එතුමාට මම ස්තුතිවන්ත වනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව ඒ අනුව මට අවස්ථාවක් ලැබෙනවා, මේ සම්බන්ධව පැහැදිලි කරන්න. අපි දන්නවා, දැනට තෙල් වැඩිපුර භාවිත කිරීම සීමා කරන්නත්, ඒ වාගේම තෙල් අනවශ්‍ය ආකාරයකින් ගොඩ ගසා ගැනීම වළක්වා ගැනීමටත්, ඒ වාගේම අත්‍යවශ්‍ය සේවා සඳහා ඉදිරි මාස ගණනකට තෙල් ඉතිරි කර ගැනීම අරමුණු කරගෙනත් QR Code එක හඳුන්වා දී තිබෙන බව. එහෙම කළේ දැනට තිබෙන තෙල් හිඟයක් නිසා නොවෙයි. නමුත්, අපි ප්‍රක්ෂේපණය කළාම ඉදිරි කාලයේදී ඇති විය හැකි තත්ත්වයකට අනුවයි එහෙම කළේ.

ගරු කථානායකතුමනි, ඒ අනුව QR code එක හඳුන්වා දී තිබෙනවා. QR code එක ලබා ගැනීමේදී මේ සිද්ධියට බලපාන වර්ග - categories - 4ක් තිබෙනවා. එකක් තමයි, පරණ වාහනයක් තිබෙනවා, පරණ දුරකථන අංකයක් තිබෙනවා. ඒ අයට කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒ අයට QR code එක ලබා ගන්න පුළුවන්; ඒ අය ලබාගෙනත් තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ වාගේම පරණ වාහනය තිබෙනවා, හැබැයි, දුරකථන අංකය අලුත්. ඒ අයට ගැටලුවක් තිබෙනවා. ඊළඟ එක තමයි, දුරකථන අංකය පරණයි, අලුත් වාහනයක් අරගෙන තිබෙනවා.

ඒ අයටත් ප්‍රශ්නයක් තිබෙනවා. අනෙක් කාණ්ඩය තමයි, වාහනයත් අලුත්, දුරකථන අංකයත් අලුත් අය. ඒ අයට කිසිම ප්‍රශ්නයක් නැහැ. දැනට මෙන්න මේ වර්ග හතරේ අය තමයි ඉන්නේ. ඒ හතරෙන් වැඩිම කාණ්ඩය තමයි, පරණ වාහනය සහ පරණ දුරකථන අංකය තිබෙන අය. ඒ අයට QR codes ලබා ගැනීමේ ගැටලුවක් නැහැ. දැනටමත් විශාල පිරිසක් එය ලබාගෙන තිබෙනවා. මම ඉලක්කම් ටික කියන්නම්. අලුත් වාහන සහ අලුත් දුරකථන අංක තිබෙන අයටත් ප්‍රශ්නයක් නැහැ. නමුත්, අර කාණ්ඩ දෙකට ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපේ රටේ වාහන ලක්ෂ 88ක් ලියාපදිංචි වෙලා තිබුණාට, ලංකාවේ වාහනයක් ලියාපදිංචි වුණාට පස්සේ අවුරුදු 50ක්, 60ක්, 70ක් ගියත් එය ලැයිස්තුවෙන් ඉවත් වන ක්‍රමයක් නැහැ. මම ඉලක්කම් වශයෙන් කිව්වොත්, වාහන ලක්ෂ 88ක් තිබුණාට 2023දී QR codesවලට ලියාපදිංචි වෙලා තිබෙන්නේ වාහන ලක්ෂ 70ක් වාගේ සංඛ්‍යාවක්. අපි හිතනවා, මේ වනකොට ඒකේ උපරිමය ලක්ෂ 72ක් වෙන්න පුළුවන් කියලා.

[ගරු බිමල් රත්නායක මහතා]

ගරු කථානායකතුමනි, මේ වනකොට ලක්ෂ 55කට වැඩි පිරිසක් QR පද්ධතියේ ලියාපදිංචි වෙලා තිබෙනවා. මාර්තු 15වෙනි දා අලුතෙන් ලියාපදිංචි වෙලා තිබෙනවා, 42,899ක්. මාර්තු 16වෙනි දා - අපි දැන් මේක enhance කරගෙන යන නිසා - 337,068ක්, මාර්තු 17වෙනි දා නව ලියාපදිංචි කිරීම් 395,349ක්, මාර්තු 18වෙනි දා 301,463ක්, මාර්තු 18 සිට අද දක්වා - අද 19 - අලුතෙන් ලියාපදිංචි වෙලා තිබෙනවා, 77,806ක්. අද පෙර වරු 8.30-9.30 අතරත් 100,000කට ආසන්න ප්‍රමාණයක් ලියාපදිංචි වෙලා තිබෙනවා. අන්න අර කාණ්ඩ දෙකේ අය තමයි ගැටලුවට මුහුණ දුන්නේ, ගරු කථානායකතුමනි. එනම්, පරණ වාහනය, අලුත් දුරකථන අංකය තිබෙන අය සහ පරණ දුරකථන අංකය, අලුත් වාහනය තිබෙන අය. ඒ අයට තිබුණු ප්‍රශ්නය තමයි, ඒ අයගේ QR code එක download කර ගන්න බැරි වීම, ඒ අංක වෙනස් නිසා.

මේ සම්බන්ධ දත්ත පද්ධතියක් ලංකාව සතුව නැහැ. ඒ නිසා සිද්ධ වුණු දේ තමයි, පරණ වාහනය, අලුත් දුරකථන අංකය තිබෙන අය සහ පරණ දුරකථන අංකය, අලුත් වාහනය තිබෙන අය කියන categoriesවලට අයිති ඒවායෙන් මිලියන 2.7ක් අපට එකින් එකට QR codes delete කරන්න වුණා. ඒකට සැලකිය යුතු කාලයක් - දවස් එකහමාරක විතර කාලයක් - ගත වුණා. අපි දැන් එවැනි දත්ත ලක්ෂ 27ක් delete කරලා තිබෙනවා. දැන් ඒ අයටත් ප්‍රශ්නයක් නැහැ. ගරු කථානායකතුමනි, අපි කල්පනා කළා, ඊට වඩා හොඳ ක්‍රමයක් හදන්න. අපි ඊයේ ඒ කටයුත්ත සම්පූර්ණයෙන් ඉවර කළා. දැන් test run එකක් කරලා, අද උදේ 11.00ට ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයෙන් ඒ පිළිබඳව ජනතාවට පැහැදිලි කරනවා. මම ඒකේ ක්‍රමවේදය කියන්නම්.

එවැනි ක්‍රමවේදයක් ගෙනාවේ, ආයතනයකින් මේ කණ්ඩායම් දෙකේ QR codes delete කරන්න ගියොත් විශාල කාලයක් ගතවන නිසායි. ඒ නිසා අපි දැන් හදලා තිබෙන ක්‍රමය තමයි, පරණ වාහනයක් තිබෙන කෙනෙකුට අලුත් දුරකථන අංකයක් නම් තිබෙන්නේ, ඔහුට fuelpass.gov.lk කියන නිවැරදි website එකට ගිහිල්ලා register වෙන්න පුළුවන්. එහෙම register වනකොට ඔහුට කියනවා, ඔබේ දුරකථන අංකය වෙනස් කියලා. එතකොට ඔහුට පුළුවන්, ඔහුගේ වාහන අංකය නැවත එතැන යොදලා පරණ එක delete කරන්න. පරණ එක delete කළාට පස්සේ, ඔහුට අලුත් QR code එක ගන්න අවස්ථාව ලැබෙනවා. හැබැයි, එතැනදී ඔහු වගකීමක් ගන්න ඕනෑ. ඒ අවලංගු කිරීමේදී වංචනිකව එය අවලංගු කරන්න බැහැ, වංචනිකව අවලංගු කළොත් ඔහු පරිගණක අපරාධවලට ලක් වනවා. ඒ නිසා සරලව ගත්තොත්, ඒ ගැටලුව අදාළ ප්‍රශ්නය තිබෙන කෙනාටම විසඳාගන්න පුළුවන්.

ඊළඟට අනෙක් කණ්ඩායම තමයි, පරණ දුරකථන අංකයයි, අලුත් වාහනයයි තිබෙන අය. ඒ අයටත් පරණ දුරකථන අංකයෙන් log වෙන්න පුළුවන්. ඒ විධියට log වෙලා ඔහුට පුළුවන්, අලුත් වාහන අංකය ඇතුළත් කරන්න. ඊට කලින් ඒ දුරකථන අංකයෙන් වෙන වාහනයක් ලියාපදිංචි වෙලා තිබෙනවා නම්, ඒක ඔහුටම delete කරන්න පුළුවන්. Delete කරලා, අලුත් එක download කරන්න පුළුවන්. ඒ නිසා මේ තත්ත්වය මත අපි හිතනවා, අද දවස ඇතුළතදී මේ කණ්ඩායම් දෙකේ ඉන්න ජනතාව පත් වෙලා තිබෙන අපහසුතාව විසඳාගන්න පුළුවන් වෙයි කියලා.

ඒ වාගේම මම මේ කාරණයත් කියන්න ඕනෑ. බලශක්ති අමාත්‍යාංශය සතුව තමයි මේ සම්බන්ධ සම්පූර්ණ දත්ත තිබෙන්නේ. අපට වාර්තා කරලා තිබෙනවා, සාමාන්‍ය ඉන්ධන භාවිතය වාගේ දෙගුණයක් ඉන්ධන භාවිත කරන සමහර දිස්ත්‍රික්ක තිබෙනවා කියලා. සමහර පෙට්‍රල් ෂෙඩ් සාමාන්‍ය අලෙවිය වාගේ දෙගුණයක් අලෙවි කරලා තිබෙනවා. එච්චර පහසුකම් නැහැ, පෙට්‍රල් ෂෙඩ්වලට ඉන්ධන ගබඩා කරන්නත්. තෙල් බවුසර්වලට එච්චර පහසුකම් නැහැ, තෙල් ගෙනිහින් දෙන්නත්. ඒ නිසා අපි ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ, කරුණාකරලා තමන් විසින්ම තමන් පීඩාවට පත් කරගන්න එපා කියලායි. මම හිතනවා, දැන් මේ QR code එක ආවාට පස්සේ මේ ප්‍රශ්නය හෙට උදේ ඉඳලා සම්පූර්ණයෙන් විසඳෙයි කියලා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම කියන්න ඕනෑ, අපි ඔත්තේ, ඉරට්ටේ ක්‍රමය හඳුන්වා දුන්නේත් මේ අනවශ්‍ය පීඩනය නිසා බව. එහෙම නැත්නම් ඇත්තටම QR code එකෙන් මේක manage කරන්න පුළුවන්. ඔත්තේ, ඉරට්ටේ ක්‍රමය අනුගමනය කරද්දී කලින් කාලවලදී සිදු වෙච්ච ටෙන්ඩර් මගඩි නිසා number plates නිකුත් නොකරපු වාහන ප්‍රමාණයක් තිබෙනවා. අපි මාර්තු 10වැනි දා ගිවිසුම අත්සන් කළත්, ඒ ගිවිසුමට අනුව ඒ සමාගම number plates මුද්‍රණය කරද්දී මැයි මාසයේ මුල් සතිය වාගේ වනවා. ඒ නිසා number plate එක නැති අයට තෙල් ගහගන්න කිසි ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. ඔවුන් සතුව තිබෙනවා, වාහනයේ ආදායම් බලපත්‍රය, දුම් සහතිකය, වාහනයේ පොත සහ insurance එක. ගරු කථානායකතුමනි, ඒ හතරේම වාහනයේ අංකය තිබෙනවා. ඉතින්, මේ හතරම අරගෙන යන්න ඕනෑ නැහැ. මෙයින් එකක් කොහොමත් වාහනයේ තිබෙනවා. ඒක පෙන්වූවාම තෙල් ගහගන්න පුළුවන්. මේ වාගේ දේවල් පටන් ගන්නා විට ගරු මන්ත්‍රීතුමා කියපු ආකාරයේ යම් යම් වංචනික දේවල් වෙන්න පුළුවන්.

නමුත්, අපි මේ වෙලාවේදී උපරිම වශයෙන් කල්පනා කරන්නේ ඇත්තටම ජනතාවගේ මේ අවශ්‍යතාව සම්පූර්ණ කරන්නයි. හෙටින් විතර පසුව මේ තත්ත්වය සාමාන්‍ය තත්ත්වයට පත් වුණාම එවැනි වංචනික ක්‍රියා කරන අය සම්බන්ධව අදාළ අමාත්‍යාංශ කටයුතු කරයි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ගරු අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වනවා, පිළිතුර ලබා දීම සම්බන්ධයෙන්. ගරු කථානායකතුමනි, ගරු අමාත්‍යතුමා ඉදිරිපත් කළ වාහන පිළිබඳ විස්තර දැක්වෙන ලේඛනයට අනුව දැනට ශ්‍රී ලංකාව තුළ වාහන ලක්ෂ 88ක් වාගේ ප්‍රමාණයක් ලියාපදිංචි වෙලා තිබෙනවා. එයින් වැඩි ප්‍රමාණයක් තිබෙන්නේ මෝටර්සයිකල්. ඒ අනුව අපේ රටේ මෝටර්සයිකල් 5,212,573ක් පමණ ලියාපදිංචි වෙලා තිබෙනවා. මේ වාහනවලට වාර්ෂික ආදායම් බලපත්‍ර නිකුත් කිරීම හරහා රජයට විශාල ආදායමක් උපයා ගන්න හැකියාව තිබෙනවා. ගරු කථානායකතුමනි, මට බොහෝ පිරිසක් කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා, කොවිඩ්-19 වසංගතය පැවති කාල සීමාව තුළදී මෝටර්සයිකල් විශාල ප්‍රමාණයකට වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා ගන්න එක මහ හැරිලා තිබෙනවාය කියලා. ඊට පෙරත් ඒ වාගේම මෝටර්සයිකල් විශාල ප්‍රමාණයක් වෙනුවෙන් වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා ගැනීම මහ හැරිලා තිබෙනවා. මේ වනකොට විශාල දඩ මුදලක් ගෙවන්න සිදු වන නිසා දිගින් දිගටම ඒ මෝටර්සයිකල් හිමිකරුවන් ඒවාට ආදායම් බලපත්‍ර ලබා ගන්නේ නැතුව පාවිච්චි කරනවා. එම නිසා ඒ හිමිකරුවන්ගෙන් ඉල්ලීමක් තිබෙනවා. දිරිගැන්වීමක් වශයෙන් ඒ දඩ මුදල් අය කර ගන්නේ නැතුව නැවත ආදායම් බලපත්‍ර ලබා ගන්නට ඔවුන්ට අවස්ථාවක් ලබා දුන්නොත් අපේ ආදායම වැඩි කර ගැනීමට හැකියාවක් ලැබෙනවා. ගරු අමාත්‍යතුමාගෙන් මම දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්න කැමතියි, පසුගිය කාල සීමාව තුළ මෝටර්සයිකල් සහ ඉඩම් වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා නොගත් අයට ඒ දඩ මුදල ගෙවන්නේ නැතුව ආදායම් බලපත්‍ර ලබා ගැනීම සඳහා අවස්ථාවක් ලබා දීමට හැකියාවක් තිබෙනවාද, එවැනි වැඩ පිළිවෙළක් සකස් කරන්න පුළුවන්ද කියලා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එය සහමුලින්ම මුදල් අමාත්‍යාංශයට පැවරී තිබෙන වගකීමක්. නමුත් එය සිදු කළ නොහැකියි සහ එය සිදු නොකළ යුතුයි. මොකද, ඔය හැම දුෂ්කරතාවක් යටතේම බදු ගෙවපු මිනිස්සු විශාල ප්‍රමාණයක් ඉන්නවා. අනෙක, ඒ මුදල විශාල මුදලකුත් නොවෙයි. ඒ වාගේම යුද්මය තත්ත්වයක් තිබුණු පළාතක් නම් අපට ඒ ගැන සලකන්න පුළුවන්කම තිබුණා, අතීතයේ වාගේ. අපි දැන් බදු එකතු කරනවා වාගේම ජනතාවට සාධාරණව බදු මුදල් නැවත ලබා දෙනවා. ඒ නිසා මන්ත්‍රීතුමනි, එවැනි සහනයක් ලබා දීම මම ප්‍රවාහන අමාත්‍යවරයා වශයෙන් නම් අනුමත කරන්නේ නැහැ.

## මොනරාගල දිස්ත්‍රික්කයේ පාසල්: ශ්‍රවණාගාර
## மொனராகலை மாவட்டத்திலுள்ள பாடசாலைகள்: கேட்போர் கூடங்கள்
## SCHOOLS IN MONARAGALA DISTRICT: AUDITORIUMS

1860/2026

**10. ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, ජාතික පාසල් සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පාසල්වල ස්ථාපිත කර ඇති ශ්‍රවණාගාර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) බුත්තල දුටුගැමුණු මධ්‍ය මහා විද්‍යාලයේ ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් ආරම්භ කළ දිනය කවරේද;

(ii) ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iii) එම ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදයක් තිබේද;

(iv) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) மொனராகலை மாவட்டத்திலுள்ள தேசிய பாடசாலைகள் மற்றும் மாகாண கல்வித் திணைக்களத்தின்கீழ் இயங்கும் பாடசாலைகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி பாடசாலைகளில் நிறுவப்பட்டுள்ள கேட்போர் கூடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) புத்தல துட்டகைமுனு மத்திய மகா வித்தியாலய கேட்போர் கூடத்தின் நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப்பட்ட திகதி யாது என்பதையும்;

(ii) அதற்காக ஒதுக்கீடு செய்யப்பட்ட நிதியின் அளவு எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி கேட்போர் கூடத்தின் நிர்மாணப் பணிகளில் தாமதமெதுவும் நிலவுகின்றதா என்பதையும்;

(iv) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) separately, the number of National Schools and schools operating under the Provincial Education Department in the Monaragala District; and

(ii) the number of auditoriums established in those schools?

(b) Will she further inform this House -

(i) the date on which construction work of the auditorium of Dutugemunu Central College in Buttala was commenced;

(ii) the total amount of funds allocated for the same;

(iii) whether there is any delay in the construction of the said auditorium; and

(iv) if so, the reasons for the said delay?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ ජාතික පාසල් 11ක් සහ පළාත් පාසල් 280කි. එය ඇමුණුම 01 සහ 02 මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 01 සහ 02 **සභාගත*** කරමි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

(ii) එම පාසල්වල ස්ථාපිත කර ඇති ශ්‍රවණාගාර සංඛ්‍යාව 10කි.

(ආ) (i) බුත්තල දුටුගැමුණු මධ්‍ය මහා විද්‍යාලයේ ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් ආරම්භ කළේ 2019 ජනවාරි 28වැනි දින.

(ii) ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 70.06කි.

(iii) ඔව්.

(iv) රටේ පැවති ආර්ථික අර්බුදය හමුවේ නව ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම සීමා වීම මත අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාසල්වල පන්ති කාමර අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ගොඩනැඟිලි ඉදිකිරීමට ප්‍රමුඛතාව ලබා දෙමින් කටයුතු කර ඇත. නමුත්, මෙම ගොඩනැඟිල්ල අර්ධ වශයෙන් ඉදිකර තිබීම පාසල් ළමුන්ගේ ආරක්ෂාවට තර්ජනයක් වී තිබූ බැවින්, එය භාවිතයට ගත හැකි මට්ටමට ඉදිකර අවසන් කිරීමට කටයුතු කරන ලදී. මෙම ගොඩනැඟිල්ලේ ඉතුරු වැඩ නිම කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති අතර, 2027 වර්ෂයේ එහි ඉතුරු වැඩ කොටස් සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, පිළිතුර ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, බුත්තල දුටුගැමුණු මධ්‍ය මහා විද්‍යාලය කියන්නේ වැල්ලවාය අධ්‍යාපන කලාපයේ බුත්තල කොට්ඨාසයේ පිහිටා තිබෙන එකම ජාතික පාසල. එම පාසලේ 2,500කට ආසන්න ළමුන් සංඛ්‍යාවක් අධ්‍යාපන කටයුතුවල නිරත වෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, එය විෂය සමගාමී සහ විෂය බාහිර ක්‍රියාකාරකම්වලදී සැලකිය යුතු ප්‍රමාණයකින් සමස්ත ලංකා මට්ටමින් ජයග්‍රහණ ලබමින් ක්‍රියාත්මක වන පාසලක්. ඒ නිසාම එම පාසලට ශ්‍රවණාගාරයක අවශ්‍යතාව දැඩිව තිබෙනවා.

විශේෂයෙන්ම බුත්තල කොට්ඨාසයේ පාසල් 26ක් පමණ තිබෙනවා. ඒ පාසල් 26න් එකම පාසලකටවත් ශ්‍රවණාගාරයක් නැහැ, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. එම නිසා ඒ කොට්ඨාසයේ පාසල් 26 තුළ ඉගෙනුම ලබන දරුවන්ගේ විෂය සමගාමී සහ විෂය බාහිර ක්‍රියාකාරකම් ඇතුළු අධ්‍යාපන කටයුතුවලට මෙන්ම විශේෂයෙන්ම සමස්ත ලංකා තරගවලට ඉදිරිපත් වීමේදී ශ්‍රවණාගාරයක අවශ්‍යතාව දැඩිව බලපා තිබෙනවා.

එම නිසා බුත්තල දුටුගැමුණු මධ්‍ය මහා විද්‍යාලයේ ඉදි වෙමින් පවතින ශ්‍රවණාගාරයේ වැඩ කටයුතු හැකි ඉක්මනින් නිමා කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. ඒ සඳහා ඔබතුමන්ලාගේ දැඩි අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටින ගමන්, එහි වැඩ කටයුතු හැකි ඉක්මනින් නිම කර සිසු අයිතියට එය පැවරීම සඳහා ඔබතුමන්ලා සතු සැලැස්ම මොකක්ද කියාත් මා අහන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයට අදාළ ඉතිහාසයක් තිබෙනවා. මේ පාසලේ මෙම ශ්‍රවණාගාරය ඉදිකිරීමේ කටයුතු පටන් ගෙන තිබෙන්නේ "ළඟම පාසල - හොඳම පාසල" කියන ජාතික වැඩසටහන යටතේ 2016 වසරේදීයි. නමුත් එය නියමාකාරයෙන් ආරම්භ කර තිබෙන්නේ 2019 වසරේදී. ඊට පසුව 2020 වසර වෙනකොට ඇති වුණු කොවිඩ් වසංගත තත්ත්වයත් එක්ක එහි ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාද වීමක් සිදු වී තිබෙනවා. 2023 වසරේදී නැවත වාරයක් අමාත්‍ය මණ්ඩල තීරණයක් මත මෙම ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබී තිබෙනවා. ඊට පසුව 2024 වසරේදී රුපියල් මිලියන 36ක ප්‍රතිපාදන මත මෙම ශ්‍රවණාගාරයේ අත්‍යවශ්‍ය කොටස් ප්‍රමාණයක් පමණක් ඉදි කර තිබෙනවා.

අපි මේ සම්බන්ධව ඉංජිනේරු දෙපාර්තමේන්තුව එක්කත් සාකච්ඡා කර තිබෙනවා. එම ගොඩනැඟිල්ල සහ ඒ අවට තිබෙන භූමිය ආරක්ෂිත ප්‍රදේශයක් විධියට සංවර්ධනය කිරීමටත්, ඒ වාගේම ගොඩනැඟිල්ල ඇතුළත සිවිලිම ඉදිකිරීමේ සහ පුටු ඇතුළු අනෙකුත් බඩු බාහිරාදිය ලබා ගැනීමේ අවශ්‍යතාවකුත් තිබෙනවා. ඒ කියන්නේ, පූර්ණ ශ්‍රවණාගාරයක් විධියට මෙහි ක්‍රියාකාරිත්වය ඇති කිරීම සඳහායි. 2027 වසර වනවිට ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර එම කටයුතු නිම කිරීම සඳහා අමාත්‍යාංශය සූදානම් කියන තොරතුර අපි ලබා ගෙන තිබෙනවා.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

එම පිළිතුර ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, අපේ රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ භෞතික සම්පත් සංවර්ධනය කිරීම කියන කාරණාව එක මූලික කුලුනක් විධියට සඳහන් කර තිබුණා. පවතින තත්ත්වය ඇතුළේ වුවද මේ අවුරුද්ද තුළ ඉලක්කගත භෞතික සම්පත් සංවර්ධනය කිරීම සඳහා ඔබතුමන්ලා සැලසුම් සකස් කර තිබෙනවාද කියන කාරණාව සහ ඒවා කුමන ආකාරයෙන් ද ක්‍රියාත්මක වන්නේ කියන කාරණාව සම්බන්ධව දළ අදහසක් ලබා ගන්න මා කැමැතියි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු මන්ත්‍රීතුමනි, එම අතුරු ප්‍රශ්නය ඇසුවාට ඔබතුමාට ස්තුතියි. ඔව්, අධ්‍යාපනික ආයතනවල යටිතල පහසුකම් නැංවීම සඳහා කාරණා 2ක් යටතේ කටයුතු කරනවා.

එකක් තමයි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලදි මේ සම්බන්ධයෙන් කරන ක්‍රියාවලිය. එහිදී ඩිජිටල්කරණය අධ්‍යාපන පද්ධතියට හඳුන්වා දීමේදී මේ වෙනකොට ද්විතීයික පාසල් 6,200ක් පමණ හඳුනාගෙන තිබෙනවා. මේ පාසල් සියල්ලටම ජාලගත කිරීම, එක්කෝ fibre-optic, එහෙම නැත්නම් broadband ජාලගත කිරීම මේ අවුරුද්ද අවසන් වීමේදී අවසන් කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා බහු පාර්ශ්වික එකඟතාවක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරමින් තිබෙනවා.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල තව කුලුනක් තමයි, පාසල් ප්‍රති සංවිධානය කිරීම කියන කොටස. එතැනදී අපි එක පාසලක් තෝරාගෙන -ඒ සඳහා නිශ්චිත නිර්ණායක 8ක් පමණ තිබෙනවා- ඒ පාසලට අදාළව ඒ අවට අවුරුදු 5ට අඩු ළමයින් කොච්චර ඉන්නවාද, කොච්චර පාසල් ප්‍රමාණයක් ඒ අවට තිබෙනවාද, ඒ පාසල්වලින් කොපමණකට ප්‍රවාහන පහසුකම් තිබෙනවාද,

ගුරුවරුන් කොච්චර ප්‍රමාණයක් ස්ථානගත කළ හැකිද, ගොඩනැඟිලි කොච්චර ප්‍රමාණයක්ද, ගොඩනැඟිලි ප්‍රමාණය කොච්චර සංවර්ධනය කළ හැකිද වැනි නිශ්චිත නිර්ණායක මත තීරණය කරලා ගිය අවුරුද්ද වන විට පාසල් 31ක් තෝරාගෙන රුපියල් මිලියන 500ක් යොදවා අපි මේ වෙද්දි ප්‍රතිසංස්කරණ කටයුතු කරමින් පවතිනවා. ඒ වාගේම තමයි මේ අවුරුද්දේදී රුපියල් බිලියනයක් යොදවා තිබෙනවා. එතැනදී පාසල් 169ක් තෝරාගෙන මේ විධියේ නිර්ණායක මත යටිතල පහසුකම් නැංවීමේ කටයුතු කරමින් පවතිනවා. ලබන අවුරුද්දේත් ඒ විධියටම නිශ්චිත නිර්ණායක මත කටයුතු කරනවා. විශේෂයෙන් ඒකෙදි ප්‍රාථමික පාසල් සංවර්ධන කටයුතු තමයි සිද්ධ කරන්නේ.

ඒ වාගේම, අපි සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ කාරණා 4ක් ඔස්සේ යටිතල පහසුකම් නැංවීමේ කටයුතු කරනවා. එකක් තමයි පිරිවෙන් සහ විශේෂ අධ්‍යාපන කියන කොටස. ඒ සඳහා රුපියල් බිලියන 12ක විතර ප්‍රමාණයක් අපි යොදා ගන්නවා. ඒ වාගේම විශේෂයෙන්ම ගත්තොත්, ජාතික පාසල් පද්ධතිවල යටිතල පහසුකම් නැංවීම සඳහා රුපියල් මිලියන 5,000ක් -රුපියල් බිලියන 5ක්- වාගේ ප්‍රමාණයක් මේ අවුරුද්දේ අපි යොදා ගන්න බලාපොරොත්තු වෙනවා. ඊට අමතරව විශේෂයෙන් වතු පාසල්වල ගුරු හිඟය අඩු කිරීම සඳහා, ගුරු නිවාස සකස් කිරීම සහ ඊට අමතරව යටිතල පහසුකම් නැංවීම සඳහා රුපියල් මිලියන 700ක විතර ප්‍රමාණයක් අපි යොදවනවා.

ඊටත් අමතරව, "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතියට ඇතුළත් වන 2016 සිට ඉතුරු වුණු යටිතල පහසුකම් ප්‍රමාණයක් තිබෙනවා. මේ ශ්‍රවණාගාරයත් ඊට ඇතුළත්. ඒ ප්‍රමාණය නැංවීම සඳහා රුපියල් මිලියන 700ක විතර ප්‍රමාණයක් මේ අවුරුද්ද තුළ යොදා ගැනීමට බලාපොරොත්තුවක් තිබෙනවා.

ඒ අනුව ගත්තොත්, යටිතල පහසුකම් නැංවීම සඳහා අපට නිශ්චිත සහ ඉලක්ක ගත මුදල් ප්‍රමාණයක් තිබෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## මන්නාරම දිස්ත්‍රික්කයේ බහුකාර්ය සේවා කාර්යාල: පහසුකම්
### மன்னார் மாவட்டத்திலுள்ள பல்தேவை சேவை அலுவலகங்கள்: வசதிகள்
### MULTI-PURPOSE SERVICE CENTRES IN MANNAR DISTRICT: FACILITIES

1455/2025

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු කේ. කාදර් මස්තාන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு கே. காதர் மஸ்தான் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. K. Kader Masthan)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය (1) :

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ, ග්‍රාම නිලධාරි වසම් 153 අතරින්, ග්‍රාම නිලධාරින්, සංවර්ධන නිලධාරින් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරින් සඳහා භාවිත කිරීම සඳහා බහුකාර්ය කාර්යාල (සේවා පියස) නොමැති ග්‍රාම නිලධාරි වසම් තිබේද;

(ii) එසේ නම්, තාවකාලිකව විකල්ප ස්ථානවල ක්‍රියාත්මක වන කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iii) ප්‍රතිසංස්කරණය කළ යුතු කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iv) වැසිකිළි, ජල සහ විදුලි පහසුකම් නොමැති කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(v) විදුලිය විසන්ධි කර ඇති කාර්යාල සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම අඩුපාඩු මහ ජනතාවට ගුණාත්මක සේවාවක් සැපයීමට බාධාවක් බව දන්නේද;

(ii) එවැනි අපහසුතා නිරාකරණය කර ගුණාත්මක හා කඩිනම් සේවාවක් සැපයීම සඳහා අදාළ අඩුපාඩු සපුරාලීමට ඇති සැලැස්ම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மன்னார் மாவட்டத்திலுள்ள 153 கிராம அலுவலர் பிரிவுகளில், கிராம அலுவலர்கள், அபிவிருத்தி அலுவலர்கள் மற்றும் சமுர்த்தி அபிவிருத்தி அலுவலர்கள் பயன்படுத்தக்கூடிய பல்தேவை சேவை அலுவலகங்கள் (சேவாபியஸ) இல்லாத கிராம அலுவலர் பிரிவுகள் உள்ளனவா;

(ii) ஆமெனில், தற்காலிகமாக மாற்று இடங்களில் இயங்கிவரும் அலுவலகங்களின் எண்ணிக்கை யாது;

(iii) புனரமைக்கப்பட வேண்டிய அலுவலகங்களின் எண்ணிக்கை யாது;

(iv) மலசலகூடங்கள், நீர் மற்றும் மின்சார வசதிகள் இல்லாத அலுவலகங்களின் எண்ணிக்கை யாது;

(v) மின்சாரம் துண்டிக்கப்பட்டுள்ள அலுவலகங்களின் எண்ணிக்கை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா;

(ஆ) (i) மேற்படி குறைபாடுகள் பொது மக்களுக்குத் தரமான சேவையை வழங்குவதில் தடையாக உள்ளதென்பதை அவர் அறிவாரா;

(ii) தரமான மற்றும் துரிதமான சேவையை வழங்கும் பொருட்டு மேற்படி குறைபாடுகளை நிவர்த்தி செய்வதற்குள்ள திட்டம் யாது;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) whether there are any Grama Niladhari Divisions, out of the 153 Grama Niladhari Divisions in the Mannar District, which do not have multi-purpose service centres (Sevapiyasa) that can be used by the Grama Niladharis, Development Officers and Samurdhi Development Officers;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(ii) if so, the number of offices that are temporarily housed in alternative buildings;

(iii) the number of offices that need to be renovated;

(iv) the number of offices that do not have toilets, water and electricity facilities; and

(v) the number of offices in which the electricity supply has been disconnected?

(b) Will he also inform this House -

(i) whether he is aware that there are difficulties in providing quality services to the public due to such shortages; and

(ii) the nature of the plan that is in place to address the said shortages in order to provide quality and expeditious services to the public?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) 15

(iii) 121

(iv) වැසිකිළි පහසුකම් නොමැති කාර්යාල සංඛ්‍යාව - 46

ජල පහසුකම් නොමැති කාර්යාල සංඛ්‍යාව - 92

විදුලි පහසුකම් නොමැති කාර්යාල සංඛ්‍යාව - 38

(v) විදුලිය විසන්ධි කර ඇති කාර්යාල සංඛ්‍යාව - 14

(ආ) (i) ඔව්.

(ii) 2026 වසරේ අය වැය ප්‍රතිපාදන මඟින් මන්නාරම දිස්ත්‍රික්කයේ පවතින නිලසෙවන කාර්යාල අලුත්වැඩිය කිරීම සඳහා රුපියල් මිලියන 24.7ක ප්‍රතිපාදන වෙන් වී ඇති බැවින්, එම ප්‍රතිපාදන යොදවා පවතින අඩුපාඩු ඉදිරියේදී ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර ඇත.

(ඇ) අදාළ නොවේ.

## කම්කරු නීති සංශෝධනය: විස්තර

### தொழில் சட்டங்கள் திருத்தம்: விபரம்

### AMENDMENT OF LABOUR LAWS: DETAILS

1721/2025

**7. ගරු තිළිණ සමරකෝන් මහතා (ගරු ඔෂානි උමංගා මහත්මිය වෙනුවට)**
(மாண்புமிகு திலிண சமரக்கோன் - மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா சார்பாக)
(The Hon. Thilina Samarakoon on behalf of the Hon. (Mrs.) Oshani Umanga)

කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය (1) :

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකාවේ කම්කරු නීති සංශෝධනය කරමින් පවතින්නේද;

(ii) එසේ නම්, සංශෝධනය කරනු ලබන අංශ කවරේද;

(iii) එම සංශෝධන සඳහා මැදිහත් වන බාහිර පාර්ශ්වයන් කවරේද;

(iv) එම සංශෝධන සිදු කිරීම අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන කාල රාමුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தற்போது தொழில் சட்டங்கள் திருத்தப்படுகின்றனவா என்பதையும்;

(ii) அவ்வாறெனில், திருத்தப்படும் பிரிவுகள் யாவை என்பதையும்;

(iii) மேற்படி திருத்தங்களில் ஈடுபட்டுள்ள வெளித் தரப்பினர்கள் யாவர் என்பதையும்;

(iv) மேற்படி திருத்தங்களை எக்காலப்பகுதிக்குள் செய்து முடிப்பதற்கு எதிர்பார்க்கப்படுகின்றது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Labour:

(a) Will he inform this House -

(i) whether labour laws in Sri Lanka are currently being amended;

(ii) if so, the specific areas that are being amended;

(iii) the external stakeholders who are involved in the said amendments; and

(iv) the timeframe within which the said amendments are expected to be completed?

(b) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) අංශ 04ක් යටතේ පහත සඳහන් කර ඇති පනත් සංශෝධනය කරනු ලබයි.

1. ශ්‍රම ප්‍රමිති
   - 1939 අංක 32 දරන ප්‍රසූතිකාධාර ආඥා පනත
   - 1941 අංක 47 දරන පඩිපාලක සභා ආඥා පනත
   - 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා පාරිශ්‍රමික විධිමත් කිරීමේ) පනත

- 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදවීම පිළිබඳ පනත
- 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත
- 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතන පනත
- 2021 අංක 28 දරන සේවකයන් විශ්‍රාම යෑමේ අවම වයස පනත

2. කාර්මික සබඳතා

- 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත
- 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත
- 2003 අංක 13 දරන කාර්මික ආරාවුල් නඩු කටයුතු විභාග කිරීමේ සහ විනිශ්චය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත

3. වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය

- 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත

4. වෘත්තීය සමිති

- 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥා පනත

(iii) අංක අමප/25/1368/812/066-III හා 2025.08.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් යුත් කමිටුවක් පත් කර ඇත.

රාජ්‍ය නිලධාරින්:

01. ලේකම් - කම්කරු අමාත්‍යාංශය (සභාපති)

02. ලේකම් - වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය (සාමාජික)

03. අතිරේක ලේකම් (සංවර්ධන) - කම්කරු අමාත්‍යාංශය (සාමාජික)

04. කම්කරු කොමසාරිස් ජනරාල් - කම්කරු දෙපාර්තමේන්තුව (සාමාජික)

05. මහාචාර්ය ඒ. සර්වේශ්වරන් මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පෞද්ගලික හා සංසන්දනාත්මක නීති දෙපාර්තමේන්තුව, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය (සාමාජික)

06. ආචාර්ය අභිලාන් අර්සරත්නම් කදිරගාමර් මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, යාපනය විශ්වවිද්‍යාලය (සාමාජික)

අනෙකුත් සාමාජිකයන්:

07. ආචාර්ය කේ.බී. සමන් ප්‍රියලාල් මහතා - නීතිඥ (සාමාජික)

08. ලාල් පෙරේරා මහතා - නීතිඥ (සාමාජික)

09. රුවන් ඩී.වී. ඩයස් මහතා - නීතිඥ (සාමාජික)

10. ජී.ආර්. දිලිප් ඔබේසේකර මහතා - නීතිඥ (සාමාජික)

11. ඩී.වී.ආර්. ඉසුරු ලක්පුර මහතා - නීතිඥ (සාමාජික)

12. සත්‍යා ගුණවර්ධන මෙනවිය - නීතිඥ (සාමාජික) (මෙම සාමාජිකයා රාජකාරි බහුලත්වය මත ඉල්ලා අස් වී ඇත.)

13. එස්.එර්මිසා ටීගල් මහත්මිය - නීතිඥ (සාමාජික)

14. මනෝලි ගෝනදූව ජිනදාස මහත්මිය - නීතිඥ (සාමාජික)

15. ඒ.පී. ජානක අධිකාරි මහතා - නීතිඥ (සාමාජික)

16. කේ.ජී.ජේ.බී. කුරුකොහොතැන්න මහතා - විශ්‍රාමික සහකාර කම්කරු කොමසාරිස් (සාමාජික)

17. අමරසේන අතුකෝරල මහතා - වරලත් ගණකාධිකාරි, මූල්‍ය, බදු හා ආයෝජන උපදේශක (සාමාජික)

18. හෙට්ටිතන්ත්‍රිගේ තුෂාර චමින්ද මහතා - මානව සම්පත් වෘත්තික (සාමාජික)

ඉහත කමිටුව විසින් ජාතික කම්කරු උපදේශන සභාව - NLAC- එම උපදේශන සභාවේ සාමාජික නොවන අනෙකුත් වෘත්තීය සමිති, සේවා යෝජක සංගම් සහ මහජන අදහස් ලබා ගනිමින් කම්කරු නීති සංශෝධනය සඳහා යෝජනා සකස් කිරීමට කටයුතු කෙරේ.

(iv) මෙම වසර තුළ අවසන් කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

(ආ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### දූප්පත්කම තුරන් කිරීමේ රජයේ වැඩ පිළිවෙළ
### வறுமையை ஒழிப்பதற்கான அரசாங்கத்தின் வேலைத்திட்டம்
### GOVERNMENT INITIATIVE FOR POVERTY ALLEVIATION

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ලංකාව තවදුරටත් සැලකිය යුතු ලෙස ආර්ථික අභියෝගයන්ට මුහුණ දෙමින් පවතින පසුබිමක් තුළ දූප්පත්කම සහ ආදායම් අසමතුලිතතාව තවදුරටත් ජන ජීවිතයට බරපතළ බලපෑමක් ඇති කරමින් පවතින බව පිළිගත යුතු කරුණකි. විශේෂයෙන්ම ආහාර, ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය හා ජීවන තත්ත්වය සම්බන්ධයෙන් දූප්පත්කම බහුමාන - multidimensional - ආකාරයෙන් ප්‍රකාශ වන අතර, එය ජාතික සංවර්ධනයට බාධාවක් වන මූලික ගැටලුවක් ලෙස හඳුනාගත යුතු වේ. එබැවින්, ශ්‍රී ලංකාවේ දූප්පත්කම පිළිබඳ වත්මන් තත්ත්වය, එයට පිළිතුරු ලෙස රජය ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු පිළිබඳව මෙම සභාවට පැහැදිලි කිරීමක් ලබා දෙන ලෙස අදාළ ගරු අමාත්‍යවරයාගෙන් මම ඉල්ලා සිටිමි.

1. වර්තමානයේ ශ්‍රී ලංකාවේ දූප්පත්කමින් පෙළෙන ජනගහනය දිස්ත්‍රික්ක වශයෙන් කොපමණද?

විශේෂයෙන්ම මේ පිළිබඳව වර්තමාන තත්ත්වයත් අවබෝධ කරගෙන මැද පෙරදිග යුද තත්ත්වය තුළ ඉන්ධන ඇතුළු අත්‍යවශ්‍ය දේවල්වල මිල ඉහළ යාම නිසා නිර්මාණය වන දූප්පත්කමත් ගණනය කරමින්, පැහැදිලි සංඛ්‍යාලේඛන අපි රජයෙන් බලාපොරොත්තු වනවා.

2. රජය විසින් දූප්පත්කම නිර්වචනය කරන්නේ කෙසේද? දූප්පත්කම හේතුවෙන් සමස්තයක් ලෙස රටට ඇති වී තිබෙන බලපෑම පිළිබඳව රජයේ තක්සේරුව කුමක්ද?

ඒ කියන්නේ, විශේෂයෙන්ම දැනට නිර්මාණය වී තිබෙන ජීවන බරත් එක්ක මේ දූප්පත්කම කියන කාරණය පිළිබඳව නිවැරදි, පැහැදිලි නිර්වචනයක් අවශ්‍ය වනවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

3. ශ්‍රී ලංකාවේ දුප්පත්කම හඳුනා ගැනීම සඳහා භාවිත කරන ජාතික දරිද්‍රතා රේඛාව - official Poverty Line - සහ බහුමාන දරිද්‍රතා දර්ශකයන් - multidimensional poverty indicators - මිනුම් කිරීමට භාවිත කරන දර්ශක සහ ඒවා හඳුන්වා දීමට පසුබිම් වූ නිර්ණායකයන් - criteria - මොනවාද? විශේෂයෙන්ම නවතම දත්ත අනුව මේවායේ අගයන් කොපමණ ද?

මේ සඳහා පිළිතුරු ලබා දීමේදී, විශේෂයෙන්ම මේ යුද තත්ත්වය තුළ නිෂ්පාදන කර්මාන්තවලට, ස්වයං රැකියාවලට, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට අත්පත් වී තිබෙන බලපෑමත් එක්කම ගණනය කරලා පිළිතුරු ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

4. දුප්පත්කම ජාතික ආර්ථිකයට ඇති කරන බලපෑම් පිළිබඳව රජය විසින් අධ්‍යයනයක් සිදු කර තිබේද?

5. දුප්පත්කමෙන් ජනතාව මුදා ගැනීම සඳහා දැනට ක්‍රියාත්මක සමාජ ආරක්ෂණ වැඩසටහන් හා ආදායම් වැඩි කිරීමේ වැඩසටහන් කවරේද? ඒවායේ ප්‍රගතිය - outcomes - කුමක්ද?

6. දුප්පත්කම වැනි බරපතළ ජාතික ගැටලුවක් සඳහා ජාතික ප්‍රතිපත්තියක්, දුප්පත්කම තුරන් කිරීමේ ජාතික ප්‍රතිපත්තියක් - National Poverty Alleviation Policy එකක් - අවශ්‍ය බව රජය පිළිගන්නේද?

මොකද, ඇත්තටම අස්වැසුම වැඩසටහන දුප්පත්කම තුරන් කරන්නට කිසිසේත්ම ප්‍රමාණවත් නැහැයි කියන එක ජනතාවගෙන් මතු වන යෝජනාවක්.

7. එවැනි ප්‍රතිපත්තිය සකස් කර තිබේද? එහි ප්‍රධාන අංග - key components - කවරේද? එය ක්‍රියාත්මක වන කාලසීමාව - timeline එක - කුමක්ද?

8. දුප්පත්කමෙන් වඩාත් බලපෑමට ලක්ව ඇති කණ්ඩායම් හඳුනා ගෙන තිබේද?

එනම්, අවදානම් සහිත කොට්ඨාස, අවදානම් කාණ්ඩවලට ලක් වන කණ්ඩායම්. විශේෂයෙන්ම මේ යුද්මය තත්ත්වය තුළ ශීඝ්‍රයෙන් ඉහළ යන භාණ්ඩ මිලත් සමඟ මේ අවදානම් කොට්ඨාස හඳුනා ගෙන තිබෙනවාද?

එම කණ්ඩායම් වෙන් වෙන්ම සංඛ්‍යාත්මකව දැක්විය හැකිද? නොඑසේනම්, එවැනි දත්ත සකස් කිරීමට මෙතෙක් රජය අපොහොසත් වී තිබේද?

විශේෂයෙන්ම මතක් කරන්න කැමතියි දරුවන්, මව්වරුන්, ආබාධිත ප්‍රජාව, වැඩිහිටි ප්‍රජාව, තරුණ ප්‍රජාව තමයි මේ අවදානමට ලක් වෙච්ච කොට්ඨාස. දුප්පත්කම තුරන් කිරීමට මේ අය වෙනුවෙන් රජය ගන්නා පියවර කුමක්ද?

9. මෙවැනි කණ්ඩායම් වෙත සමානව සැලකීම සඳහා යෝජිත රජයේ වැඩ පිළිවෙළ කුමක්ද?

10. බහුමාන දුප්පත්කම තුරන් කිරීම සඳහා වන රජයේ කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මොනවාද?

මේ ප්‍රශ්නයට උත්තරය ලබා දෙන විටත් අද නිර්මාණය වෙලා තිබෙන මේ අර්බුදකාරී තත්ත්වය වාගේම ආර්ථික අභියෝග සැලකිල්ලට ලක් කරන්න. විශේෂයෙන්ම භාණ්ඩ මිල ඉහළ යෑම තුළ, ජීවන බර ඉහළ යෑම තුළ, ආදායම් මාර්ග අහිමි වීම තුළ, රැකියා අහිමි වීම තුළ ප්‍රශ්න ගණනාවක් ඇති වෙලා තිබෙනවා. අපි දන්නවා, බොහෝ තැන්වල garment factories විශාල ප්‍රමාණයක් වැසී තිබෙන බව. මේ තත්ත්වයන් හමුවේ රජය දුප්පත්කම තුරන් කරන්නට ගන්නා ක්‍රියාමාර්ග කවරේද කියන එක ගැන පැහැදිලි විස්තරයක් අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා කල් ඉල්ලා සිටිනවා.

# II

## ශ්‍රී ලංකාවේ ගුවන් ප්‍රවාහන අංශයේ වර්තමාන තත්ත්වය
## இலங்கையின் விமானப் போக்குவரத்துத்துறையின் தற்போதைய நிலை
## CURRENT STATUS OF SRI LANKA'S AVIATION SECTOR

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

රටේ වැඩි වන සංචාරක, වෙළෙඳ සම්බන්ධතා සහ ජාත්‍යන්තර මඟී ගමනාගමනය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ ගුවන් ප්‍රවාහන අංශයේ වර්තමාන තත්ත්වය, පිටත්වීමේ බදු අය කිරීම සහ ගුවන් තොටුපොළ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳව කථා කිරීමට මම ඉඩ ලබා ගනිමි.

පහත සඳහන් ප්‍රශ්නවලට වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා මෙම සභාවට පිළිතුරු දන්වන්නේ දැයි මම විමසමි.

1. වර්තමානයේ ශ්‍රී ලංකාවට කාලසටහන්ගත මඟී ප්‍රවාහන සේවා සපයන ජාත්‍යන්තර ගුවන් සමාගම් කීයක් තිබේද සහ ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපොළවල් හරහා ක්‍රියාත්මක වන මෙම ගුවන් සමාගම්වල අනුමත වාර්ෂික මඟී ප්‍රවාහන ධාරිතාව කොපමණද? About the passenger-carrying capacity, please provide details.

2. ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපොළවලින් පිටත් වන එක් මඟියෙකු සඳහා දැනට අය කරන පිටත් වීමේ බදු මුදල කොපමණද? එවැනි බද්දක් ගුවන් ටිකට්පත් මිලට ඇතුළත් කර තිබේද? මෙම බද්ද අය කරන්නේ කවුරුන්ද සහ මෙම බද්ද රජයට ගෙවිය යුතු දින ගණන කීයද?

අපේ රටින් පිට රටවලට යන අයටත් මේ බද්ද අය කරනවාද යන්න පිළිබඳව දැනුවත් කරාවි කියලා මම විශ්වාස කරනවා.

3. 2023, 2024, 2025 යන වර්ෂවලදී ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපොළවලට පැමිණි සහ පිටත් වූ මුළු මගීන් සංඛ්‍යාව කොපමණද? එම තොරතුරු එක් එක් ගුවන් තොටුපොළට අදාළව වාර්ෂිකව, වෙන වෙනම සඳහන් කරන්න.

4. ඉහත කී 3වන ප්‍රශ්නයට අනුව ඉහත සඳහන් එක් එක් වර්ෂයේදී පිටත් වීමේ බදු ලෙස මගීන්ගෙන් රජයට ලැබිය යුතු මුළු මුදල කොපමණද? That is the Embarkation Tax, Sir.

5. වර්තමානය දක්වා ගුවන් සමාගම් විසින් රජයට නොගෙවූ සහ ගෙවිය යුතු තත්ත්වයේ පවතින පිටත්වීමේ මුළු බදු මුදල කොපමණද? එවැනි බදු ගෙවීමට අපොහොසත් වී ඇති ගුවන් සමාගම් මොනවාද? කරුණාකර එක් එක් ගුවන් සමාගමේ නම සහ ලබා ගත හැකි නවතම දිනය වන විට ගෙවිය යුතු මුදල සඳහන් කරන්න. ගෙවීම් ප්‍රමාදය නිසා සිදු වී ඇති පාඩුව කුමක්ද සහ ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

6. ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර සහ දේශීය ගුවන් තොටුපොළ කීයක් තිබේද? එක් එක් ගුවන් තොටුපොළවල උපරිම වාර්ෂික මගී හැසිරවීමේ ධාරිතාව කොපමණද? ඒවාට පමණක් සීමා නොවී,

- කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ
- මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ
- යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපොළ
- රත්මලාන ජාත්‍යන්තර ගුවන් තොටුපොළ
- මඩකලපුව ගුවන් තොටුපොළ සහ

අනෙකුත් දේශීය ගුවන් තොටුපොළවල් නම් කරන්න.

7. එක් එක් ගුවන් තොටුපොළේ වත්මන් වාර්ෂික මගී හැසිරවීමේ ධාරිතාව සහ භාවිත අනුපාතය කොපමණද? ඒවා දැනට තමන්ගේ නිර්මිත ධාරිතාවට වඩා ඉහළින් හෝ පහළින් ක්‍රියාත්මක වන්නේද? That is, whether it is underutilization or overutilization?

8. Terminal -2 ව්‍යාපෘතිය BIAහිදී සහ අනෙකුත් ප්‍රාදේශීය ගුවන් තොටුපොළවල සංවර්ධන ව්‍යාපෘති ඇතුළුව සැලසුම් කර ඇති හෝ ඉදි කරමින් පවතින නව ගුවන් තොටුපොළ සංවර්ධන, පර්යන්ත ව්‍යාපෘති සහ ධාවන පථ උත්ශ්‍රේණි කිරීම් මොනවාද? සංචාරක වර්ධන බාධක පිළිබඳව දන්වන්න.

9. මෙම ව්‍යාපෘති අවසන් වූ විට අතිරේක වාර්ෂික මගී ධාරිතාව කොපමණක් වේද? What is the new incremental passenger movement at the airport?

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)

Hon. Speaker, the Answer to the Question raised by the Hon. Ravi Karunanayake is as follows;

1. A total of 29 scheduled airlines are operating from Sri Lanka, including two Sri Lankan carriers - the SriLankan Airlines and FitsAir. They have been approved to operate for the winter season 2025/2026. But, based on the approved aircraft capacities, the weekly one-way seat availability ranges from approximately 115,000 to 203,000 seats.

However, given the prevailing situation in the Middle East, several airlines, namely Qatar Airways, Emirates, Air Arabia, Etihad Airways, Air Arabia Abu Dhabi, Flydubai, Kuwait Airways, Jazeera Airways, SriLankan Airlines and FitsAir, have either cancelled their scheduled flights or reduced their frequencies to and from Sri Lanka. Meanwhile, a few airlines such as Aeroflot, Edelweiss and SalamAir have introduced additional flights to meet the current demand from this region.

From the second-half of this question, the Hon. Member asks about seating capacities and details of those airlines and their respective minimum and maximum seating capacities are given in Annex 01.

Annex 01

| No. | Airline | Minimum Seats per week (OW) | Maximum Seats per week (OW) | Max Annual Seat Capacity (OW) | Min Annual Seat Capacity (OW) |
|---|---|---|---|---|---|
| As per the approvals given for Winter25/26 IATA Season | | | | | |
| 1 | Aeroflot-Russian | 888 | 1,206 | 46,176 | 62,712 |
| 2 | Air Arabia | 3,654 | 4,515 | 190,008 | 234,780 |
| 3 | Air Arabia Abu Dhabi | 1,218 | 1,218 | 63,336 | 63,336 |
| 4 | Air Asia Berhad | 2,604 | 2,604 | 135,408 | 135,408 |
| 5 | Air China | 1,106 | 2,177 | 57,512 | 113,204 |
| 6 | Air India | 3,402 | 3,948 | 176,904 | 205,296 |
| 7 | Air Astana | 358 | 358 | 18,616 | 18,616 |
| 8 | Air Seychelles | 336 | 336 | 17,472 | 17,472 |
| 9 | Cathay Pacific Airways | 1,414 | 3,066 | 73,528 | 159,432 |
| 10 | China Eastern Airlines | 1,876 | 4,396 | 97,552 | 228,592 |
| 11 | Chongqing Airlines | 996 | 1,248 | 51,792 | 64,896 |
| 12 | Edelweiss Air. | 628 | 628 | 32,656 | 32,656 |
| 13 | Emirates | 8,736 | 10,080 | 454,272 | 524,160 |
| 14 | Etihad Airways | 3,672 | 13,122 | 190,944 | 682,344 |
| 15 | Fits Aviation | 4,860 | 4,860 | 252,720 | 252,720 |
| 16 | flydubai | 5,874 | 6,237 | 305,448 | 324,324 |
| 17 | Gulf Air | 1,224 | 2,538 | 63,648 | 131,976 |
| 18 | Indigo Airlines | 10,044 | 12,528 | 522,288 | 651,456 |
| 19 | Jazeera Airways | 2,436 | 2,436 | 126,672 | 126,672 |
| 20 | Jetstar Asia Airways | 900 | 900 | 46,800 | 46,800 |
| 21 | Kuwait Airways | 536 | 1,296 | 27,872 | 67,392 |
| 22 | Malaysia Airlines | 1,120 | 2,030 | 58,240 | 105,560 |
| 23 | Qatar Airways | 5,040 | 14,420 | 262,080 | 749,840 |
| 24 | Salam Air | 1,260 | 1,610 | 65,520 | 83,720 |
| 25 | Singapore Airlines | 3,370 | 3,370 | 175,240 | 175,240 |
| 26 | Srilankan Airlines Ltd | 45,016 | 98,307 | 2,340,832 | 5,111,964 |
| 27 | Thai AiaAsia | 1,860 | 2,360 | 96,720 | 122,720 |
| 28 | Thai Airways | 1,092 | 1,092 | 56,784 | 56,784 |
| 29 | Turkish Airlines | 126 | 349 | 6,552 | 18,148 |
| | | 115,646 | 203,235 | **6,013,592** | **10,568,220** |

Note - Capacities are indicated as per the approved aircraft capacity and airline can change the capacities according to the demand time to time

[ගරු අනුර කරුණාතිලක මහතා]

2. a. Embarkation levy presently charged per passenger departing from airports in Sri Lanka.

| Name of the Airport | Date of Issuing of Tickets | Applicable USD Amount |
|---|---|---|
| a. Bandaranaike International Airport (BIA) - (IATA code- CMB) | From 01.02.2020 | USD 60 |
| b. Jaffna International Airport (JIA) - (IATA code -JAF) | From 01.02.2026 | USD 60 |
| c. Colombo International Airport Ratmalana (CIAR) - (IATA code -RML) | From 27.03.2025 to 26.03.2026 | USD 30 |
| d. Mattala Rajapaksa International Airport - (MRIA) - (IATA code- HRI) | Until the date of completion of three years from the date of commencement of operations by an international airline on June 26th, 2027 whichever comes first | Free |
| b. Batticaloa International Airport - (IATA code BTC) | From 01.02.2020 | USD 60 |

b. The above tax amount is included in the price of the air ticket

c. It is transmitted to the Civil Aviation Authority accumulated by the airlines

d. Twice a week

Usually, this embarkation levy only applies to departures and is included in the price of the air ticket. The Civil Aviation Authority is responsible for collecting this tax, which is then transferred to the Treasury twice a week.

3. The details of departures and arrivals from 2023 to 2025 from each airport is as follows;

| Airport | | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|
| CMB | Departures | 3,762,145 | 4,351,507 | 4,982,918 |
| | Arrivals | 3,559,636 | 4,294,431 | 4,980,656 |
| HRI | Departures | 60,772 | 65,173 | 63,000 |
| | Arrivals | 63,746 | 65,963 | 59,854 |
| JAF | Departures | 14,624 | 20,476 | 29,428 |
| | Arrivals | 13,659 | 18,373 | 23,397 |
| BTC | Departures | 790 | 682 | 1,179 |
| | Arrivals | 519 | 444 | 558 |
| RML | Departures | 6 | 6 | - |
| | Arrivals | 6 | 4 | - |

4. The total amount due to the Government as Embarkation Levy from passengers in 2023, 2024 and 2025 is given in Annex 02 below.

Annex 02

| Airline | 2022 Interest | 2023 Tax Value | 2023 Interest | 2024 Tax Value | 2024 Interest | 2025 Tax Value | 2025 Interest | Total | Grand Total |
|---|---|---|---|---|---|---|---|---|---|
| | Rs. | Rs. | Rs. | Rs. | Rs. | Rs. | Rs. | Rs. | Rs. |
| SriLankan Airlines | 507,352,744.27 | 4,896,668,327.00 | 2,498,969,674.23 | 15,785,197,594.78 | 3,358,860,615.75 | 0.48 | 92,158,262.75 | 27,139,207,219.25 | |
| Fits Aviation | | 440,411,556.01 | 300,148,484.80 | 1,222,824,087.93 | 272,492,340.26 | 373,864,527.06 | 45,098,147.10 | 2,654,839,143.15 | |
| Air Asia Berhad | | | | | | | 759,257.87 | 759,257,87 | |
| | | Rs. | Rs | | | | | - | |
| Aeroflot Russian Airlines | | 381,958,485.00 | 190,563,565.28 | | | | | 572,522,050.28 | 30,367,327,670.55 |
| | | $ | $ | $ | $ | $ | $ | $ | $ |
| | | - | 101,093.10 | 114,120.00 | 60,557.35 | 1,119,300.00 | 61,162.60 | 1,456,233.05 | |
| Rossiya Airlines | | | 204.39 | 50.00 | 86,500.15 | | | 86,754.54 | 1,542,987.59 |

5. The total amount of Embarkation Levy currently outstanding and unpaid by each airline is given in Annex 03 below.

Annex 03

**Total Embarkation Levy Outstanding from Airlines as of 31.10.2025**

| Serial No. | Name of the Airline | Tax | Interest | Total Rs. |
|---|---|---|---|---|
| 1 | SriLankan Airlines | 21,536,756,162.74 | 5,630,854,778.82 | 27,167,610,941.56 |
| 2 | Air Asia Berhad | 71,147,250.58 | 1,926,221.87 | 73,073,472.45 |
| 3 | Aeroflot Russian Airline | 381,958,485.00 | 169,305,267.01 | 551,263,752.01 |
| 4 | Air India | 1,307,869.84 | 58,090,697.78 | 59,398,567.62 |
| 5 | Thai Air Asia | 47,461,072.50 | 1,183,276.72 | 48,644,349.22 |
| 6 | Fits Air | 2,306,307,847.44 | 527,945,675.56 | 2,834,253,523.00 |
| 7 | Maldivian Airline | - | 2,376,174.60 | 2,376,174.60 |
| | | | | |
| | Total | 24,344,938,688.10 | 6,391,682,092.36 | 30,736,620,780.46 |

| Serial No. | Name of the Airline | Tax | Interest | Total USD |
|---|---|---|---|---|
| 1 | Aeroflot Russian Airline | 511,320.00 | 205,781.59 | 717,101.59 |
| 2 | Rossiya Airline | 50.00 | 86,699.11 | 86,749.11 |
| | | | | |
| | Total | 511,370.00 | 292,480.70 | 803,850.70 |

6. We have 13 international and domestic airports operational in Sri Lanka and the details are given below.

| | Name of the Airport | Airport Operator | Annual Passenger Handling Capacity/ Designed Capacity |
|---|---|---|---|
| 1 | Bandaranaike International Airport, Katunayake (BIA) | AASL | 7 Million |
| 2 | Mattala Rajapaksa International Airport (MRIA) | AASL | 1 Million |
| 3 | Jaffna International Airport (JIA) | AASL | 0.2 Million |
| 4 | Colombo International Airport Ratmalana (CIAR) | AASL | 0.2 Million |
| 5 | Batticaloa Airport | AASL | 1 Million |
| 6 | Sigiriya Airport | SLAF | N/A |
| 7 | Koggala Airport | SLAF | N/A |
| 8 | Weerawila Airport | SLAF | N/A |
| 9 | Ampara Airport | SLAF | N/A |
| 10 | Trincomalee/China Bay Airport | SLAF | N/A |
| 11 | Anuradhapura Airport | SLAF | N/A |
| 12 | Hingurakgoda Airport | SLAF | N/A |
| 13 | Katukurunda Airport | SLAF | N/A |

7.

| Name of the Airport | Designed Capacity (passenger) Per Year | Passengers Handled in 2025 | Rate of Utilization |
|---|---|---|---|
| BIA | 7 Million | 9.96 Million | 142% |
| MRIA | 1 Million | 122,856 | 12.28% |
| JIA | 0.2 Million | 52,825 | 26.41% |
| CIAR | 0.2 Million | 0 | - |
| Batticaloa Airport (Domestic) | 0.1 Million | 1,737 | 1.74% |

8. The Terminal 2 Development Project of the Bandaranaike International Airport is at the final stage of procurement. The expected timeline for this project to be completed is by 2030. Until the Terminal 2 Project is completed, several capacity-increasing projects for the existing terminals are in progress and that has to be completed within 2026 and 2027.

The departure capacity has been increased with 36 additional check-in counters and six new boarding gates. Immigration counters have been relocated and the number of Immigration counters has been increased from 25 to 40. E-gates are already implemented in immigration - arrival - and arrangements will be made for emigration - departure - as well. The expansion of arrival terminal lobby is also underway. That is for the Bandaranaike International Airport.

The expansion of arrival terminal of the Jaffna International Airport has already been started. It is supposed to be completed within this year. Procurements for the common lobby expansion project for both arrival and departure are to be completed and construction will be completed by mid-2027. The purpose of these projects is to standardize the prevailing basic facilities and space at the Jaffna International Airport on par with international standards.

9. With the completion of the Terminal 2 Project of the Bandaranaike International Airport, an additional nine million passengers could be handled,and with capacity enhancement of the exiting terminals, an additional three million passengers would be accommodated. With the development of the Jaffna International Airport, the passenger capacity will be increased by an additional 0.2 million.

Thank you.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I congratulate the Hon. Minister for giving a precise Answer and I appreciate it. I hope that all the other Ministers would take cue from the Minister.

Hon. Minister, in your response, which I was eagerly listening to, there was one specific elimination. The President cited the Hingurakgoda Airport as a way forward and that has not been brought into the Answer. I presume it is part of this with its constructions ongoing.

So, in this particular situation, I could see that the Bandaranaike International Airport operates at a capacity of 142 per cent. That is what you revealed, Hon. Minister. You have two VIP terminals there. So, why can you not look at converting one of them into an active terminal because passengers are going through a very arduous procedure at the moment and that does not go well with a person who leaves the country because the last point he remembers of Sri Lanka would be the airport. So, I would take it upon myself to propose that one of the VIP terminals be converted into an additional terminal. You can add in as 8, 9 and 10 because slots are there and they are not at the key points at key times. So, Hon. Speaker, I would greatly appreciate it if the Hon. Minister looks into that.

Furthermore, another most important aspect today is that, with the Middle East being in turmoil, also for the next month or so, we would have to bear the brunt of what is going on there. I would want you to really look at positioning Sri Lanka to take advantage of that situation, which I have been saying for the last 14 months. The Mattala Airport is a sleeping giant which could be awakened at this particular moment. There are two or three Qatar Airways flights which operate from here directly to Europe. Likewise, they also go to Muscat. So, use the Mattala Airport to our advantage. You could even offer free handling because the concomitant advantages we are going to get thereafter would be far greater. Hon. Minister, you have Qatar Airways which handles a seating capacity of roughly about 700,000 a week. Bring them in, speak to them and say, "We will give you free handling", and the rest would flow in thereafter. Likewise, with Etihad Airways and Emirates Airline, the same thing could be pursued.

The next one is cargo. Last time, I told the Hon. Minister of Fisheries, Aquatic and Ocean Resources that about 400 to 500 tons of fish perish due to lack of capacity. So, ensure that these all these areas are converted so that we could earn foreign exchange at this fairly decisive time. So, Hon. Minister, you have a big role to play with regard to both the Port and the Airport. You can bring them into Sri Lanka by sea and take them out by air. So, all these can be converted, if you adopt a forward-thinking approach.

All we could basically do is give you ideas and those must be crystalized soon because this type of situation would not last for the next two, three or four years. So, seize the opportunity.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please shorten your clarification.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, this is also important. You allowed 15 minutes to answer a very good point relating to Question No. 9.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Please proceed with the stipulated -

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
So, allow it for the Opposition as well when we try to ensure that these are looked into. I mean, we do not lose any time on this.

So, I appreciate the precise Answer the Hon. Minister gave. That is why I thought I would add on a question, which would help you, Hon. Minister, to ensure that your portfolio is brought to more fruition in the future.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
Hon. Ravi Karunanayake, thank you so much for your comments. We are revisiting the existing Master Plan of the Bandaranaike International Airport and are considering all possibilities to increase its capacity.

And with regard to the second point you have raised, we have already started a round of discussions with several airlines to get more scheduled flights to Sri Lanka, exploiting the current situation in the Middle East.

Thank you so much.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Minister the most important thing is - *[Interruption.]*

ගරු ටී.බී. සරත් මහතා
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
ගරු කථානායකතුමනි, මට පොඩි වේලාවක් ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ටී.බී. සරත් නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම කෘෂිකාර්මික දිස්ත්‍රික්කවල මේ මොහොතේ පැන නැඟිලා තිබෙන විශේෂ ප්‍රශ්නයක් මම මේ ගරු සභාවේ අවධානයට යොමු කරනවා. 48CC මෝටර් සයිකල් වර්ගය ලියාපදිංචි කරලා නැති නිසා ඒගොල්ලන්ට ඉන්ධන පිරවුම්හල්වලින් තෙල් නිකුත් කරන්නේ නැහැ. විශේෂයෙන්ම මෙම මෝටර්සයිකලය ගොවි ජනතාව අතර වැඩියෙන්ම භාවිත වන මෝටර්සයිකලයක් නිසා, ඒවාට ඉන්ධන ලබා ගැනීම සඳහා ක්‍රමයක් සකස් කරන ලෙස ගෞරවනීය සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපට පුළුවන් ඒ chassis number එකෙන් QR code එක හදලා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 2.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය. "

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු, න්‍යාය පත්‍රයේ විෂය අංක 1, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග අනුමත කිරීම සඳහා ඉදිරිපත් කිරීම.

ගරු සභානායකතුමා.

## කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත: නියෝග
## கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழுச் சட்டம்: ஒழுங்குவிதிகள்
## COLOMBO PORT CITY ECONOMIC COMMISSION ACT: REGULATIONS

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
Sir, on behalf of the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education, I move,

> "That the Regulations made by the Minister of Finance, Planning and Economic Development in consultation with the Colombo Port City Economic Commission and relevant Regulatory Authorities under Section 71 of the Colombo Port City Economic Commission Act, No. 11 of 2021 and published in Gazette Extraordinary No. 2469/02 of 29th December, 2025, which were presented on 03.03.2026, be approved.
>
> (Cabinet approval signified.)"

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, Standing Order No. 118.(3) හි පැහැදිලිව සඳහන්ව තිබෙනවා, Ethics and Privileges Committee එකට complaint එකක් submit කළොත්, within two weeks, final report එක ඔබතුමාට දෙන්න ඕනෑ කියලා. ගරු කථානායකතුමනි, මීට අවුරුද්දකට කලින් දාපු එකක් අදත් දාලා, ඒ කියන්නේ ඒ පුද්ගලයා ගෙන්වලා අදත් cancel කරනවා. ගිය මාසයේත් cancel කළා. ඊට කලින් මාසයේත් cancel කළා. අර සුදත්ත කියන, යූටියුබ් නාළිකාවක් කරන කෙනා මට කුණුහරුපයෙන් බැණපු එක ගැන තමයි මේ inquiry එක තිබෙන්නේ. දැන් one year has passed, Sir.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මම ඒ සම්බන්ධයෙන් සොයා බලන්නම්.

The Hon. (Dr.) Anil Jayantha to start the Debate. You have 14 minutes.

[පූ.භා. 11.17]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, අද දින පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන මේ සංශෝධන 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනතේ 71(2) (අ) වගන්තියට අනුව වරාය නගරය තුළ ගොඩනැඟිලි සහ ව්‍යුහයන්, ඒ ලක්ෂණ නියාමනය කිරීම සඳහා 2023 ජූනි 2වැනි දින, 2023 අංක 1 දරන කොළඹ වරාය නගරය සංවර්ධන රෙගුලාසි පනතින් ප්‍රකාශයට පත් කර තිබුණා. ඒ පළමුවැනි සංශෝධනය සිද්ධ වෙලා තිබෙන්නේ 2023 නොවැම්බර් මාසයේ. දැන් අපි පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා එහි දෙවැනි සංශෝධනය ඉදිරිපත් කරනවා. විශේෂයෙන්ම මෙහිදී සිදු වන්නේ මේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සහ ආයෝජන පහසුකම් සැපයීම. විශේෂයෙන්ම ආයෝජන කැඳවීමේදී ගන්නා වූ විවිධ ක්‍රියාමාර්ග අතර, අභිමතාර්ථය පරිදි ගන්නා සමහර තීන්දු පුද්ගලයා අනුව, රට අනුව, ආයෝජන ප්‍රමාණය අනුව, විවිධාකාර ගැටලු ගණනාවක් අතීතයේ තිබිලා තිබෙනවා. නමුත්, දැන් අපි ක්‍රමයෙන් මේ ආයෝජන දිරිමත් කිරීම සඳහා රීති පාදක - rule-based - ක්‍රම අනුගමනය කරනවා, කිසිම පාර්ශ්වයකට විශේෂයෙන් සැලකීමක් දක්වන්නේත් නැති, යම් පාර්ශ්ව පිටුදකින්නේත් නැති ආකාරයට. ඒකට හේතුව තමයි, අපි මේ රට බාර ගත්තාට පස්සේ තිබෙන අභියෝග ගණනාවක් ඇතුළේ ඒවාට මුහුණ දෙන්න අවශ්‍ය කරන ප්‍රධානම ක්ෂේත්‍රයක් විධියට මේ රටට තිරසාර, සියල්ල සම්බන්ධ වෙච්ච මධ්‍ය කාලීන සහ දිගු කාලීන ආර්ථික වර්ධනයක් අත්පත් කර ගත යුතුව තිබීමයි.

අපේ ගියවර අය වැය කථාවේදී ඒ සියයට 7කට වැඩි ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීම සඳහා වූ ස්ථාවර අඩිතාලමක් රට තුළ දමා තිබෙනවා. එතැනින් ඉදිරියට යෑම සඳහා වූ ආයෝජන කැඳවීම තමයි මෙහි අරමුණ වන්නේ. ඒ අනුව, මේ දෙවන සංශෝධනයෙන් ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් ඉදිරිපත් කරනවා. එකක් තමයි, භූමි පරිහරණ ව්‍යාප්තිය. දැනට සිදු කර තිබෙන ප්‍රමාණයට වෙනස් නොවන ආකාරයට, හැබැයි ආයෝජකයන්ගේ ඉල්ලීම්, අවශ්‍යතා, ඒ වාගේම නව තත්ත්වයන් වෙනස් වීම සැලකිල්ලට භාජන කර, ආයෝජන කොමිෂන් සභාවට මේ කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඔවුන්ගේ 60වන කොමිෂන් සභාවෙන් මේ යෝජනා අනුමත කර කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව කැබිනට් මණ්ඩලයෙන් ඒවා අනුමත කර තිබෙනවා.

ඒවායින් කිහිපයක් මම ඉදිරිපත් කරන්නම්. (1)වන සංශෝධනය අනුව 47 වන නියෝගය යටතේ පොදු පහසුකම් පිළිබඳව වෙන් කර තිබුණු භූමි ප්‍රමාණයේ යම් ගැළපීම් ප්‍රමාණයක් සිද්ධ කරනවා, ඒ පහසුකම් වැඩිදියුණු කර ගැනීම සඳහා. ඒ වාගේම සංස්කෘතික සහ සෞඛ්‍ය කියන කාණ්ඩ දෙක එක ක්ෂේත්‍රයක තිබුණේ. ඒක කොටස් දෙකකට වෙන් කර වෙන වෙනම කටයුතු කර ගැනීමේ පහසුව සලසා තිබෙනවා. පොදු උපයෝගී සේවා පිළිබඳව සාකච්ඡා කරනවා. ඒ වාගේම විවෘත අවකාශ - උද්‍යාන හා චතුරශ්‍ර -, වෙරළ සම්බන්ධ කරගත් කොටස්, පොදු වීදි, පොදු ප්‍රවාහන පහසුකම් පිළිබඳවත් සාකච්ඡා කරනවා. ඒවාට අදාළ පරාමිතීන්, ඒ වැඩකටයුත්ත කරන්න ඕනෑ කොහොමද කියන එක ගැන (2)වන සංශෝධනයේ 48 වන නියෝගය යටතේ සඳහන් වෙනවා.

ඒ වාගේම මේ සංශෝධන යම් කොන්දේසිවලට යටත් කර තිබෙනවා. ප්‍රධාන වශයෙන් දළ ගෙබිම් ප්‍රමාණයේ සමස්තය වෙනස් වන්නේ නැහැ. ඒ සමස්තය ඇතුළේ කරන වෙනස් කිරීම් පමණයි කළ යුතු වන්නේ. ඒ වාගේම ඉදිරිපත් කරන සැලසුම් ප්‍රමාණය, ඒ ඒ ආයෝජකයන්ගේ සැලසුම්, ඒ ව්‍යාපාරයට එමඟින් ප්‍රතිලාභ ලැබෙන්නේ කොහොමද කියලා සැලසුම් සාධාරණීකරණයක් ඉදිරිපත් කරන්නට ඕනෑ. ඒ වාගේම මේ සැලසුම් නිසා වාහන ගමනාගමනයට, අභ්‍යන්තර සංසරණයට බාධා ඇති නොවන්නට ඕනෑ. ඒ වාගේම අලුතින් ඇති කරන තත්ත්වය නිසා නව උපයෝගීතාවන් වැඩි නොවන බවටත් සහතික වන්නට ඕනෑ. ඒ තත්ත්වයන් සැලකිල්ලට භාජන කර භූමි පරිහරණය සහ සේවා භාවිතය පිළිබඳ න්‍යාසයක් - matrix එකක් - ඉදිරිපත් කර තිබෙනවා. එහිදී භූමි පරිහරණය සඳහා මෙන්න මේ කොටස්වලට ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ නිර්ණායක ඉදිරිපත් කරනවා. ඒ කියන්නේ නේවාසික ආයෝජන සම්බන්ධයෙන්, සිල්ලර වෙළෙඳ කටයුතු සඳහා ඒ සීමාව සියයට 5 දක්වා අඩු කර තිබෙනවා. කාර්යාල පවත්වාගෙන යෑම, සේවා, අධ්‍යාපන, සෞඛ්‍ය, ප්‍රජා කටයුතු, සමාජ හා සංස්කෘතික කටයුතු, විවෘත හා විනෝද කටයුතු, ක්‍රීඩා හා විනෝද කටයුතු, ප්‍රවාහන යනාදී වශයෙන් ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ මේ සඳහා අපි සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. ආයෝජන කැඳවීම සඳහා මේ සංශෝධන ඉතාම දිරිගන්වනසුලුයි, අවශ්‍යයි කියලා අපි හිතනවා.

ඒත් එක්කම මේ කාරණයත් මෙතැනට සම්බන්ධ කරගන්න මම කැමැතියි. මේ දිරිගැන්වීම් එක්ක ආයෝජකයන් පැමිණීමේදී ඔවුන් බලන අනෙකුත් කාරණාවලට අමතරව ලෝක පරිමාණයෙන් ගත්තත් ආයෝජකයාගේ විශ්වාසය - investor confidence, ආයෝජනවල විශ්වාසය ඉතාම වැදගත්. එය ස්ථාපිත කරන්නට අවශ්‍ය කරනවා. මේ ආයෝජන පිළිබඳව අතීත භාවිතය තුළ විශ්වාසය කැඩුණු තැන් ගණනාවක් තිබෙනවා. ඒ වෙනුවට දැන් ඒ විශ්වාසය ගොඩනඟන්න අපි උත්සාහ කර තිබෙනවා. ඒ අවස්ථාවලදී විශේෂයෙන්ම එමිරේට්ස්, එටිසලාට් වැනි ආයතනවල අර අභිමතාර්ථය මදි නිසා, සමහර තැන්වලදී එවැනි තීන්දු අරගෙන ඒ ආයෝජන අධෛර්යවත් වුණා. ඔවුන් ආයෝජන හකුළාගෙන ගියා. ඒ නිසා අපි අලුතින් ඉදිරිපත් කරන මේ සංශෝධනවලට අමතරව ආයෝජන විශ්වාසය ගොඩනඟා ගැනීමේදී නීතිමය රාමුව ඉතාම වැදගත් වෙනවා. ඒ නීතිමය රාමුව ශක්තිමත් කරන්න අපි විවිධ වූ වැඩසටහන්, කටයුතු ගණනාවක් කර තිබෙනවා. ගිය වර්ෂයේදීත් ආයෝජනයට සම්බන්ධ නීති-රීති විශාල ප්‍රමාණයක් අපි ඉදිරිපත් කළා.

සමහර අවස්ථාවලදී අපට ප්‍රශ්න කරනවා, පනත් සම්මත කළේ නැහැ කියලා. සමහර නීති, අණ පනත් ලියවිල්ලක තිබුණාට වැඩක් නැහැ කියන එක අපි දන්නවා. ඒවාට පණ දෙන්නට ඕනෑ. ඒවා ක්‍රියාත්මක කරන්න මැදිහත් වෙන්නට ඕනෑ. ඒ සඳහා වූ දේශපාලන වුවමනාවක් - political will එකක් - අවශ්‍ය කරනවා. අපි මේ සම්මත කරන හැම පනතකදීම ඒ දේශපාලන වුවමනාවත් එකතු කරලා, ඒ නීතිවලට පණ ලබා දෙනවා. පසුගිය දවසක අපි විවාදයට ලක් කළා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත. එහි ස්වාධීනත්වය සඳහා 2023 පනතට; ඒ ලියවිල්ලට අලුතෙන් නව පණක් එකතු කර තිබෙනවා. ඒ වාගේම මේ ආයෝජනවලට සම්බන්ධ, ඉදිරියේදී ඉදිරිපත් වෙන්න තිබෙන පනත් ගණනාවක් පිළිබඳව මම කරුණු ඉදිරිපත් කරන්න කැමැතියි.

Public-Private Partnership Act එකත් විශේෂයෙන් සාකච්ඡාවට බඳුන් වෙච්ච එකක්. ඒක අපට මේ අවුරුද්දේ අප්‍රේල්, මැයි වෙනකොට ගෙනෙන්න පුළුවන්කම තිබෙනවා. ඒ සඳහා අදාළ වැඩ කටයුතු සිද්ධ කරමින් තිබෙනවා. ඒවා අවසාන අදියරේ තිබෙන්නේ. ඒ වාගේම Investment Protection Act එක පිළිබඳවත් නිරන්තරයෙන් කථා කළා. විවිධ ආයතන අදහස් ඉදිරිපත් කළා. "කෝ, මේක තවමත් නැහැ" කියලා කිව්වා. ඒකත් අවසාන වෙලා දැන් නීති කෙටුම්පත් අංශයට ඉදිරිපත් වෙලා

තිබෙනවා. මේ වර්ෂය තුළදී එම Investment Protection Act එකත් ගෙනෙනවා. ඒ අනුව යම් ආයෝජකයෙකු ආයෝජන ගෙනාවාම ඔහුට ඔහුගේ ලාභය, ඒ අදාළ දේ නැවත සුරක්ෂිතභාවයෙන් ගෙන යන්න පුළුවන් වන ආකාරයට එය නිශ්චිත රීති යටතේ ඉදිරිපත් කරනවා. ඒ වාගේම රාජ්‍ය මැදිහත් වෙනවා නම්, ඒ මැදිහත් වෙන්නේ කුමන තත්ත්වයන් යටතේද, කුමන ක්‍රමවේද යටතේද, වන්දි ගෙවන්නේ මොන ආකාරයටද කියන කරුණු කාරණාත් Investment Protection Act එක යටතේ ඉදිරිපත් වෙනවා. ඒ වාගේම තමයි අයෝජන ප්‍රවර්ධනය සඳහා වන Investment Promotion Act එක. අපි දන්නවා, BoI එක හරහා යම් කෙටුම්පතක් ඉදිරිපත් වෙලා තිබුණා. අපේ ආණ්ඩුව බලයට ආවාට පසුව එයට යම් සංශෝධන ප්‍රමාණයක් ගෙනැල්ලා, අයෝජන ප්‍රවර්ධනය කිරීමේ කොටස විධිමත් කිරීමට සහ සවිබලගැන්වීමට නීති රීති හදමින්, ගෙනෙන ලද ආයෝජන කළමනාකරණය කිරීම වෙනත් ආකාරයකට සිදු කිරීමට පනත් කෙටුම්පත් ඉදිරිපත් කරලා තිබෙනවා.

මේ ආයෝජනවලට සම්බන්ධ වන, විවාදයට තුඩු දුන්, කථාබහට ලක් වුණු කාරණයක් තමයි රාජ්‍ය ව්‍යවසායයන් - State-owned enterprises - පිළිබඳ තත්ත්වය. ඒ පිළිබඳවත් පනත් කෙටුම්පතට අලුතෙන් සංශෝධන ගණනාවක් ඉදිරිපත් කරනවා. එහි විශේෂත්වය තමයි ඔවුන්ගේ - State-owned enterprisesවල - මැදිහත් වීම තුළ විශේෂයෙන්ම වෙළෙඳ පොළ තුළ සිදු වන විකෘති තත්ත්වයන් පිළිබඳව අවධානය යොමු කිරීම. වෙළෙඳ පොළ බලය අනවශ්‍ය ලෙස එක්කෙනෙක් දෙන්නෙක් පාවිච්චි කිරීම වෙනුවට, වඩාත් කාර්යක්ෂම විධියට වෙළෙඳ පොළ ක්‍රියාත්මක වන්නේ කොහොමද කියන කාරණය පිළිබඳවත් අවධානය යොමු කරමින්, State-owned enterprisesවල තීන්දු තීරණ ගැනීම සම්බන්ධයෙන් ඔවුන්ට ස්වාධීනත්වය ලබා දෙන ආකාරයට මේ සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අනුව එන එක්තරා වැදගත් සංශෝධනයක් ඉදිරියේදී අපි මේ පනතට ඉදිරිපත් කරනවා. අපි මේ තෝරා ගනු ලබන වාණිජ ස්වරූපයේ ආයතන එක umbrella එකක්; එක ක්ෂේත්‍රයක් යටතට ගෙනැල්ලා, හෝල්ඩින්ග් කොම්පැනියක් විධියට පවත්වාගෙන යන්නත් අපි බලාපොරොත්තු වෙනවා. මේ ආයෝජනත් එක්ක මේවා එකකට එකක් ගැටගැහිලා තිබෙනවා.

ඒ වාගේම තමයි, ආයෝජකයන් බුන්වත්භාවයෙන් ආරක්ෂා කර ගැනීම සිදු කරනවා. ව්‍යාපාරයක් බිඳ වැටුණාට පස්සේ ගොඩ ගන්න අමාරුයි. ඒ නිසා ව්‍යාපාරය බිඳ වැටෙන්න කලින් ඔවුන්ට මඟ පෙන්වීම සඳහා ඉදිරියේදී අපි Insolvency Act එක ඉදිරිපත් කරනවා. මෙවැනි සංශෝධන ගණනාවක් ඉදිරියේදී එනවා. ඒ වාගේම තමයි, Prevention of Money Laundering Act, Financial Transactions Reporting Act, Suppression of Terrorist Financing Act කියන සියල්ලටම අපි සංශෝධන ඉදිරිපත් කරනවා. ඒ වාගේම මේ මැයි මාසයේදී සිදු වෙන්න නියමිත "Anti-Money Laundering and Countering the Financing of Terrorism" කියන රාමුව - framework එක - ඇතුළේ අපි වැඩ කටයුතු කරමින් ඉන්නවා. ඉදිරියේ දී එය ඇගයීමකට ලක් වෙනවා.

ඊළඟට, ආයෝජකයන්ගේ විශ්වාසය සම්බන්ධයෙන් තවත් වැදගත් තොරතුරු කිහිපයක් හෙළිදරව් කරන්න මම කැමැතියි. අපි කවුරුත් දන්නවා, රට ස්ථාවරත්වයෙන් ඔබ්බට ගෙන යන්න මේ ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම අපට ඉතාම අවශ්‍ය වුණු බව. අපි ස්වෛරී බැඳුම්කර නිසි පරිදි ප්‍රතිව්‍යුහගතකරණය කළා. එහි ප්‍රතිඵලයක් විධියට, ණය ශ්‍රේණිගත කිරීම්වල අපිව යටටම දමලා තිබුණත්, 2025 වසරේදී CCC + කියන මට්ටමට උඩට ගෙන එන්න අපට පුළුවන් වුණා.

එහෙත් යම් බාධකයක් පැන නැඟී තිබෙනවා, SriLankan Airlines එකෙන් නිකුත් කරලා, මහා භාණ්ඩාගාරය විසින් ඇප වී තිබුණු ඩොලර් මිලියන 175ක බැඳුම්කරය සම්බන්ධයෙන්. අපට ඒ වැඩ කටයුත්ත ප්‍රතිව්‍යුහගත කර ගන්න අපහසු වෙලා තිබුණා. මොකද, ඒක වෙනමම තමයි ප්‍රතිව්‍යුහගත කළේ. මම සන්තෝෂයෙන් කියන්න කැමැතියි, අද මුදල් අමාත්‍යාංශයත්, ශ්‍රීලන්කන් ගුවන් සමාගමත් අතර එකඟතාව මත මේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමට ඒ ණය හිමිකරුවන් එකඟතාව ප්‍රකාශ කර තිබෙන බව. ඒ, සමස්ත වටිනාකමින් සියයට 99ක් සඳහා. ඒ වාගේම ණය සැපයුම්කරුවන්ගෙන් සියයට 97ක් ඔවුන්ගේ එකඟතාව ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒ පුවත් පත් නිවේදනය අද ඉදිරිපත් කරන්න නියමිතයි.

ඒ වාගේම අපේ ස්වෛරී බැඳුම්කරවල තත්ත්වය ගත්තොත්, ද්විතියික වෙළෙඳ පොළේ ඒවා විකිණුනේ ඉතාම අඩු මිලට. දැන් ඒ විකිණීම් වැඩි මිලට ගිහිල්ලා එළදාවත්, coupon rate එකත් අතර යම් සමපාතයකට ළං වෙලා තිබෙනවා; ස්ථාවරත්වය තවත් ඉදිරියට පෙන්වමින් තිබෙනවා. මේ නිසා අපි දැඩිව විශ්වාස කරනවා, අද මේ ඉදිරිපත් කරන සංශෝධනත්, මේ ඇති වෙලා තිබෙන තත්ත්වයත් එක්ක ආයෝජකයින්ගේ විශ්වාසය වැඩි වෙලා ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම මේ අවුරුද්ද ඇතුළතදී විශාල ප්‍රමාණයකින් ඉහළට එසවේවි කියලා. ඒ වාගේම මේ ප්‍රතිව්‍යුහගතකරණය ඇතුළේ අපට තවත් කාරණයක් සිද්ධ කර ගන්න පුළුවන් වුණා. ලෝකයේ පළමු වතාවට තමයි, යහපත් ආණ්ඩුකරණය සම්බන්ධ කරලා බැඳුම්කරයක් - governance-linked bond එකක් - ඉදිරිපත් කළේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තමන්ගේ ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන ඇතුළේ විවිධ වූ දේවල් ඉදිරිපත් කරනවා. හැබැයි, බොහෝ රටවල් මේ governance, යහපත් ආණ්ඩුකරණය හා බැඳුණු ඒ ප්‍රතිසංස්කරණවලට කැමැති වන්නේ නැහැ. නමුත් අපට පුළුවන්කම ලැබුණා, පළමු වතාවට ඒ යහපත් ආණ්ඩුකරණය පිළිබඳව ගැට ගැසුණු බැඳුම්කර ඉදිරිපත් කරන්න. ඒ අනුව අපේ යහපත් ආණ්ඩුකරණය පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉදිරිපත් කරන ලද ප්‍රාථමික ප්‍රධාන නිර්ණායක 16ම අපි ඉෂ්ට කරලා තිබෙනවා. ඒ අනුව අපට පුළුවන් වුණා, ඒ නිර්ණායකවල ප්‍රතිඵලයක් විධියට ඩොලර් මිලියන 70ක විතර ප්‍රමාණයක වාසියක් අත්පත් කර ගන්න. ඒක ඓතිහාසික තත්ත්වයක්. ඒ වාගේම ඔවුන් ඉදිරිපත් කරලා තිබෙන ආනුෂංගික නිර්ණායකවලිනුත් සියයට 50ක් විතර අපි සම්පූර්ණ කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම මේ පැහැදිලි කළේ අද මේ ඉදිරිපත් කරන සංශෝධනවලින් කොළඹ වරාය නගරයට නව ආයෝජන කැන්දවීමට යම් ආකාරයකින් පහසුකම් සැපයීමත්, එය තවදුරටත් ඉදිරියට ප්‍රවර්ධනය කරගෙන යැමත් සහ ආයෝජන පරිසරය සවිමත් කරන්නේ කෙසේද කියන කාරණය පිළිබඳව සහ ඒ සඳහා ආණ්ඩුව ගත් ක්‍රියාකාරකම් පිළිබඳවයි. මෙය ඉතාම වැදගත් වන්නේ ඇයි? මෙය වැදගත් වන්නේ 2025 වර්ෂයේදී ඉතාම දුෂ්කර කොන්දේසි යටතේ අපි අත්පත් කර ගත් ආර්ථික ස්ථාවරත්වය නිසායි. නමුත් රට තුළ අපට පාලනය කරන්න බැරි බාහිර සාධකයක් වන යුද තත්ත්වය නිසා ඇති වෙච්ච තෙල් සැපයුම, තෙල් ප්‍රවාහනය පිළිබඳව ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙනවා. ඒකත් අපි කළමනාකරණය කරමින් ඉන්නවා. හැබැයි, මේ රට ගැන හිතන්නේ නැතුව, සමස්තය ගැන හිතන්නේ නැතුව සමහර බලවේග විසින් එය පෙන්වන්න හදනවා, රට ඇතුළේ අර්බුදයක් - crisis එකක් - තිබෙනවා කියලා. නමුත් එවැනි අර්බුදයක් රට ඇතුළේ නැහැ. බාහිරව ඇති වෙච්ච සාධකයක් විසින් රට ඇතුළට යම් බලපෑමක් සිද්ධ වෙමින් තිබෙනවා. රටක් ඇතුළේ අර්බුදයක් ඇති වෙන්න නම්, ආණ්ඩුවට මුදල් එකතු කර ගන්න බැරි වෙන්න ඕනෑ. ආණ්ඩුවේ ආදායම් අහිමි වෙන්න ඕනෑ.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

වියදම් කර ගන්න මුදල් නැති වෙන්න ඕනෑ. නමුත් අද අපි ඉතාම ස්ථාවර විධියට රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සිද්ධ කරලා තිබෙනවා. රාජ්‍ය මූල්‍ය විනය පෙන්වා තිබෙනවා. කිසිදු දේශීය අර්බුදයක් රට ඇතුළේ නිර්මාණය වෙලා නැහැ. ඒ වාගේම අය වැය පරතරය ඉතාම පහළට ගේන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මම මේ දේවල් කියන්න උත්සාහ කළේ, සමහර පිරිස් අර්බුදයක් මවාපාන්න උත්සාහ කරන නිසායි.

2022/2023 කාලයේදී ඒ අර්බුද පැන නැඟුණේ ඓතිහාසික තත්ත්වයන්, වැරදි දේශපාලනය, වංචාව, දූෂණය නිසායි. ඒකට සම කරන්න උත්සාහ කරනවා, දැන් පවතින තෙල් පෝලිම්. එදා තෙල් පෝලිම් හැදුණේ ඒ කාලයේදී ඇති වූ ගැටලුවක් නිසා; වැරදි පාලනයක් නිසා. අද තෙල් පෝලිමක් යම් ආකාරයකට නිර්මාණය වන්නේ සැපයුම්දාමයේ පවතින ගැටලුවක් නිසායි. ඒ නිසා මේ දෙක ආකාර දෙකක්. දැන් කිසිදු ආකාරයක අර්බුදයක් රට ඇතුළේ නැහැ. හැබැයි අපි පිළිගන්න ඕනෑ, ජාත්‍යන්තර වශයෙන් පැන නැඟුණු තත්ත්වයේදී යම් බලපෑමක් ලංකාවට සිද්ධ වනවා කියන කාරණය. ඒ බලපෑම සම්බන්ධයෙනුත් අපි නිතිපතා විමර්ශනය කරමින්, එකතු වෙමින්, තොරතුරු එක්රැස් කරමින් තීන්දු තීරණ ගන්නවා. ඒ නිසා මහජනතාවට අපි කියන්නේ කිසිදු ආකාරයක බයක් සැකක් ඇති කර ගන්න එපා, මේ අර්බුදයට අපි සාමූහිකව මුහුණ දෙමු කියන එකයි. ආණ්ඩුව ඒ වගකීම නිසියාකාරයෙන්ම ඉෂ්ට කරනවා. අපි මේ අත්පත් කරගත් ස්ථාවරත්වයෙන් ඔබ්බට ගිහිල්ලා ඔබගේ අරමුණු වෙනුවෙන් මැදිහත් වනවා කියන කාරණයත් මතක් කරමින් මගේ අදහස් දැක්වීම අවසාන කරනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. Leader of the Opposition Sajith Premadasa. You have 10 minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[පූ.භා. 11.32]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෙර කථා කළ, රජය නියෝජනය කරපු අමාත්‍යවරයා පෙන්නුම් කරලා දුන්නා, රටේ කිසිම අර්බුදයක් නැහැ කියලා. ඇත්තවශයෙන්ම ආයෝජනයට හිතකර පරිසරයක් නිර්මාණය කරන්නට නම් අඛණ්ඩව විදුලිය ලබා දීම ඉෂ්ට සිද්ධ විය යුතු දෙයක්. අද මේ මොහොත වන විට නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය මුල් කරගෙන බරපතළ ජාතික අර්බුදයක් ඇති වෙලා තිබෙනවා.

මම ගරු අමාත්‍යවරයාට යම් කාරණයක් මතක් කරලා දෙන්න කැමැතියි. විශේෂයෙන්ම අපි 12වැනි දා ගත්තොත්, මෙගාවොට් 51ක් අඩුවෙන් තමයි විදුලිය උත්පාදනය කළේ. 13වැනි දා මෙගාවොට් 130ක් අඩුවෙන්, 14වැනි දා මෙගාවොට් 135ක් අඩුවෙන්, 15වැනි දා මෙගාවොට් 132ක් අඩුවෙන්, 16වැනි දා මෙගාවොට් 148ක් අඩුවෙන්, 17වැනි දා මෙගාවොට් 165ක් අඩුවෙන්, ඊයේ දවසේ මෙගාවොට් 176ක් අඩුවෙන් තමයි විදුලිය නිෂ්පාදනය කළේ. ඒ තමයි ගල් අඟුරු බලාගාරයේ විදුලි උත්පාදන හිඟය. ඉතින්, අර්බුදයක් නැහැයි කියන්න බැහැ. ගල් අඟුරු අර්බුදය; බාල ගල් අඟුරු යෙදවීම ඇත්තවශයෙන්ම විදේශ බලප්‍රදේශවල ක්‍රියාත්මක වන යුද්මය තත්ත්වය නිසා නිර්මාණය වුණු දෙයක් නොවෙයි. නමුත්, අද වන විට ඉතාම භයංකර තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. මොකද, බාල ගල් අඟුරු යෙදවීම තුළ පියාසර අළු - fly ash - සහ තැන්පත් අළු - bottom ash - වෙනදාට වඩා වැඩි ප්‍රමාණයක් නිපදවමින් පවතිනවා. මේ නිසා අළු කළමනාකරණ උපකරණවලට අධික බරක් පැටවිලා තිබෙනවා. විශේෂයෙන්ම ඊයේ දිනයේ පමණක් මේ ගල් අඟුරු බලාගාරයේ පද්ධතිවල හත්, අට වතාවක් අවහිර වීම් සිදු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ගල් අඟුරු ඇතුළු කිරීමේ වේගය අඩු වෙලා, විදුලිය ජනනය අඩු වෙලා, මේ මොහොත වන විට ගල් අඟුරුවල Gross Calorific Value එක පමණක් නොවෙයි, අළු අන්තර්ගතය ඉහළ යෑම, ඒ කියන්නේ වෙනදාට දිනකට මෙට්‍රික් ටොන් 700ත්, 900ත් අතර ප්‍රමාණයක් බැහැර වන අළු ප්‍රමාණය දැන් මෙට්‍රික් ටොන් 1,500ක්, 1,800ක් අතර ප්‍රමාණයකින් -දෙගුණයකින්- වැඩි වෙලා තිබෙන බව මේ අවස්ථාවේ මම කියන්න කැමැතියි. Cotecna සහ Mitra ආයතනවලින් ලබා දුන් වාර්තා අසත්‍ය වාර්තා, ගොතපු වාර්තා කියන එක මෙයින් ඉතාම පැහැදිලි වනවා.

බරපතළම ප්‍රශ්නය එන්නේ එළඹෙන අලුත් අවුරුදු සමයේ. මේ සිමෙන්ති සමාගම්, ඒ කියන්නේ පියාසර අළු - fly ash - මිලදී ගන්නා ආයතන අලුත් අවුරුදු සමයේ සති දෙකක් වහනවා. ඒ සති දෙකක කාලය තුළ දිනකට පියාසර අළු මෙට්‍රික් ටොන් 1,800ක් බැහැර වනවා. මේවා යවන්න සිද්ධ වනවා, අළු කන්දට. අවුරුදු ගණනාවක් මුළුල්ලේ අළු කන්දේ අළු තැන්පත් කරවීම බැහැර කරලා තිබෙනවා, පරිසර හේතු මත. නමුත් මේ තත්ත්වය නිසා බරපතළ පරිසර ව්‍යසනයක් නිර්මාණය වනවා. ඒ වාගේම පියාසර අළුවල - fly ashවල - මයික්‍රෝන් 10, මයික්‍රෝන් 2.5 ඉහළ සාන්ද්‍රණයකින් සමන්විත කුඩා අංශු තිබෙනවා. මෙයින් සෞඛ්‍යයට යම් බලපෑමක් ඇති වනවා. වැඩිහිටියන්ට, දරුවන්ට, කාන්තාවන්ට, විශේෂයෙන්ම ගර්භිණී මවුවරුන්ට බරපතළ සෞඛ්‍ය තර්ජනයක් මේ තුළින් නිර්මාණය වනවා. ඒ වාගේම හුස්ම ගැනීමේ අපහසුතා, චර්ම රෝග, හෘදයාබාධ, වකුගඩු ආබාධ පවා මේ තුළින් ඇති වෙන්න පුළුවන්. මයික්‍රෝන් 2.5 කියන්නේ, carcinogen එකක්. ඒ කියන්නේ, පිළිකා කාරකයක්. විශේෂයෙන් ඉදිරි වැහි සමයේදී සියුම්භාවයෙන් යුතු carcinogen පුළුල් භූමි ප්‍රදේශයක ව්‍යාප්ත වීමේ ගැටලුව තිබෙනවා. ඒ තුළින් සෞඛ්‍ය ප්‍රශ්න නිර්මාණය වනවා, පරිසර ප්‍රශ්න නිර්මාණය වනවා. තවත් පැත්තකින් කෘෂි කර්මාන්තයේ ඵලදායිතාවට මේක බලපානවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ බාල ගල් අඟුරු භාවිතය තුළ අපේ රටේ විදුලිය උත්පාදනයේ බරපතළ ගැටලුවක් නිර්මාණය වී හමාරයි.

අඛණ්ඩව විදුලිය සැපයීමේ වැඩ පිළිවෙළට බාල අඟුරු ප්‍රශ්නය සෘජුවම බලපානවා සේම අද වනකොට මැද පෙරදිග

පවතින යුද්ධමය තත්ත්වය නිසාත් මේ ප්‍රශ්නය උග්‍ර අතට හැරෙන්නට බොහෝ දුරට ඉඩකඩ තිබෙනවා. මහජන උපයෝගිතා කොමිසම පැහැදිලිවම කියනවා, මේ බලාගාර නඩත්තු කිරීම නිසා සමහර වෙලාවට අප්‍රේල්, ජූනි සහ ජූලි මාසවල විදුලි කප්පාදුවකට යන්න සිද්ධ වෙයි කියලා. ඇත්තවශයෙන්ම ඒකට හේතුව තමයි බාල ගල් අඟුරු භාවිතය තුළ විශේෂයෙන්ම පිටත පාවිච්චිය සඳහා අවශ්‍ය මෙගාවොට් 810 ලබා දෙන්නට බැරි වීම. ඒ වාගේම මේ මොහොත වනවිට නිර්මාණය වී තිබෙන අර්බුදය තුළ බරපතළ ප්‍රශ්න රැසක් උද්ගත වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ගොවි ජනතාවට, ධීවර ජනතාවට, පතල් කර්මාන්තයේ යෙදෙන අයට, රාජ්‍ය සේවකයින්ට, වෘත්තීයවේදීන්ට, ත්‍රිරෝද රථ, කුලී රථ වැනි ප්‍රවාහන ක්ෂේත්‍රයේ නියැළෙන අයට, බෙදා හැරීමේ ක්ෂේත්‍රයේ නියැළෙන අයට, කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැළෙන අයට, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට ඉන්ධන හිඟය නිසා අද වනකොට බරපතළ ගැටලු රැසකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. QR code ක්‍රමය හරියාකාරව, නිවැරදිව තවමත් ක්‍රියාත්මක කරන්නට බැහැ. කර්මාන්තශාලාවලට ලබා දෙන furnace oil කප්පාදු කරලා තිබෙනවා.

ඊළඟට, බාල ගල් අඟුරු භාවිතය තුළින් නියමිත ප්‍රමාණයට විදුලිය උත්පාදනය කරන්න බැරි වනකොට පාරිභෝගිකයාට ලබා දෙන ඩීසල්, විදුලිය උත්පාදනයට යොමු කරන්න හදනවා. ඒ වාගේම බාල ගල් අඟුරු භාවිතය නිසා ඇති වූ විදුලිබල අර්බුදය තුළ නිර්මාණය වන පිරිවැය, නිර්මාණය වන අලාභය වැඩි විදුලි බිලක් හරහා හැත්තෑ පන්ලක්ෂයක් පමණ වන විදුලි පාරිභෝගිකයන්ට ලබා දෙන්න පිඹුරුපත් සකස් කරමින් සිටිනවා. වර්තමානයේ උද්ගත වෙලා තිබෙන තත්ත්වය තුළ ගොවියාට සහ ධීවරයාට අත්පත් වන ඉරණම මොකක්ද කියලා මම අහන්න කැමැතියි. ඒ වාගේම කර්මාන්තකරුවන්ට, වෘත්තීයවේදීන්ට, ස්වයං රැකියාලාභීන්ට, ත්‍රිරෝද රථ හිමියන්ට, ප්‍රවාහන ක්ෂේත්‍රයේ නියැළෙන අයට, ව්‍යවසායකයින්ට ලබා දෙන උත්තරය මොකක්ද? මහා භාණ්ඩාගාරය මුදල්වලින් පිරී ඉතිරී යනවාය කියලා කිව්වා නේ. එහෙනම් අපි ඉල්ලීමක් කරනවා, අසහනයට පත් වුණු මේ කොට්ඨාසවලට සහන ලබා දීමේ වැඩසටහනක් කරුණාකරලා ආරම්භ කරන්න කියලා. මේ ආර්ථික අර්බුදය තුළ අනිවාර්යයෙන්ම ඒ අයට සහන ලබා දෙන්න ඕනෑ. ලෝකයේ අනෙකුත් රටවල් ඒ රටවල සිවිල් පුරවැසියන්ට ලබා දීම සඳහා විශේෂිත වූ ආර්ථික පැකේජ නිර්මාණය කරලා තිබෙනවා. මේ මොහොතේ පිරී ඉතිරී යන භාණ්ඩාගාරයේ අරමුදල් උපයෝගී කරගෙන අර්බුදයට ලක් වුණු අපේ රටේ ගොවි, ධීවර, කම්කරු, දුගී දුප්පත්, ග්‍රාමීය සහ නාගරික ජනතාව, වතු ක්ෂේත්‍රයේ, කර්මාන්ත ක්ෂේත්‍රයේ, සේවා ක්ෂේත්‍රයේ, සංචාරක ක්ෂේත්‍රයේ සහ සැපයුම් දාමයේ නියැළෙන අය වෙනුවෙන් කිසිම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා නැහැ.

QR කේත ක්‍රමය අදටත් ක්‍රියාත්මක කරන්න බැරි වෙලා තිබෙනවා. මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්නට බැරි ආණ්ඩුව මේ අර්බුදකාරී තත්ත්වයේදී ජනතාවට සහන සලසන්නේ කොහොමද කියන එක බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා මේ අවස්ථාවේදී අපි ඉතාම වගකීමෙන් අහන්න කැමැතියි, මේ රටේ විදුලි උත්පාදනය පිළිබඳව බරපතළ ගැටලුවක් නිර්මාණය වනකොට ඔබ කථා කරන ආයෝජකයින් අපේ රටට ඒවිද කියලා. ඒ වාගේම අපේ රටට ලැබෙන්න තිබෙන සෘජු විදේශ ආයෝජන අපේ රටට ඒවිද? බාල ගල් අඟුරු නිසා විදුලි බල ක්ෂේත්‍රය තුළ අර්බුදයක් නිර්මාණය වනකොට අපේ රටේ ආයෝජනයට මොකක්ද වෙන්නේ? අපේ රටේ රැකියා උත්පාදනයට මොකක්ද වෙන්නේ? අපේ රටේ නිෂ්පාදන ක්ෂේත්‍රයට මොකක්ද වෙන්නේ? මේ හැම දෙයම එකතු වුණාම, ආදායම් මාර්ග නැති වෙනවා, රැකියා නැති වෙනවා. අද වනකොට කර්මාන්තශාලා වැසී යනවා. මහජනතාව මහ පාරට බහිනවා. ආදායම් මාර්ග නැති වීම තුළින් ඇත්තවශයෙන්ම දුප්පත්කම වර්ධනය වෙනවා. අද මම රජයෙන් ඇහුවා, දුප්පත්කම තුරන් කිරීම සඳහා තිබෙන වැඩසටහන මොකක්ද කියලා. ඒකට උත්තර දෙන්නත් කල් ඉල්ලන ආණ්ඩුවක් තමයි මේ තිබෙන්නේ. ඒවාට උත්තර නැහැ; වැඩ පිළිවෙළක් නැහැ; මාර්ග සිතියමක් නැහැ. මේ අර්බුදකාරී තත්ත්වයෙන් පීඩනයට සහ අසහනයට ලක් වුණු, දුකට, කනගාටුවට, වේදනාවට පත් වුණු මහා පීඩනයකින් ජීවත් වන මේ රටේ ලක්ෂ 220ක් පමණ වන ජනතාවට ලබා දෙන විසඳුම, සහන පැකේජය මොකක්ද කියන එක කාල වකවානු සහිතව රටට ඉදිරිපත් කරන්න කියලා මම යෝජනා කරනවා.

ස්තූතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[11.43 a.m.]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

Hon. Deputy Chairperson of Committees, I always get the opportunity to speak after the Leader of the Opposition. And, it is quite interesting to note that the Leader of the Opposition has, since last year, been dreaming about a situation in which this country would collapse. There were various issues that arose in the world like the Trump's tax issue and a possible war in the Middle East last year and even Cyclone "Ditwah", during which there were predictions by the Opposition that the country would collapse with so many issues taking place, that investors would not come into the country, the factories would close down and people would come onto streets. I would say that that is a dream he could continue to have.

But, what we could say today is that, last year, with all those difficulties, Sri Lanka achieved a 5 per cent growth. Even with Cyclone "Ditwah" that we had to face at the end of last year, Sri Lanka has achieved a strong growth trajectory, and now, we are moving forward to have a better year. Unfortunately, we have a shock coming from the global economy, even if there is no crisis as such in the country. The crisis was what Sri Lanka had in 2022, where we had twin deficits - a trade deficit and a fiscal deficit. Now, we have surpassed all those and have a positive trade balance and a fiscal balance. There is no crisis in Sri Lanka now. There is a war happening in the Middle East, and because of that, we have to face an economic shock, and that, the Government is quite ready to manage.

It is very unfortunate to see the Opposition trying to reduce the confidence of the investors in our country and create a fear among the entrepreneurs. But, I am pretty

[ගරු චතුරංග අබේසිංහ මහතා]

sure that the Sri Lankan entrepreneurs and exporters are very resilient. Even within the past few weeks, they have been talking about issues that could impact our country. I am happy to say that even within the period of this war, that is, during the last two weeks, we did not see any drop in tea exports. Our exporters are resilient. They have figured out various ways of exporting their tea and there has been no problem at tea auctions so far, no reduction in prices, and the exporters are doing well.

Also in remittances, there has not been a drop. But, there is a little bit of adjustment that we have to make in the tourism sector. What I want to emphasize is that, with all these issues that are being discussed, the country's economy is moving resiliently. Even with the issues during the past few days like fuel queues and all these limitations, we are making all the efforts to ensure that industries have the required fuel quotas and that their requirements are met so that manufacturing continues.

And, in terms of the Regulations we are presenting today under the Colombo Port City Economic Commission Act, we need to understand about the asset we have. The Port City now has a great opportunity. As there is a level of risk being applied to the Middle East, we have a great opportunity to attract investments to the Port City at this point. Also, I have to tell you that six months ago, the Opposition started screaming when we reduced or changed the tax benefits of the Port City, that investments would not come. But, I can tell you that it has not been the case. Out of the 245 inquiries, only 13 have declined the new tax structure and everybody else is moving ahead. We are happy to say that, in the Port City, the inquiries for investments have now amounted to US Dollars 4.6 billion. Even with all these cries, there are investors who are looking at Sri Lanka in a very positive way. And, from primary investments, there is about US Dollars 1.4 billion and from secondary investments, there is about US Dollars 600 million that is being attracted to the Port City.

With these Regulations, what we are going to do is make five adjustments. One is the adjustment on land allocation for common services, which is required for power generation. Then, we are going to adjust the allowed maximum height of the buildings. Earlier, it was 180 metres and now, it has been changed to 240 metres. That is again to facilitate investment, and without compromising the land or the risk of the area, we are making that adjustment. And also, there was a minimum retail space required for these investments and now, we are reducing it to 5 per cent so that investors have the opportunity to decide between retail businesses and other uses. This is done after an analysis of Colombo, where there are so many retail shops, to ensure that there is a proper market in the Port City area. And also, there is a slight adjustment to the open spaces, which needed a correction. Then, we are also changing the matrix of the classification of businesses with the culture and health sector being added as a new category. Now, with all these changes, what we are looking for is a positive trajectory towards the Port City and also with these changes, we hope there would be clarity and better investment facilitation.

At the same time, we are seeing is a strong requirement when we go through BoI inquiries. Now, with the new Investment Promotion Act, we are going to make it extremely clear what kind of investments are promoted in Sri Lanka and what kind of tax holidays each of those categories would get. If we take the extension of tax holidays, they could be extended up to ten years based on the investment. Those things had not been cleared over the past decade. That is why investments did not come to Sri Lanka.

At the same time, over and over again, some are now talking about a possible power crisis. But, there is no such risk. We clearly know that mainly our power requirement is met by coal. Yes, we see a tangible reduction in coal-fired power generation on a daily basis, but this is the dry season. In the dry season, power generation is compensated by fossil fuel, that is true; thermal power will come into play, and there is no risk as such.

The Leader of the Opposition was there at the last Meeting of the Committee on Public Finance on invitation and the officials clearly explained that there is no possible risk of a power cut. Unfortunately, now they are making news, using the newspapers aligned to them and fabricating the information that came through the officials to say that a power cut was predicted. Nobody has predicted a power cut. The Ministry of Energy has clearly given their fuel requirement to the CPC and that fuel requirement is not even 10 per cent of the national requirement. So, why are you all crying about it? If there is a shortage of coal, we will supply to the demand with thermal power. The cost will go up, but a continuous supply is what we are driving at. And, there is no reason to predict a power cut. So, that is what this Opposition is doing; they want to ensure that the investors reverse their decisions and that the investors would have doubts about carrying out their day-to-day activities. But, I am happy to say that through the EDB, the BoI and the Ministry of Industry and Entrepreneurship Development, we are talking to each and every investor and manufacture in this country, giving them confidence and working alongside them to come out of this global situation. Whilst we are doing that, what the Opposition does is, they go on TV or use a mike and create fear among people. We clearly see that even the general public is fully aware of this situation and they are not buying into what these few television channels report, clearly saying, "We understand there is a problem and know that the Government is fighting hard and we will work with the Government to get through this". Last year, we had a 5 per cent GDP growth and we are anticipating a 6 per cent plus GDP growth this year. We are also anticipating more investments and more production this year. So, at a time like this, that is what the Opposition is doing.

Also, I am happy to say that this January, we have done extremely well compared to January, last year. The remittances have increased; our exports have increased and that is the trajectory we are on.

I also want to emphasize the national strategy on conserving energy. This is not a strategy to stop anything, but a strategy through which we are trying to preserve energy and see how far we could move without getting disrupted. To that strategy, every individual, every industry has to support and that is how things would go on.

Also, Madam, I want to clearly mention to all our exporters that they can reach out to the BoI. All our FDIs - Foreign Direct Investors - who are operating here can reach out to the BoI and the EDB because the officers are there 24/7 to ensure that they run their businesses without disruption. Then, the CPC is supporting us and by yesterday, the Ministry of Industry and Entrepreneurship Development received from 1,900 various industries their fuel requirements. We have analysed those and given recommendations to the Ceylon Petroleum Corporation so that they would get a quota. They would be informed from which fuel station they could get their fuel quota to continue their operations. The SMEs could send their fuel requirements to the Divisional Secretariat. The circulars will be issued today to ensure that the Divisional Secretariats, with the support of the Grama Niladharis, would look into the fuel requirements of smaller businesses and provide them with fuel.

At the same time, the Ministry of Trade, Commerce, Food Security and Co-operative Development, the Ministry of Fisheries, Aquatic and Ocean Resources, the Ministry of Agriculture, Livestock, Land and Irrigation and also the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism are supporting all these industries. Those industries have a Line Ministry to reach out to and if there are those which are not registered under any Ministry, they can reach out to the Ministry of Industry and Entrepreneurship Development and we are there to support them.

Now, our entire objective is to have a continuous fuel supply. We are very confident that with the intervention of the Minister of Energy, the Hon. President and the Minister of Foreign Affairs, Foreign Employment and Tourism, we could ensure a continuous supply of fuel and electricity. So, those are the two priorities of the country now. And, I hope the public will understand the situation and disregard the misinformation and false predictions that are being made by the Opposition continuously.

Thank you very much.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[පූ.භා. 11.56]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙය, රටට, ලෝකයට ප්‍රශ්නයක් තිබෙන අවස්ථාවක්. නමුත් භූගෝලීය වශයෙන් ලංකාව පිහිටා තිබෙන තැන අනුව අපි මේකෙන් උපරිම වාසි ලබා ගත යුතුයි කියන මතයේ සිටිමින් තමයි මම කථා කරන්නේ. ඇයි මම එහෙම කියන්නේ? මීට පෙර කථා කරපු ඇමතිවරු හිතුවේ, ලංකාවට මෙහෙම ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන්නේ ප්‍රථම වතාවට කියලායි. නමුත්, අපේ රටට නිදහස ලබාගෙන අවුරුදු 78ක කාලය තුළ මෙවැනි ප්‍රශ්න මීට පෙරත් ඇති වෙලා තිබෙනවා. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ ඒ ප්‍රශ්න කොයි ආණ්ඩු කාලවලද තිබුණේ කියන එක නොවෙයි. අපි දැන් ශ්‍රී ලාංකිකයන් වශයෙන් මේ ඇති වී තිබෙන අවස්ථාවේ ආදායම් උපයා ගන්න පුළුවන් විධියට කටයුතු කරන්න අවශ්‍යයි. අනිල් ජයන්ත ඇමතිතුමා පෙන්වා දුන්නා, යම් දිරිගැන්වීම් තුළින් අපි ආයෝජන ගේන්න ඕනෑ කියලා. මීට පෙර ආණ්ඩුව මේ ආයෝජන කලාපය -Colombo Port City එක- ගෙනෙන්න කටයුතු කළා. ඒ වාගේම, 1977දී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විවෘත ආර්ථිකය තුළින් නිදහස් වෙළෙඳ කලාප මේ රටට හඳුන්වා දීලා, ලංකාව තුළ ඉතා වැදගත් ආයෝජන මණ්ඩලයක් ඇති කරන්න හදපු අවස්ථාවේදී එවකට සිටි විපක්ෂය ඇති කරපු ප්‍රශ්න මතක් කර දෙන්න වෙලාව නාස්ති කරන්න මට ඕනෑ නැහැ. හැබැයි ඒවාත් අපි මතකයට නඟා ගන්න ඕනෑ. අප මීට පෙර රට පාලනය කරලා තිබෙන නිසා අපි දන්නවා විදේශ ආයෝජනවල වටිනාකම. ඒ නිසා තමයි අද විපක්ෂය වශයෙන් කටයුතු කරන අපි මේ කටයුතුවලට අභියෝග කරන්න, බෝඩ් ලෑලි අල්ලාගෙන අරක අඩු කරන්න, මේක අඩු කරන්න කියන්න, strike කරන්න, මේ වාගේ දේවල් ගේන්න එපා, ඩොලර් එවන්න එපා වැනි කථා කියන්නේ නැත්තේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මෙතැන නැඟී සිටින්නේ සමස්ත විපක්ෂය වශයෙන්. රටකට කරන්න අවශ්‍ය දේවල් අපි මේ අවස්ථාවේ නිර්පාක්ෂිකව කරන්න අවශ්‍යයි. මොකද, අපට අවශ්‍ය රට දියුණු කිරීමයි. මේ රට එක පක්ෂයකට බද්දට දීලා තිබෙන එකක් නොවෙයි. ශ්‍රී ලාංකිකයන් වශයෙන් අපිත් -පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව- මේ රට ඉදිරියට ගෙන යා යුතුයි කියන සංකල්පය තහවුරු කළ යුතුයි. ඒ සම්බන්ධයෙන් කථා කරන කොට Colombo Port City එක ඉතාම වැදගත්. මොකද, Colombo Port City එක කියන්නේ, විශේෂ කලාපයක්. ඒ කලාපය තුළ සේවා අංශය වැඩි දියුණු කරලා ආයෝජන ගෙන එන්නයි හදන්නේ. ඒක මුල් කොටගෙන අපි offshore companies ඇති කරලා පුළුවන් තරම් දිරි ගැන්වීම් කරන්න අවශ්‍යයි. ඒ නිසා තමයි මම එදා ඉඳන්ම සටන් කරමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධයෙන් කිව්වේ, ඒ අයට මෙහේට ඇවිල්ලා අර දිරි ගැන්වීම් දෙන්න බැහැ, මේ දිරිගැන්වීම් දෙන්න බැහැ කියලා අපට තහංචි දමන්න බැරි බව. ඒ වාගේම අනෙක් පැත්තෙන්, 2028 අප්‍රේල් මාසය වනකොට අප ගෙවන්න තිබෙන ණය ප්‍රමාණයත් ගෙවිය යුතුයි කියන තර්කය ඉදිරිපත් කරන්න ඒ අයට බැහැ. ආණ්ඩුවක් වශයෙන් එදා කටයුතු කරද්දී වාගේම අද විපක්ෂයේ ඉඳගෙනත් අපි ආණ්ඩුවට කියන්නේ ඒ ස්වාධීනත්වය තියාගෙන කටයුතු කරන්න අවශ්‍ය බවයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇවිල්ලා තිබෙන්නේ ප්‍රශ්නයකට උත්තරයක් දෙන්න මිස, ඉදිරි අනාගතයේ කළු ගලේ ලියා තබන්න පුළුවන් විධියේ ප්‍රතිපත්ති ඇති කරන්න නොවෙයි කියන එක මේ ආණ්ඩුව දැනගන්න අවශ්‍යයි.

දැන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව ඇති කරගත් ණය පහසුකමේ කාල පරිච්ඡේදය අවුරුද්දේ අග වනකොට අවසන්. 2027 අප්‍රේල් මාසයේ, -දැන් ඉඳන් හරියටම මාස 12යි- ඒගොල්ලන්ගේ කාල පරිච්ඡේදයේ තිබෙන management style එක අවසන් වෙනවා. ඉතින්, මේ අවස්ථාවේදී ඕනෑම ආයෝජකයෙකුට දිරිගැන්වීම් දෙන්න පුළුවන්, අපට හිතෙන විධියට සහ රටට ඔබින විධියට.

මේ අවස්ථාවේදී අපි Colombo Port City එක ගැන කථා කරනවා. ඔබතුමන්ලා මේ දිරිගැන්වීම් දෙන්න හදන්නේ, ගෙවල්

[ගරු රවි කරුණානායක මහතා]

හදන්න. මොකටද ඒක ඇතුළේ ගෙවල් හදන්න දෙන්නේ? යම් යම් කොම්පැනි Colombo Port City එකේ නැතුව ඉන් පිටත ලස්සනට ඒවා කරනවා. නිදසුනක් වශයෙන් ගත්තොත්, මේ රටේ ඉතාම දක්ෂ ලෙස කටයුතු කරන කොම්පැනියක් තමයි Prime Lands. ඔවුන් බොහොම දක්ෂ ලෙස කටයුතු කරනවා. Home Lands එකත් ඒ ආකාරයෙන්ම කටයුතු කරනවා. දැන් ඒ අය Colombo Port City එක ඇතුළට ගිහිල්ලා ගෙවල් හදන්න ඕනෑද, ආයෝජන ගෙනාවා කියලා පෙන්වන්න?

Colombo Port City එකෙන් කිලෝමීටරයක් එළියට ආවාට පස්සේ ඒගොල්ලන්ට තිබෙන සෘජු බදු සියයට 30 Port City ඇතුළේ නැහැ. ඉතින්, මේ ව්‍යාපාර ඒක ඇතුළට යනවාට වඩා, කරුණාකරලා ඒ වෙලාව මිඩංගු කරන්න බැංකුවලට; මහ බැංකුවෙන් ඒගොල්ලන්ට ඉඩ දෙන්න offshore banks ඇති කරන්න.

මේ අවස්ථාවේදී මැදපෙරදිග ඉතාම භයානක තත්ත්වයක් තිබෙන කොට, මම මාස 12ක්, 13ක් පෙන්වා දුන්නේ - මේ ප්‍රශ්නය එන්න ඉස්සෙල්ලා - මේවා තමයි low-hanging fruit බව. ඒ කියන්නේ, මේ අවස්ථා උපයෝගී කරන්න පුළුවන්, අභියෝගයකට උත්තර දෙන්න පුළුවන් දේවල් තමයි පෙන්වා දුන්නේ. ඇයි, ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රායෝගික නොවන ප්‍රතිපත්ති ගෙනයනවාට වඩා, ප්‍රායෝගික මට්ටමින් ක්‍රියාත්මක කරන්න පුළුවන් ඒ offshore banks මෙහාට ගෙනැල්ලා ආයෝජනය කරන්න නොකියන්නේ? Insurance companies, cryptocurrency ඇති කරන්න; Digitalization ක්‍රියාත්මක කරන්න.

2025 ජනවාරි මාසයේ 23වැනි දා මහ බැංකුවෙන් අපි ප්‍රශ්න කළා, ඇයි මේ digital currencyවලට වලංගු බවක් ඇති කරන්නේ කියලා. එදා උත්තර දුන්නා, නැහැ, මේකේ නීත්‍යානුකූලභාවයක් තිබෙනවාද නැද්ද කියලා අපි දන්නේ නැහැ කියලා. නමුත් අද උසාවියෙන් මහ බැංකුවට කියනවා, කරුණාකරලා මේක control කරන්න කියලා. අපි ඒක දැනගෙන පාර්ලිමේන්තුවේදී අහනකොට ගණන් ගන්නේ නැහැ. මේ නිසා තමයි මම හැම අවස්ථාවකම කියන්නේ මහ බැංකුව රටට උදවු කරන්න පුළුවන් විධියේ ස්වාධීනත්වයක තිබිය යුතුයි කියලා. ඒගොල්ලන්ගේ අභිමතය පරිදි කටයුතු කරලා රුපියල අවප්‍රමාණ කිරීම සහ ඒ තුළින් උද්ධමනය පාලනය කිරීම විතරක් නොවෙයි කරන්න ඕනෑ කියන එක මම ඉතා ඕනෑකමින් මේ අවස්ථාවේදී මතක් කරනවා.

අපට අවශ්‍ය වන්නේ දිරි ගැන්වීම්. අපට අවශ්‍ය වන්නේ Colombo Port City එක ඇතුළේ පුළුවන් තරම් සේවා අංශය දියුණු කරන්න. ඒක තමයි කළ යුතු දේ. The motivational aspect of the Colombo Port City should be to develop the service sector. Our reliance on service industries is 64 per cent of GDP. Therefore, we must ensure that that sector is motivated and optimized at this particular moment.

අද මැදපෙරදිග රටවල්වල කොයි මොහොතක කොයි තැනකට ඩ්‍රෝන් එකක් හරි මිසයිලයක් හරි පතිත වෙනවාද කියලා කියන්න බැරි අවස්ථාවක, ලංකාවට ලස්සනට මේ අවස්ථාව market කරන්න පුළුවන් නේද? අද උදේ කථා කරනකොට අනුර කරුණාතිලක ඇමැතිතුමා හොඳ පිළිතුරක් දුන්නා, පාර්ලිමේන්තුවට. මම ඒකට ප්‍රතිඋත්තරයක් දුන්නේ; මත්තල ගුවන් තොටුපළ පාවිච්චි කරන්න. Free landing කියලා මැදපෙරදිග හිර වන අහස් යානා ඔක්කොම මෙහේට ගෙන්වා ගන්න. මේ සුමාන දෙක තුළ Qatar Airways මෙතැන ඉඳන් කෙළින්ම යුරෝපයට පියාසර කරනවා. ඉතින්, ඒවා මෙහේට ගෙනෙන්න පුළුවන් නම්, හොඳයි. මත්තල land කරන්න පුළුවන් ඕනෑම A380 aircraft එකකට. අපෙන් ඒ services ටික free දෙන්න. එහෙම තමයි ඒ වාගේ අවස්ථා ලංකාවට ගන්න පුළුවන් වෙන්නේ. ඒ අවස්ථා ගන්න. ඉතින්, ඒ අවස්ථා තිබියදී, Colombo Port City එකෙන් කිලෝමීටරයක් එළියට ගිහිල්ලා ගෙවල් හදන්න පුළුවන්කම තිබියදී, ඒක ඇතුළට ගිහිල්ලා ගෙවල් හදන්නේ මොකටද?

මම ඉතා ඕනෑකමින් කියන්න කැමතියි, the biggest problem we have in Sri Lanka is maintaining economic sustainability. රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ ආර්ථිකය කඩා වැටී තිබූ අවස්ථාවේ දේශපාලනය පැත්තකට දාලා භය නැතිව ආර්ථිකය හැදුවා. නමුත්, ඒකට ලැබුණු උත්තරය තමයි ඒ කණ්ඩායම විපක්ෂයට යවලා වෙනත් ආණ්ඩුවක් බලයට ආව එක. ඒකට කමක් නැහැ. හැබැයි, ඒ ගත්ත මූල්‍ය ස්ථාවරභාවය නිසා අද ඉදිරියට ගමන් කරන්න පුළුවන් වෙලා තිබෙනවා.

We have got economic stability in Sri Lanka, but the main problem is, we have not brought about economic transformation that is needed. The structural reforms that are required need to be done soon. The reform of State-owned enterprises must be done; commercialization of State-owned enterprises must be carried out immediately. Look at the SriLankan Airlines. They say their loss per day is roughly about Rs. 400 million. Rs. 400 million per day means Rs. 12 billion a month and Rs. 144 billion a year! That is not what is expected of Sri Lanka's national airline. It is the national airline of the country, not of the NPP or the JVP; it belongs to all of us. We just give ideas. So, let us work together and ensure that we crystallize these into positive outcomes.

Then, trade reforms are absolutely essential. We have to have market access. Where is the proposed Sri Lanka-Singapore Free Trade Agreement? Where is the Sri Lanka-Thailand Free Trade Agreement? Where is the ETCA with India? Those are what create market access. Look at the way India is moving forward. They have a Free Trade Agreement with Europe which offers zero tax.

Then, labour market reforms are also absolutely essential. If we are to move into and penetrate the digitalized world that we are talking about, we need to make labour reforms.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Just give me two minutes, Hon. Deputy Chairperson of Committees.

Look at short-term priorities, the medium-term reforms and the long-term transformation that need to be done. So, through that process, we absolutely require a complete change, a new approach and not blame the past.

අපි අවුරුදු 76ක ශාපයක් ගැන කථා කරනවා වෙනුවට අපේ රටේ ඉදිරි ගමන ඉලක්ක කරගෙන වැඩ කරමු. අහිංසක ජනතාව

බලාගෙන සිටිනවා. හිසේ ඇම්මට කොට්ට මාරු කරනවා වාගේ මේ තාවකාලික විසඳුම් විතරයි දෙන්නේ කියලා ඒ අය හිතාගෙන ඉන්නවා. මම හිතන විධියට, මේ අවස්ථාවේදී අපට අවශ්‍ය වෙන්නේ අලුත් ගමනක්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ඉතාම ඕනෑකමින් ආණ්ඩුවට කියනවා. මේ අවස්ථාවේදී අභියෝග තිබෙනවා. හැම ආණ්ඩුවකටම අභියෝග තිබුණා. හිතන්න එපා මීට පෙර තිබුණු ආණ්ඩුවලට ප්‍රශ්න තිබුණේ නැහැ කියලා. නමුත් රටට ඔබින දේවල් කළා.

මේ කථා කරන මොහොතේ රනිල් වික්‍රමසිංහ මහත්මයාට ශල්‍යකර්මයක් කරලා තිබෙනවා, එය සාර්ථක වෙලා තිබෙනවා. අපි ප්‍රාර්ථනය කරනවා එතුමාට ඉක්මනට සුවය ලැබේවා කියලා.

එක්සත් ජාතික පක්ෂය, අවුරුදු 30න් කරන්න තිබුණු මහවැලිය අවුරුදු 5න් කළා වාගේම, Colombo Port City එක සම්බන්ධයෙනුත් ක්‍රියාමාර්ගයක් ඇති කළා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පාරවල්, digitalization, බැංකු, අධ්‍යාපන ක්‍රමය, මහපොළ, නැවිගත කිරීම් ඇතුළු ඒ ඔක්කෝම එක්සත් ජාතික පක්ෂය කරලා තිබෙනවා. අපි මේ අවස්ථාවේදී ඉල්ලන්නේ, Colombo Port City එක මුල් කරගෙන කරුණාකරලා මේ අවස්ථාව උපයෝගී කර ගන්න කියලා අපේ ආර්ථිකය ඉදිරියට තල්ලු කරන්න. ඒ investments අපට අවශ්‍යයි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 2ක කාලයක් ලැබෙනවා.

[12.06 p.m.]

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Hon. Deputy Chairperson of Committees. Madam, I would like to take this opportunity to thank the Indian Prime Minister Shri Narendra Modi for receiving us in India and giving us the opportunity to participate in the NXT Summit 2026 organized by the NXT team. I especially thank the Hon. Kartikeya Sharma, Member of the Rajya Sabha, Dr. Aishwarya Sharma, Chairperson of NXT, Ms. Megha Sharma, Vaibhav and the whole organizing team for graciously and warmly receiving us in India and giving us the opportunity, as young Sri Lankan leaders, to interact with other leaders of the world and to study the progression or the development that is taking place in India at the moment with a growth rate of over 7 per cent.

I, together with the Hon. J.C. Alawathuwala and the Hon. Harshana Rajakaruna, thank the Hon. Leader of the Opposition for giving us that opportunity.

We had a wonderful time in India. We managed to interact with several Ministers, including the Chief Minister of New Delhi. They gave us the opportunity to study their economy, health system, medicine and other areas, which would help us, as young leaders, to take Sri Lanka forward, emulating India.

I would like to once again thank the entire NXT team for organizing that wonderful summit and encourage them to organize more summits in the future.

Thank you very much.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමා විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 12.08]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගෝලීය දේශපාලන තත්ත්වය ඉතාම සංකීර්ණ තත්ත්වයකට පරිවර්තනය වෙමින් පවතිනකොට ඒකේ නරක පැත්ත විතරක් කථා කරන්නේ නැතිව, ඒ හරහා සිද්ධ වෙන අපේ පැත්තට වාසිසහගත දේවල් කරන්න පටන් ගන්න ඕනෑ. උදාහරණයක් විධියට කිව්වොත් රටට ආයෝජකයෝ කැඳවා ගැනීම ඇතුළු ආර්ථික වර්ධනයට අදාළව යම්කිසි ආකාරයකින් මැදිහත් වෙන්න අපි පටන් අරගෙන තිබෙනවා. එතැනදී, මේ මොහොතේදී Colombo Port City Economic Commission Act එකට අදාළ මේ නියෝග ගෙන ඒම ඉතාම වැදගත් දෙයක් කියලා මම හිතනවා.

මේ Colombo Port City ව්‍යාපෘතිය මුලින් පටන් ගන්නකොටම අපේ පැත්තෙනුත් යම්කිසි විවේචනාත්මක අදහස් දැක්වීම් තිබුණා. Colombo Port City එක විතරක් නොවෙයි ලංකාවේ බොහෝ ව්‍යාපෘති පටන් ගන්නකොට ඒවාට අදාළ විධිමත් සැලසුමක් තිබුණේ නැහැ. ඒ නිසාම ලංකාවේ එවැනි ව්‍යාපෘති ගණනාවක්ම අසාර්ථක ව්‍යාපෘති බවට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත් ඒවා හම්බන්තොට වරාය වෙන්න පුළුවන්, මත්තල ගුවන් තොටුපොළ වෙන්න පුළුවන්, හම්බන්තොට හදපු ඒ Conference Hall එක වෙන්න පුළුවන්, නෙළුම් කුලුණ වෙන්න පුළුවන්, පටන් ගත්ත මුල්ම කාලයේ උමා ඔය ව්‍යාපෘතිය වෙන්න පුළුවන්, හම්බන්තොට ක්‍රිකට් ක්‍රීඩාංගණය වෙන්න පුළුවන්, රන්මිණිතැන්න සිනමා ගම්මානය වෙන්න

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

පුළුවන් - ලංකාවේ නූතන ඉතිහාසයේ සිදු කළ ඒ වාගේ විවිධ ව්‍යාපෘති අරගෙන බැලුවොත්, හරියට සැලසුම්සහගතව කරගෙන නොයෑම තුළ අපට රටක් විධියට දැවැන්ත ආර්ථික අර්බුදයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඉතා විශාල ණය ප්‍රමාණයක් අරගෙන තමයි ඒ ව්‍යාපෘති පටන් අරගෙන තිබෙන්නේ. නමුත් ඒ ව්‍යාපෘති හරහා ඵලදායී ප්‍රතිඵල, ඵලදායී ආදායම් මේ රටට ගෙන්වන්න අසමත් වෙලා තිබෙනවා.

එතැනදී අද අපි මේ කථා කරන නියෝගයට අදාළ කාරණා කථා කරන්න ඕනෑ. ඇත්තටම මෙය පනත් සංශෝධනයක් නොවෙයි. ඇමතිතුමාට පුළුවන්, පනතට අදාළ නීති-රීති රෙගුලාසිවලට අදාළව යම් කිසි සංශෝධන ගෙන එන්න. ඒ ව්‍යාපෘතිය යටතේ හදන ගොඩනැඟිලිවල උස ප්‍රමාණයේ යම් කිසි සංශෝධනයක් වෙලා තිබෙනවා. තිබුණු ප්‍රමාණයට වඩා වැඩියෙන් උස ගොඩනැඟිලි හදන්න පුළුවන් කියලා සංශෝධනයක් කරලා තිබෙනවා. ඒ වාගේ විවිධ දේවල් තිබෙනවා. මෙහි ප්‍රධාන චේතනාව වෙන්නේ මේකයි. මම අර මුලින් කිව්වා වාගේ බොහෝ තැන්වල මේ ව්‍යාපෘති පටන් ගන්න අපේ හිටපු පාලකයෝ දක්ෂ වෙලා තිබෙනවා. ඒ හරහා තැන් තැන්වල සිදු වූ විවිධ දූෂණ, වංචා, නාස්තිය ගැන දිගින් දිගටම පසුගිය කාලවකවානුව තුළ වාර්තා වෙලා තිබුණා. අපි ඒ කාලයේ මේ ව්‍යාපෘතිවල තිබුණු අක්‍රමිකතාවලට අදාළව විවේචන ඉදිරිපත් කළාට, බලය ගත්තාට පස්සේ දැන් අපටත් යුතුකමක් තිබෙනවා. විශේෂයෙන්ම ජාතික ජන බලවේගය පසුගිය මැතිවරණවලදී දැවැන්ත ජයග්‍රහණයක් අත් පත් කර ගත්තාට පස්සේ, අපට වගකීමක් තිබෙනවා, මේ ව්‍යාපෘතිවල තිබෙන අඩු පාඩු නිවැරදි කරගෙන ඉදිරියට ගෙන යන්න. එතැනදී අපි දකින දෙයක් තමයි මෙවැනි දේවල් අනිවාර්යයෙන් සිද්ධ විය යුතුයි කියන එක.

රටක් විධියට පසුගිය කාලයේ අපට තිබුණු ප්‍රධාන අර්බුදයක් තමයි, ආයෝජකයෝ කැඳවා ගැනීම. විශේෂයෙන්ම investor-friendly environment එකක්, ආයෝජකයන්ට අදාළ ආයෝජකයන්ට පක්ෂපාතී බිමක්, පරිසරයක් පසුගිය කාල වකවානුව තුළ හරියාකාරව තිබුණේ නැහැ. ඒ සම්බන්ධයෙන් විවිධ ආයෝජකයෝ, විවිධ තැන්වලදී අදහස් දක්වා තිබෙනවා, ඒ සිද්ධ වෙච්ච අත යට ගනුදෙනු, ඒ වාගේම මැති-ඇමතිවරුන්ගේ පැත්තෙන් සිද්ධ වෙච්ච එක් එක් බලපෑම් ගැන. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වාගේ විවිධ අවස්ථාවල, විවිධ ප්‍රශ්න, ගැටලු තිබියදී තමයි පසුගිය අවුරුදු ගණනාවක් අපි රටක් විධියට ආවේ. නමුත්, දැන් අලුත් පාලනයත් එක්ක අපේ ආයෝජනවලට අදාළ වටපිටාව, ඒ පරිසරය ඉතා වේගයෙන්, ඉතා සක්‍රියව ඉදිරියට යනවා. විශේෂයෙන්ම අපි ඒකට කියනවා, Single Window platform කියලා. Single Window channel කියන්නේ, ආයෝජකයෙක් ලංකාවට ආපු ගමන්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙන්න පුළුවන්, Colombo Port City එකට අදාළව තිබෙන කොමිසම වෙන්න පුළුවන්, ඒ වාගේ ආයතනවලට ගිහිල්ලා රස්තියාදු නොවී එක තැනකින් සියලු කටයුතු කරගෙන යන්න පුළුවන් වටපිටාවක් හදාගෙන, ඉතා සක්‍රියව ඒ වැඩ පිළිවෙළ කරගෙන යනකොට අතර තමයි අපි මේ නියෝග ගෙන එන්නේ.

ඔබතුමන්ලා දන්නවා, ලෝකයේ අසමත් වෙච්ච විවිධ ව්‍යාපෘති තිබෙනවා. සමහර නගර හදලා තිබෙනවා, ඒ නගරවල මිනිස්සු නැහැ, ගොඩනැඟිලි විතරයි තිබෙන්නේ. ඒ සියලු දේවල් දිහා බැලුවොත්, සැලසුම් සම්බන්ධ ප්‍රශ්න තමයි ඒවාට අදාළ වෙන්නේ. ලංකාවේ ගත්තොත්, මම අර මුලින් කියපු ව්‍යාපෘතිවලට අමතරව ඒ වාගේ තව ව්‍යාපෘතියක් තිබෙනවා. ඒ කියන්නේ, මම කලින් කියපු ගුවන්තොටුපළ වෙන්න පුළුවන්, වරාය වෙන්න පුළුවන්, සම්මන්ත්‍රණශාලාව වෙන්න පුළුවන්, සිනමා ගම්මානය වෙන්න පුළුවන්. මේ සියලු දේවල්වලට අමතරව, සැලසුමේ යම් කිසි ප්‍රශ්න සිද්ධ වෙච්ච, ඒ වාගේම බලපෑම් මත අපේ රටේ නිර්මාණය වෙච්ච බලාගාරයක් තමයි ලක්විජය බලාගාරය. ඒ බලාගාරය හදනකොටම ජනතාවගේ පැත්තෙන් ලොකු විරෝධයක් ආවා, විශේෂයෙන්ම ඒ බලාගාරය හදන්න සුදුසු භූමිය, ඒ භූමිය නොවෙයි කියලා. ඒ වාගේම විවිධ පරිසර සංවිධාන ඒ අයගේ පැත්තෙන් ඒකට අදාළ කරන බලපෑම් එල්ල කරලා තිබුණා. ඒ බලාගාරයට විරුද්ධව යම් කිසි හඬ නැඟීමක් සමාජය තුළ සිද්ධ වෙනකොට වෙඩි තැබීම් සිද්ධ වෙලා තිබුණා. නමුත්, කාගේ හෝ වුවමනාවකට ඒ බලාගාරය ඉදි වුණා. ඒ ඉදි වුණු කාලයේ සිට ඒ බලාගාරයේ ලක්ෂණයක් තමයි, දිගටම, අඛණ්ඩව ඒ බලාගාරය අකර්මන්‍යවීම. ඒ කියන්නේ, බලාපොරොත්තු වුණු, අපේක්ෂා කරපු පරිදි විදුලිය සැපයීමේදී යම් කිසි ගැටලුවක් තිබුණා. අද මම දැක්කා, විපක්ෂ නායකතුමාත් ඒ වාගේ යම් කිසි චෝදනාවක් ඉදිරිපත් කරලා තිබුණා.

කිලෝග්‍රෑම් එකකින් ලබා ගන්නා කිලෝ කැලරි ප්‍රමාණයට අදාළ දේවල් ගත්තොත්, මේවා ලෝකයේ සිද්ධ වෙන දේවල්. මෙතැනදී හරියාකාරයෙන් කිලෝ කැලරි ප්‍රමාණය අපට ලබා ගන්න බැරි නම්, අදාළ වන්දි මුදල ඒ සමාගම ගෙවන්න ඕනෑ. මේක තමයි පිළිගත් ක්‍රමවේදය. නමුත් දැන් මෙතැනදී කථා කරන්න ඕනෑ ඇත්තටම මේ ප්‍රශ්න ගැන විතරක් නොවෙයි. එතැන ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒකට අදාළ කමිටුවක් තිබෙනවා. COPE එකේ සභාපතිතුමාත් ඒකට අදාළ සංචාරයක නිරත වී සිටියා. එතුමා නිරීක්ෂණ චාරිකාවක් කළා. ඒ වාගේම දූෂණය, වංචාව, නාස්තිය, අක්‍රමිකතාවලින් තොරව පාලනයක් අරගෙන යන්න ඕනෑ කියන විශ්වාසය තිබෙන ආණ්ඩුවක් විධියට කොතැනකවත් වංචාවක් සිද්ධ වෙන්න විධියක් නැහැ කියලා අපි පිළිගන්නවා. කොතැනකවත් වංචා සිද්ධ වෙන්න අපි ඉඩ දෙන්නේ නැහැ. ඒත් කොතැනක හරි ප්‍රශ්න, ගැටලු තිබෙනවා නම්, අපි ඒ සම්බන්ධව පරීක්ෂණ පවත්වා ඒකට විසඳුම් ලබා දෙන්න සූදානම්.

දැන් මේ සැලසුම් සම්බන්ධ කාරණාවේදී නුසුදුසු තැනක නුසුදුසු ව්‍යාපෘතියක් ආරම්භ කරලා අවුරුදු ගණනාවක් ඉතාම අසාර්ථකව පවත්වා ගෙන යෑම තුළින් රටට දැවැන්ත පාඩු සිද්ධ වෙලා තිබෙනවා කියන එක කාටවත් ප්‍රතික්ෂේප කරන්නට බැහැ. ඒ කියන්නේ වෙඩි තැබීම්, මර්දන මැද්දේ තමයි මේ ව්‍යාපෘතිය පටන් ගත්තේ. පටන් ගන්නකොටම විවිධ අය කිව්වා, "ඕක පටන් ගන්න එපා" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඕනෑම ව්‍යාපෘතියක් ආරම්භ කරන්නට කලින් ඒකට අදාළ කරන ඉතාම හොඳ සැලැස්මක් අවශ්‍යයි. ඒ වාගේම සමහර දේවල් පටන් ගත්තාට පස්සේත් ඒ සැලසුම්වල යම් කිසි සංශෝධනයක් කරන්නට ඕනෑ නම්, ඒ සංශෝධන කරන්නත් අපි දෙපාරක් කල්පනා කරන්නට හොඳ නැහැ. මේක ඉතාම වටිනා සංශෝධනයක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේවාට සුදු අලි ව්‍යාපෘති - white elephant projects - කියලා කියනවා. එවැනි white elephant projects නොව, අපේ බදු මුදල්වලින් ඉදිවෙන, එහෙම නැත්නම් අපේ බදු මුදල් වියදම් කරලා යම් කිසි ආකාරයකින් පටන් ගත්ත සියලුම ව්‍යාපෘතිවලට අදාළවත් අපි නිසි පරිදි කටයුතු කළ යුතුයි. ඒ වාගේම මම නැවතත් මතක් කරන්න ඕනෑ, මේ ගෝලීය තත්ත්වය යම් කිසි ආකාරයකින් කලබලකාරී වාගේම සංකීර්ණභාවයකට පත් වෙලා තිබෙනකොට, අපි සැලසුම් සහගතව කටයුතු කළ යුතු බව. මේ තිබෙන ප්‍රශ්න තුළ අපි සමස්තයක් විධියට මානසිකව වැටෙන්නේ නැතිව මේකෙන් මොකක් හරි ප්‍රයෝජනයක් අරගෙන රටට යම්

කිසි වාසිදායක තත්ත්වයක් බවට මේක හරවා ගන්න ඕනෑ; we try to capitalize on the situation in a proper way. ඉතින්, අපට අවස්ථාවක් උදා වෙලා තිබෙනවා. මේක ඉතාම වැදගත් යෝජනාවක් කියලා මම හිතනවා. ඒ නිසා සමස්තයක් විධියට මේ සංශෝධනවලට අපි පක්ෂපාතී වෙනවා. ඉතාම කෙටි කාලයක් තුළ මේ Colombo Port City ව්‍යාපෘතිය ඉතාම සාර්ථක ව්‍යාපෘතියක් බවට පරිවර්තනය කරන්න ආණ්ඩුවක් විධියට අදාළ සියලුම මැදිහත්වීම් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එම පණිවුඩය ලබා දෙමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[பி.ப. 12.19]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழு பற்றிய விவாதம் நடைபெற்றுக் கொண்டு இருக்கின்றது. இலங்கையைப் பொறுத்தமட்டில், பல எதிர்பார்ப்புகளுடனேயே இந்தத் துறைமுக நகரத் திட்டம் கொண்டுவரப்பட்டது. எனினும், அந்த எதிர்பார்ப்புகள் எந்தளவுக்கு நிறைவேற்றப்பட்டு இருக்கின்றன என்ற கேள்வி இருக்கின்றது. குறிப்பாக, இந்தத் துறைமுக நகரமானது, டுபாய், சிங்கப்பூர், ஹொங்கொங் போன்று பொருளாதார அபிவிருத்தி மையமாக அமைந்து, இலங்கையின் பொருளாதாரத்தை உயர்த்திவிடும் என்ற எதிர்பார்ப்பு காணப்பட்டது. அந்த எதிர்பார்ப்புகள் எந்தளவுக்கு நிறைவேற்றப்பட்டு இருக்கின்றன என்பதைப் பற்றி நாங்கள் சிந்திக்க வேண்டியவர்களாக இருக்கின்றோம்.

ஒரே கூரையின்கீழ் பல தேவைகளை நிறைவேற்றக்கூடிய விதத்தில் அந்தப் பொருளாதார மையம் உருவாக்கப்பட்டதாகப் பேசப்பட்டது. அதன் இன்றைய நிலை எவ்வாறு இருக்கின்றது? அதைச் சிறப்பாகக் கொண்டுசெல்வதற்கு என்ன வேலைகளைச் செய்ய வேண்டும்? எவ்வாறான அபிவிருத்தித் திட்டங்களை மேற்கொள்ள வேண்டும்? எத்தகைய தொழில்நுட்பத்தைக் கையாள வேண்டும்? போன்ற விடயங்கள் எல்லாம் ஆராயப்பட வேண்டியவையாக இருக்கின்றன. உயர் தொழில்நுட்பம், நிதி தொழில்நுட்பம் கொண்ட உலகத்தைக் கவருகின்ற ஒரு வணிக மையமாக இது அமையும் என்றெல்லாம் பேசப்பட்டு இருக்கின்றது. அதுமாத்திரமன்றி, விளம்பரங்களும் செய்யப்பட்டு இருக்கின்றன. மேலும், கடலுக்குள் ஒரு நகரத்தை உருவாக்கி, அதன்மூலம் இலங்கையின் பொருளாதாரத்தை வளர்த்தெடுக்க முடியும் என்றெல்லாம் பேசப்பட்டது; பிரஸ்தாபிக்கப்பட்டது. இவை எந்தளவுக்கு நிறைவேற்றப்பட்டு இருக்கின்றன என்பதைப் பற்றி நாங்கள் மதிப்பீடு செய்ய வேண்டியவர்களாக இருக்கின்றோம்.

ஏனென்றால், இலங்கை வங்குரோத்து நிலையிலிருந்து தற்போது படிப்படியாக வளர்ச்சியடைந்து வருகின்றது என்ற கருத்துச் சொல்லப்படுகின்றது. இந்த வளர்ச்சிக்கு கொழும்புத் துறைமுக நகரம் - Colombo Port City - எந்தளவுக்குப் பங்களித்து இருக்கின்றது? அல்லது நாங்கள் எதிர்பார்த்த பங்களிப்பைச் செய்திருக்கின்றதா? என்பதைப் பார்க்க வேண்டும். எங்களுடைய நாட்டின் இறைமையின் ஒருபகுதி இழக்கப்பட்டு இருக்கின்றது என்ற கருத்தும் இருக்கின்றது. அதாவது, எமது நாட்டின் இறைமையானது Colombo Port City உருவாக்கத்தின் மூலம் இன்னொரு நாட்டின் கைக்குள் சென்றிருக்கின்றது என்ற விமர்சனமும் இருக்கத்தான் செய்கின்றது.

கடந்த ஆட்சிக் காலத்தின்போது அம்பாந்தோட்டை துறைமுகம், மத்தள விமான நிலையம், Colombo Port City என்பன பல பில்லியன் ரூபாய் செலவிலே உருவாக்கப்பட்டு இருக்கின்றன. இந்தச் செலவுக்கு ஏற்ற விதத்தில் இவை எமது நாட்டின் பொருளாதாரத்துக்கு எந்தளவு பங்களிப்பைச் செய்திருக்கின்றன? ஒருவருடைய பெயரைச் சொல்வதற்காக இந்த அபிவிருத்தித் திட்டங்கள் கொண்டுவரப்பட்டனவா? என்ற கேள்வியும்கூட இருக்கின்றது. எது எப்படி இருந்தாலும், எமது நாட்டில் உருவாக்கப்பட்டு இருக்கின்ற Colombo Port City என்ற கட்டமைப்பு உயர் தொழில்நுட்பம் மற்றும் நிதித் தொழில்நுட்பம் உள்ளதாக இருக்க வேண்டும்.

நாங்கள் சிங்கப்பூரைப் பார்த்துப் பெருமைப்படுகின்றோம். 1977ஆம் ஆண்டு காலப்பகுதியில் ஜே.ஆர். ஜயவர்தன அவர்கள் சொல்லியிருந்தார், இலங்கையை சிங்கப்பூர் போன்று மாற்றப் போவதாக. ஆனால், என்ன நடந்தது என்பது எங்களுக்குத் தெரியும்! நாங்கள் சொல்வது என்னவென்றால், இனியும் அபிவிருத்தி விடயத்தில் கோட்பாட்டு ரீதியான கருத்துகளைச் சொல்லிக்கொண்டு இருக்காமல், செயற்பாட்டு ரீதியாக நாட்டை அபிவிருத்தி செய்வதற்குரிய ஆக்கபூர்வமான செயற்பாடுகளை முன்னெடுக்க வேண்டும் என்றுதான். மேலும், மக்களின் வாழ்க்கைத் தரம் உயரக்கூடிய விதத்திலும் நாட்டின் பொருளாதாரம் உயர்ந்து செல்லக்கூடிய விதத்திலும் நடவடிக்கைகளை எடுக்க வேண்டும். அதற்கு ஏற்ற விதத்தில் சட்டத் திருத்தங்களைச் செய்ய வேண்டும் என்பதை நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

இன்றைய விவாதத் தலைப்புக்கு அப்பால், தற்போது பேசுபொருளாக இருக்கின்ற விடயங்களைச் சொல்லவேண்டி இருக்கின்றது. குறிப்பாக, இப்போது எரிபொருள் தட்டுப்பாடு ஏற்பட்டிருக்கின்றது. மின்வெட்டு ஏற்படும் என்ற கருத்துகள் நிலவுகின்றன. கறுப்புச் சந்தையில் - black marketஇல் - கூடுதலான விலைக்கு விற்பதற்காக உரம், கிருமிநாசினி என்பன பதுக்கப்படுகின்ற நிலைமைகள் காணப்படுகின்றன. நான் காலையில் newsஐப் பார்த்தபோது தெரிந்தது, எரிபொருள் திராவகங்களைப் பதுக்கிக்கொண்டு இருக்கின்றார்கள் என்பது. இந்தப் பதுக்கலானது மக்களுக்குப் பாரிய சிக்கலை ஏற்படுத்துகின்றது. இப்படிச் செய்பவர்களைச் சட்டத்தின்முன் நிறுத்த வேண்டும். அதனை நீங்கள் செய்வீர்களென நாங்கள் நினைக்கின்றோம். உரம், கிருமிநாசினி என்பன பதுக்கப்படுவதால் விவசாயிகள் அவற்றைப் பெறுவதில் மிகவும் கஷ்டப்படவேண்டிய சூழ்நிலை இருக்கின்றது. எனவே, இந்தப் பதுக்கல் செயற்பாட்டைத் தடுத்து நிறுத்தி, அவை நியாய விலைக்கு விவசாயிகளுக்குக் கிடைப்பதற்கு வழிவகை செய்யப்பட வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன். எரிபொருள் மட்டுமல்ல, உரம், கிருமிநாசினி என்பனவும் பதுக்கப்படுகின்ற நிலை காணப்படுகின்றது. இதற்கு எதிராக அரசாங்கம் துரிதமாகச் செயற்பட்டு, விவசாயிகளைக் காப்பதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டுமென இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, எங்களுடைய மக்கள் கோருகின்ற ஒரு விடயத்தை இங்கு முன்வைக்க விரும்புகின்றேன். டெங்கு ஒழிப்பு

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

உதவியாளர்கள் பற்றிய விடயத்தை நான் கௌரவ சுகாதார அமைச்சரிடம் பிரஸ்தாபித்தேன். அதன்போது அவர், மிகுதியாக இருக்கின்ற உத்தியோகத்தர்களுக்கு மார்ச் மாதத்துக்குள் நிரந்தர நியமனம் வழங்கப்படுமெனச் சொல்லியிருந்தார். ஏற்கெனவே, O/L pass பண்ணாதவர்களுக்கு இந்த நியமனம் கொடுக்கப்பட்டு இருக்கின்றது. O/Lஇல் சித்தியடைந்தவர்கள் இந்த நியமனத்தை எதிர்பார்த்துக்கொண்டு இருக்கின்றார்கள்.

அடுத்து, யாழ். பல்கலைக்கழக மாணவர் அமைப்பின் தலைவர் இன்று TIDஇனரால் விசாரணைக்கு அழைக்கப்பட்டு இருக்கிறார். இந்தச் செயற்பாடு மீண்டும் வடக்கு மக்கள் மத்தியில் அச்சமான சூழ்நிலையை ஏற்படுத்தி இருக்கின்றது. மாணவர்களுடைய செயற்பாடுகளில் குறைபாடுகள் இருக்குமாக இருந்தால், அவற்றுக்குரிய காரணங்கள் என்ன என்பதைக் கண்டறிந்து, அவற்றை அகற்றிவிடுவதன்மூலம் அவர்களைத் திருத்திக்கொள்ள முடியும் என்பதை நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன். இன்று அந்த மாணவர்கள், மீண்டும் தங்களுக்கு அச்சுறுத்தலான சூழ்நிலை ஏற்பட்டிருப்பதாகச் சொல்லி இருக்கின்றார்கள். இந்த விடயத்தைப் பெரிதுபடுத்தி மீண்டும் ஓர் அச்சமான சூழ்நிலையை உருவாக்காமல், முற்போக்காகச் சிந்தித்து, அதற்குரிய காரணங்களைக் கண்டறிந்து, அவற்றை அகற்றுவதன்மூலம் இவ்வாறான செயற்பாடுகளைத் தடுக்க முடியும் என்பதை நான் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, பயங்கரவாதத் தடைச் சட்டம், நிகழ்நிலைக் காப்புச் சட்டம் என்பன எமது மக்களுக்கு எதிரான சட்டங்களாக மாறும் என்று அந்தக் காலத்தில் சர்வதேச மனித உரிமை அமைப்புகளால் கூறப்பட்டது. இப்போது, நிகழ்நிலைக் காப்புச் சட்டமானது ஓரளவுக்கு மக்களைப் பாதிக்கக்கூடிய நிலைக்கு வந்துள்ளதை நாங்கள் பார்க்கின்றோம். நிகழ்நிலை காப்புச் சட்டத்துக்கு எதிராக தமிழரசுக் கட்சி மிகவும் கடுமையான வாதங்களை முன்வைத்தது. இப்போது அந்தச் சட்டம் ஊடகவியலாளர்களையும் பொது மக்களையும் பாதிக்கக்கூடிய விதத்தில் அமைந்திருக்கின்றது என்பதை நான் இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன். எமது நாடு ஜனநாயக நாடு, மனித உரிமைகளைப் பேணுகின்ற நாடு என்ற அடிப்படையில், சாதகமான சட்டங்களைக் கொண்டுவந்து, இந்த விடயத்தைக் கையாள வேண்டுமென இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

இறுதியாக, Colombo Port City ஊடாக எங்களுக்குக் கிடைக்கவேண்டிய வருவாய்மூலம் மக்கள் அடையவேண்டிய நன்மைகளை விரைவாகப் பெற்றுக்கொள்வதற்கும், அதன் மூலம் மக்கள் நேர்கணியமான மனப்பாங்கை உருவாக்கிக் கொள்வதற்கும் உரிய நடவடிக்கை எடுக்குமாறு கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன், நன்றி! வணக்கம்!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[12.28 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)

Hon. Deputy Chairperson of Committees, I am thankful that I have been given this opportunity to speak on the Regulations under the Colombo Port City Economic Commission Act.

Firstly, I would like to appeal to the Government to please stop talking and move on. You know that in the Middle East there is a conflict and there is great opportunity for us with people looking at moving their funds from the Middle East. So, you all should look at offering similar concessions, without being dictated by the IMF. Go there and try to entice the investors who are trying to leave the Middle East because safety is paramount for investment. Therefore, this is a great opportunity and I appeal to you to go there and entice investment. Please do that, and that should be done immediately.

Madam, 80 per cent of global trade moves by sea. Nearly two-thirds of global oil transportation is done through the Indian Ocean. In the Port City, there are 269 hectares; we allow 100 per cent ownership and full capital repatriation and 137 authorized businesses. So, we have only 137 authorized businesses compared to DIFC - Dubai International Financial Centre - where there are 8,800 companies, 50, 000 professionals and over US Dollars 200 billion worth of investment made. The fundamental issue in Sri Lanka is, when you make an application to the Port City, there is no specific time period for approval to be granted, whereas in the DIFC, within two to six weeks, approval is granted. If you take GIFT City in India, they offer a ten-year tax concession and approval is given within two to eight weeks. Therefore, for the Port City, there has to be a very transparent mechanism with regard to approvals. You lodge your application and you do not know when you would get approval. I believe that at the COPF, questions were raised with regard to how certain entities got approval and certain entities did not. So, therefore, that has to be looked into. Also, if you are going to encourage investments to the Port City, dispute resolution has to be expedited. There should be a separate Commercial High Court set up there and also we have to look at how we could expedite our arbitration process.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි දේශීයත්වයට මුල්තැන දෙනවා. අපි දන්නවා, ළඟදී COPF එකේදී Home Lands සමාගම සහ Prime Lands සමාගම සම්බන්ධයෙන් සාකච්ඡා වුණු කරුණුවලට අනුව මුහුණුපොතේ නොයෙක් දේවල් පළ වී තිබුණු බව. ආයෝජකයෝ මේ රට දිහා බලනකොට අපි දැනගත යුතු කාරණයක් තිබෙනවා.

විශේෂයෙන්ම high-rise apartment ක්ෂේත්‍රය ගත්තොත්, if you take foreigners who have come and invested here, they would have done a run. Therefore, I appeal to the Hon. Members of all these Committees to look into these matters. ලංකාවේ සමාගම් සම්බන්ධයෙන් යම් අඩුපාඩු තිබෙන්න පුළුවන්. විශේෂයෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කටයුතු කරන Home Lands

සමාගම සහ Prime Lands සමාගම ගැන COPF එකේ කළ සාකච්ඡාව අනුව මුහුණුපොත තුළ සමහර ප්‍රශ්න මතු කරලා, ඒ සමාගම්වල කීර්තිනාමයට ලොකු ප්‍රශ්නයක් ඇති කරලා තිබෙනවා. හැබැයි, ඒ සමාගම් දෙක ඕස්ට්‍රේලියාවට, ඩුබායි රාජ්‍යයට ගිහිල්ලා ආයෝජනය කරලා ලංකාවට ලොකු කීර්තියක් ලබා දී තිබෙනවා. එම නිසා මම ඉල්ලීමක් කරනවා, ලංකාවේ අපේ සමාගම් COPF එක වාගේ තැන්වල හංවඩු ගහන්න එපා, ඒගොල්ලන්ව ගෙනැල්ලා කථා කරලා ඔවුන්ගේ ප්‍රශ්න විසඳන්න කියලා. මොකද, මෙහේදී පොඩි පොඩි අඩුපාඩු සිදු වුණත්, ලංකාවේ ආයෝජකයින් පිට රට ගිහිල්ලා ලංකාවට කීර්තියක් ගෙනැල්ලා තිබෙනවා. ඉදිකිරීම් ක්ෂේත්‍රය ගත්තොත්, ලංකාවට ඇවිල්ලා මේ ක්ෂේත්‍රයේ ආයෝජනය කරන බොහෝ විදේශිකයින් ලංකාවේ උදවියගෙන් සල්ලි අරගෙන ඊට පස්සේ පිට රට යනවා. එම නිසා අපි මුලින්ම දැනගත යුතුයි, අපේ සමාගම් ආරක්ෂා කර ගන්න. මම දැක්කා, COPF එකේ සිදු වන සමහර දේවල් මුහුණුපොතේ දාලා මේ සමාගම් දෙක හංවඩු ගහනවා. ඒක නොකළ යුතුයි. හේතුව, එම සමාගම් දෙක සහ ICC එක Port City එකේ high-rise apartments හදන්න applications දාලා තිබෙනවා. ඉතින්, එම සමාගම්වල අඩුපාඩු පිළිබඳව සමාජ මාධ්‍යවලින් පතුරවලා යැව්වොත්, ඒගොල්ලන් ලබා ගත් ප්‍රගතියටත් ලොකු හානියක් සිදු වනවා. එම නිසා ඒවා ගැනත් අපි සලකා බලන්න ඕනෑ.

විශේෂයෙන්ම Port City එක සම්බන්ධයෙන් කිව යුතු දෙයක් තමයි, there has to be an expeditious approval process and transparency. And also, once again, I am appealing to the Ministers in this House, please do not wait here, go to the Middle East, go out to the conflict zone and offer investors the same facilities that Dubai has been offering.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Are you trying to get them killed?

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Life is a risk.

So, try to entice them because when there is conflict, people look at other destinations. We have to take risk. Therefore, go there and offer them concessions. You all should not be dictated by the IMF.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
මට තව පොඩි වෙලාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඔබතුමන්ලා තමයි විශේෂයෙන්ම විපක්ෂයේ ඉන්නකොට IMF එකට අනුව කටයුතු කිරීම ගැන ලොකු කථා කිව්වේ. ඒ නිසා මේ අවස්ථාවේ IMF එක කියන හැම දෙයක්ම මේ රටේ කරන්න ගියොත්, අපට ප්‍රගතියක් ලබා ගන්න බැහැ. ආයෝජකයින්ට සහන දුන්නේ නැත්නම් ඔවුන් කවදාවත් ලංකාවට එන්නේ නැහැ. කරුණාකරලා IMF එකට කියන්න, "අපට ආර්ථික ප්‍රගතියක් අවශ්‍යයි, ඔබ කියන හැම දෙයක්ම අපට කරන්න බැහැ" කියලා. කොන්ද කෙළින් තබාගෙන කියන්න, "අපට මේ අවස්ථාවේ ණය ගෙවීමට තිබෙනවා. So, if we do not offer them concessions, we cannot move forward. Therefore, we have to do so". Please, do not always do what the IMF tells you to. This is the time to take this golden opportunity and move forward.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Order, please! දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු පස් වරු 1.00 දක්වා අත්හිටුවනු ලැබේ.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නිශාන්ත ජයවීර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග අද දින පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර තිබෙනවා. ඒ සම්බන්ධවයි මේ විවාදය පැවැත්වෙන්නේ. ඒ යටතේ කරුණු 6ක් ඉදිරිපත් කර තිබෙනවා. අපි මුලින්ම ඒ කරුණු 6 මොනවාද කියලා බලමු. විශේෂයෙන්ම මේ වාගේ සංශෝධන ඉදිරිපත් කරමින් රජය විධියට අප මේ කටයුත්තට මැදිහත් වෙලා තිබෙන්නේ ආයෝජන කැඳවා ගැනීමට පවතින බාධක හඳුනා ගෙන එම බාධක නිවැරදි කිරීම තුළ වඩාත් වේගවත්ව ආයෝජන කැඳවා ගැනීම අපගේ ප්‍රධානම පරමාර්ථය නිසායි.

අපි මෙතැනදී පළමුවෙන්ම යෝජනා කර තිබෙන සංශෝධනය තමයි, වරාය නගරය දෙවැනි අදියර සඳහා විදුලිය සපයන්න අවශ්‍ය බිම්කඩක අවශ්‍යතාව. එම ඉඩ ප්‍රමාණය වැඩි කර ලබා ගැනීම සඳහා වන අවශ්‍යතාව වෙනුවෙන් තමයි පළමුවන සංශෝධනය ඉදිරිපත් වන්නේ. ඊළඟට, දෙවැනි සංශෝධනය ඉදිරිපත් කර තිබෙන්නේ වරාය නගරය ඇතුළත ඉදිවන ගොඩනැඟිලිවල උස ප්‍රමාණය සම්බන්ධවයි. ඒ කියන්නේ, පවතින ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකට ගෙනියන්න, අදාළ බලධාරින්ගේ අනුමැතිය සහිතව නව නිර්මාණ කටයුතු සිදු කරන්න අවශ්‍ය සංශෝධනයක් තමයි දෙවැනි සංශෝධනය. තුන්වනුව ඉදිරිපත් කර තිබෙන්නේ වරාය නගරය තුළ සිල්ලර වෙළෙඳාම සඳහා පවතින සියයට 30ක භූමි ප්‍රමාණය, සියයට 5ක ප්‍රමාණයට අඩු කරලා, ඉතුරු ප්‍රමාණය නගර අලංකරණ කටයුතු සඳහා යොදා ගැනීමට සිදු කරනු ලබන සංශෝධනයක්. හතරවන සංශෝධනය තුළින් විවෘත අවකාශ (වෙරළ) භූමි ප්‍රමාණය සඳහා කරනු ලබන තාක්ෂණික නිවැරදි කර ගැනීමක් ඉදිරිපත් කර තිබෙනවා. පස්වන සංශෝධනය යටතේ භාවිතයන් පිළිබඳ න්‍යාස

[ගරු නිශාන්ත ජයවීර මහතා]

වර්ගීකරණය යටතේ ප්‍රතිශෝධන සහ හයවන සංශෝධනය විධියට බිම් කැබලි සහ වීදි සඳහා වන භූමි ප්‍රදේශ සඳහා කරනු ලබන තාක්ෂණික නිවැරදි කර ගැනීමක් ඉදිරිපත් කර තිබෙනවා.

අපි මෙහෙම නිවැරදි කර ගැනීම් සිද්ධ කර කරන්නේ ඇයි කියා බලමු. අපේ රටේ ජනතාවට පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් උදා කර දෙන්න යන මේ ගමන තුළ මේ වෙනකොට අපේ ආර්ථිකය ඉලක්කගත දිශානතියකට අපි මෙහෙයවමින් සිටින බව මම ප්‍රථමයෙන්ම සඳහන් කරන්න ඕනෑ. අන්න ඒ ගමනට අවශ්‍ය ඉතා තීරණාත්මකම සාධකයක් වෙනවා, සෘජු විදේශ ආයෝජන සහ වෙනත් විදේශ ආයෝජන අපේ රට තුළට වඩාත් හොඳින් කැඳවා ගැනීම.

පසුගිය වසර 3ක, 4ක කාලය දෙස බැලුවාම අපට පෙනී යනවා, ජාතික ජන බලවේගය රජය බලයට පත් වුණාට පසුව වැඩිම සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයක් වන ඩොලර් මිලියන 1,057ක් - ඩොලර් බිලියනයකට වැඩි ප්‍රමාණයක් - 2025 වසරේදී ලබා ගන්න අප සමත් වුණු බව. අපේ ඉලක්කය වන්නේ 2026 අවුරුද්දේදී සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය ඩොලර් බිලියන 2ක වාගේ ප්‍රමාණයකට ළඟා කර ගැනීමයි. මෙන්න මේවාට අවශ්‍ය පහසුකම් සැපයීම තමයි මේ වාගේ සංශෝධනවලින් ප්‍රධාන වශයෙන්ම බලාපොරොත්තු වන්නේ.

අපි වාගේ රටකට සෘජු විදේශ ආයෝජනවල තිබෙන වැදගත්කම දෙස බලන්න. අපි 2026 වසරේදී ඉදිරිපත් කරන අය වැයෙන් බලාපොරොත්තු වන්නේ විශේෂයෙන්ම මධ්‍ය කාලීනව අපේ ආර්ථික වර්ධන වේගය සියයට 7කට ළඟා කරගෙන, වඩාත් වැදගත් ආර්ථික වර්ධන වේගයක් අත්පත් කරගෙන, ඒ තුළින් අපේ ආර්ථිකය වඩා පුළුල් මට්ටමකට ගෙනිහින් ඒ ප්‍රතිලාභ කිසිවෙක් අත් නොහැරෙන විධියට ජනතාවටම ආපසු ගලා ගෙන එන්න අවශ්‍ය කටයුතු සිදු කිරීමයි. මෙන්න මේ වෙනුවෙන් තමයි සෘජු විදේශ ආයෝජන අතිශය වැදගත්, තීරණාත්මක සාධකයක් වන්නේ. අපි ඒ වෙනුවෙන් සෘජු විදේශ ආයෝජන වැඩි වැඩියෙන් ආකර්ෂණය කර ගන්න අවශ්‍ය උපාය මාර්ග සහ නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා.

සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ප්‍රධාන ක්‍රියාමාර්ග 4ක් තිබෙන බව අපි දකිනවා. සෘජු විදේශ ආයෝජකයින් රටකට එන්න කලින් ඒ රටේ තිබෙන දේශපාලන සහ ආර්ථික ස්ථාවරත්වය මොන වාගේද කියලා බලනවා. ඒක තමයි පළමුවැනි ක්‍රියාමාර්ගය. අපි මේ වෙනකොට මේ රට ඉතාම හොඳ දේශපාලන ස්ථාවරත්වයකට පත් කර තිබෙනවා. ඊටත් අමතරව අපේ ආර්ථිකය වඩාත් හොඳ, ස්ථාවර මට්ටමකට ගෙනැල්ලා තිබෙනවා. නමුත් 2025 අවුරුද්ද ගත්තාම, රජය විධියට අපි නොහිතපු අභියෝග දෙකකට අපට මුහුණ දෙන්න වුණා. එයින් පළමුවැනි අභියෝගය තමයි, ඇමෙරිකාව විසින් පැනවූ තීරු බදු ප්‍රතිපත්තිය.

දෙවැනි අභියෝගය තමයි, අපි කවුරුත් බලාපොරොත්තු නොවුණු විධියට ආපු "දිට්වා" සුළි කුණාටු තත්ත්වය. මෙන්න මෙවැනි අභියෝග දෙකක් මැද්දේ අපි වඩාත් හොඳින් අපේ ආර්ථිකය ස්ථාවර කර ගන්නත්, සියයට 5ක වාගේ ආර්ථික වර්ධන වේගයක් අත්පත් කර ගන්නත් සමත් වෙනවා වාගේම ඉතිහාසයේ අඩුම අය වැය හිඟය සහිත අය වැය 2025 වර්ෂයේ අය වැය බවට පත් කර ගන්නත් සමත් වෙනවා. ඒ වාගේම, අපි ආයෝජකයන් ආකර්ෂණය කර ගන්න අදාළ වන පළමුවැනි සාධකය ඉතාම හොඳින් සපුරා ගන්න සමත් වෙලා තිබෙනවා.

ආයෝජකයෙක් රටකට එන්න බලපාන තවත් ප්‍රධානම සාධකයක් තමයි, ඒ රටේ තිබෙන යටිතල පහසුකම්. යටිතල පහසුකම් ගත්තාම, අපි 2026 අය වැය තුළදී මේ රටේ භෞතිකව තිබෙන යටිතල පහසුකම් වැඩි කර ගන්න අපේ දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 4ක මුදල් ප්‍රමාණයක්, එහෙම නැත්නම් රුපියල් බිලියන 1,400ක - රුපියල් ට්‍රිලියන 1.4ක - මුදලක් මුදා හැර තිබෙනවා. ඒ තුළින් අපි බලාපොරොත්තු වෙනවා, මේ අවුරුද්ද තුළ අපේ අධිවේගී මාර්ග ප්‍රමාණය කිලෝමීටර 50ක් දක්වා දීර්ඝ කර ගන්න. ඊට අමතරව කිලෝමීටර 25,000ක ජාතික මාර්ග සහ පළාත් මාර්ග, කිලෝමීටර 100,000ක ග්‍රාමීය මාර්ග වැනි පහසුකම් වැඩි කර ගන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඊට අමතරව අපේ ප්‍රවාහන පද්ධතියට අලුතින් දුම්රිය කට්ටල 5ක් ගෙනෙන්නත්, අලුතින් බස් රථ 900ක වාගේ ප්‍රමාණයක් ධාවනයට එක්කහු කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. යටිතල පහසුකම් පැත්තෙන් අපි ඒ කටයුතු කරලා තිබෙනවා.

ඊට අමතරව අපි අඛණ්ඩ බලශක්ති සැපයුමක් පවත්වාගෙන යන්න අදාළ ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. මොකද, හයිඩ්‍රජන් යොදාගෙන battery backup system එකක් හදලා විදුලිය නිපදවන්න අවශ්‍ය කටයුතු මේ වෙනකොට අපි ඉදිරිපත් කරපු අය වැය තුළ යෝජනා විධියට දමා තිබෙනවා. ඊට අමතරව දත්ත මධ්‍යස්ථාන - data centres, සන්නිවේදන කුලුනු වාගේ යටිතල පහසුකම් වැඩිදියුණු කරන්නත් අපි රජය විධියට භෞතික වශයෙන් ක්‍රියාමාර්ග විශාල ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. ඒ වෙනුවෙන් අපි ක්‍රියාත්මක වෙමින් පවතිනවා. එතකොට ඒක ආයෝජකයෝ කැන්දන්න බලපාන සුවිශේෂී කාරණයක් වෙනවා. මම ඒ කිව්වේ භෞතික පැත්තෙන් ගත් ක්‍රියාමාර්ග.

ඊට අමතරව අපි ඩිජිටල් ආර්ථිකය වර්ධනය කරන්නත් ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. ඩිජිටල් ආර්ථිකය වර්ධනය කිරීම ගත්තාම, ප්‍රධාන කරුණු කිහිපයක් යටතේ අපි ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. ඒ අනුව ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයක් පිහිටුවා ඒ යටතේ රටේ ඩිජිටල් ආර්ථිකය වර්ධනය කරන්න අවශ්‍ය උපාය මාර්ග අරගෙන, සැලසුම් සකස් කරලා මේ වනකොට ඒවා ක්‍රියාවට නඟමින් තිබෙනවා. ඒ යටතේ තිබෙන ප්‍රධාන කාරණයක් තමයි, ආයෝජකයන්ට බලපාන තනි කවුළුවක් - Single Window system එකක් - ඇති කිරීම. ඒ Single Window system එකක් ඇති කිරීම තුළ ඕනෑම ආයෝජකයෙකුට දුරස්ථ ප්‍රවේශයක් යටතේ සම්බන්ධ විය යුතු ආයතනවලට online හරහා සම්බන්ධ වෙලා තමන්ගේ කටයුතු ඉතාම කෙටි කාලයකින්, කඩිනම්ව ඉටු කර ගැනීමේ හැකියාව ලැබෙනවා. ඒ අනුව National Single Window System එකක් ඇති කරන්න කටයුතු කරමින් පවතිනවා.

ඊට අමතරව ශ්‍රී ලංකා රේගුව පැත්තෙන් ගත්තොත්, අපි වෙළෙඳ පහසුකම් - trade facilitations - වැඩි කිරීම යටතේ Single Window එකක් ඇති කරලා තිබෙනවා. ඒක විශේෂයෙන්ම ආනයනකරුවන්ට සහ අපනයනකරුවන්ට විශේෂ රුකුලක් වෙනවා. ආනයනකරුවෙක් ගත්තොත්, ඔහුගේ ආනයන මේ රටට ළඟා වෙන්න කලින් pre-arrival processing කියලා තමන්ගේ documents ටික ඉදිරිපත් කරලා, නිෂ්කාසන කටයුතු සිද්ධ කරගෙන, ඒ ආනයනික භාණ්ඩ මේ රටට ළඟා වුණු සැණින් කිසි ප්‍රමාදයකින් තොරව ශ්‍රී ලංකා රේගුවෙන් - Sri Lanka Customs එකෙන් - නිදහස් කර ගැනීමේ හැකියාව ලැබෙනවා. යටිතල පහසුකම් වැඩි කරන්න, ආයෝජකයෝ කැන්දන්න ආදී වශයෙන් භෞතික වශයෙන් වැදගත් කරුණු අපි දැන් ස්ථාපනය කරමින් පවතිනවා.

තුන්වැනි කාරණය තමයි, අපේ පුහුණු ශ්‍රමය. අපි රට තුළ තිබෙන පුහුණු ශ්‍රමය වැඩි කරන්න අවශ්‍ය උපාය මාර්ග අරගෙන තිබෙනවා.

හතරවැනි කාරණය තමයි, බදු සහන. බදු සහන ගත්තාම, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතට අවශ්‍ය

සංශෝධන අපි මෑතකදී ඉදිරිපත් කළා. ආයෝජකයෝ ගෙනෙන ආයෝජන ප්‍රමාණය අනුව සහ ලබා දෙන ලද රැකියා අවස්ථා ප්‍රමාණය අනුව අදාළ බදු සහන ලබා දෙන්න අවශ්‍ය කටයුතු කර තිබෙනවා. ඊට අමතරව, දේශීය ආයෝජකයෝ එනවා නම් ඒ ආයෝජන ප්‍රමාණ අනුව සහ ඒගොල්ලන් ලබා දෙන රැකියා අවස්ථා අනුව ඔවුන්ට අවශ්‍ය බදු සහන ලබා දෙන්නත් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත -Strategic Development Projects Act - යටතේ අපි කටයුතු කර තිබෙනවා.

ආයෝජකයෝ දිරිමත් කරන්න ඒ බදු සහන ලබා දීමට අවශ්‍ය නීතිමය සංශෝධන මේ නියෝග යටතේ ගෙනැල්ලා තිබෙනවා. ඊටත් අමතරව ආයෝජකයන්ගේ ආයෝජන ආරක්ෂාව සුරක්ෂිත කරන්න ආයෝජන ආරක්ෂණ පනත් කෙටුම්පත - Investment Protection Bill - ඉදිරියේදී ගෙනෙන්න අපි බලාපොරොත්තු වනවා. ඒ වාගේම ආයෝජන ප්‍රවර්ධන පනත් කෙටුම්පතත් - Investment Promotion Bill - ඉදිරියේදී ගෙනෙන්න බලාපොරොත්තු වනවා. ආයෝජකයන් දිරිමත් කරන්නයි අපි එම නීති ගෙනෙන්නේ. ආයෝජකයෝ දිරිමත් කිරීම තුළින් වඩ වඩාත් දේශීය සහ විදේශීය ආයෝජන කැඳවා ගැනීමට උත්සාහ ගන්නවා. ඒ ඇසුරින් අපි අද බලාපොරොත්තු වන ආර්ථික වර්ධන වේගය අත්පත් කරගෙන ආර්ථිකය පුළුල් කිරීමේ ගමනක තමයි අපි ඉන්නේ. මේ ගමන යාමේදී අපට මේ වෙලාවේ හොඳ අවස්ථාවක් ලැබිලා තිබෙනවා; මේ යුද්ධයත් එක්ක මැද පෙරදිග තිබෙන ආයෝජන අපේ රටට කැඳවා ගැනීමේ හොඳ අවස්ථාවක් අපට ලැබිලා තිබෙනවා. නමුත්, විපක්ෂය විසින් නිතරම ගරු සභාවේ අනියත බියක්, අනියත අවිශ්වාසයක් ඇති කරන්න හදනවා, අපේ රටේ බලශක්ති අර්බුදයක් එන බවට. අපේ රට තුළ බලශක්තිය, අනෙකුත් ප්‍රභව සහ යටිතල පහසුකම් පිළිබඳ අනියත අවිශ්වාසයක් ඇති කරන්න හදනවා. එහෙම නැහැ. අපි රජය විධියට ජනතාව සහ ආයෝජකයෝ වෙනුවෙන් අඛණ්ඩ බලශක්ති සැපයුමක් ලබා දෙන්න බැඳිලා ඉන්නවා. ඒ වෙනුවෙන් කටයුතු කරන බවත්, විපක්ෂය නඟන බොරු චෝදනාවලට අහු වෙන්න එපා කියාත් අයෝජකයන්ට කියමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. M.K.M. ASLAM took the Chair.*

[අ.භා. 1.11]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ ඉදිරිපත් කර තිබෙන නියෝග අනුමත කිරීම තමයි අද මෙම විවාදයෙන් බලාපොරොත්තු වෙන්නේ. විශේෂයෙන්ම මේ මොහොත වන විට අපේ රට සහ අපේ රටේ ජනතාව මුහුණ දෙන ගැටලුකාරී තත්ත්ව පිළිබඳව මේ ලැබුණු මිනිත්තු අටේදී කථා කරන්නයි මම අදහස් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ දේශපාලන ඉතිහාසය පුරාවටම ජනතාව විසින් විවිධ ආණ්ඩු පත් කර ගත් හැටිත්, ඒ පත් කර ගත් ආණ්ඩු බිඳ වැටුණු හැටිත් අපි ඕනෑ තරම් දැක තිබෙනවා. ඒ හැම වෙලාවකදීම මිනිසුන් ඡන්දය දුන්නේ ඒ ඒ පක්ෂ රාජ්‍ය පාලනය කළ කාලවල සිදු කළ සහ සිදු නොකළ වැඩ කිරලා, මැනලා බලලා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාව අතීතයේදී එහෙම ආණ්ඩු පිහිටෙව්වාට මෙවර අතීතයේ කළ වැඩ ගැන නොහිතා ඡන්දය දුන්නා. අපට මතකයි, විටෙක එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් බලයට පත් වනවා. ඊට පසුව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මිනිසුන් ඡන්දය දීලා ආණ්ඩුකරණයට පත් කර ගන්නවා. නමුත්, මෙවර පළමු වතාවට මේ රටේ මිනිස්සු අතීතයේ කළ වැඩ ගැන නොහිතා ඡන්දය දුන්නා. ඉස්සර යූඑන්පී ආණ්ඩුව පත් කරනකොට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව පත් කරනකොට මිනිසුන් බැලුවා, කළේ මොනවාද, නොකළේ මොනවාද කියලා. එහෙම බලලා තමයි ආණ්ඩු පත් කළේ. මෙවර පළමු වතාවට ඒ මොකක්වත් නොබලා ඡන්දය දුන්නා. තමුන්නාන්සේලාගේ ප්‍රතිවාදීන් හැමෝම ජේවීපී එකේ අතීත ක්‍රියාකාරකම් අනන්තවත් කිව්වා. නමුත්, මිනිස්සු ඒවා ගැන බැලුවේ නැහැ. මහජනයා ඒ හැම දේකටම වැඩිය තමුන්නාන්සේලාගේ වචන ගැන අප්‍රමාණ විශ්වාසයකින් තමයි ආණ්ඩු බලය ලබා දුන්නේ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව බලයට පත් කළ මහා පොදු සාධකය තමයි, ජනතාවට කප්පරක් පොරොන්දු දෙමින් තමුන්නාන්සේලා පාවිච්චි කළ වචන.

හැබැයි, මේ අවස්ථාව වනකොට තමුන්නාන්සේලා බලයට පත් කළ මහා පොදු සාධකය වෙච්ච ඒ වචනවල විශ්වාසය බිඳ වැටිලා ඉවරයි. ආණ්ඩුව කිව්වාම, පෝලිම්වලට යන්න එපා, ඇති තරම් තෙල් තිබෙනවා කියලා, ඡන්දය දීපු අයයි, නොදීපු අයයි දෙගොල්ලෝම තෙල් පෝලිමට යනවා. ආණ්ඩුව කිව්වොත්, ඇති වෙන්න ගෑස් තිබෙනවා කියලා, ඡන්දය දීපු අයයි, නොදීපු අයයි වැඩි වැඩියෙන් ගෑස් පෝලිමට යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව කිව්වාම තෙල් මිල වැඩි වෙන්නේ නැහැ කියලා, ජනතාව හිතනවා, අනිවාර්යයෙන්ම තෙල් මිල වැඩි කරන්නයි හදන්නේ කියලා. ආණ්ඩුව කිව්වාම, විදුලි බිල වැඩි කරන්නේ නැහැ කියලා, ඡන්දය දීපු අයයි, නොදීපු අයයි දෙගොල්ලෝම දන්නවා බාල ගල් අඟුරු වංචාවේ පාඩුව පියවා ගන්න අනිවාර්යයෙන්ම විදුලි බිල ළඟදීම වැඩි වෙයි කියලා.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුද්ගලයෙකුට වේවා, පක්ෂයකට වේවා, රජයකට වේවා, විය හැකි විශාලම හානිය තමයි තමන්ගේ වචන ගැන තිබෙන විශ්වාසය බිඳ වැටීම. මේ රජයටත් අද වෙද්දී ඒ දේ තමයි වෙලා තිබෙන්නේ කියන එක මට කියන්න සිද්ධ වෙනවා. මේ මොහොත වන විට ගම්වල අලුත් ප්‍රස්ථා පිරුළු හැදිලා තිබෙනවා. පසුගිය වකවානුවේ වෙච්ච දේවල් එක්ක අලුත් ප්‍රස්ථා පිරුළු දැන් ගම්වල ඇහෙන්න ලැබෙනවා. "තහඩු කැල්ලකට ලක්ෂ දහය දුන්නා වාගේ", "කැඩුණු ගෙයකට කෝටියක් දුන්නා වාගේ", "සංගණනයෙන් රිළව් පැන්නුවා වාගේ" කියන අලුත් දේවල් දැන් අහන්න ලැබෙනවා. නමුත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොතේ රට මුහුණ දෙන තත්ත්වය සුපුරුදු බොරු වචනවලින් පමණක් කළමනාකරණය කර ගන්න බැරි බව අපි ආණ්ඩුවට මතක් කර දිය යුතුව තිබෙනවා.

යුද්ධය ආරම්භ වෙලා දෙසතියක් තුළ අපේ රටට එය දැනිලා තිබෙන හැටි බලන්න. කොයි තරම් මිනිස්සු ඒක අත්විඳිනවාද කියලා දැන් පාරට බැස්සාම පෙනෙනවා. මේ යුද්ධය තවදුරටත් ඇදුණොත් ඇති වන තත්ත්වය ගැන වාගේම පශ්චාත් යුද ප්‍රතිඵල ගැන රජය මීට වැඩිය බරපතළ ලෙස බැලිය යුතුව තිබෙනවා, ක්‍රියා කළ යුතු තිබෙනවා කියන එක මම කියන්න කැමැතියි. ඒ නිසා අත්දැකීම් සහිත විෂයය ප්‍රවීණයන්ගෙන් අහලා ප්‍රායෝගික විසඳුම්වලට යන්න ඕනෑ අවස්ථාවක තමයි දැන් ආණ්ඩුව ඉන්නේ. කරුණාකර සුපුරුදු උද්ධච්චකමෙන් ඉවත් වෙලා මේ තත්ත්වය හරියට කළමනාකරණය කර ගන්න වගකිව යුතු ආණ්ඩුවක් හැටියට කටයුතු කරන්න කියා අපි ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රට පුරා ගොවි ජනතාව අස්වනු නෙළන කාලයයි දැන් එළැඹිලා තිබෙන්නේ. ඒ මිනිස්සුන්ගේ යන්ත්‍ර-සූත්‍රවලට හරියට තෙල් ටික දීමට හරි හමන් වැඩ පිළිවෙළක් ඇති කරන්න කියලා අපි ආණ්ඩුවට කියනවා. ගොවි ජනතාවට ප්‍රමාණවත් විධියට, වෙලාවට ඒ තෙල් ටික ගන්න බැරි නම් ඒ මිනිස්සුන්ට ලොකු ප්‍රශ්නයක් වෙනවා. ඒ වාගේම අපේ රටේ ධීවර ප්‍රජාවට තමන්ගේ ධීවර රැකියාව අවශ්‍ය පරිදි කර ගන්න ඉන්ධන ප්‍රමාණයක් ලබා දිය යුතුව තිබෙනවා. දැන් දෙන විධියට දියඹට යන්න පුළුවන්, එන්න බැහැ කියලා තමයි ධීවරයෝ කියන්නේ. ඒ නිසා මේවා ගැන ප්‍රායෝගිකව කල්පනා කර විසඳුම් දිය යුතුව තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මම තව අමතරව විනාඩි දෙකක කාලයක් ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම මේ, tourist season එක. මේ කාලය සංචාරකයෝ බහුලව සිටින කාලයක්. සංචාරකයින්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් දෙන වාහනවලට අඩුවක් නැතිව තෙල් මිලදී ගැනීමට පහසුකම් දිය යුතුව තිබෙනවා. ඊළඟට, බහලුම්වලට ප්‍රමාණවත් පරිදි තෙල් නොලැබුණොත් රටේ සමස්ත සැපයුම් ජාලය බිඳ වැටෙන්න පුළුවන්කම තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ත්‍රිරෝද රථවල හයර් ගිහිල්ලා එදිනෙදා ආදායමක් ලබාගෙන දරු පවුල් නඩත්තු කරන ලක්ෂ සංඛ්‍යාත පිරිසක් අපේ රට පුරාම ඉන්නවා. ඒ අයට ප්‍රමාණවත් පරිදි තෙල් ලැබුණේ නැත්නම් ජීවත්වීමේ ප්‍රශ්නයක් ඇති වෙනවා. බැකෝ යන්ත්‍ර, ඩෝසර් වාගේ බර වාහනවලට ප්‍රමාණවත් පරිදි තෙල් ලබා දීමට බැරි වුණොත් ලක්ෂ ගණනකගේ ජීවනෝපායට එය බලපාන්න ඉඩ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යුදමය තත්ත්වය නිසා අපේ ප්‍රධාන තේ ගැණුම්කරුවන් වෙච්ච ඉරානය ප්‍රධාන මැද පෙරදිග රටවලට අපේ තේ අළෙවි කිරීම සම්බන්ධයෙන් යම් කිසි ගැටලුවක් ඉදිරියට ඇති වුණොත් ඒ පිළිබඳව ආණ්ඩුවේ තිබෙන සූදානම මොකක්ද කියලා අපි දැන ගන්න කැමැතියි. ඒ ගැන වැවිලි කර්මාන්ත ඇමතිතුමා රාජ්‍ය තාන්ත්‍රිකව කළ මැදිහත්වීම් මොනවාද කියලා දැන ගන්න කැමැතියි. දැනටමත් මේ කතන්දර දාලා කුඩා තේ වතු හිමියන්ගෙන් රුපියල් 5ක් විතර කපනවා. සාමාන්‍යයෙන් අපේ පළාත්වල තේ දළුවලට advance එකක් ගන්න පුරුද්දක් තිබෙනවා. ඒ ගැන කර්මාන්ත ඇමතිතුමාත් හොඳටම දන්නවා. හෙට-අනිද්දා සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වනකොට advance ගන්නා කාලය. දැන් ඒවා සීමා කරලා තිබෙනවා. ඒ වාගේම, පොහොර ප්‍රශ්නය ගැනත් අද මහජනතාව -විශේෂයෙන් ගොවි ජනතාව- බරපතළ ලෙස කල්පනා කරන්න පටන් අරගෙන තිබෙනවා, මේ තත්ත්වය යටතේ ඒකට මොනවා වෙයිද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කාරණය තමයි, දැන් මේ සමහර වාහන මිලට ගත්තාට QR code එක තිබෙන්නේ පරණ හිමිකරුවාට. ඒ නිසා වාහනය අලුතෙන් ගත්ත කෙනාට QR code එක හදා ගන්නත් තවම බැරි වෙලා තිබෙනවා. ගමනක් බිමනක් යන්න බැරි වෙලා තිබෙනවා. තෙල් ටික ගන්න පෝලිමට ගිහිල්ලාවත් ඉන්න පුළුවන්කමක් නැහැ, QR code එක නැති නිසා. ඒ නිසා මේ කාරණා ගැන විශේෂයෙන් අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මම මතක් කරන්න කැමැතියි, තව සති දෙක, තුනකින් අපේ රටේ ජනතාවගේ ප්‍රධානම උත්සව අවස්ථාව වන සිංහල හා හින්දු අලුත් අවුරුද්ද උදා වෙන බව. මේ ආණ්ඩුව බලයට පත් වෙලා පළමුවෙනි ජනවාරි 01වැනිදා රටේ ජනතාවට ලුණු තිබුණේ නැහැ. මේ ආණ්ඩුව බලයට පත් වෙලා පළමුවැනි සිංහල අලුත් අවුරුද්ද උදා වන කොට හාලුත් නැහැ; පොලුත් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අමතර කාලය පටන් ගන්නවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මට වෙන් කරපු කාලය ඉවර වෙන්නද හදන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අමතර විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
අපි දැක්කා, පසු ගිය සිංහල අලුත් අවුරුද්ද වනකොට හාලුත් නැතුව, පොලුත් නැතුව ළතැවෙන්න සිදු වුණු ආකාරය. මේ ආණ්ඩුව බලයට පත් වෙලා දෙවන සිංහල අලුත් අවුරුද්ද උදා වන කොට "නැකතුත් නැහැ, තෙලුත් නැහැ" කියන්න සිද්ධ වෙයි කියලා තමයි දැන් අපට පෙනෙන්නට තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්වය උදා වෙයි කියලා කවුරුවත් හිතුවේ නැහැ. මේ ආණ්ඩුව බලයට පත්

වනකොට විශේෂයෙන්ම ජනතාවට දීපු පොරොන්දුත් එක්ක, මවලා පෙන්නපු විත්‍රපටත් එක්ක මෙහෙම තත්ත්වයක් එයි කියලා ජනතාව හිතුවේ නැහැ. ජනාධිපතිතුමා පසුගිය කාලයේ කිව්වේ, "අපේ ආණ්ඩුවක් ආවොත් තෙල් පෝලිම් නැහැ; ගෑස් පෝලිම් නැහැ. ඒ වෙනුවට සිනමාශාලා ඉස්සරහා විතරයි පෝලිම් දකින්න ලැබෙන්නේ" කියලායි. බලයට එනකල්ම කිව්වේ, පැවැති ආණ්ඩු තෙල්වලට අසීමිත බද්දක් ගහනවා කියලායි. "වරායට ගොඩබාන කොට තෙල් ලීටරයක මිල අච්චරයි, බදු මෙච්චරයි, ඇමතිගේ කොමිස් එක මෙච්චරයි, ජනතාවට මෙන්න මේ ගණනට දෙන්න පුළුවන්" කියලායි කිව්වේ. එහෙම කියලා තමයි බලය ගත්තේ. නමුත් අද? වගකිව යුතු විපක්ෂයක් හැටියට අපි කියන්නේ නැහැ, තෙල්වලට බදු ගහන එක නවත්වන්න කියලා. සියයට 100ක්ම බදු ඉවත් කරලා සහන දෙන්න පුළුවන් කියා වගකිව යුතු විපක්ෂයක් හැටියට, ආණ්ඩු කරපු උදවිය හැටියට අපි කියන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මේ අමාරු වෙලාවේ ඒ බද්දෙන් සියයට 50ක්වත් අඩු කරලා ජනතාවට සහනයක් දෙන්න වහාම පියවර ගන්න කියා අපි කියන්න කැමැතියි. ඒ කාලයේ ලෝකයේ තෙල් මිල වැඩි වන හැම වෙලේම තමුන්නාන්සේලා ඇහුවේ මොකක්ද? "ලෝකයේ තෙල් මිල නගින කොට නග්ගන්නයි, මිල බස්සන කොට බස්සන්නයි ආණ්ඩු මොකටද?" කියලායි. එහෙම අහපු අයගේ ආණ්ඩුවක් තමයි දැන් තිබෙන්නේ. එහෙම නම්, කරුණාකර ඒවාත් මතක තියාගෙන කටයුතු කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මේ අවසාන තත්පර කීපයේ මම මේ කාරණයත් කියනවා. එදා විදුලි බිල සියයට 33කින් අඩු කරන හැටි ගණන් හදලා පෙන්නුවා. "අර ගණනට තිබෙන එක මේ ගණන වෙනවා. මේ ගණනේ එක අර ගණන වෙනවා" කියලා පෙන්නුවා. දැන් ඉතින් බාල ගල් අඟුරුවල, දූෂිත ගනුදෙනුවල ප්‍රතිඵල හැටියට ජනතාව දන්නවා ළඟදීම තමන්ට විදුලිය බිලෙනුත් පහර වදින බව. මේ අසීරු අවස්ථාවේ කරුණාකර ජනතාව මත බර පටවන්නේ නැතුව, පිරිලා ඉතිරිලා ගිය භාණ්ඩාගාරයෙන් සහන දෙන්න කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.22]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි, මට කාලය ලබා දුන්නාට.

කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග අනුමත කිරීමේ විවාදය තමයි අද යෙදිලා තිබෙන්නේ. ඒ ගැන කථා වෙච්ච නිසා සහ ඒ සම්බන්ධයෙන් ලොකු විරෝධයක් විපක්ෂයෙන් පවා මතු නොවන නිසා මම හිතුවා මේ අවස්ථාවේ ලෝකයේ ඇති වෙලා තිබෙන තත්ත්වය සහ ඒ සම්බන්ධව අපේ රටේ ප්‍රතිචාරය කුමක් විය යුතුද, විශේෂයෙන් පාර්ලිමේන්තුව හැටියට සහ ජනතාව හැටියට අප ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්විය යුත්තේ කොහොමද කියන එක ගැන පොඩ්ඩක් කථා කළා නම් හොඳයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප ඇත්තටම මේ අවස්ථාවේ බලන්න ඕනෑ දෙයක් තිබෙනවා. අප ඉන්නේ යුද්ධමය තත්ත්වයක. ඒ කියන්නේ, ගෝලීය යුද්ධමය තත්ත්වයක තමයි අප අද වනකොට ස්ථානගත වෙලා ඉන්නේ. ඊශ්‍රායලය විසින් ඉරානයට කරපු පහර දීමට පිළිතුරක් හැටියට ඉරානය විසින් මැද පෙරදිග රටවල් කිහිපයක බලශක්ති කේන්ද්‍රස්ථානවලට කරන පහරදීම් සහ විශේෂයෙන්ම හෝමුස් සමුද්‍ර සන්ධිය ආශ්‍රිතව සිදු කර තිබෙන බාධා කිරීම් නිසා මේ වෙලාවේ ගෝලීය සැපයුම් දාමවලට විශාල බලපෑමක් එල්ල වෙලා තිබෙනවා. හෝමුස් සමුද්‍ර සන්ධිය හරහා ගෝලීය තෙල් සැපයුමෙන් තුනෙන් එකක් ප්‍රවාහනය වෙනවා. ඒ වාගේම, එය ආහාර සැපයුමට ඉතාම තීරණාත්මක තැනක්. අන්න ඒ සමුද්‍ර සන්ධිය සම්බන්ධයෙන් ඇති කර තිබෙන තත්ත්වය හේතුවෙන් ඒ ඔස්සේ නැව් ගමන් කිරීම සීමා වීම නිසා සහ ඒකට බාධා කිරීම් සිදු වන නිසා මේ වනකොට විශේෂයෙන්ම ආසියාවට කෙරෙන තෙල් සැපයුම ඇතුළු අනෙකුත් සියලු සැපයුම්වල කඩා වැටීමක් තිබෙනවා. ඒක තමයි කිව්වේ, අප මේ ගෝලීය තත්ත්වය තේරුම් ගන්න ඕනෑ කියලා.

මේක ආසියාවේ තෙල් සැපයුම සම්බන්ධ ප්‍රශ්නයක්. ආසියාවේ තෙල් සැපයුම කියලා කිව්වාම, ලංකාව ඇතුළු දකුණු ආසියාතික රටවල් විතරක් නොවෙයි, Southeast Asian countriesවලට පවා -තායිලන්තය, තායිවානය, මැලේසියාව, ඉන්දුනීසියාව වැනි රටවලට පවා - මේ තෙල් ප්‍රශ්නය බලපාමින් තිබෙනවා. ඒ රටවල් හැම එකක්ම තමන්ගේ තෙල් සැපයුම අඩාළ වන අවස්ථාවලදී තෙල් මිල වැඩි කරනවා. තෙල් සැපයුම විතරක් නොවෙයි, ඕනෑම සැපයුමක් අඩාළ වන අවස්ථාවකදී වන දේ තමයි එහි මිලට අනිවාර්ය බලපෑමක් සිදු වීම.

සැපයුම කඩාගෙන වැටුණාම මිල වැඩි වීමක් අනිවාර්යයෙන් සිද්ධ වෙනවා. ඒක සමහර වෙලාවට කළුකඩ මිලක් දක්වා ඉහළ යනවා. ඒකම තමයි තෙල් සැපයුමටත් මේ අවස්ථාවේදී වෙලා තිබෙන්නේ. මෙහෙම වෙච්ච පළමුවැනි අවස්ථාව නොවෙයි, මේක. ලෝකයේ මීට ඉස්සර වෙලාත් මෙවැනි දේ සිද්ධ වෙලා තිබෙනවා. නමුත් ජාත්‍යන්තර වාර්තාවල පළ වන හැටියට සහ ජාත්‍යන්තර සංවිධාන විසින් පැහැදිලිවම ප්‍රකාශ කර තිබෙන හැටියට ඉතිහාසයේ තෙල් සැපයුමට සිදු වෙච්ච විශාලම disruption එක තමයි මේ වෙලාවේ සිදු වෙලා තිබෙන්නේ. ඉතින් අපි අන්න ඒ අවබෝධයෙන්, ඒ බරපතළකමින් ගෙන තමයි පාර්ලිමේන්තුව හැටියට මේ ප්‍රශ්නය ගැන කථා කරන්න අවශ්‍ය වන්නේ. මොකද, එසේ කිරීම අපට වැදගත්.

මේ ඇති වෙලා තිබෙන තත්ත්වය - ගෝලීය දේශපාලනයේ මේ ඇති වෙලා තිබෙන තත්ත්වය - කෙටි කාලීනව අපට අපහසුයි තමයි. ඒක ඇත්ත. අපේ ජනතාවට, අපේ කර්මාන්තකරුවන්ට, ඒ වාගේම රටක් හැටියට අප හැමෝටම කෙටි කාලීනව දුෂ්කරතා සහිත කාලයක් තමයි මේ උදා වෙලා තිබෙන්නේ. අපේ තෙල් සැපයුම අඩාළ වෙලා කියන්නේ, ගෝලීය තෙල් සැපයුම අඩාළ වෙලා තිබෙන නිසා. අප විසින් ඇණවුම් කරන ලද තෙල් නැව් ලංකාවට තවමත් එමින් තිබෙනවා. නමුත් අපි රටක් හැටියට සූදානම් වෙන්න ඕනෑ, අපට ලැබෙන තෙල් ටික; අප ඇණවුම්

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

කරලා ලබා ගන්නා තෙල් ටික උපරිම කාලයක් පරිභෝජනය කිරීමට. ඒක තමයි අර්බුදයක් අවස්ථාවේදී අප හැමෝගේම වගකීම. ඒ මානසිකත්වය තමයි අප ඇති කර ගන්න ඕනෑ. අප කෙටි කාලීනව ගොඩක් තෙල් පාවිච්චි කළොත්, අර්බුදය දීර්ඝ කාලීනව අපට බලපාන ආකාරය අනුව අපේ තෙල් සැපයුමට වෙන්න තිබෙන හානිය තවත් වැඩි වෙනවා. එහෙම වෙලා තිබෙනවා කියන එක නොවෙයි මේ කියන්නේ. නමුත් එසේ වීමේ හැකියාවක් තිබෙනවා. ඒ නිසා අපි රටක්, ජාතියක් හැටියට මේ වෙලාවේ අපේ තිබෙන සම්පත් අරපරිස්සමින් පරිභෝජනය කළ යුතුයි. ඒක තමයි පළමුවැනි කාරණය. ඒක අපට කෙටි කාලීනව අපහසුයි. ඒ නිසා තමයි අපි බදාදා නිවාඩු දිනයක් කරලා තිබෙන්නේ. ඒ නිසා තමයි QR code එකක් දමලා තිබෙන්නේ. ඒ නිසා තමයි රජයේ ආයතනවල තෙල් වියදම සියයට 25කින් කප්පාදු කිරීමට මැදිහත් වීමක් කර තිබෙන්නේ. ඒ අනුව කෙටි කාලීනව මේ වාගේ යම් යම් සීමාවීම්වලට ලක් වීමට අපට සිදු වෙනවා. ඒක අමාරුයි තමයි. ඒක අපි හැමෝම පිළිගන්නවා. රජය හැටියට අපටත් ඒක තේරෙනවා.

විශේෂයෙන්ම අපේ රටේ අවිධිමත් අංශයේ රැකියාවල නියුතු පිරිස්වලට, එදිනෙදා ආදායම් ලබන පිරිස්වලට ඒකෙන් යම් බලපෑමක් තිබෙන්නට පුළුවන්, ඉතාම ආසන්න වශයෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මෙවැනි අවස්ථාවකදී, මෙවැනි යුදමය තත්ත්වයකදී අපි රටක් හැටියට දීර්ඝ කාලීනව සූදානම් වෙන්න අවශ්‍යයි. කෙටි කාලීනව මේ තත්ත්වයට මුහුණ දෙනවා වාගේම අපි තේරුම් ගන්න ඕනෑ, මෙවැනි වෙනසකට, ගෝලීය දේශපාලන, ආර්ථික පද්ධතියේ සිදු වුණු මෙවැනි වෙනසකට අප දීර්ඝ කාලීනව මුහුණ දෙන්නේ කොහොමද කියන එක. ඒකත් අපි සලකා බලන්නට ඕනෑ. එතැනදී පැහැදිලිව පෙනෙන දෙයක් තමයි, මේ වෙලාවේ මැද පෙරදිග ඇති වෙලා තිබෙන තත්ත්වය සහ ගෝලීයව ඇති වෙලා තිබෙන තත්ත්වය හරහා ලංකාව ආර්ථිකමය ලෙස, දේශපාලනමය ලෙස, බලශක්තිමය ලෙස ස්ථාවර ආරක්ෂිත රටක් ලෙස ලකුණු වීම තුළින් සහ අප අපේ ඒ ශක්‍යතාවන්, capacity එක තව තවත් ගොඩනංවා ගැනීම තුළින් විදේශ ආයෝජන දීර්ඝ කාලීනව රට තුළට ආකර්ෂණය කර ගැනීමට අපට අවස්ථාවක් තිබෙනවා කියන එක.

ලෝකයේ බොහෝ රටවල් මේ වෙලාවේ අනාරක්ෂිත තත්ත්වයකට ගිහින් තිබෙනවා. නැව් එන්නේ නැති නිසා විතරක් නොවෙයි, ඔවුන් කෙළින්ම යුදමය තත්ත්වයන්ට සම්බන්ධ වෙලා තිබෙනවා; ඔවුන් යුද්ධයේ පාර්ශ්වකරුවන් බවට පත් වෙලා තිබෙනවා; යුද්ධයේ එක කඳවුරකට අයත් අය බවට පත් වෙලා තිබෙනවා. නමුත් ලංකාවට එහෙම වෙලා නැහැ. ලංකාව මධ්‍යස්ථභාවය ආරක්ෂා කරන රටක්. ඒ නිසා තමයි ගරු ජනාධිපතිතුමා විශේෂයෙන්ම රට අමතපු වෙලාවේ, ජාතිය අමතපු අවස්ථාවේ "මධ්‍යස්ථභාවය" කියන එක ඉතාම බරපතළ ලෙස අවධාරණය කළේ. කොයි තරම් අසීරුතා ආවත්, කොයි තරම් අමාරු වැඩක් වුණත් අපි ඒ මධ්‍යස්ථභාවය නඩත්තු කරන්නේ ඒ නිසායි. මොකද, අපේ මධ්‍යස්ථභාවය කියන එක, මේ ගැටුම්කාරී අවස්ථාවේදී අප මධ්‍යස්ථ රටක් හැටියට මැදිහත් වීම, රටක් හැටියට ආරක්ෂිත වීම කියන එක මේ අවස්ථාවේ විතරක් නොවෙයි, දීර්ඝ කාලීනවත් ලංකාව ආරක්ෂිත ආයෝජන ස්ථානයක් -destination එකක් - හැටියට ලංකාවේ තිබෙන හැකියාව - credibility එක - වර්ධනය කරනවා. අපේ මේ මධ්‍යස්ථභාවය අපේ දීර්ඝ කාලීන ආර්ථික ආයෝජනයක්. අපි ඒක තේරුම් ගන්න ඕනෑ.

මේ ලෝකයේ එක එක පැතිවලට බර වෙලා පාලනය කරපු රටවල් තිබෙනවා. අපට පෙනෙනවා, ඒවාට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා.

එවැනි ලෝකයක්, ඒ කියන්නේ පාර්ශ්වීයත්වය සහිතව තිබෙන ලෝකය අනතුරට ගිහිල්ලා තිබෙන අවස්ථාවේදී අපට පැහැදිලිව පෙනෙන දෙයක් තමයි අපේ දේශපාලන මධ්‍යස්ථභාවය. ඒ කියන්නේ, මේ රට ගෝලීයව තියෙද්දී අපේ දේශපාලනික මධ්‍යස්ථභාවය. ආර්ථිකමය ලෙස මේ ප්‍රශ්නය අපට capital එකක්; මේක අපට පාවිච්චි කරන්න පුළුවන්. ඒ කියන්නේ, අපේ ආරක්ෂාවට විතරක් නොවෙයි, ආර්ථික සංවර්ධනය සහ ආයෝජන වෙනුවෙන් පාවිච්චි කළ හැකි asset එකක් බවට මේක පත් වෙලා තිබෙනවා. ඒක අපි හඳුනාගත යුතුයි. හැබැයි, අපි ඒක හඳුනාගන්න ගමන්ම තේරුම් ගන්න ඕනෑ දේ තමයි, අපට තව මොනවාද අවශ්‍ය කියන එක. අපට අවශ්‍යයි දේශපාලන ස්ථාවර බව. අපේ රටේ මේ වෙනකොට ඇතිවෙලා තිබෙන තත්ත්වය දෙස බැලුවාම අපට පෙනෙන විධියට, විපක්ෂයේ සමහර බලවේග හිතාගෙන ඉන්නවා මේ ඔවුන්ගේ අවස්ථාව කියලා. නමුත් මම හිතන විධියට, ජනතාව අතර එහෙම කිසිදු අදහසක් නැහැ. දැන් මේ රට වැටෙන්නයි යන්නේ, දේශපාලනය අස්ථාවර වෙන්නයි යන්නේ කියලා සමහර කණ්ඩායම් හරි සතුටක් ලබන බව අපට පෙනෙනවා. දේශපාලන අස්ථාවරභාවය කියන එක අපට දීර්ඝකාලීනව අවාසි සහගතයි. අපි මධ්‍යස්ථභාවය නඩත්තු කරලා මේ asset එක හදා ගත්තාට වැඩක් නැහැ, අනාගතයේදී අපි දේශපාලන වශයෙන් අස්ථාවරභාවයට පත් වුණොත්. මේ දේශපාලන අස්ථාවරභාවය කියන සාකච්ඡාව රටේ ඇති කරන්නවත් ඕනෑ සාකච්ඡාවක් නොවෙයි. නමුත්, අපට පෙනෙනවා මිනිස්සු පිළිනොගත්තත්, පටු දේශපාලන වාසි සඳහා ඉතාම නරක සාකච්ඡාවක් ඇති කරන්න උත්සාහ කරන බව.

දෙවැනි කාරණය තමයි, රටක් හැටියට අපි සාර්ව ආර්ථිකමය ලෙස ශක්තිමත් වෙන්න ඕනෑකම. පසුගිය අවුරුද්ද තුළ ජාතික ජන බලවේගය රජයේ වැදගත්ම සාර්ථකත්වය තමයි සාර්ව ආර්ථිකය සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය තුළින් ලබාගත්ත සාර්ථක බව. අපි අය වැය හිඟය සියයට 2.4කට අඩු කරලා තිබෙනවා. අපි ණය පොලී ගෙවීමේ වියදම අඩු කරලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට තව පොඩි වේලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි Budget deficit එක අඩු කරලා, ණය ගැනීමට තිබෙන වුවමනාව අඩු කරලා, රාජ්‍ය වියදම හරියට කළමනාකරණය කරලා, රාජ්‍ය ආදායම වැඩි කරගෙන, රජයේ මූල්‍ය ස්ථාවරත්වය පවත්වාගෙන, රුපියල් ට්‍රිලියනයකට වැඩි මුදලක් රජයේ භාණ්ඩාගාරයේ රඳවාගෙන මෙන්න මේ ආර්ථිකමය ස්ථාවරත්වය හදාගෙන තිබෙනවා. මේක අපට අනාගතයේදී වැදගත්. ඒ නිසා ඒකට බාධා වන ආකාරයට අපි කටයුතු නොකළ යුතුයි. මේ තත්ත්වය ගැන මේ වෙලාවේ විපක්ෂයටත් වගකීමක් තිබෙනවා වාගේම, විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුවටත් වගකීමක් තිබෙනවා, නැකැත් ගැන කථා කරන්නයි, අප්‍රේල්වල අවුරුදු සමරන එක ගැන කථා කරන්නයි යනවාට වඩා. අවුරුදු සමරන එක වැදගත් තමයි. නමුත්, අපි හිතන්න ඕනෑ මේ වාගේ දේශපාලන සාකච්ඡා ඇති කිරීම තුළින් දීර්ඝකාලීනව රටට සිදුවන හානිය ගැන. ඒ ගැන කල්පනා කරන්නේ නැතිව මෙහෙම කථා කරන්න හොඳ නැහැ. ඒ නිසා අපි ඒ ගැන හිතන්න ඕනෑ.

ඇත්තටම අපි මේ අවස්ථාවේ වැඩ කරන්න ඕනෑ කොහොමද? අපේ විදේශ ප්‍රතිපත්තිය විසින් අපට golden opportunity එකක් හදලා දීලා තිබෙනවා. අනාගතයේදීත් ආර්ථික ආයෝජන සඳහා ඒක දිශාගත කරගැනීමට අපි මේක යොදාගන්න ඕනෑය කියන යෝජනාව කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.33]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් රජය ගෝලීය දේශපාලනය තුළ මැද මාවතේ යනවා කිව්වාට, ඇත්ත වශයෙන්ම ගිය සතියේ මේ යුද්ධය අස්සේ "Newswire" කියන නාළිකාව ප්‍රකාශයට පත් කර තිබුණා, අනුර කරුණාතිලක ඇමතිතුමා ඇමෙරිකාවට ගිහිල්ලා ශ්‍රී ලංකාවේ වරායවල් සහ ගුවන් තොටුපොළවල් ආරක්ෂා කිරීම පිළිබඳව ඇමෙරිකාවත් එක්ක සාකච්ඡා කරලා තිබෙනවා කියලා. ආ! විදේශ ඇමතිතුමා මේ අවස්ථාවේ සභාවේ සිටින එක හොඳයි.

ඒ සාකච්ඡාවෙන් පස්සේ සර්ජියෝ ගෝර් කියන දිල්ලියේ සිටින ඇමෙරිකානු තානාපතිවරයා ලංකාවට ඇවිල්ලා තිබෙනවා. ඔහු තමයි දකුණු ආසියාවේ ට්‍රම්ප්ගේ නියෝජිතවරයා. මයිකල් ජෙරිමියා කියන්නේ White House එකේ ආරක්ෂක කවුන්සලයේ සාමාජිකයෙක්. ඔහු දකුණු ආසියාව පිළිබඳව ඇමෙරිකානු බුද්ධි අංශය භාරව ඉන්න පුද්ගලයා. ඔහුත් ලංකාවට ඇවිල්ලා ඉන්නවා ලු. හැබැයි, මේක වැඩිය ප්‍රසිද්ධ නැහැ. ඔවුන් ඇයි ලංකාවට ආවේ? මේ යුද්ධයක් තිබෙන වෙලාවේ ලංකාවේ වරායවල්, ගුවන් තොටුපොළවල් ආරක්ෂා කිරීම ගැන ඇමෙරිකාව එක්ක කථා කළේ මොනවාද කියන එක මේ පාර්ලිමේන්තුවට පැහැදිලි කිරීමේ වගකීම රජයට තිබෙනවා. අනුර කරුණාතිලක ඇමතිවරයා ගිහිල්ලා ගිවිසුම් ගහන්න සාකච්ඡා කරපු දේවල් මොනවාද කියලා මේ පාර්ලිමේන්තුවට පැහැදිලි කිරීම අත්‍යවශ්‍යයි. මොකද, අහක යන එකක් ඉල්ලාගෙන කන්නේ නැතිව තිබෙන විධියට ගියා නම් ඊට වඩා හොඳයි කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Colombo Port City එක ගැන කථා කරන මේ වෙලාවේ මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපට මතකයි, වර්තමාන ජනාධිපතිතුමා ඒ කාලයේ කිව්වා, සීගිරි පර්වතය කැඩුවත්, ඒකේ තිබෙන කළුගල් ටික ගෙනාවත් මේක හරියන්නේ නැහැ කියලා.

නමුත්, අද මේ මැදපෙරදිග යුද්ධය වෙලාවේ Colombo Port City එක කියන්නේ ආයෝජන ගේන්න තෝතැන්නක්. නැඟෙනහිර ආසියාව පැත්තේ යුද්ධය නැහැ. ඒවායේ තිබෙන opportunities අපි බලන්න ඕනෑ. මේ තත්ත්වය තුළ අපට ආයෝජන ගේන pillars 4න් එකක් කොහොමටත් ආවේ නැහැ, විදේශ ආයෝජන. නේද? ඒක "බිග් කුච්චන්" වෙලා ගියා. ඒක ආවේ නැහැ. ඉතිරි තුන අතරින් අපනයනයට බාධා ඇවිල්ලා තිබෙනවා; ප්‍රේෂණවලට බාධා ඇවිල්ලා තිබෙනවා; සංචාරක කර්මාන්තයට බාධා ඇවිල්ලා තිබෙනවා. මේ විධියට ඩොලර් ආදායම හීනවෙලා ගියොත් අපේ රටට තෙල් ගෙන්වන එක, බෙහෙත් ගෙන්වන එක, කෑම ගෙන්වන එක පාලනය කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා ඉතා ඉක්මනින් ඩොලර් සෙවීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ සඳහා මේ Colombo Port City එක තෝතැන්නක් කරගන්න පුළුවන්. මේ Colombo Port City එකට විදේශීය ආයතනවලට වාගේම දේශීය, විදේශීය ඒජන්තයන් එක්ක එකතු වෙලා ගේන්න පුළුවන් කර්මාන්ත තිබෙනවා. ඒ වාගේම, විශේෂයෙන්ම මේ ක්ෂේත්‍රයේ ආයෝජකයන් ඉන්නවා. මේ අය ගෙන්වන්න. Unsolicited proposalsවලට යන්න හොඳ වෙලාවක් මේක. එහෙම ගෙනැල්ලා ඉතා ඉක්මනින් අපේ රටට ඩොලර් ගෙන ඒමේ අවශ්‍යතාවක් තිබෙනවා. අශ්වයා ගියාට පස්සේ ඉස්තාලය වහලා වැඩක් නැහැ. වැරදුණාට පස්සේ සීමාසහිතව ඩොලර් ගේන්න තිබ්බව ඒවා ලිහිල් කරලා හරියන්නේ නැහැ. ඒ නිසා ආණ්ඩුවට ඒ සම්බන්ධයෙන් ඇස් පැදේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම, කොළඹ නගරයේ නාගරික සංවර්ධන අධිකාරිය ව්‍යාපෘති 22ක් තිබෙනවා. දැන් නාගරික සංවර්ධන අධිකාරිය ඩොලර් මිලියන 500ක් මේ අවුරුද්දට ගේන්න බලාපොරොත්තු වෙනවා ලු. හැබැයි, ඉදිරි මාස 3ක කාලය තුළ ඒකෙන් යම් කොටසක් ගේන්න අවශ්‍ය කටයුතු ඉක්මන් කරන්න, නීති ලිහිල් කරන්න කියලාත් අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි මේ කාරණයත් පැහැදිලිව කියන්න ඕනෑ. වග කිවයුතු විපක්ෂයක් විධියට අපි QR code එක සම්බන්ධයෙන් මේ ආණ්ඩුවට "කෝචොක්" කරන්නේ නැහැ, ඒගොල්ලන් "කෝචොක්" කළා වාගේ. ඒ සඳහා ඕනෑ තරම් වීඩියෝ තිබෙනවා, දාලා පෙන්වන්න පුළුවන්. ඔත්තේ අංකවලට, ඉරට්ටේ අංකවලට ඒ කාලයේ "කෝචොක්" කරපු විධිය මේ උදවියට මතකද දන්නේ නැහැ. මගේ මිත්‍රයා ආණ්ඩු පක්ෂයේ ඉදිරි පේළියේ ඉන්නවා. නම කිව්වොත් නැඟිටින නිසා මම එතුමාගේ නම කියන්නේ නැහැ. මාතර දිස්ත්‍රික්කයේ මගේ මිත්‍රයා. ඒ කාලයේ මේවාට "කෝචොක්" කළා. හැබැයි, අද අපි ඔබතුමන්ලාට "කෝචොක්" කරන්නේ නැහැ. හරි ද? කරුමය කියන්නේ, මේ අයටත් අද ඒවාම කරන්න සිද්ධ වීම. අපි මේකත් මේ අයගෙන් අහන්න ඕනෑ. රටේ මෙවැනි තත්ත්වයක් තුළ, work from home ක්‍රමයෙන් කුඹුරු කොටන්නේ කොහොමද? Work from home ක්‍රමයෙන් කොහොමද බෝට්ටුවේ ගිහින් මාළු අල්ලන්නේ? Work from home ක්‍රමයෙන් කොහොමද රෙස්ටුරන්ට් කරගෙන යන්නේ? තේ දළු කඩන්නේ කොහොමද? ඒ නිසා මේවාට අපි අවධානය යොමු කළ යුතුයි.

දැන් වැඩේ තිබෙන්නේ මේකයි. ආණ්ඩුව ඕනෑවටත් වඩා කලින් පාලනය ගේනවා. හේතුව, මිනිස්සු පාරට බහියි කියලා. හැබැයි, අපි එකක් කියන්න ඕනෑ. පැහැදිලිවම මිනිස්සු පාරට බහින එකට ආණ්ඩුව භයයි. ඒ නිසා මිනිස්සු පාලනය කිරීම සඳහා අවශ්‍ය දේවල් කරනවා. නමුත්, මොනවා කෙරුවත් දැන් හෝදන්න බැරි මට්ටමට ඇවිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ කාරණයත් මම පැහැදිලිව කියන්න ඕනෑ. අපේ ජනාධිපතිතුමා පසුගිය දවසක ජාතිය අමතද්දී කිව්වා, "බලශක්ති ඇමතිවරයාට තිබෙන චෝදනාවලට වරදකරු වුණොත් අයින් කරනවා" කියලා. විශේෂයෙන්ම පුණ්‍ය ශ්‍රී කුමාර ජයකොඩි ඇමතිවරයාට නඩුවක් වැටිලා තිබෙනවා. ඒක එතුමා නිලධාරියෙක් විධියට හිටපු කාලයේ වුණු එකක් ලු. හැබැයි, අපි මෙන්න මේකත් මතක් කරන්න කැමැතියි. අර්ජුන රණතුංග හිටපු ඇමතිවරයාටත්, ධම්මික රණතුංග හිටපු සභාපතිතුමාටත් මිලියන 800ක් සඳහා නඩු වැටුණේ හොරකම් කළා කියලා නොවෙයි. ඒ අයට නඩු වැටුණේ රජයට පාඩු කළා කියලායි. එතකොට, පුණ්‍ය ශ්‍රී කුමාර ජයකොඩි රජයට හානි කරපුවා සම්බන්ධයෙන් තවම ගණන් හදනවා. ගල් අඟුරු ටෙන්ඩර් එකට අදාළව දැන් නැව් 13ක් ඇවිල්ලා තිබෙනවා.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

නැව් 13න්, 12ක් ෆේල්. ගෙනාපු නැව් 12ක්ම ෆේල්. එතකොට, ප්‍රමිතියෙන් බාල ගල් අඟුරු ගෙනැල්ලා රජයට පාඩු කිරීමක් පැහැදිලිවම සිද්ධ වෙලා තිබෙනවා. මේවා මම කියන ඒවා නොවෙයි.

ඊයේ දවසේ විතරක් ලක්විජය බලාගාරයේ නිෂ්පාදනය වෙන්න ඕනෑ මෙගාවොට් ප්‍රමාණයෙන් මෙගාවොට් 176ක් අඩුයි. පෙරේදා මෙගාවොට් 165ක් අඩුයි. 16වැනි දා මෙගාවොට් 148ක් අඩුයි. දැන් ඒ වෙනුවට ඩීසල්වලින් නිෂ්පාදනය කරන විදුලිය මිලදී ගන්න වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් විදුලිය නිෂ්පාදනයට මාසයකට දෙන්නේ ඩීසල් මෙට්‍රික්ටොන් 1,500යි. මේ තෙල් අර්බුදය වෙලාවේ, මිනිස්සු පෝලිමේ ඉන්න වෙලාවේ, මිනිස්සු කට්ට කන වෙලාවේ, මිනිසුන්ට jobs කරගන්න බැරිව ඉන්න වෙලාවේ, කුඹුරු අස්වද්දා ගන්න බැරිව ඉන්න වෙලාවේ, ඌබර් දුවන්න බැරිව ඉන්න වෙලාවේ, ත්‍රීවීල් දුවාගන්න බැරිව ඉන්න වෙලාවේ, ඩීසල් මෙට්‍රික්ටොන් 1,500ක් වෙනුවට ඩීසල් මෙට්‍රික්ටොන් 5,000ක් දෙන්න වෙලා තිබෙනවා, ප්‍රමිතියෙන් බාල ගල් අඟුරු ගෙන්වීම නිසා අඛණ්ඩ විදුලි සැපයුමක් සඳහා විදුලිය නිෂ්පාදනය කරන්න. එතකොට මේවා පාඩු නොවෙයි ද? අප්‍රේල් මාසයේ 22වැනි දා වෙනකොට නැව් 25ක් එන්න තිබෙනවා. මාර හුරතලයක් තිබෙන්නේ. අප්‍රේල් මාසයේ 22වැනි දා වෙනකොට නැව් 25 එන්න තිබුණාම, නැව් ටික එන්නේ නැති නිසා තවත් සතියක කාලයක් දුන්නා.

තව සතියක කාලයක් දීලාත් නැව් 25 එන්නේ නැහැ කියලා දැන් ඒගොල්ලන්ටම තේරිලා තිබෙනවා. ඒගොල්ලන්ට තේරුණු නිසා, ඔන්න දැන් හදිසි මිලදී ගැනීමක් කරන්න යනවා. හදිසි මිලදී ගැනීමක් සඳහා යනකොට පාඩු දෙකක් සිද්ධ වෙලා තිබෙනවා. නැව් ප්‍රමාදය හරහා පළමුවෙනි නැව් 5ට විතරක් ඩොලර් 445,000ක දඩයක් ගන්න ඕනෑ, ඒගොල්ලන්ගෙන්. ඊට අමතරව අවශ්‍ය කිලෝ කැලරි 5,900 නොමැතිවීම නිසා පළමු නැවට ඩොලර් මිලියන 2යි, 9වන නැවටත් ඩොලර් මිලියන 2ක් දඩ ගහන්න වෙනවා. මේ 13ටම දඩ ගහන්න ඕනෑ. ඊට අමතරව මේ ප්‍රමාදය නිසා අවශ්‍ය ගල් අඟුරු නොමැතිවීම නිසා හදිසි මිලදී ගැනීමකට ප්‍රසම්පාදනයක් දැම්මා. දැන් නැව් 5ක් ගේනවා ලු. එතකොට මෙට්‍රික්ටොන් එකකට ඩොලර් 30ක් වැඩියෙන් ගෙවන්න සිදු වෙලා තිබෙනවා. ඒ කියන්නේ, ඩොලර් 30 ගාණේ මෙට්‍රික්ටොන් 6,000ක් එක නැවකට. ඔය ටික ඔක්කෝම ගත්තාම, නැව් 5ක මෙට්‍රික්ටොන් ප්‍රමාණයට ඩොලර් මිලියන 9ක් වැඩිපුර ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. හරිද? ඩොලර් මිලියන 9ක් වැඩිපුර ගෙවන්න වෙලා තිබෙනවා. මේක පැලවත්තේ සල්ලිවලින්වත්, ජයකොඩිගේ පෞද්ගලික account එකෙන්වත් දෙන එකක් නොවෙයි. එතකොට, මේක පියවා ගන්නේ කොහොමද? විදුලිබල මණ්ඩලයට මේක දරා ගන්න පුළුවන්ද? එක්කෝ විදුලිය කපන්න ඕනෑ. නැත්නම් ගාණ වැඩි කරන්න ඕනෑ. අපි විදුලිය කපන්න වෙන්න කියා කිසිසේත්ම ප්‍රාර්ථනා කරන්නේ නැහැ. මොකද, දැන් මේ නැව් 5 හේලීස් සමාගම දිනාගෙන තියෙන නිසා quality එකට එයි කියලා අපි හිතනවා. මොකද, තමන්ගේ brand name එක රැක ගන්න ඕනෑ නිසා. නමුත්, තිබෙන ප්‍රශ්නය මේකයි. අර්බුදයෙන් පස්සේ යන්නෙත් හේලීස් සමාගමට. SriLankan Airlines එකේ Melbourne destination එක යන්නෙත් Jetstar Airways වලට. ඊළඟට, Gatwick වලින් පටන් ගන්නා British Airways එක යන්නෙත් හේලීස් සමාගමට. කොහොම හරි, මේ පාඩුව තමයි ලංකා ඉතිහාසයේ සිද්ධ වෙලා තිබෙන ලොකුම දූෂණය, නාස්තිය, වංචාව. ඒ නිසා අපිට පැහැදිලිව කියන්න පුළුවන්, මේක. දැන් හොඳන්න. ඇත්ත පිළිගන්න ඇමතිවරු ඉන්නවා; මන්ත්‍රීවරු ඉන්නවා. ඒගොල්ලන්ට කථා කරන්න බැහැ. මේවා ඇදෙනවා. හරිද? අර්ජුන රණතුංගට නඩු වැටුණා වාගේ තමයි මේකටත් වැටෙන්නේ කියන එකත් අපි කියනවා. ඒ නිසා අපි ජයකොඩිට කියනවා, ඇමතිකමින් අයින් වෙලා ජනාධිපතිතුමාට සහයෝගය දෙන්න කියලා. පරීක්ෂණය ඉවර වුණාම නිවැරදි නම් ආයේ එන්න. හැබැයි, තමන් ෂුවර් නැහැ. එතුමාට අභියෝග කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.42]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මතකයි, එදා විපක්ෂයේ සිටියදී ඔබේ ජනාධිපතිවරයා ප්‍රමුඛ ඔබ QR ක්‍රමයට හිනා වුණා; QR ක්‍රමවේදය හැල්ලු කළා; එයට විරුද්ධව කථා කළා. ඔත්තේ, ඉරට්ටේ ක්‍රමය හැල්ලු කළා; විවේචනය කළා; ඒ පිළිබඳව සමාජය තුළ විවිධ මත ගොඩනැඟුවා. හැබැයි, එදා ඔබ විරුද්ධ වෙච්ච ඒ ක්‍රමවේදයට අද ඔබ අනුගත වෙමින් මේ ප්‍රශ්නය යම්තාක් දුරට සමනය කරන්න එය විකල්පයක් විධියට භාවිත කිරීම පිළිබඳව අද අපි සතුටු වෙනවා. එය දෛවයේ සරදමක් විධියට අපි සලකනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම එදා QR ක්‍රමය ගෙනාපු වෙලාවේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා මේ රටේ විවිධ ගැටලුවලට මුහුණ දීපු, ඒ ප්‍රශ්න තිබුණු ජනතාව පිළිබඳව බැලුවා අපට මතකයි. හැබැයි, මේ ආණ්ඩුව පළමුවෙන්ම ගෙනාපු ක්‍රමවේදය විධියට අද මේ QR ක්‍රමය අඩුපාඩුකම් ඇතිව ගෙනාපු විධිය දැක්කාම අපට කිසිසේත් සතුටු වෙන්න බැහැ කියන කාරණය මම සිහිපත් කරන්න ඕනෑ. මීට පෙර QR ක්‍රමය පිළිබඳව මේ රටේ පූර්වාදර්ශයක් තිබුණා. ඉතින්, මීට පෙර පූර්වාදර්ශයක් තිබුණු QR ක්‍රමයේ අඩුපාඩු ඔබෙන් සිදුවෙන්න බැහැ. ඒක ඔබේ ආණ්ඩුවේ අඩුපාඩුවක් විධියට අපි දකිනවා කියන කාරණයත් මේ මොහොතේ මම සිහිපත් කරන්න ඕනෑ. අපි දන්නවා, ඒ ක්‍රමවේදයේ විශාල අඩුපාඩුකම් තිබුණු බව. අද පාර්ලිමේන්තුවේදී ගොඩක් අය ඒ පිළිබඳව කථා වුණා.

අද බස් රථ සඳහා ඔබ ලබාදෙන තෙල් ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා. හැබැයි, ත්‍රිරෝද රථ ගත්තාම, කෘෂිකර්මාන්තයට අවශ්‍ය උපකරණ, යන්ත්‍රසූත්‍ර ගත්තාම, බහලුම්, සංචාරක ව්‍යාපාරය, ධීවර ක්ෂේත්‍රය, ඒ වාගේම විශේෂයෙන්ම ජෙනරේටර් ඇතුළු ඒ උපකරණ ගත්තාම, අද ඔබලා ඒවාට හරි විසඳුම් ලබා දීලා නැහැ කියන කාරණයත් මේ මොහොතේ මා සිහිපත් කරන්න ඕනෑ. ඒ වාගේම අපි මේ ආණ්ඩුවට කියා සිටිනවා, අද ජනතාව අමාරුවෙන් තමයි ජීවත් වන්නේ කියලා. එදා -2025 අප්‍රේල් මාසයේදී- ඔබ බඩු මල්ලක් දෙනවා කිව්වා. අපි ඔබට යෝජනා කරනවා, ජනතාව අමාරුවෙන් ඉන්න මේ වෙලාවේ ඔබට මුදල් ප්‍රශ්නයකුත් නැත්නම් අපේ ජනතාවට මේ අප්‍රේල් මාසයේ එදා පොරොන්දු වෙච්ච ඒ බඩු මල්ල දෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවසක ගාල්ලේ අපේ ජාතික රෝහලේ හෙද නිලධාරි මහත්ම මහත්මීන්ට ජර්මන් ජාතික කාන්තාවක් චෝදනාවක් කරන ආකාරය සමාජ මාධ්‍ය හරහා අපි දැක්කා.

ඒ පිළිබඳව මේ මොහොතේ අපි අපේ විරෝධය පළ කරනවා. කොරෝනා වසංගතය වෙන්න පුළුවන්, පසුගිය කාලයේ ඉරාන

තෙල් නැවට ප්‍රහාර එල්ල කරපු වෙලාවේ නාවිකයන්ට සියලු පහසුකම් ලබා දීම වෙන්න පුළුවන්, ඒ හැම අවස්ථාවේදීම ගාල්ල ජාතික රෝහලේ හෙද නිලධාරි මහත්ම මහත්මීන් කරපු විශිෂ්ට මෙහෙවර, විශිෂ්ට කාර්යභාරය පිළිබඳව අපට තිබෙන්නේ ඉතාම ඉහළ විශ්වාසයක්, ඉතාම ඉහළ සතුටක්. ඒ ජර්මන් ජාතික කාන්තාව විසින් ගාල්ල කරාපිටිය රෝහලේ හෙද නිලධාරි මහත්ම මහත්මීන් වෙත එල්ල කළ චෝදනාව සම්බන්ධයෙන් රාජ්‍ය තාන්ත්‍රිකව යම් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා අපි ඔබෙන් ඉල්ලා සිටිනවා. අපේ රට පිළිබඳව, අපේ හෙද නිලධාරීන් පිළිබඳව ලෝකය පුරා තිබෙන විශ්වාසය තමයි ඒ පලුදු කළේ. ඒ සම්බන්ධව තානාපති කාර්යාලය හරහා යම් ක්‍රියාමාර්ගයක් ගන්න කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරනවා. ගාල්ලේ අපේ රෝහල්වල සිටින හෙද නිලධාරි මහත්ම මහත්මීන් කරන කාර්යභාරය පිළිබඳව අපට ඉතාම ඉහළ අගය කිරීමක් තිබෙනවාය කියන කාරණයත් මේ අවස්ථාවේ මම සිහිපත් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තිබෙන්නේ ඉතාම කෙටි කාලයක් නිසා මේ මොහොතේ මම තව එක කාරණයත් ඉදිරිපත් කරන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
යුද හමුදාවේ "අනීතික මූල්‍ය ඒකාධිකාරය" පිළිබඳව යම් කරුණක් ඉදිරිපත් කරලා මගේ කථාව ඉතාම ඉක්මනින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. යුද හමුදාපති ගිණුම සහ සේවා වනිතා ගිණුම රජයේ විගණකාධිපතිවරයාට පරීක්ෂා කිරීමට ඇති ඉඩකඩ අහුරමින්, 2024 සිට එම විගණන ක්‍රියාවලිය හිතාමතා අහුරා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හමුදා සාමාජිකයන් දහසකට අධික පිරිසක් වෘත්තීය රාජකාරිවලින් බැහැර කර බේකරි, අවන්හල්, වගා බිම් වැනි ව්‍යාපෘති හරහා තමයි මේ ගිණුම්වලට මුදල් එන්නේ. මේ සඳහා රජයේ විදුලිය, ජලය සහ ඉන්ධන නොමිලේ භාවිත කරනවා. මෙම ව්‍යාපාර හරහා උපයා ගන්න බිලියන ගණනක ලාභය මහා භාණ්ඩාගාරය වෙත වාර්තා නොකිරීම සහ ඒවා පෞද්ගලිකව පරිහරණය ඒකාධිකාරයක් ලෙස, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.47]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද සාකච්ඡා කරන්නේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ ගෙන එන නියෝග පිළිබඳවයි. කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපයක් හැටියට මේ පනතෙන්ම ස්ථාපිත කරද්දී තහවුරු කරපු දේ තමයි එය නියාමනය කරනවා, ආයෝජන ආකර්ෂණය කරනවා, ජාතික තිරසාරභාවය ආරක්ෂා කරනවා වාගේම රැකියා අවස්ථා වැඩිපුර ලබා දෙනවා, ආර්ථිකය වර්ධනය කරනවා කියන එක. අපි එතකොට හිටියේ විපක්ෂයේ. මම කියන්නට ඕනෑ, අපි ඒ වෙලාවේ ඒකේ තිබිච්ච යම් යම් කාරණාවලට විරුද්ධ වුණු බව. හැබැයි, මේ පනත සම්මත කරපු දවසේ ඉඳලා 2024 දෙසැම්බර් මාසය වනතුරු ඔබතුමන්ලාට කැඳවාගන්න පුළුවන් වුණේ ආයෝජන තුනයි. ආයෝජන තුනයි! ඒවාත් ඉතාම දුර්වල මට්ටමෙන් තමයි ක්‍රියාත්මක වුණේ. විශේෂයෙන්ම මේ ආයෝජන තුනෙනුත් එකක් අතරමඟ නතර වුණා. 2024 දෙසැම්බර් වනකොට තිබුණේ දෙකයි. නමුත්, වර්තමාන ජනාධිපති අනුර දිසානායක මැතිතුමාගේ ආණ්ඩුව - අපි - බලයට ආවාට පසුව දැන් ඒ ආයෝජන තුනත් පටන් අරගෙන තිබෙනවා. ඒ නතර කරපු ආයෝජනත් ලබා ගනිමින් 2025 ජනවාරි මාසයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කළා. අපි අනෙක් ආයෝජන දෙක සඳහාත් එකඟ කරගෙන තිබෙනවා. ඊට අමතරව, මේ වෙනකොට අලුතින් ව්‍යාපාර 150කට වැඩිය ලියාපදිංචි කරන්න අපි කටයුතු කරමින් තිබෙනවා. ඒ වාගේම මේ කාල සීමාව ඇතුළත -2026 තුළ- මේකේ වර්ග මීටර මිලියන 6.3ක ප්‍රමාණයට ඇමෙරිකානු ඩොලර් බිලියන 14ක පමණ විදේශ ආයෝජන ගෙනෙන්න තමයි අපේ බලාපොරොත්තුව තිබෙන්නේ. හැබැයි, ආයෝජන ගෙනෙන්න නම් එම ආයෝජකයින්ට තමන්ගේ ආයෝජන පිළිබඳව තිරසරභාවයක්, විශ්වාසනීයත්වයක් සහ ක්‍රමවත්භාවයක් අවශ්‍යයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. M.K.M. ASLAM left the Chair and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොළඹ වරාය නගරය ව්‍යාපෘතියට ගෙනෙන ආයෝජන පිළිබඳව ඔවුන්ට විශ්වාසනීයත්වයක් අවශ්‍යයි. මේ පනත පාර්ලිමේන්තුවේ සම්මත කරපු දවසේ ඉඳලා 2024 වෙනතුරුම ආයෝජකයන් කැඳවා ගන්න බැරි වුණේ ඇයි? ඔබතුමන්ලාට ආයෝජකයන් කැඳවාගන්න බැරි වුණේ ඒ වකවානුවල පැවැති පාලනයේ තිබුණු දූෂිතභාවය නිසායි. අපි විරුද්ධ වෙච්ච නිසා නොවෙයි. දූෂිතභාවය නිසා, පගාව ඉල්ලපු නිසා, commission නිසා ඒක දිගටම සිද්ධ වුණා.

ඒ ක්‍රියාවලිය සිද්ධ වුණා, පවුල් පාලනයේදී සහ හවුල් පාලනයේදී. ඒ හවුල් පාලනයේත්, පවුල් පාලනයේත් තිබුණු ජානමය ලක්ෂණයක් තමයි, දූෂිතභාවය. ඩුබායි, සිංගප්පූරුව, මලයාසියාව, ඉන්දුනීසියාව වාගේ රටවලට ඉඩකඩ හදලා තිබුණා, කොළඹ වාගේ ප්‍රධාන ස්ථානයක තිබෙන duty-free zone එකක ආයෝජනය කරන්න. ඒ, අපේ පාලනයක් තුළ නොවෙයි.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

මොකද, අපේ පාලනයක් ආවොත් ආයෝජකයින් එන්නේ නැහැ, ව්‍යාපාරිකයින් එන්නේ නැහැ, කර්මාන්ත ආරම්භ වෙන්නේ නැහැ, මේවා වැහිලා යනවා කියලා ඔබතුමන්ලා භීතියක් හැදුවා නේ. ඒ නිසා අපේ පාලනයක් තුළ නොවෙයි, විවෘත ආර්ථිකය පිළිගන්නා එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ පාලනය ගැන සහ ඒ වැඩ පිළිවෙළ දිගටම ගෙනියපු මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පාලනය ගැන හදපු විශ්වාසයත් එක්ක ආයෝජකයින්ට එන්න තිබුණා නේ. හැබැයි, ආයෝජකයින් නොපැමිණියේ ඇයි? 2024 දෙසැම්බර් වෙනකම් ඇවිල්ලා තිබුණේ ආයෝජන 3යි. හැබැයි, ඒ ආයෝජන 3ත් නතර වුණා. පහසුකම් පිට පහසුකම් දෙනවා කියලා කියද්දිත් ආයෝජකයින් නොපැමිණියේ ඇයි? ඒකට හේතුව මොකක්ද? පනත සම්මත වෙලා අවුරුදු 8ක්, 10ක් යනකම් ආයෝජන 3යි ආවේ. ඒකට හේතුව, දූෂිතභාවය. හැබැයි, අපි මේ රටේ පාලනය ආරම්භ කරලා අවුරුදු එකහමාරක් ගතවන තැන ඒ වහන්න ගිය, අයින්වෙලා ගිය ආයෝජනත් කැඳවාගෙන, තවත් ව්‍යාපාර 150ක් මේ වනකොට ලියාපදිංචි කරලා තිබෙනවා. දැන් නව ආයෝජකයින් එනවා.

විශේෂයෙන්ම අපි කියන්න කැමැතියි, දැනටමත් අලුත් ව්‍යාපාර ගණනාවක් සඳහා ආයෝජකයින් ඇවිල්ලා තිබෙන බව. ජාත්‍යන්තර මට්ටමේ රෝහලක්, විශ්වවිද්‍යාලයක්, ජාත්‍යන්තර පාසලක් යනාදී වශයෙන් පහසුකම් සලසන ආයතන ගණනාවක් ඇවිල්ලා තිබෙනවා. ඒවා mixed projects හැටියටත් එනවා, apartments හැටියටත් එනවා. ඒ විධියට අලුත් ව්‍යාපාර ගණනාවක් සඳහා ආයෝජකයින් ඇවිල්ලා තිබෙනවා. ඒ වෙන මොකුත් නිසා නොවෙයි. මේ ආණ්ඩුවට තිබෙන දේශපාලන ස්ථාවරභාවය නිසා, දූෂිතභාවයෙන් තොර නිසා, පගාව ඉල්ලන්නේ නැති නිසා, අරයා හම්බවෙන්න, මෙයාව හම්බවෙන්න කියන්නේ නැති නිසා, මේකේ "Mr. Ten Percent"ලා නැති නිසා. කොටින්ම කිව්වොත්, බැසිල් රාජපක්ෂලා නැති නිසා. මේක තමයි ඇත්ත. ඔබතුමන්ලාගේ කාලයේ, බැසිල් රාජපක්ෂ ගණන් මිනුම් ඉල්ලපු නිසා හැරිලා ගිය අය අනන්ත ඉන්නවා. අපි ඒ යථාර්ථය පිළිගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ව්‍යවසායකයින්ට, ව්‍යාපාරිකයින්ට, ජාත්‍යන්තර ආයෝජකයින්ට යන්න ඕනෑ තරම් රටවල් ලෝකයේ තිබෙනවා. හැබැයි ඔවුන් බලනවා, කලාපීය සුහදත්වය, ව්‍යාපාර ක්‍රියාදාමය - business value chain එක - කොයි විධියටද තිබෙන්නේ කියන එකත්, කාර්යක්ෂමතාව, වරාය පහසුකම් - logistics facilities, නාවුක පහසුකම්, තොරතුරු තාක්ෂණය වාගේ දේවල් පිළිබඳවත්. ඒ ඔක්කෝටම වඩා ඔවුන් කල්පනා කරනවා, දේශපාලන ස්ථාවරභාවය ගැන. මේ ආණ්ඩුව කොච්චර කාලයක් තිබේවිද, මේ බදු ප්‍රතිපත්ති කොච්චර කාලයක් තිබේවිද, මේ නීතියේ ආධිපත්‍යය කොච්චර කාලයක් තිබේවිද, මේ ආණ්ඩුවට තිබෙන ජන වරම කොච්චර ශක්තිමත්ද කියන එක ඕනෑම ආයෝජකයෙක්, ව්‍යාපාරිකයෙක් කල්පනා කරනවා. අද මහා පරිමාණයේ ව්‍යාපාරිකයින්, ආයෝජකයින් අපේ රටට එන්නේ ඇයි? ඔවුන්ට අර මන්ත්‍රීතුමා හම්බවෙන්න, ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම්තුමාව car park එකේදී හම්බවෙන්න, අර halt එකේදී හම්බවෙන්න කියන ඒවා අද නැති නිසායි ඔවුන් එන්නේ. ඒ නිසා අද ආයෝජකයින් භය නැතිව අපේ රටට එනවා.

අද අපි මේ සංශෝධන තුළින් කරන්නේ මොකක්ද? වෙළෙඳ නගරය, කොළඹ වරාය සංවර්ධන නගරය නියාමනය කිරීම සඳහා විශේෂිතභාවයක් නැතිව - favour එකක් නැතිව, පෞද්ගලික ස්වභාවයක් නැතිව, ඕනෑම කෙනෙකුට සාධාරණ ලෙස ආයෝජනය කරන්න පනතින් තිබෙන බලතල හදලා දෙන එක. මේ වාගේ අවස්ථා ගණනාවක් තිබුණා. 2023දී BSI වෙනුවෙන්, ව්‍යාපාරික වැදගත්කම අනුව සහ ව්‍යාපාර නියාමනය කරන්න හදපු අණ පනත් සංශෝධනය අපි 2025 අගෝස්තු මාසයේ ගැසට් කළා. 2026 ජනවාරි වනකොට ඩොලර් මිලියන 250ක ව්‍යාපාර ගිවිසුම් අපි අත්සන් කළා. දැනටමත් අපි කොළඹ වරාය නගරයේ තිබෙන රජයට අයිති කොටසෙන් වර්ග මීටර ලක්ෂයක් වාසස්ථාන සහ වෙළෙඳ ඉඩකඩ සඳහා වෙන් කර දී අවසානයි. 2026 ජනවාරි මාසය වන විට apartmentsවලට, වෙළෙඳ ව්‍යාපාරවලට ඩොලර් මිලියන 250ක ආයෝජන ඇවිල්ලා තිබෙනවා. මම කලින් කිව්වා වාගේ ඔබතුමන්ලාගේ කාලයේ එකහ වෙලා, වහන්න ගිය ව්‍යාපාර ආයෝජනත් දැන් අලුතින් පටන්ගෙන තිබෙනවා. ඒ අනුව, අපේ ඉලක්කවලට අපි යමින් ඉන්නවා.

ඇත්තටම කියන්න ඕනෑ, මේක පරිවර්තනයක ආරම්භයක් බව. ස්ථාවරභාවය, නියාමනය, වගකීම්සහගතභාවය, අයෝජකයින් සමහ ක්‍රියාකාරීව එකඟතාවලට පැමිණීම අපේ මූලික කටයුත්තක්. ඒ නිසා ජනාධිපතිතුමාම කැබිනට් අනුකාරක සභාවක් - high-level economic management committee එකක් - පත් කර තිබෙනවා. ඒකේ විදේශ කටයුතු ඇමතිතුමා ඉන්නවා, වෙළෙඳ ඇමතිතුමා ඉන්නවා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉන්නවා, මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා, කර්මාන්ත අමාත්‍යවරයා හැටියට මම ඉන්නවා. ඒ විතරක් නොවෙයි, BoI Chairman, Colombo Port City Economic Commission Chairman ඉන්නවා. ඒ නිසා මෙම කටයුතු කිරීමේදී අපට පහසුවක් ලැබී තිබෙනවා වාගේම කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සහිතව ඍජු විදේශ ආයෝජන කැඳවන්නත් අපට පුළුවන්කම ලැබී තිබෙනවා. එතැනින් අනුමත කළාට පස්සේ කැබිනට් මණ්ඩලයෙන් එය අනුමත කරලා, මේ පාර්ලිමේන්තුවෙන් අනුමත කරලා වේගවත්ව අපට මේ ගමන යන්න පුළුවන්.

ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා කිව්වා, ප්‍රමාදය කියන ගැටලුව තිබෙන බව. ඒක අපි පිළිගන්නවා. ඔබතුමා කියන එක හරි. ඒ ප්‍රමාදය අඩු කරන්න දැන් අපි කටයුතු කරමින් ඉන්නවා. විශේෂයෙන්ම ඒ ප්‍රමාදය ඇති වෙලා තිබෙන්නේ එතැන register කළාට පස්සේ නැවත මුදල් අමාත්‍යාංශයට ඇවිල්ලා, මුදල් අමාත්‍යාංශයෙන් අවශ්‍ය කටයුතු කරලා අදාළ නිර්ණායක අනුව බලන්න ඕනෑ නිසායි. සති 6ක් ඇතුළත අවශ්‍ය අනුමැතීන් ලබා දෙන්න high-level economic management committee එක දැන් තීරණය කර තිබෙනවා. ඇත්තටම ප්‍රශ්නය ඒකයි.

ඔබතුමන්ලා දන්නවා, ව්‍යාපාරවල, කර්මාන්තවල ආයෝජන කටයුතු කරන්න අපේ රටට ආයෝජකයෙක් ආවොත් අදාළ කටයුතු කර ගැනීම සඳහා අඩු තරමේ දින 179ක් පමණ ගතවන බව. මොකද, ආයතන 21කට වැඩි සංඛ්‍යාවකින් අවසර ගන්න ඕනෑ, ඒ කටයුතුවලට. ඒ නිසා තමයි අපි industriesවලට industrial facilitation centre එකක් පටන් ගන්න යන්නේ. ඒක Single Window system එකක්, එක තැනකින් සෑම දෙයක්ම අනුමත කරගත හැකි පරිදි තිබෙන්න ඕනෑ. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Dayasiri Jayasekara?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මේ සිදු කරන කාර්යභාරය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට අපි ස්තුතිවන්ත වනවා. ෆයිසර් මුස්තාපා මැතිතුමාත් කිව්වා, මේ කාරණය. පිටරට ආයෝජකයින් එනකල්, ඇත්තටම Colombo Port City එක ඇතුළේ Prime Lands, Home Lands, ICC වාගේ ශ්‍රී ලාංකික කොම්පැනි ගිහිල්ලා මේ කටයුතු පටන් ගත්තාම, පාර්ලිමේන්තුවේ කමිටුවලට ඒ නිලධාරින් ගෙන්වා චෝදනා කරනවා. මම දන්නේ නැහැ, මොකක්ද මේ කරන්නේ කියලා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒක මම දන්නවා, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! Does the House agree to extend the time of this Debate until its Proceedings are over?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Minister, you may continue.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

Thank you, Sir.

දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඒ කථාව ඇත්ත. ඒ කථාව මම පිළිගන්නවා. ඔබතුමා කිව්ව විධියට ඒ ආයතන ලංකාවේ විශාල ව්‍යාපෘති කරනවා. අපි දන්නවා, තුන්මුල්ලේත් ලොකු ව්‍යාපෘතියක් ආරම්භ කර තිබෙන බව. තවත් තැන්වල ව්‍යාපෘති ආරම්භ කර තිබෙනවා. ආරම්භයේදී අඩුපාඩුකම් තිබෙනවා නම් ඒවා හරි විධියට සකස් කරලා ඒ ව්‍යාපෘති කරගෙන යන්න ඕනෑ. දැන් හුඟක් වෙලාවට තරගකාරිත්වය නිසා බොහෝ සමාගම් Facebook campaignsවලට ගිහිල්ලා තිබෙනවා. මමත් ඒක දැක්කා. ඒකෙන්, ඒ ආයෝජනවලට තිබෙන විශ්වසනීයත්වය බිඳ වට්ටනවා. ඒක තරගකාරිත්වය නිසා වෙන්න පුළුවන් දෙයක්. මොකද, එක project එකක් කරන අය, තවත් කෙනෙකුගේ project එකක් හරි නැහැ කිව්වාම, ඒගොල්ලන් Facebook campaigns කළාම ඒක හරිගස්සගන්න පුළුවන්. ඒක අපි දන්නවා. හැබැයි, ඒක නිසා රටේ තිබෙන නීති රීති violate කරන්න බැහැ. විශේෂයෙන්ම අපි ඒ ගැන සාකච්ඡා කර තිබෙනවා.

දැන් අපේ රටේ ලොකු real estate industry එකක් තිබෙනවා. දැන් අපේ ඉදිකිරීම් ක්ෂේත්‍රය ලොකු එකක්. එම නිසා මේ තිබෙන සීමිත ඉඩ කඩ තුළ අපි ඒගොල්ලන්ට ලොකු අවස්ථාවක් දෙන්න ඕනෑ. ඒක ඇත්ත. කාට හරි එක්කෙනෙකුට, දෙන්නෙකුට පෙත්සමක් ගැහුවොත්, මුළු ව්‍යාපෘතියම නවත්වන්න පුළුවන්. එතකොට බිලියන ගණනක් අපතේ යනවා. අපිත් ඒක දන්නවා. ඔබතුමන්ලා කියන දෙයෙහි සාධාරණ පැත්තක් තිබෙනවා. දැනට ඒක අධිකරණ කටයුත්තක්. ඒක නිසා අධිකරණයෙන් මොනවා හරි පහසුකමක් දුන්නොත්, ඒ ලැබෙන තීරණය අනුව ඉදිරි කටයුතු කරනවා. *[බාධා කිරීමක්]* මට තව විනාඩි දෙකයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)

ගරු ඇමතිතුමනි, පැහැදිලි කර ගැනීමකට මට පොඩි වෙලාවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Minister, are you allowing that intervention?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

Yes, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, Hon. Faiszer Musthapha, you can have it within 15 seconds.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)

ගරු ඇමතිතුමනි, COPF එකේදි සමාගම් 3ක් ගැන කථා කළා.

ඒවා අන්තිමට මුහුණු පොතේ පළ වෙනවා. ලංකාවේ ව්‍යාපෘති කරන ප්‍රයිම් ලෑන්ඩ්ස්, හෝම් ලෑන්ඩ්ස් වැනි සමාගම් ගැන ඒ Committeesවල කථා කරන දේවල් වාගේම ඒගොල්ලන්ගේ අඩුපාඩු ගැන මුහුණු පොතේ පළ වෙලා ඒ පිළිබඳව කථා කරනකොට ඒ සමාගම් කෙරෙහි තිබෙන සමාජ විශ්වාසය නැති වනවා. ඒ නිසා අප ඒ අඩුපාඩු හදා ගන්න ඕනෑ, ඇමතිතුමා. ඔබතුමා අපේ දේශීයත්වයට මුල් තැන දෙනවා නම් මෙවැනි දේවල් නවත්වන්න ඕනෑ. මේ විධියට මේ Committeesවල කට්ටිය ඒවා මුහුණු පොතේ පළ කිරීම නිසා ඒ සමාගම්වලට ඒගොල්ලන්ගේ ව්‍යාපාර කරගෙන යැමේදී විශාල වශයෙන් ප්‍රශ්න ඇති වෙනවා. ඒගොල්ලන් ලංකාවේ විතරක් නොවෙයි, වෙන රටවලත් ව්‍යාපාර කර තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, could you shorten that, please?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඔබතුමා ආපසු කියන්නේ කලින් කියපු දෙයමයි, ගරු මන්ත්‍රීතුමනි. මම කියන්නේ, මේවා විකිණෙන, විකුණන සමාජයක් හැදුණු නිසා ඇති වුණු තත්ත්වයන් කියන එකයි. අධිකරණ කටයුත්තක් තිබෙන නිසා මම ඒ ගැන මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්න උත්සාහ කළේ මේකයි. රටේ දේශපාලන ස්ථාවරභාවය තිබෙන නිසා ආයෝජකයන් අද කැමැත්තෙන් අපේ රටට එනවා. අද වනකොට ජාත්‍යන්තරයේ

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

යුදමය තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. හැබැයි, අද ඔබතුමන්ලා විපක්ෂය හැටියට කිරීමට උත්සාහ කරන්නේ මොකක්ද? දැන් අද මේ විවාදයෙන් පස්සේ, රටේ වර්තමාන තත්ත්වය ගැන සභාව කල් තැබීමේ විවාදයක් තිබෙනවා. ඔබතුමන්ලා කථා කරන්නේ යුද්ධයක් නැති තත්ත්වයකදී ලැබෙන්න තිබෙන තෙල්වල සහනය හැමෝටම ලැබෙන ආකාරයට දැනුත් කටයුතු කරන්න කියලා. ඒකයි ඔබතුමන්ලා කියන්නේ.

ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කිව්වා, ධීවරයා මුහුදු ගියාම එන්න විධියක් නැහැ, තෙල් නැති නිසා කියලා. එහෙම මුහුදු ගිහිල්ලා තෙල් නැති නිසා එන්න බැරි වුණු එක ධීවරයෙකු ඉන්නවාද? මේ යුදමය තත්ත්වය නිසා තෙල් ටික නැතුව මුහුදු ගිහිල්ලා එන්න බැරි වුණු ලංකාවේ එක ධීවරයෙක් ඉන්නවා නම් කියන්න. තෙල් නැති නිසා ඒ විධියට වැහුණු හෝටලයක්, කර්මාන්තශාලාවක්, garment factory එකක් තිබෙනවා නම් කියන්න. බෙදා හැරීම් ජාලයේ කොතැන හරි බිඳ වැටීමක් සිදු වෙලා තිබෙනවා නම් ඒ ගැන කියන්න. QR code එක දෙන්න පටන් ගත්ත දවසේ ඉඳලා එහෙම මොකක්වත් සිදු වෙලා නැහැ. හැබැයි, එහෙම වෙච්චා යැයි කියා ඔබතුමන්ලාගේ විශාල ප්‍රාර්ථනාවක් තිබෙනවා. ඒ ප්‍රාර්ථනාව තමයි මේ සභාවට ඇවිල්ලා කියවන්නේ, මේකෙන් හරි ගොඩ යන්න පුළුවන් වෙයිද කියලා බලන්න. අපි ඊයේ හවස් වනකොට ව්‍යාපාර, කර්මාන්තශාලා 1,300කට ඉන්ධන පහසුකම් ලබා දීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව - CPC එක - සහ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය ඒකාබද්ධ වෙලා කටයුතු සකස් කළා. එහෙම කොහේ හරි වැහුණු තැනක් තිබෙනවා නම් ඔබතුමන්ලා මට කියන්න. හුඟක් තැන්වල එකතු කර ගත්ත තැන් තිබෙනවා, centres තිබෙනවා. හැබැයි, ඒවා පවත්වාගෙන යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ස්ථාවරභාවය තුළින් ආයෝජන සඳහා හොඳ පරිසරයක් අපි හදා තිබෙනවා කියන කාරණය අවධාරණය කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. You have 18 minutes.

## වත්මන් ගෝලීය අර්බුදය හේතුවෙන් දේශීය ආර්ථිකයට වන බලපෑම
## தற்போதைய உலகளாவிய நெருக்கடியால் உள்நாட்டுப் பொருளாதாரத்துக்கு ஏற்படும் பாதிப்பு
## EFFECTS OF CURRENT GLOBAL SITUATION ON OUR ECONOMY

[අ.භා. 2.03]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "රට තුළ උද්ගතව ඇති අර්බුදකාරි වාතාවරණය තුළ රටේ ජන ජීවිතය සෑම අංශයකින්ම අභියෝගයට ලක්ව ඇත. දෛනික ක්‍රියාකාරකම් බිඳ වැටීමේ තර්ජනය තුළ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවාවන් මුහුණ දී ඇති අභියෝග හමුවේ රටේ ආර්ථිකය යළිත් මුහුණ දෙන තත්ත්වය මත රටේ සාමාන්‍ය කටයුතු ගෝලීය වාතාවරණය සමඟ දැඩි අර්බුදයකට ලක් වීම නිරීක්ෂණය වේ.
>
> සිංහල, දෙමළ අලුත් අවුරුදු උත්සව සමයේ මෙවැනි අර්බුදයක් මතු වීම රටේ ප්‍රධාන සංස්කෘතික උළෙලට පවා ඍජු බලපෑමක් එල්ල වන අවස්ථාවකි.
>
> සංචාරක ව්‍යාපාරය, අපනයන වෙළෙඳ පොළ, විදේශ ප්‍රේෂණ ආදී රටේ ආර්ථිකයට බලපාන ප්‍රධාන නිර්ණායකයන් රැසකට එල්ල වන බලපෑම හමුවේ රටේ ආර්ථිකයද අවදානමකට ලක් වීම වැළැක්විය නොහැක.
>
> එබැවින් පවතින ගෝලීය තත්ත්වය තුළ රටේ ජන ජීවිතය ආර්ථික අර්බුදයකට ලක් නොවන අයුරින් පවත්වාගෙන යාම රජයේ ප්‍රමුඛ වගකීමක් වන අතර, ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සහිත මාර්ග සිතියමක් වහාම පාර්ලිමේන්තුවට ආණ්ඩුව ඉදිරිපත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි සියලුදෙනාම දන්නවා, අද වනකොට මුළු ලෝකයම මේ යුද්ධය නිසා ආර්ථික පීඩනයකට ලක් වෙලා තිබෙන බව. ඒ වාගේම රාමසාන් උත්සවයටද මෙම අර්බුදකාරි අවස්ථාවෙන් ඍජු බලපෑමක් එල්ල කරන බව අපට පෙනී යනවා. රාමසාන් උපවාස කාලය තුළ මේ යුද්ධය සිදු වීම නිසාම විශේෂයෙන් මැද පෙරදිග ජීවත් වන, රාමසාන් උපවාසයට සම්බන්ධ වෙලා ඉන්න ජනතාවත් අද වනකොට ඉතාම පීඩාකාරි තත්ත්වයකට පත් වෙලා ඉන්නවා. මේ යුද්ධය නිසා මනුෂ්‍ය ඝාතන විශාල ප්‍රමාණයක් සිදු වෙමින් පවතිනවා. මේ යුද්ධයේ ප්‍රතිවිපාක සමගි ජන බලවේගය විධියට අපි කලින් දැකලා පාර්ලිමේන්තුවටත් යෝජනා කළා. විපක්ෂ නායකතුමා ඇතුළු අපි සියලුදෙනාම යුද්ධය එපා කියන ස්ථාවරයේ තමයි හිටියේ. මොකද, මේ යුද්ධය තුළින් අපි සියලුදෙනාට වාසියක් හෝ කිසිම දෙයක් ලබා ගන්න බැහැ කියන එක අපි දන්නවා. මේ යුද්ධය විනාශකාරී යුද්ධයක්. මනුෂ්‍ය සංහතියටම විනාශය ගෙන දෙන යුද්ධයක් හැටියට තමයි මුල ඉඳන්ම අපි මේ යුද්ධය හඳුනා ගත්තේ. ඒ නිසා අපට පුළුවන් වුණා, එක ස්ථාවරයක ඉන්න. ඒ අනුව සමගි ජන බලවේගය හැටියට අපි දිගින් දිගටම පැහැදිලි ස්ථාවරයක හිටියා. නමුත් අපි දන්නවා, ආණ්ඩුව තමන්ගේ ස්ථාවරය ගැන හරියට පැහැදිලි කළේ නැහැ කියලා. ආණ්ඩුව හැම තිස්සේම කිව්වේ, "අපි මධ්‍යස්ථයි, අපි මධ්‍යස්ථයි" කියලා. ඒ විධියට "මධ්‍යස්ථයි" කියන්නේම එක පැත්තකින් අනියම් ආකාරයකින් යුද්ධයට සහයෝගය දෙන එක.

මොකද, මෙවැනි අවස්ථාවක අපි යුද්ධයට පක්ෂද, යුද්ධයට විපක්ෂද කියලා තීන්දුවක් ගන්නේ නැතුව "අපි මධ්‍යස්ථයි" කියන්නේ, ලෝක බලවතුන්ගේ වුවමනාව පරිදි කටයුතු කිරීමට එකඟ වීමයි. මම දන්නේ නැහැ, විශේෂයෙන්ම මේ මාක්ස්වාදී දේශපාලනයකින් ආපු ආණ්ඩුවක්, වාමාංශික ව්‍යාපාරයකින් ආපු ආණ්ඩුවක් මධ්‍යස්ථයි කියන්නේ මොකද කියලා. එතුමන්ලාගේ දේශපාලන ඉතිහාසය දෙස බැලුවාම අපට පෙනෙනවා, එහෙම මධ්‍යස්ථ තැනක එතුමන්ලා කවදාවත් ඉඳලා නැහැ කියන එක. නමුත්, අවාසනාවකට, බලය ගත්තාට පසුව මධ්‍යස්ථ තැනක ඉන්න එතුමන්ලාට සිද්ධ වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ ඇති වෙලා තිබෙන අර්බුදය අපට පෙනෙනවා. තමුන්නාන්සේලා විපක්ෂයේ සිටියදී රටේ අර්බුදකාරී තත්ත්වයක් එනකොට හැම දාම ඒවා පැහැදිලි කර දීලා තිබෙනවා; ඒවා ගැන උත්තර දීලා තිබෙනවා; ඒවාට ලබා දෙන්න ඕනෑ පිළියම් කියලා තිබෙනවා. ඒවා නිවැරදිව හඳුනාගෙන තිබෙනවා, තමුන්නාන්සේලා විපක්ෂයේ ඉන්නකොට. ඒ, ඒ ආණ්ඩුවලට උපදෙස් පවා දුන්නා. හැබැයි, තමුන්නාන්සේලා බලය ගත්තාම ඒක එහෙම වුණේ නැහැ. ඒ දැනුම කෝ? ඒ දැනුමට මොකද වුණේ? විපක්ෂයේ ඉන්නකොට දීපු උපදෙස්වලට මොකද වුණේ කියලා අපට අහන්න වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනවාරි 26වැනි දා තමයි ගල්ෆ් කලාපයට යුද නෞකා ඔක්කෝම ගියේ. යුද්ධයක් ඇති වුණොත් අනිවාර්යයෙන්ම තෙල් අර්බුදයක් ඇති වෙනවා කියන එක අපි සියලුදෙනාම දන්නවා. ඕනෑම පොඩි ළමයෙක් වුණත් දන්නවා, මැද පෙරදිග යම්කිසි ආකාරයක යුද්ධයක් ඇති වුණොත් අනිවාර්යයෙන්ම තෙල් අර්බුදයක් ඇති වෙන බව. ඒක ගැන අපි ආපසු වාද විවාද කරන්න ඕනෑ නැහැ. එහෙම නම් ඒක තමුන්නාන්සේලාට කළමනාකරණය කර ගන්න බැරි වුණේ ඇයි? ඔබතුමන්ලා ඒක කළමනාකරණය කර ගන්න ප්‍රමාද වුණේ ඇයි? අර්බුදය ඇති වුණාම තමයි විසඳුම් හොයන්න පටන් අරගෙන තිබෙන්නේ.

අපි දන්නවා, අද QR code එක හදන්න උත්සාහ කරන බව. නමුත්, තවම අංගසම්පූර්ණ විධියට ඒ ප්‍රශ්නය විසඳිලා නැහැ. ඔබතුමන්ලා අද ඒක කර ගන්න බැරි තත්ත්වයකට පත් වෙලා ඉන්නවා. එහෙම වුණේ මොකක් හින්දාවත් නොවෙයි, නෙතන්යාහුලා, ට්‍රම්ප්ලා දින 4කින් මේ යුද්ධය ඉවර කරනවාය කිව්ව නිසායි. ඒ හින්දා තමුන්නාන්සේලා ට්‍රම්ප් සහ නෙතන්යාහු කියන එක විශ්වාස කළා. ඒවා විශ්වාස කළ හින්දා තමයි තමුන්නාන්සේලා මේ යුද්ධයෙන් ඇති වන ප්‍රතිඵලවලට, මේ යුද්ධය හරහා ඇති වන අර්බුදවලට කලින්ම විසඳුම් සොයන්න ඕනෑ කියන එක ඔළුවට ගත්තේ නැත්තේ. මොකද, ඔබතුමන්ලා හිටියේ ඒ අය කියන අදහසේ. එම අදහසේ ඉඳලා තමයි ඔබතුමන්ලා වැඩ කළේ. ඒ හින්දා තමයි, අපේ ආණ්ඩුවෙන් උත්තරය එනකම් ඉරානයේ නෞකාවට පැය 11ක් අපේ මුහුදු ආසන්නයේ නවත්වාගෙන ඉන්න සිද්ධ වුණේ. අපේ ආණ්ඩුවෙන් උත්තරය දෙන්න ප්‍රමාද වුණු නිසා තමයි නාවිකයෝ 104දෙනෙකුගේ ජීවිත නැති වුණේ. මොකද, ඔබතුමන්ලා එතකොට නෙතන්යාහු සහ ට්‍රම්ප් කියන දේවල් විශ්වාස කරගෙන හිටියා. ඒ හින්දා තමයි අර්බුදයට විසඳුම් දෙන්න බැරි වුණේ.

දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් ජනාධිපතිතුමා තෙල් හොයන්න පටන් අරගෙන තිබෙනවා; QR code දෙන්න පටන් අරගෙන තිබෙනවා; work from home කියනවා; බදාදාට නිවාඩු දෙනවා. ආණ්ඩුව මේ ඔක්කෝම ටික කරන්න උත්සාහ කරන්නේ අර්බුදය ඇති වුණාට පසුවයි. අපි මේ යුද්ධය එපා කිව්වේ මේ කාරණා හින්දා තමයි. අපි මේ යුද්ධය එපා කිව්වේ වෙන දෙයක් හින්දා නොවෙයි, යුද්ධය ඇති වුණාම මේ අර්බුද ගොඩනැඟෙන හින්දායි. ඒක තමයි මේ යුද්ධය එපා කියලා අපි දිගින් දිගටම කිව්වේ. නමුත් තමුන්නාන්සේලා ඒ මතයට ආවේ නැහැ. තමුන්නාන්සේලා හැම තිස්සේම, "අපි මධ්‍යස්ථයි, අපි මධ්‍යස්ථයි" කියමින් යුද්ධයට ආවඩන තත්ත්වක් තිබුණා. ලෝක බලවතුන් ඉදිරියේ තමුන්නාන්සේලාට කියා ගන්න බැරි වුණා, මේ යුද්ධය එපා කියලා. ඒක කිව්වේ නැහැ. ඒක හංගාගෙන හිටියා. ඒ හින්දා තමයි විජිත හේරත් ඇමතිතුමාගෙන් අපි හෝමුස් සමුද්‍ර සන්ධිය ගැන අහනකොට එතුමා කිව්වේ, හෝමුස් සමුද්‍ර සන්ධිය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නැහැ, හෝමුස් සමුද්‍ර සන්ධිය වැහුවා කියලා අපට තෙල් නැති වෙන්නේ නැහැ, අපට තෙල් ඕනෑ තරම් තිබෙනවාය කියලා. දැන් මොකද වෙලා තිබෙන්නේ? මට මතකයි, අගෝස්තු මාසය වෙනකම් තෙල් තිබෙනවා කියලා එතුමා කිව්ව බව. දැන් අපට විජිත හේරත් ඇමතිතුමාගෙන් අහන්න වෙනවා, හෝමුස් සමුද්‍ර සන්ධිය දැන් සිංගප්පූරුවට ගෙනිහින්ද කියලා. මොකද, සිංගප්පූරුවෙන් තෙල් එන හින්දා හෝමුස් සමුද්‍ර සන්ධිය වැහුවා කියලා අපට ප්‍රශ්නයක් නැහැ කියා එතුමා කිව්වා. එහෙම නම් දැන් අපට අහන්න වෙනවා, හෝමුස් සමුද්‍ර සන්ධිය සිංගප්පූරුවට අරගෙන ගිහිල්ලාද, එහෙම නැත්නම් සිංගප්පූරුව හෝමුස් සමුද්‍ර සන්ධිය අරගෙන ඇවිල්ලාද කියලා. මේ දෙකෙන් කෝකද වෙලා තිබෙන්නේ? ඒකෙන් පෙනෙනවා, ඔබතුමන්ලා මේ ප්‍රශ්නය ගැන හරියට දැනගෙන හිටියේ නැහැ කියන එක.

යුද්ධය පටන් ගත්තේ පෙබරවාරි 28වැනි දා. එතකොට ඔබතුමන්ලා කිව්වා තෙල් සම්බන්ධයෙන් අවුලක් නැහැ කියලා. ඔබතුමන්ලාගේ සභාපතිවරු ඇවිල්ලා කිව්වා, තෙල් ගැන ප්‍රශ්නයක් නැහැ කියලා. ජනාධිපතිතුමා 03වැනි දා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, තෙල් තිබෙනවා, කිසිම ගැටලුවක් නැහැ කියලා. එහෙම තමයි එතුමන්ලා සහ ඔබතුමන්ලා උත්තර දීලා තිබෙන්නේ. අපිට පෙනෙනවා, දැන් මොකද වෙලා තිබෙන්නේ කියලා. දැන් පෙට්‍රල් ෂෙඩ්වල පෝලිම් තිබෙනවා. දැන් ෂෙඩ් වහලා තිබෙනවා. සමහර පෙට්‍රල් ෂෙඩ්වලට තෙල් එන ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. අද වෙනකොට බෙදා හැරීමේ ගැටලුවක් තිබෙනවා. අපි කොළඹින් පිට යන්න ඕනෑ නැහැ. කොළඹ නගරයේම රවුමක් ගිහිල්ලා බැලුවා නම්, පෙට්‍රල් ෂෙඩ් කීයක් අද වහලා තිබෙනවාද කියලා අපට පෙනෙනවා. කොළඹ නගරය ඇතුළේ ගියා නම්, අපට ඒ අත්දැකීම ගන්න පුළුවන්, පිට පළාත්වලට යන්න ඕනෑ නැහැ. අද තෙල් බෙදා හැරීමේ ගැටලුවක් මතු වෙලා ජනතාවට රස්තියාදු වෙන්න වෙලා තිබෙනවා. ඇයි, එහෙම වුණේ? එහෙම වුණේ, තමුන්නාන්සේලාට මේක හරියාකාරව කළමනාකරණය කර ගන්න බැරි වුණු නිසා. ඔබතුමන්ලා පසුගිය කාලයේ කියපු දේවල් අපට මතකයි.

සභානායකතුමා ඊයේ කථා කරනකොට කිව්වා, පසුගිය කාලයේ සුද්දේ තිබුණු නිසා තමයි තෙල් නැති වුණේ, අද යුද්ධය නිසා තමයි තෙල් නැති වුණේ කියලා. මතක තියා ගන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ තෙල් විකුණන්නේ කීයටද? මේ, ගත්ත පරණ stock එක. පෙට්‍රල් ලීටරය රුපියල් 24කින් වැඩි කළා. ඩීසල් ලීටරය රුපියල් 22කින් වැඩි කළා. අහිංසක ජනතාව පාවිච්චි කරන භූමිතෙල් ලීටරය රුපියල් 13කින් වැඩි කළා. එතකොට මොකක්ද සුද්දේ? සුද්දේ අපට පෙනෙනවා. ඔබතුමන්ලා ලාභයක් තියාගෙන, ඒ ලාභයට තවත් මුදලක් එකතු කරලා; පෙට්‍රල්වලට රුපියල් 24ක්, ඩීසල්වලට රුපියල් 22ක් එකතු කරලා අධික ලාභයක් ලබලා තිබෙනවා. මොකක්ද ඒ සුද්දේ? ඒක තමයි නියම සුද්දේ. ඒ කියන්නේ යුද්ධය අස්සේ සුද්දේ දැම්මා. ඒකෙන් ලාභය කීයද? රුපියල් කෝටි 710ක අමතර ලාභයක් තමුන්නාන්සේලා ලබනවා. ඒ කියන්නේ, පෝලිමේ ඉඳලා තෙල් ටික ගහ ගන්න, රස්තියාදු වෙලා තෙල්

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ටික ගහ ගන්න ඒ මිනිස්සුන්ගෙන් ආණ්ඩුව අමතරව රුපියල් 24ක් හා 22ක් පෙට්‍රල් හා ඩීසල් සඳහා අය කරනවා. ඒක හරහා රුපියල් කෝටි 710ක අමතර ආදායමක් මේ ආණ්ඩුව ලබා ගන්නවා. කොහොමද ඒ යුද්දේ? ඒ යුද්දේ යුද්ධය ඇතුළේ යුද්දේ. ඔබතුමන්ලා කියනවා නේ, පසුගිය කාලයේ හිටපු රාජපක්ෂලා මේ රට බංකොලොත් කළේ යුද්ධයක් නැතුව කියලා. ඒක හරි. යුද්ධයක් නැතුව තමයි බංකොලොත් වුණේ. දැන් ඔබතුමන්ලා මොකක්ද කරන්නේ? ඔබතුමන්ලා යුද්ධය ඇතුළේ යුද්දේ දමනවා. සහන නැහැ. සහන බලාපොරොත්තුවෙන් ඉන්නවා. අද ඒ තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා.

ඒක යුද්දේ නම්, මේ දැන් දමන යුද්දේ නම් අනුර කුමාර ජනාධිපතිතුමාගෙන් තමයි ඉගෙන ගන්න ඕනෑ. මොකද, එතුමා මේ දමන යුද්දේ කාටවත් කරන්න බැරි යුද්දයක්. ගානට දමනවා මිනිස්සුන්ගේ පොකට්වලට යුද්දේ, මේ අමාරු වෙලාවේ. ආවේ VAT එක ඉවත් කරනවා කියලා; අත්‍යවශ්‍ය භාණ්ඩවල VAT එක ඉවත් කරනවා කියලා. සෞඛ්‍ය සේවයේ VAT එක ඉවත් කරනවා කිව්වා. ළමුන්ගේ පාසල් උපකරණවලට ආලා තිබෙන VAT එක ඉවත් කරනවා කිව්වා. එහෙම ඉවත් කරනවා කියලා ඇවිල්ලා, අද යුද්ධයක් යන අවස්ථාවේදී, මිනිස්සු අමාරුවෙන් ජීවත් වෙන අවස්ථාවේදී, පරණ මිලට ගෙනාපු පෙට්‍රල් හා ඩීසල්වලට රුපියල් 24ක්, රුපියල් 22ක් වැඩි කරලා අමතර ලාභයක් ආණ්ඩුව ගන්නවා. ඒක සාධාරණීකරණය කරන්නේ කොහොමද කියන එක අපට තේරෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපිට පෙනෙනවා, දැන් පෙට්‍රල් ෂෙඩ් වහලා තිබෙන බව. පසුගිය ජනාධිපතිවරණය කාලයේදී ජනාධිපතිතුමා කිව්වා, මාළු ඉන්න තැන සොයා ගන්න app එකක් දෙනවා කියලා. දැන් මම යෝජනා කරනවා, මාළු ඉන්න තැන සොයා ගන්නා app එක පස්සේ දෙන්න, දැන් පෙට්‍රල් තිබෙන පෙට්‍රල් ෂෙඩ් ටික සොයා ගන්න app එකක් දෙන්න කියලා. මාළු ඉන්න තැන සොයා ගන්නා app එක පස්සේ දෙන්න පුළුවන්. දැන් මිනිස්සුන්ට ඕනෑ වෙලා තිබෙන්නේ, මේ ලංකාව ඇතුළේ පෙට්‍රල් තිබෙන ෂෙඩ් එක සොයා ගන්නා එකයි. පුළුවන් නම් ඒ app එක අපට ඉක්මනට හදලා දෙන්න. අපිට ඒක වටිනවා. මොකද, එහෙම නැත්නම් කොළඹ පුරාම, රට පුරාම යන්න ඕනෑ මොන ෂෙඩ් එකේද පෙට්‍රල් තිබෙන්නේ කියලා සොයා ගන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපි කියනවා, ඒ පරණ මිල ගණන්වලට ගෙනාපු ඒවා පරණ මිල ගණන්වලට දෙන්න කියලා. මේ වැඩේ කරන්න එපා. මේ අපරාධය කරලා මේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය කඩා දමන්න එපා. අද ඉතා අසීරු තැනකට මේ රටේ ජනතාව පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ තෙල් පෝලිම් ආවේ යුද්ධය නිසාය කියන එක තමයි, ඔබතුමන්ලා ගෙනෙන තර්කය. අපි දන්නවා, යාබද ඉන්දියාවේ කෝටි ගණනක ජනතාවක් ඉන්න බව. හැබැයි, ඉන්දියාවේ තෙල් පෝලිමක් නැහැ.

ඒගොල්ලන් මේ වැඩේ කළමනාකරණය කර ගත්තා. අපට වඩා වාහන විශාල සංඛ්‍යාවක් ඉන්දියාවේ තිබෙනවා. ඔවුන් අපට වඩා විශාල රටක්. අපේ ජනගහනයට වඩා සිය ගුණයකින් වැඩි ජනගහනයක් ඉන්න රටක්. එහෙම රටක එහෙම කළමනාකරණය කරගන්න ඒගොල්ලන්ට පුළුවන්කම ලැබුණා. නමුත් තමුන්නාන්සේලා මේක කළමනාකරණය කරගන්න අපොහොසත් වුණා. මොකද, තමුන්නාන්සේලා මධ්‍යස්ථයි, මධ්‍යස්ථයි කිය කියා හිටියාට මේක කළමනාකරණය කළේ නැහැ.

ඊයේ ජනාධිපතිතුමාගේ Iftar programme එකක් තිබුණා නේ. මම හිතන විධියට, ඒ Iftar programme එකට ගරු නියෝජ්‍ය කථානායකතුමාත් ගියා. ඒකට අරාබි රටවල තානාපතිවරු ආවාද? කවුරුවත් ආවේ නැහැ. ඉරාන තානාපතිතුමා ආවාද? එතුමා ආවෙත් නැහැ. මධ්‍යස්ථ නම් දෙගොල්ලන්ම එන්න එපා යැ. දෙගොල්ලන්ම ආවේ නැහැ. අරාබි රටවල ඉන්න තානාපතිවරු ටික ආවෙත් නැහැ. ඉරාන තානාපති ආවෙත් නැහැ. මොකද, දෙගොල්ලන්ම දන්නවා, ඔයගොල්ලන් "ඩබල් ගේම්" කියලා. ඒකයි දෙගොල්ලන්ම ආවේ නැත්තේ. කාගේ හරි එක පැත්තක ස්ථාවරයක් ගත්තා නම්, කවුරු හරි එන්න එපා යැ. අරාබිකාරයන්ගේ පැත්ත ගත්තා නම්, අරාබිකාරයෝ ටික එන්න ඕනෑ. ඉරානයේ පැත්ත ගත්තා නම්, ඉරාන තානාපති එන්න ඕනෑ. දෙගොල්ලන්ම ආවේ නැහැ. කවුරුවත් ආවේ නැහැ. ඇයි ඒ? ඒගොල්ලන් දන්නවා, ඔයගොල්ලන් ඉන්නේ "ඩබල් ගේම්" එකක කියලා. අරහෙන් ඊශ්‍රායලයත් එක්ක ඩීල් දමනවා. ඊශ්‍රායලය කටාර් රාජ්‍යයට ගැහුවාම ඒක හෙළා දකින්න බැරි වුණා. ඒ හින්දා ඒගොල්ලන් දන්නවා, අද තමුන්නාන්සේලාගේ විදේශ ප්‍රතිපත්තිය තිබෙන්නේ ඉතාම නපුංසක තැනක කියලා. කියන්නත් කනගාටුයි. විපක්ෂයේ ඉන්නකොට අධිරාජ්‍යවාදය ගැන, ලෝක බලවතුන් ගැන අපට දේශනා දීපු වාමාංශික ව්‍යාපාරයේ පතාක යෝධයන් වැනි ඔයගොල්ලන් අද මේ රටේ ආණ්ඩු කරනකොට කිසිම ආකාරයක ප්‍රතිපත්තියක ඉන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා කියලා අපට පේනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි නැවත තෙල් පෝලිම් පිළිබඳ කථාවට ආවොත්, ඉදිරියේදී විදුලිය කැපිල්ලක් තිබෙනවා කියලා දැන් අපට පොඩි ඉඟියක් ඇවිත් තිබෙනවා. එදා අපේ ඇමතිතුමාගේ කථාවෙන් ඒ පිළිබඳ පොඩි ඉඟියක් ආවා. ඊළඟට, මහජන උපයෝගිතා කොමිසමත් කියලා තිබෙනවා, ඉදිරි කාලයේදී, ඒ කියන්නේ ජූලි, අගෝස්තු වෙනකොට බොහෝදුරට විදුලිය කප්පාදුවක් එන්න පුළුවන් කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් අපට පේනවා, විදුලිය කැපිල්ල එන්නේ කොහොමද කියලා. ඇයි විදුලිය කපන්න සිද්ධ වෙන්නේ? දැන් අපට පේනවා, ඒක එන්නේ මේ යුද්ධය හින්දා නොවෙයි කියලා. විදුලිය කැපිල්ල එන්නේ යුද්ධය හින්දා නොවෙයි. විදුලිය කැපිල්ල එන්නේ අර ඇමතිතුමායි, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවයි දාපු යුද්දේ හින්දායි. ගල් අඟුරුවලට දාපු යුද්දේ හින්දායි එහෙම වෙන්නේ. ගල් අඟුරුවලට දාපු යුද්දේ නිසා අද වෙනකොට රුපියල් මිලියන 8,400කට වඩා වැඩි අලාභයක් සිද්ධ වෙලා තිබෙනවා කියලා අපට පේනවා. යුද්ධය හින්දා නොවෙයි විදුලිය කැපිල්ල එන්නේ. ගල් අඟුරු ගෙනැල්ලා ඒකට දාපු යුද්දේ හින්දා තමයි විදුලිය කැපිල්ල එන්නේ. ඒක හොඳට මතක තියා ගන්න. ඒක හින්දා විදුලිය කැපිල්ල එනකොට කියන්න එපා, ඒකත් එන්නේ යුද්ධය හින්දායි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට පේනවා, ගල් අඟුරු සුදු කරන්න ගිහිල්ලා දාපු යුද්දේ. ඒක අද වෙනකොට අපට දරා ගන්න බැරි වෙලා තිබෙනවා. ගෙනෙන ගෙනෙන ගල් අඟුරු නැව් ෆේල් වෙලා තිබෙනවා. අද වෙනකොට ගෙනාපු ඔක්කොම ගල්අඟුරු නැව් ටික ෆේල් වෙලා තිබෙනවා. ඊයේ පෙරේදා ජනාධිපතිතුමා ඇවිල්ලා කියනවා අපි දැක්කා, අපේ ඇමතිතුමාට ගල් අඟුරු සම්බන්ධව නඩුවක් දැම්මොත් තීන්දුවක් ගන්නවා කියලා. ජනාධිපතිතුමා ඇමති වෙලා සිටි කාලයේ තමයි එතුමා ප්‍රසම්පාදන කමිටුවේ සභාපති හැටියට පත් කරන්නේ. සාමාන්‍යයෙන් දේශපාලන පත්වීමක් දෙන්නේ සභාපති හැටියට නේ. එක්කෝ, පොහොර සංස්ථාවේ සභාපති කරලා තියන්න ඕනෑ. එතැන සභාපති කළේ නැහැ. දුන්නේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිකම. ඒ කියන්නේ, ගාණ කපන තැන තමයි සභාපතිකම දුන්නේ. ඒකට තමයි දැන් එතුමාට නඩු වැටිලා තිබෙන්නේ. ලක්ෂ 80කට අදාළවයි නඩුව තිබෙන්නේ. ජනාධිපතිතුමා තමයි එතකොට ඇමති වෙලා හිටියේ. එතුමා ඇමති වෙලා ඉන්නකොට

තමයි මේ ඇමතිතුමාව ඒ තනතුරට ගත්තේ. සිද්ධිය ඊට පස්සේ වුණා වෙන්න පුළුවන්. නමුත් දැන් ජනාධිපතිතුමා මොකක්ද කියන්නේ? ගල් අඟුරුවලට නඩු නැහැ ලු. ඉස්සර හොරකම් කළාට කමක් නැහැ, දැන් හොරකම් කළොත් තමයි මම අයින් වෙන්න කියන්නේ කියලා නේ, ජනාධිපතිතුමා ඔය කියන්නේ. මොකක්ද ඒ තියරිය? ඔය තියරිය තමයි මහින්ද රාජපක්ෂටත් දැම්මේ. ඕක අලුත් තියරියක් නොවෙයි. මහින්ද රාජපක්ෂ එදා "Helping Hambantota" චෝදනාවට ලක් වෙලා සිටියදී තමයි තමුන්නාන්සේලා රට පුරාම එක්ක ගිහින් මහින්ද රාජපක්ෂව මේ රටේ ජනාධිපති කළේ. ඒ තියරියම ජනාධිපතිතුමා දැන් මේ ඉන්න ඇමතිතුමාටත් දමනවා. ඒ සිද්ධිය එදා වුණේ, අද වුණේ නැහැ, අද වුණා නම් අපි තීන්දුවක් ගන්නවා කියලා නේ කියන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා ඔක්කොම බබාඋකුම් කථා. මොන්ටිසෝරි ළමයින්ට හොඳයි මේ කථා.  ජනාධිපතිතුමා කියන්න ඕනෑ කථා නොවෙයි, මේවා.

දැන් ඒ ඇමතිතුමාට චෝදනාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා. නඩුවක් වැටිලා තිබෙනවා. එතුමා අද ඇමතිවරයෙක් හැටියට සිටීම මේ නඩුව ගෙනයාමට බාධාවක්.  ඒ හින්දා තමයි අපි කියන්නේ එතුමාව මේ නඩුව ඉවර වෙනකම් හරි ඇමතිකමින් අයින් කරන්න කියලා. නමුත් එතුමාව අයින් කරන්නේ නැහැ. ජනාධිපතිතුමා දැන් එතුමා වෙනුවෙන් කථා කරන්න ඇවිත් තිබෙනවා.

ඒ නිසා අපට සැකයක් තිබෙනවා. ජනාධිපතිතුමා එතුමා වෙනුවෙන් කථා කරන්න ඉස්සරහට එනවා නම්, ගල් අඟුරු වංචාව සහ ඒ හරහා කරපු අවභාවිතාව පිළිබඳ වගකීම, ඒ කරපු පාඩුව පිළිබඳ වගකීම, උඩ ඉඳලා පහළ දක්වා සියලුදෙනාටම බෙදී යා යුතුයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman, your  time is up.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දැන් ආණ්ඩුව කියනවා, මුදල් තිබෙනවා, මහා භාණ්ඩාගාරය ඉතිරිලා ගිහිල්ලා තිබෙනවා කියලා. එහෙම නම් මේ අවස්ථාවේදී අපි කියනවා, මේ රටේ පෝලිම්වල සිටින අහිංසක ජනතාවට පෙට්‍රල් ටික ගහගන්න, ඩීසල් ටික ගහගන්න, භූමිතෙල් ටික ගහගන්න සහනයක් ලබා දෙන්න කියලා. අහිංසක ජනතාවට එසේ සහනයක් ලබා දෙන්න කියා යෝජනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Rauff Hakeem. You have eight minutes to second the Adjournment Motion moved by the Hon. Mujibur Rahuman.

[2.21 p.m.]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon.  Rauff Hakeem, Attorney-at-Law)
Hon. Deputy Speaker, I second the Motion moved by the Hon. Mujibur Rahuman.

At the very outset, අපි පාර්ලිමේන්තුවේ පක්ෂ නායක රැස්වීමේදී සාකච්ඡා කළ කාරණයක් පිළිබඳව මම මුලින්ම කියන්න ඕනෑ. ඉන්ධන පිරිමසා ගැනීම සඳහා රටේ හැම රජයේ ආයතනයකටම බදාද දිනයේ ලබා දීලා තිබෙන නිවාඩුව පාර්ලිමේන්තුවටත් බලපාන ලෙස දැන් පරිවර්තනය වෙලා තිබෙනවා. එබැවින්, අපට පාර්ලිමේන්තුවේ රැස්වීම් සඳහා තිබෙන සතියේ දින 4 සම්පූර්ණ වීමට සඳුදා දින රැස්වීම් දිනයක් හැටියට ලබා දෙන්න කියලා අපි බැගෑපත්ව ඉල්ලා සිටිනවා. මොකද, මා ඇතුළුව දුර පළාත්වලින් එන  මන්ත්‍රීවරුන්ට සතිය මැද කිසි දෙයක් කර ගන්න බැහැ. රජයේ කාර්යාල වැඩ කරන්නේ නැහැ. එදාට අපට නිකම් ගෙදර වාඩි වෙලා ඉන්න වෙනවා. දුර පළාත්වලින් එන මන්ත්‍රීවරු කොළඹට ඇවිල්ලා බදාදා දිනයේ කිසිම දෙයක් කර ගන්න බැරුව නිකම් ඉන්නවා. ඉතින්, අපට තිබෙන අයිතිය අනුව පාර්ලිමේන්තු රැස්වීම් වෙනුවෙන් අපට දවස් 4ම ලබා දිය යුතුයි. සඳුදා දිනය පාර්ලිමේන්තු රැස්වීම් සඳහා අපට ලබා දෙන්න කියා මම නැවත වතාවක් ඉල්ලා සිටිනවා. ගරු කථානායකතුමාගෙන් අප ඒ ඉල්ලීම කළාම ගරු සභානායකතුමා කියනවා, ඒ ගැන හෙට ජනාධිපතිතුමාත් එක්ක කථා කරන්න ඕනෑ කියලා. ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් තීරණ ගන්නේ නැහැ. ගරු කථානායකතුමා, ගරු සභානායකතුමා සහ ගරු අගමැතිතුමිය ඉන්නවා. ඒගොල්ලෝ එකතු වෙලා අපට ඒ තීරණය ලබා දෙන්න ඕනෑ. මොකද, මේ වාගේ අර්බුදයක් තිබෙන වෙලාවක තමයි අපි පාර්ලිමේන්තුවේ විවාද කරන්න ඕනෑ; ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කරන්න අවස්ථාව ලබා ගන්න ඕනෑ. ඉන්ධන හිඟය පාවිච්චි කරලා අපට තිබෙන පාර්ලිමේන්තු විවාද දිනයක් අඩු කරන්න ගියාම අපට ඒක ප්‍රශ්නයක් වෙනවා. බදාදා දවස නිවාඩු දිනයක් හැටියට තබා ගන්න පුළුවන්. ඒ වෙනුවට සඳුදා දිනය පාර්ලිමේන්තු රැස්වීම් දිනයක් හැටියට නම් කරන ලෙස අපි ඉල්ලා සිටිනවා. ඒ ඉල්ලීම කරමින්,

Having said that, Sir, I would like to say that this unfortunate war imposed on Iran has created global issues. One of the major issues is the oil shortage the entire world is facing.

This particular so-called asymmetrical war that has been imposed on Iran has been started along with a country that had been called an apartheid nation - Israel - for engaging in serious genecide against Palestinians. Has Iran caused genocide? Has Iran - you may not like the regime - established an apartheid State? No. But, an apartheid and a genocide State, together with the Americans, have bombarded Iran and killed several of its leaders, and this Government did not have the backbone to criticize that. So, now, what has happened? This is certainly a war of attrition, a war which is asymmetrical with it being fought between two disproportionate military powers. Of course, you cannot compare America's military power with that of Iran. Yet, a war which was said to be concluded within four to five days has now extended into four weeks and beyond; it might even go on  for months because they are prepared. Now, the question is, who is at the threshold of pain, who can

withstand pain? "If we get pain, you also had better suffer it" has been the attitude of the Iranians. And, the entire Third World is applauding them. If you take a popular vote or a public opinion in Sri Lanka today, every community will stand with Iran, not with the Americans or the Israelis; hardly anybody would. You can see that on social media.

But, unfortunately, our Government has chosen not to say anything that would hurt the Americans. This happened even when, close to our territorial waters, an Iranian frigate was torpedoed. In that, what happened? We took 11 hours to take a decision; for eleven long hours, we let them standing. There was a diplomatic note sent to the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism, but there had been complete silence for more than 11 hours. It was even discussed at the Security Council, yet no decision was taken. So, that is how you treat a friendly country. Finally, 100 sailors paid with their lives. They were not full-fledged sailors, but they were cadets. Also, they were not engaged in warfare, but they were torpedoed in the Exclusive Economic Zone close to our territorial waters. If you had allowed the ship to come into one of our ports, that would not have happened. Of course, later, the President had a special press briefing and said, "We have done our humanitarian duty; we went and saved the sailors; we brought them ashore and took the wounded to hospital". All of that is fine, but that is something you are obliged to do under international obligations, as an obligation under the UN Convention.

That is the Convention the Hon. Vijitha Herath, Minister of Foreign Affairs spoke about at the famous panel discussion with Palki Sharma as moderator. I am not going to talk about the Hon. Minister of Foreign Affairs's language skills; that is not my intention. But, when the question was asked, he was giving a *"keheda yanne, malle pol"* answer. She was asking about that incident and Sri Lanka's response, but he was talking about the blue economy and UNCLOS all the time. What has the blue economy got to do with the question that was asked?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
The Green economy.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
He was talking about the green economy, I am told.

Anyway, whatever it is, the issue is, now, we have got our wires crossed in this entire conflict. We may have got some semblance of satisfaction in having rescued those sailors, but, ultimately, the goodwill with our friendly countries has been destroyed. That is what the Hon. Mujibur Rahman just pointed out, that at the Iftar ceremony yesterday, there was no one from the Muslim world, except for Malaysia and Indonesia. Thank you very much for inviting us and we went there. Our President invited us. So, we should go. That is a different matter. But, what happened to the main countries in the Gulf Region? None of them came.

It is very unfortunate that some of the Gulf countries have also come under attack because the Iranians had previously warned that whoever who hosts a military base of the United States would become their target. Of course, they have, perhaps, not seriously targeted civilian areas, but various infrastructures have been targeted. To demobilize the capacity as far as attacks on Iran are concerned, they have had some precision strikes. It is surprising that they had had precision targeting, though nobody presumed they had such knowledge. But, now, this is going to drag on for several weeks. Then, how are we going to prepare ourselves to face that situation?

The Strait of Hormuz, as we all know, is a navigable area which is about two kilometres wide.

Such a big military power, such a massive global military establishment, the Americans, now have to plead with their friendly nations to come to their aid to get the Strait of Hormuz opened, but none of them are coming; all are refusing. Why? Because this is such a precarious position. The whole world is pushed into this position. It is a pipe dream even to get onto the Kharg Island. If they go there, they would be sitting ducks; it is so close to the Iranian coast that none of those soldiers could ever set foot there. That is the situation. So, if this situation goes on, not only would 20 per cent of the global oil supply would suffer, but if transport on Red Sea is also halted and if the Houthis start targeting the Red Sea, another 12 to 13 per cent of the world oil supply as well would be jeopardized.

So, that is the serious situation in which we ourselves are placed in. These global incidents may not have been foreseen by us, but, at least when such things happen, we must have the courage of our convictions to stand up and call a spade a spade. That had been the position of the current ruling party when they were in the Opposition. But, now, they have become great friends of the imperialists. That is why I say that when that apartheid State's horrible violations in the Gaza Strip happened, we kept silent. We did say a few words, but it was not to the satisfaction of the Palestinians then and nor is it to the satisfaction of the Iranians now. And, we are losing friends all around because of our lackadaisical Foreign Policy.

Having said that, I conclude, Sir.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Vijitha Herath. You have 15 minutes.

[අ.භා.2.32]

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය ආණ්ඩු මේ රට දැවැන්ත ආර්ථික ප්‍රපාතයකට වැට්ටුවා. ඊට පස්සේ අපි බලයට ඇවිල්ලා ඒ තත්ත්වයෙන් ක්‍රමානුකූලව රට යථා තත්ත්වයට පත් කරන්න පටන් ගත්තා. අපි ණය ප්‍රතිව්‍යුහගත කිරීම ආරම්භ කළා, ද්විපාර්ශ්වික ණය ප්‍රතිව්‍යුහගත කළා. ඒ වාගේම ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කළා. එහෙම කරලා එතෙක් තිබුණු අර්බුදයෙන් මේ රට ගොඩගත්තා.

පසුගිය අවුරුද්ද පුරාම ආර්ථිකය සුබදායී මට්ටමින් වර්ධනය වෙමින් ආවා. පසුගිය අවුරුද්දේ ආර්ථික වර්ධන වේගය සියයට 5ක මට්ටමට ගේන්න අපි සමත් වුණා. අපේ සංචාරක කර්මාන්තය වේගයෙන් දියුණු වුණා. පසුගිය වසර ඉතිහාසයේ පළමු වතාවට වැඩිම සංචාරකයන් පැමිණි අවුරුද්ද බවට පත් වුණා. ඒ වාගේම විදේශ ප්‍රේෂණ වැඩියෙන්ම ලබා ගත් අවුරුද්ද බවට පත් වුණා. අපට ඇමෙරිකානු ඩොලර් බිලියන 8.2ක වාර්තාගත ආදායමක් උපයාගන්න ලැබුණා. ඒ වාගේම අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 17.2 දක්වා වර්ධනය කර ගන්න අපි සමත් වුණා. අවුරුදු ගණනාවක් තිස්සේ අර්බුදයට වැටී තිබුණු රට ඒ තත්ත්වයෙන් මුදාගෙන, දූෂණයෙන් හා වංචාවෙන් තොරව, විනිවිදභාවයෙන් යුක්තව අපි ආණ්ඩුකරණය පටන් ගත්තාට පස්සේ අලුතින් ආයෝජන එන්න පටන් ගත්තා; ආයෝජන ගිවිසුම් ආරම්භ වුණා. ඒ සමඟ රට ඉතාම හොඳ, සුබවාදී තැනකට යන ගමන ආරම්භ වුණා.

ඒ මොහොතේ තමයි ස්වාභාවික ආපදාවකට, ඒ "දිට්වා" සුළි කුණාටු තත්ත්වයට රට මුහුණ දුන්නේ. ඒ අභාවාවක අත්දැකීමේදීත් අපි ක්ෂණිකව මැදිහත් වුණා. එහිදී අපි ජාත්‍යන්තර සහයෝගය උපරිමයෙන් ලබා ගත්තා. අපට ලෝකයේ සියලු රටවල්වලින් ආධාර උපකාර ලබා ගන්න පුළුවන් වුණා. තවම ජාත්‍යන්තර වශයෙන් රටවල් අපට උදවු කරනවා. අදත් පිලිපීනයෙන් ඩොලර් ලක්ෂයක් අපට ලබා දෙන බවට සහතික වුණා. ඒ ජාත්‍යන්තර සහයෝගය අපි උපරිමයෙන් ලබා ගනිමින්, "දිට්වා" සුළි කුණාටු තත්ත්වයත්, ඒ අභියෝගයත් ජයග්‍රහණය කළා.

අපි නැවත රට ගොඩනැගීමේ මහා භාරදූර කාර්යයට අත තියලා, "Rebuilding Sri Lanka" වැඩසටහන තුළින් ඉතාම කෙටි කාලයකින් අපේ රට නැවත කෙළින් සිටුවන්න අවශ්‍ය පියවර ගනිමින් තිබුණේ. එවැනි මොහොතකදී තමයි එකවරම ලෝක දේශපාලනය තුළ ඇති වුණු තත්ත්වය එක්ක අනපේක්ෂිත යුද්ධය ඇති වුණේ. ඒ යුද්ධය ශ්‍රී ලංකාවේ වත්මන් ආණ්ඩුව නිර්මාණය කරපු එකක් නොවෙයි. එය භූ දේශපාලනය තුළ ඇති වුණු යුදමය තත්ත්වයක්. ඒ යුද්ධයේ ප්‍රතිවිපාක අද මුළු ලෝකයටම බලපා තිබෙනවා. අද වනවිට සමස්ත ලෝකයේම බලශක්ති සැපයුමට, ඒ වාගේම එක එක රටවල අපනයනවලට, ආනයනවලට ආදී වශයෙන් සමස්ත ලෝකයේම ආර්ථිකයට මෙය බලපෑමක් ඇති කරලා තිබෙන්නේ. ඒක මේ අපේ ආණ්ඩුව විසින් නිර්මාණය කළ එකක් නොවෙයි. අපේ ආණ්ඩුවේ බැරිකමින් හැදුණු එකකුත් නොවෙයි. අපේ ආණ්ඩුව ඉතාම දක්ෂ විදියට, සාර්ථකව රට ඉස්සරහට ගෙනියන වෙලාවේ තමයි මේ ලෝක යුදමය තත්ත්වය ඇති වුණේ.

මේ පවතින ලෝක යුදමය තත්ත්වයත් එක්ක තමයි අද මේ තෙල් සහ අනෙකුත් බලශක්ති සැපයුම පිළිබඳ ගැටලු මතු වෙලා තිබෙන්නේ. ඒ තත්ත්වයත් එක්ක අපි ඉතා පැහැදිලිව තේරුම් ගත යුතු කාරණයක් තිබෙනවා. පසුගිය කාලයේ රට පාලනය කළ අය මෙවැනි අවස්ථාවකට මුහුණ දෙන්න අවශ්‍ය කරන ශක්තිමත් පදනමක් හදලා තිබුණා නම්, අපට මේ තත්ත්වයට මුහුණ දෙන්න අවශ්‍ය පිළියම් තිබෙන්න ඉඩ තිබුණා. නමුත් එහෙම එකක් නැහැ. අපට අවශ්‍ය කරන තෙල් ටික ගබඩා කරගන්න අවශ්‍ය ගබඩා පහසුකම් නැහැ. අපේ ත්‍රිකුණාමලයේ තිබෙන තෙල් ටැංකි ටික පිළිසකර කරලා තිබුණා නම්, අපේ රටට විතරක් නොවෙයි කලාපීය රටවල්වලටත් තෙල් සපයන්න පුළුවන් වෙනවා. නමුත් එවැනි තත්ත්වයකට ඒ තෙල් ටැංකි ප්‍රතිසංස්කරණය කරලා තිබුණේ නැහැ. ඒ නිසා තමයි අපි බලයට ආපු ගමන්ම ඉන්දියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ශ්‍රී ලංකාව අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කළේ. අපේ ආණ්ඩුව බලයට පත් වුණු ගමන්ම දූර දැක්මකින් යුක්තව ඒ අවබෝධතා ගිවිසුමට එළඹුණේ, ඒ pipeline එක හරහා අපට අවශ්‍ය මොහොතක තෙල් ලබා ගැනීමටත්, ඒ ලබා ගන්නා තෙල් ගබඩා කිරීම සඳහා ත්‍රිකුණාමලයේ තිබෙන තෙල් ටැංකි ටික ප්‍රතිසංස්කරණය කිරීමත් සඳහායි. ඒ අවබෝධතා ගිවිසුම අපි අත්සන් තැබුවේ අපි බලයට පත් වුණු ගමන්මයි. මොකද, අපි දැක්කා මෙවැනි තත්ත්වයන්ට තාවකාලිකව මුහුණ දෙනවාට එහා ගිය ස්ථිරසාර විසඳුමක් අපට අවශ්‍යයි කියන කාරණය.

තෙල් ගබඩාකරණයට අවශ්‍ය පහසුකම් අපට හොඳින් තිබෙනවා නම්, ශක්තිමත්ව තිබෙනවා නම් ලෝක දේශපාලනයේ ඇති වන ඕනෑම අර්බුදයකට මුහුණ දෙන්න අපට පුළුවන් කියන කාරණය අපි දැක්කා. ලෝකයේ ඇති වන තෙල් අර්බුදවලදී අපට ප්‍රමාණවත් මට්ටමින් තෙල් සංචිත තබා ගන්න පුළුවන් කියලා අපි දැක්කා. ඒ නිසා තමයි ස්ථිරසාර විසඳුමක් විදියට අපි ඒ pipeline එකත් එක්ක ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ටික ප්‍රතිසංස්කරණය කරන ත්‍රෛපාර්ශ්වික අවබෝධතා ගිවිසුමට අත්සන් තැබුවේ. අපි අදත් දකිනවා, ඒ තමයි ස්ථිර විසඳුමකට යන්න තිබෙන ක්‍රමයක් කියලා. ඒ වෙනුවෙන් අපි දැනටමත් භාණ්ඩාගාරයෙන් මුදල් වෙන් කරලා ඒ තෙල් ටැංකි ප්‍රතිසංස්කරණ ආරම්භ කර තිබෙනවා. අපි මේ ක්‍රියාමාර්ග ගන්නේ වෙන මොකටවත් නොවෙයි, රට දිගු කාලීන වශයෙන් ස්ථාවර තත්ත්වයට ගෙනෙන්නයි.

මෙවැනි අර්බුදයක් ඇති වුණු වෙලාවකදී ලෝකයේ තෙල් සැපයුමට, ලෝකයේ තෙල් ප්‍රවාහනයට හෝර්මුස් සමුද්‍ර සන්ධියේ බලපෑමක් තිබෙන බව අපි දැක තිබෙනවා. අපි එදා ඒක කිව්වා. මම එදා පැහැදිලිව කිව්වේ, ලෝක තෙල් ප්‍රවාහනයට සහ සැපයුමට හෝර්මුස් සමුද්‍ර සන්ධිය වසා තැබීම ප්‍රශ්නයක් වන බවයි. ලංකාව හෝර්මුස් සමුද්‍ර සන්ධිය හරහා තෙල් ප්‍රවාහනය කරන්නේ නැහැ; අපට එහෙම නැව් නැහැ.

අපි කරන්නේ ඉන්දියාවෙන්, මැලේසියාවෙන්, දකුණු කොරියාවෙන්, සිංගප්පූරුවෙන් තෙල් ආනයනය කරන එක. ඒක තමයි ඉතා පැහැදිලිව මේ කිව්වේ. ඒක තමයි එදාත් කියපු දේ. අදත් ඒක තමයි කියන්නේ. හෝර්මුස් සමුද්‍ර සන්ධියට විතරක් නොවෙයි, මෙවැනි තත්ත්වයක් ඇති වුණාම; සාමාන්‍ය සිවිල් තත්ත්වය බිඳ වැටුණාම සමස්ත ලෝකයටම මේ තත්ත්වයට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. අපි අද මේකට මුහුණ දෙන්නෙත් ඒ නිසා තමයි.

මේ යුදමය තත්ත්වයට බලපෑ තවත් එක හේතුවක් තමයි ඇති වෙච්ච සිදුවීම. ඒක තමයි ඉරාන නැව පිළිබඳ ප්‍රශ්නය. රවුෆ් හකීම් මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුවේ සම්පූර්ණ පට්ටපල් බොරු කිව්වා. නොදන්නා කරුණු නිකම් හරියට දන්නවා වාගේ එතුමා කිව්වා. එතුමා මුළුමනින්ම මේ පාර්ලිමේන්තුව නොමඟ යැවීමක් කළේ. ඉන්දියාවේ විසාඛාපට්නම්වල තිබිච්ච ඒ නාවික හමුදා fleet

[ගරු විජිත හේරත් මහතා]

එකට ශ්‍රී ලංකා නාවික හමුදාව සම්බන්ධ වුණා, ඉරානයේ නැව් 3ක් සම්බන්ධ වුණා, තවත් නැව් කිහිපයක්ම සම්බන්ධ වුණා. ඒ සම්බන්ධ වෙච්ච නැව්වලින් නැව් 3ක් අපේ ලංකාවට එන්න අපෙන් අවසර ඉල්ලුවා. ඇත්තටම ඒ අවසරය ඉල්ලුවේ පසුගිය පෙබරවාරි මාසයේ 26වැනි දා. මේ යුද්ධය පටන් ගත්තේ පෙබරවාරි 28වැනි දා. පළමුවැනි ප්‍රහාරය පටන් ගත්තේ පෙබරවාරි 28වැනි දා. ඊට පෙරාතුව පෙබරවාරි 26වැනි දා තමයි අපෙන් ලංකාවට එන්න අවසර ඉල්ලුවේ. හැබැයි අවසර ඉල්ලුවේ කොහොමද? මාර්තු මාසයේ 9වැනි දා ඉඳලා මාර්තු මාසයේ 13වැනි දා දක්වා ලංකාවට එන්න. එහෙම නැතුව හදිසියේ එන්න නොවෙයි. පැය 11ක් ඇතුළත එන්න කියලා කොහෙන්වත් අපෙන් අවසර ඉල්ලලා නැහැ. නොදන්නා දේවල් කියවන්න එපා. ඒ එවපු TPN එක මා ළඟ තිබෙනවා. ඉරාන තානාපති කාර්යාලයෙන් පෙබරවාරි 26වැනි දා අපේ විදේශ අමාත්‍යාංශයෙන් හරි පැහැදිලිව අවසර ඉල්ලුවේ, පසුගිය මාර්තු 09වැනි දා සිට මාර්තු 13වැනි දා දක්වා වූ දවස් 4ක කාලය තුළ goodwill visit එකකට එන්න. ඒක තමයි ඇත්ත කථාව. TPN එක මෙන්න තිබෙනවා; ලියුම මෙන්න තිබෙනවා. මේ රවුෆ් හකීම් මන්ත්‍රීවරයා පට්ටපල් බොරු කිව්වේ. පව කියන එකෙත් සීමාවක් තිබෙන්න ඕනෑ කියන එක නොවෙයි, ඇත්තටම ගත්තොත් පව කියන එකත් අහුවෙන්නේ නැති වෙන්න කියන්න ඕනෑ. කිසිදු සාක්ෂියක් නැතුවයි එතුමා ඒවා කිව්වේ, පැය 11ක් ඇතුළත එන්න අවසර ඉල්ලලා ඒ අවසරය දුන්නේ නැත්තේ කියලා. කොහෙන්ද අවසර ඉල්ලලා තිබෙන්නේ කියලා පුළුවන් නම් පෙන්වන්න කියලා මම කියනවා. නැහැ, ඒ නැව අපි ආරාධනා කරලා ආපු එකක් නොවෙයි. ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් ආරාධනා කළා කියලා තවත් මාධ්‍යයක තිබුණා මම දැක්කා. නැහැ, කිසිසේත්ම නැහැ. ඉන්දියාවේ තිබ්ච්ච fleet එකට සම්බන්ධ වෙලා ඉරානයට යන ගමන් මාර්තු 09වැනි දා අපේ රටට එන්නයි අවසර ඉල්ලුවේ.

මේ සිදුවීම වුණේ පසුගිය මාර්තු 04වැනි දා. එතකොට මාර්තු 4වැනි දා උදේ 5.08ට මේ සිදුවීම වෙච්ච ගමන් අපේ දකුණු පළාතේ තිබෙන Maritime Rescue Coordination Centre - MRCC - එකට ඒ පණිවුඩය ආපු විගස පැයක් ඇතුළත අපේ නාවික හමුදාව පළමුවැනි නැව යැව්වා. උදේ 7.00 වෙනකොට දෙවැනි නැව යැව්වා. ඒ නැව් යවලා ඒ සිදුවීම වෙච්ච තැන වහාම නිරීක්ෂණයක් කළා. සිදුවීම වුණු තැනට අපේ නාවික හමුදාව ගිහිල්ලා කවුද විපතට පත් වුණේ, මොන රටද, ආදී කිසි දෙයක් බැලුවේ නැහැ, ජාත්‍යන්තර සමුද්‍ර නීතියට අනුව මානුෂීය පදනමක් මත ඒ කටයුතු කළා. අද එය මුළු ලෝකයේම පිළිගැනීමට ලක් වෙලා තිබෙනවා; එය මුළු ලෝකයේම පැසසුමට ලක් වෙලා තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඒක දරාගන්න බැරි වුණාට අද මුළු ලෝකයක්ම අපි ඒ ගත්ත එඩිතර ක්‍රියාමාර්ගය පිළිබඳව පැසසුමට ලක් කරනවා; අපිව ඇගයීමට ලක් කර තිබෙනවා. ඇත්තටම ගත්තොත්, ඒ සිදුවීමේදී ඉන්දියාවේ ඉඳලා නැව් 3ක් ඇවිල්ලා තිබුණා. ඒ, IRIS Dena, IRIS Bushehr and IRIS Levan කියන නැව් 3. ඒ නැව් 3 ඇවිල්ලා එකක් නැවත ඉන්දියාවට ගිහිල්ලා තිබුණා. මේ නැව් 3ටම තමයි පසුගිය මාර්තු 9වැනි දාත්, 13වැනි දාත් ඇතුළත අපේ රට ඇතුළට එන්න අපෙන් අවසර ඉල්ලන්නේ. හැබැයි ඒ ගොල්ලෝ ඒ එක නැවක් ඉන්දියාවට ගෙනිහිල්ලා තිබුණා. IRIS Dena නැව තමයි ප්‍රහාරයට ලක් වෙන්නේ. එය ප්‍රහාරයට ලක් වෙච්ච තැනදී 32දෙනෙක් අපි බේරාගත්තා. ඒ බේරාගත්ත අය දැනටත් කොග්ගල ගුවන් හමුදා කඳවුරේ ඉන්නවා. අපි ඒ ගොල්ලන්ට ප්‍රතිකාර කරලා, සුවපත් කරලා දැන් අපේ අධීක්ෂණය යටතේ රඳවාගෙන ඉන්නවා. එහි සිටි 84දෙනෙක් මැරිලා තිබුණා.

අපි ඒ මෘත දේහවල පශ්චාත් මරණ පරීක්ෂණ අවසන් කරලා; උසාවි ක්‍රියාවලිය අවසන් කරලා, උසාවියෙන් ලැබුණු නියෝගය මත අවශ්‍ය කරන නීත්‍යානුකූල පියවර ගත්තා. අපි ඒ සියලු මෘත දේහ ඉරාන රජයට නැවත භාර දුන්නා. ඉරාන රජය එම මෘත දේහවලට අවසන් ගෞරව දක්වලා, ඒ කටයුත්ත අවසන් කළා. ඒ අතර තමයි 04වැනි දා IRIS Bushehr කියන නැවේ engine failure එකක් තිබෙනවාය කියලා ඒ නැවට අපේ territory එකට එන්න අවසර දෙන්න කියලා ඉල්ලීමක් කළේ. අපේ නාවික හමුදාව ක්ෂණිකව මැදිහත් වුණා. අපි ඒ නැව නාවික හමුදාවේ මැදිහත් වීමෙන් ගෙනාවා. දැන් කොළඹ වරායට මුහුදු සැතපුම් 9.5ක් එහා පැත්තේ ඒ නැව නැංගුරම්ලා තිබෙනවා. අපට ඒක ත්‍රිකුණාමල වරායට ගෙන යන්න ඕනෑ. හැබැයි, engine failure එක නිසා එය ගෙන යන්න බැහැ. අපි ඒකට අවශ්‍ය කරන තාක්ෂණික සහාය පෞද්ගලික සමාගමකින් ලබා ගත්තා. අපි එම නැව ත්‍රිකුණාමලයට ගෙන ගිහින් ත්‍රිකුණාමලය වරායේ රඳවා ගන්නවා. අපි ඒ කටයුත්තත් කරලායි තිබෙන්නේ. ඒ goodwill visit එක පිළිබඳව වැරදි මත පළ කරලා තිබුණා. ළමයින් 300ක් එක්ක එන්න හදනවා, අපි ඒකට අවසර දුන්නේ නැහැ කියමින් අසත්‍ය ප්‍රකාශ කළා. හරි පැහැදිලියි, මේක තමයි ඇත්ත කථාව. 04වැනි දා එම නැව ප්‍රහාරයට ලක් වනකොට, 4වැනි දා එන්න ඕනෑ කියලා අපෙන් අවසර ඉල්ලා තිබුණේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Minister, you have an additional five minutes. You have got a total of seven minutes from now on.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

Okay, thank you. ඒ අවසර නොදීම නිසා ප්‍රහාරයට ලක් වුණා කියලා වැරදි මත හදලා තිබුණා. එය සම්පූර්ණයෙන් අසත්‍යයක්. එහෙම එකක් නැහැ. පෙබරවාරි 26වැනි දා තමයි අපෙන් අවසර ඉල්ලුවේ, මාර්තු 09වැනි දා ලංකාවට එන්න. ප්‍රහාරය සිදු වුණේ 04වැනි දා. ඒ නිසා වෙච්ච විධිය ඉතා පැහැදිලියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාත්‍යන්තර සමුද්‍ර නීතියට අනුව අපි ඒ සියල්ල ඉටු කරනු ලැබුවා. අපි ඉරානය වාගේම, ජෝර්දානය, GCC රටවල් ඇතුළු මැද පෙරදිග අනෙකුත් රටවල් එක්ක අපේ සම්බන්ධතාව ඉතාම මිත්‍රශීලීව පවත්වාගෙන යනවා. අපි ඒ ගොඩක් රටවල විදේශ ඇමතිවරු එක්ක සාකච්ඡා කළා. ගරු ජනාධිපතිතුමා විවිධ අවස්ථාවල ඒ රටවල නායකයින් සමඟ සාකච්ඡා කළා. ඊයේත් කටාර් රාජ්‍යයේ ෂෙයික් එක්ක කථා කළා. මෙතුමන්ලා කියන තරම් ප්‍රශ්න නැහැ. ගරු ජනාධිපතිතුමා ඊයේත් කටාර් රාජ්‍යයේ ෂෙයික් එක්ක දුරකථනයෙන් කථා කළා. මේ සිදුවීම් පිළිබඳව විමසීම් කළා. අවශ්‍ය කරන සහාය ලබා දෙන්න අපි මැදිහත් වනවා. අපි මේ සියල්ල කරන ගමන් අපේ විදේශ ප්‍රතිපත්තිය ඍජුව - ස්ථාවරව - තබා ගෙන ඉන්නවා. අපි මේ යුද්ධයට සම්බන්ධ කිසිම පාර්ශ්වයකට සහයෝගය දෙන තැනක නැහැ.

අපි ඉතා පැහැදිලිව ලෝක සාමය වෙනුවෙනුයි ඒ මැදිහත්වීම කරන්නේ. පසුගිය දිනවල එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනාවක් ඉදිරිපත් වුණා. ඒ යෝජනාව සමබර යෝජනාවක් නොවෙයි. අපේ රට පුංචි වුණත් අපි ඉතා පැහැදිලිව කෙළින් තීන්දුවක් අරගෙන කිව්වා, "ඒ අසමබර යෝජනාවට අපි පක්ෂ වෙන්නේ නැහැ" කියලා. දෙපාර්ශ්වයම මේකට වගකියන්න ඕනෑ. මේ යුද්ධය ඇති කළ දෙපාර්ශ්වයෙන්ම වැරදි සිද්ධ වුණා. ඒ නිසා මේකට එක පැත්තකට විතරක් චෝදනා කරලා බැහැ. මේ යුද්ධය දෙපැත්තෙන්ම, තුන්පැත්තෙන්ම නතර කරන්න ඕනෑ. අපි ඒ ස්ථාවරයේ ඉතා පැහැදිලිව ඉන්නවා. ඒක

neutral වීමක් නොවෙයි. අපේ මධ්‍යස්ථ බව ආරක්ෂා කර ගනිමින් අපේ මතය අපි ශක්තිමත්ව ඉදිරිපත් කරලා තිබෙනවා. අපි ජාත්‍යන්තරය තුළ කොතැනකදීවත් අපේ රටට විරුද්ධ මතයක් අපි කියලා නැහැ; රටට විරුද්ධ මතයක් වෙනුවෙන් අපි පෙනී ඉඳලා නැහැ. ජාත්‍යන්තර සංවාදවලදී, ඒ ප්‍රශ්න අහපු වෙලාවේ දී අපි ඉතා පැහැදිලිව, සූක්ෂමව කිව්වේ ජාත්‍යන්තර නීතිවලට අනුව කටයුතු කරන බවයි. එතුමාට අමතක වුණා, Blue Economy එක ගැන විතරක් නොවෙයි; climate change එක ගැන විතරක් නොවෙයි; maritime security එක ගැනත් මම කිව්වා. ඒක හලනවා. මේ security එකේ බිඳ වැටීම තමයි මේ ප්‍රශ්නයේ මුල. ඒක තමයි ඉතා පැහැදිලිව මම කිව්වේ. ඒක මේ සමහර Facebookවල ඉන්න ගොයියන්ට තේරෙන්නේ නැහැ. ඒකට මට කරන්න දෙයක් නැහැ.

ඒ ඉරාන sailorsලාව දැන් අපි වැලිසර නාවික හමුදා කඳවුරේ රඳවා ගෙන ඉන්නවා. ඒ අයට අවශ්‍ය කරන කෑම බීම, ඉඳුම්-හිටුම් සියලු දේවල් අපේ රජයේ වියදමෙන් දෙනවා. ඒ අය සම්බන්ධයෙන් අපි ගන්නා තීරණය ඉතා බැරෑරුම් තීරණයක්. මොකද, යුද්ධයක් තිබෙන වෙලාවකදී යුද්ධයේ එක පාර්ශ්වයක නැවක් අපේ රටේ වරාය ආසන්නයේ තිබෙනවා. ඒ නාවික භටයන් අපේ භාරයේ ඉන්නවා; අපේ අධිකාරිය යටතේ ඉන්නවා. නැවත ඔවුන් යැවීම - repatriate කිරීම - කරන්න ඕනෑ ජාත්‍යන්තර නීතියට අනුවයි. එහෙම නැතිව අපි කාටවත් පක්ෂග්‍රාහීව වැඩ කරන්නේ නැහැ. අපි හැම රටක් එක්කම මිත්‍ර ශීලීව කටයුතු කරනවා. අපි ඉරානයත් එක්ක ඒ අවශ්‍යකරන සම්බන්ධතාව පවත්වා ගෙන යන ගමන්ම, ඇමරිකාව එක්කත් ගනුදෙනු කරනවා.

මරික්කාර් මන්ත්‍රීතුමා ඇහුවා, දකුණු සහ මධ්‍යම ආසියාව භාරව ඉන්න ඇමෙරිකානු විශේෂ නියෝජිත සර්ජියෝ ගෝර් ලංකාවට ආවා නේද කියලා. එතුමා ආවේ හොර රහසේ නේද කියලා ඇහුවා. නැහැ, හොර රහසේ නොවෙයි. ඉතා පැහැදිලියි. අද උදේ 10.00ට ජනාධිපතිතුමාව මුණ ගැහුණා. අපි මේ දෙරට අතර තිබෙන ආර්ථික, වෙළෙඳ, දේශපාලන සම්බන්ධතාවන් ගැන කථා කළා. පැයක පමණ සාකච්ඡාවක් තිබුණා. අපේ ඇමතිවරු කිහිප දෙනෙක් සම්බන්ධ වුණා. මාධ්‍යවල පළවෙලා තිබෙනවා. ඒවා හංගලා කරන දේවල් නොවෙයි. අපි ඇමෙරිකා එක්සත් ජනපදයත් එක්ක ඒ අවශ්‍යකරන ආර්ථික වෙළෙඳ සම්බන්ධතා පවත්වා ගෙන යනවා. ඒක ඔබ කවුරුත් දන්නවා.

ඇමෙරිකානු ජනාධිපතිවරයාගේ තීන්දුවක් අනුව අපට සියයට 44ක බද්දක් පැනෙව්වා. ආරම්භයේදීම සියයට 44ක බද්දක් පැනෙව්වා. අපේ තිබෙන රාජ්‍ය තාන්ත්‍රික සමත්භාවය තුළින් අපි ඒක සියයට 20 දක්වා පහළ දමා ගත්තා. අපි ඒක සියයට 20ට අඩු කර ගත්තා. එදා විපක්ෂයේ කට්ටිය කෑ ගැහුවා, මේ ආණ්ඩුවට බද්ද අඩු කර ගන්න බැහැ කියලා. අපි බදු අඩු කරගෙන පෙන්නුවා. අපි ඒවාත් balance කරගෙන තමයි මේ යන්නේ. අපි ඉරානයේ නැව තියා ගන්නා ගමන්; ඉරාන sailorsලාව අපේ අධිකාරිය යටතේ තියා ගන්නා ගමන්, ඇමෙරිකාව අප මත පනවා තිබෙන ආර්ථික ක්‍රියාවලිය සඳහා අවශ්‍යකරන රාජ්‍ය තාන්ත්‍රිකභාවය පාවිච්චි කරමින් රටට වාසිදායක විධියට පවත්වාගෙන යනවා. අපේ රටේ ජනතාව ඒවාත් හොඳින් තේරුම් ගන්නවා. රටේ ජනතාවට ඒක හොඳට තේරෙනවා. මෙක දැලි පිහියෙන් කිරි කනවා වාගේ වැඩක්. ඔව්, රටට වාසිදායක විධියට මේ දෙපැත්ත, තුන්පැත්තම සමබරව, රාජ්‍ය තාන්ත්‍රිකව ඒ සම්බන්ධතා පවත්වාගෙන යා යුතුයි කියලා අපි දන්නවා. අපි ඒක හරියට කරලා තිබෙනවා. අපි කොහේදිවත් ඒවා වළක්වා ගෙන නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තෙල් අර්බුදයේ දී අපිට අවශ්‍ය තෙල් ටික ගන්න අපි චීනයත් එක්ක සාකච්ඡා කළා. චීනය යම් මැදිහත්වීමක් කරමින් සිටිනවා. අපි රුසියාවත් එක්ක සාකච්ඡා කරලා, අද රුසියාව ඒ මැදිහත්වීම කරමින් සිටිනවා. පසුගිය දවස්වල සම්බාධක තිබුණා. සම්බාධක ඉවත් කළේ මධ්‍යම රෑ. පහුවෙනි දා දවල් වෙනකොට අපි රුසියානු තානාපතිතුමාත් එක්ක සාකච්ඡා කරලා දැන් ඒ ක්‍රියාවලිය ඉස්සරහට ගෙන යනවා. අපි ඉන්දියාවත් එක්ක, ඉන්දියාවේ විදේශ ඇමතිවරයාත් එක්ක ඉතා පැහැදිලිව අපේ තෙල් ප්‍රශ්නය ගැන කථා කරලා තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් සාකච්ඡාව පටන් ගෙන තිබෙනවා. සුභවාදී පිළිතුරු තිබෙනවා. ඉන්දියාව, චීනය, රුසියාව මේ තෙල් ප්‍රශ්නයේ දී අපිට උදව් කරන්න සුභවාදී පැත්තෙන් මැදිහත් වෙමින් ඉන්නවා.

හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ ඔවුනුත් ඒ රටවල අර්බුදවලට ලක් වෙලා තිබෙන එකයි. ඒ රටවලත් තෙල් ප්‍රශ්න තිබෙනවා. ඉන්දියාවේ පෝලිම් නැහැ කිව්වා. ඉන්දියාවේ ගෑස් පෝලිම් තිබෙන ආකාරය මුළු රටම දකිනවා. හැබැයි, මෙතුමන්ලා දැකලා නැහැ. මුළු රටම දකිනවා, ඉන්දියාවේ ගෑස් පෝලිම්වල මිනිස්සු කොච්චර දුක් විඳිනවාද කියලා. හැම රටක්ම මේ ප්‍රශ්නයෙන් පීඩාවට පත් වෙලා තිබෙනවා. අපේ තිබෙන ජාත්‍යන්තර සම්බන්ධතා නිසා මේ වෙලාවේ බොහෝ රටවල් අපට උදව් කරන්නත් කැමැත්තෙන් ඉන්නවා. අපි ඉදිරියේදී අනිවාර්යයෙන්ම ඒ උදව් ලබා ගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න ඕනෑ. මේ තත්ත්වය නිසා අපේ සංචාරක කර්මාන්තයට යම් බලපෑමක් ඇති වෙලා තිබෙනවා. විදේශ ප්‍රේෂණ අපට ලැබෙමින් තිබෙනවා. හැබැයි, විදේශගත වීමේ ප්‍රමාදයක් තිබෙනවා. මොකද, අපේ රටින් රැකියාවලට යන අයට ගුවන් තොටුපොළ අර්බුදය නිසා නිසි වේලාවට යෑමට නොහැකි වීමේ ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. අපි ඒකට මුහුණ දෙමු.

සංචාරක කර්මාන්තයේ අඩුවීම නිසා අපේ හෝටල් කර්මාන්තය යම් ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දීලා තිබෙනවා. මෙක අපි කවුරුත් දකින යථාර්ථය. ඒ වාගේම අපේ නිෂ්පාදකයිනුත්, අපනයනකරුවනුත් යම් ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දීලා තිබෙනවා. අපි ඒ ක්ෂේත්‍ර සඳහා යම් යම් සහන වැඩ පිළිවෙළ සකස් කරමින් තිබෙනවා. මේ ඇති වෙච්ච ලෝක තෙල් අර්බුදයේදී, ලෝක යුද්ධය තත්ත්වයේදී අපි රජයක් විධියට ඒකට මුහුණ දෙන්න අවශ්‍ය සැලසුම් හදලා ඒවා ක්‍රියාත්මක කරන්න දිනෙන් දින නව තීන්දු ගනිමින් ඉදිරියට යනවා. ඒක කාටවත් වළක්වන්න බැහැ. රටේ ජනතාව ආරක්ෂා කර ගන්න අපි හැකි උපරිමයෙන් කැප වෙනවා; ඇප වෙනවා. අපේ රටේ ජනතාව ඒ තත්ත්වයෙන් මුදවා ගන්න අපි අනිවාර්යයෙන්ම බැඳිලා ඉන්නවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) V.S. Radhakrishnan. You have eight minutes.

[பி.ப. 2.52]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் இந்த நாட்டினுடைய நிலைமை பற்றி பேசுவதற்குக் கிடைத்திருக்கின்ற இந்தச் சந்தர்ப்பத்தை நான் மிகவும்

[ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා]

வரவேற்கின்றேன். இன்று நாம் எதிர்நோக்கியுள்ள இந்த நிலைமை, இலங்கைக்கு மாத்திரமல்ல, முழு உலகுக்குமே பொருந்தும்.

මේක ලංකාවට විතරක් නොවෙයි, ලෝකයටම බලපාන ප්‍රශ්නයක්. නමුත් අපට මුහුණ දෙන්න සිදුවන ප්‍රශ්නය ගැන අපි කථා කරන්න ඕනෑ. ඒකට අවස්ථාව ලැබීම ගැන මම ඉතාම සතුටු වනවා. විදේශ කටයුතු ඇමතිතුමා ඉරාන නාවිකයින් බේරා ගැනීම සම්බන්ධව යම් ප්‍රකාශයක් කළා. ඒක ඇත්ත. මානුෂිකව සිතා ඉරාන නාවිකයින් බේරා ගත්ත එකට අපි එතුමන්ලාට ස්තුතිවන්ත වනවා.

நான் வசிக்கின்ற நுவரெலியா மாவட்டத்தில் இருக்கின்ற விவசாயிகளின் பிரச்சினைகளை இந்தச் சபைக்குச் சொல்லிவைக்க வேண்டிய கட்டாயத் தேவை இருக்கின்றது. இப்பொழுது அவர்களுக்கு உரம் இல்லை. නුවරඑළිය ප්‍රදේශයේ ගොවි ජනතාවට දැනුත් පොහොර නැහැ. பெற்றோல், டீசல் தட்டுப்பாடு காரணமாக உழவு இயந்திரங்களைப் பாவிக்கக்கூடிய சந்தர்ப்பமும் குறைவடைந்து வருகின்றது. இதனால் விவசாயத்துறையில் பின்னடைவு ஏற்படக்கூடிய நிலைமை ஏற்படும். எதிர்வரும் சிங்கள - தமிழ் புத்தாண்டு காலப்பகுதியில் டீசல், பெற்றோல் முறையாக வழங்கப்படாவிட்டால், அங்கு transport பிரச்சினையும் உருவாகும். எனவே, இதனை மாற்றியமைப்பதற்கான விடயங்களை மேற்கொள்ள வேண்டுமென நான் இந்த நேரத்தில் சொல்லிவைக்க விரும்புகின்றேன். தோட்டங்கள் மிகத் தூரத்தில் இருப்பதால், அங்கிருக்கின்ற மக்கள் நகரத்துக்கு வருவதற்கு transport வேண்டும். Transportஐ மேற்கொள்வதற்கு பெற்றோல், டீசல் வேண்டும். எனவே, இதனையும் கவனத்திற்கொள்ள வேண்டிய பொறுப்பு இருக்கின்றது. நுவரெலியாவில் இருக்கின்ற இன்னொரு பிரதான விடயம்தான் tourism எனப்படும் உல்லாசப் பிரயாணத்துறை.

ඔබතුමන්ලා දන්නවා, අප්‍රේල් වනකොට නුවරඑළියට විදේශීය සංචාරකයින් පමණක් නොවෙයි, ලංකාවේ සංචාරකයිනුත් ලක්ෂ පහක් විතර එනවා කියලා. ඔවුන් මේ සැරේ එයිද කියලා අපට සැකයක් තිබෙනවා. මොකද, ඩීසල්, පෙට්‍රල් නැත්නම් ඒ අයට නුවරඑළියට ඇවිල්ලා යන්න බැහැ. ඒගොල්ලන්ට එන්න බැරි වුණොත්, ඒක නුවරඑළිය ජනතාවට පාඩුයි. කාමරයක් දෙන්න විධියක් නැහැ, එළවලු ටිකක් විකුණා ගන්න බැහැ, පලතුරු ටිකක් විකුණා ගන්න බැහැ. එහෙම වුණොත් ඒ ජනතාවගේ ආර්ථික තත්ත්වය කඩාගෙන වැටෙනවා.

අපේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්න නිසා මම මේ කාරණය කියන්නේ. අප්‍රේල්වල එන වසන්ත කාලයට මොනවා හරි කරන්න. මිනිසුන්ට එන්න, යන්න පෙට්‍රල්, ඩීසල් ටික වැඩිපුර දෙන්න. ඒ අයට නුවරඑළියට ඇවිල්ලා විනෝදයෙන් කාලය ගත කරලා යන්න අවස්ථාවක් හදලා දෙන්න. එහෙම නැත්නම් ඒ මිනිස්සු කොහේ යන්නද? පිට රට යන්න flightsවත් නැහැ. ඒක නිසා නුවරඑළියට තමයි එන්න වෙන්නේ. මිනිසුන්ට වෙන විකල්පයක් නැහැ. ඒ මිනිස්සු එක්කෝ යාපනයට යන්න ඕනෑ, නැත්නම් දකුණු පළාතට යන්න ඕනෑ, එහෙමත් නැත්නම් නුවරඑළියට එන්න ඕනෑ. ඒක නිසා ඩීසල්, පෙට්‍රල් ප්‍රශ්නය ගැන විශේෂයෙන් කල්පනා කරන්න ඕනෑය කියලා මම මේ අවස්ථාවේ මතක් කරනවා.

மேலும், பெருந்தோட்ட மக்கள் நகருக்கு வருவதற்கும் நகரத்திலிருந்து பொருட்களை வாங்கிக்கொண்டு போவதற்கும் transport வசதி இல்லாமல் மிகவும் கஷ்டப்படவேண்டிய சூழ்நிலை ஏற்படும். இவற்றை எல்லாம் கருத்திற்கொண்டு, இந்த நாட்டின் நிலைமையைச் சரிசெய்ய வேண்டுமென்பது எங்களுடைய கருத்தாக இருக்கின்றது. உலகத்தில் நடக்கின்ற விடயங்களால் இலங்கையில் இவ்வாறான நிலைமை ஏற்படுவது வழமை! இது முதல் தடவையல்ல, நாங்கள் இவ்வாறான நிலைமைக்குப் பல தடவை முகங்கொடுத்து இருக்கின்றோம். குறிப்பாக, 'கொவிட்' தொற்று, 'தித்வா' புயல் ஏற்பட்டபோது, நாங்கள் பல நாட்கள் முடங்கிப்போய் இருந்தோம்.

இப்பொழுது முச்சக்கரவண்டி - three-wheeler - ஓட்டுநர்கள் முழு நேரத்தையும் petrol shedஇல் செலவிட வேண்டிய சூழ்நிலை ஏற்பட்டிருக்கின்றது. காலையில் ஷெட்டில் நின்றால், evening வரைக்கும் அங்கு நிற்கவேண்டிய சூழ்நிலை இருக்கின்றது. அவர்கள் கடன் வாங்கித்தான் three-wheel வாங்கியிருக்கின்றார்கள். இதனால் கடனைச் செலுத்த முடியாத நிலைமை ஏற்பட்டு இருக்கின்றது. இதன் காரணமாக அவர்களை finance company நெருக்குகின்றது. எனவே, அவர்களுக்குரிய வசதிகளைச் செய்து கொடுக்க வேண்டுமென நான் அன்பாகக் கேட்டுக் கொள்கின்றேன். குறிப்பாக, கடனைச் செலுத்துவதற்கு கொஞ்ச கால அவகாசத்தைப் பெற்றுக் கொடுப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். கொழும்பு மற்றும் ஏனைய பட்டினங்களில் அநேகமான மலையக இளைஞர்கள் taxi driverஆகப் பணியாற்று கின்றார்கள். அவர்களது தொழிலே அதுதான். தற்போதைய நிலைமையால் அவர்களுடைய தொழில் பாதிக்கும் என்பதை நீங்கள் கருத்திற்கொள்ள வேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, கௌரவ பிரதம அமைச்சர் அவர்களிடம் ஒரு வேண்டுகோளை விடுக்கின்றேன். கௌரவ பிரதம அமைச்சர் அவர்களே, இப்பொழுது நீங்கள் 23,000 பட்டதாரி ஆசிரியர் நியமனங்களை வழங்கப் போகின்றீர்கள். மிகவும் சந்தோசம்! இது வரவேற்கப்படக்கூடிய விடயம். கடந்த காலங்களில் ஆசிரியர் நியமனங்கள் வழங்கும்போது, பெருந்தோட்டப் பகுதிகளுக்கென விசேட வரப்பிரசாதங்கள் இருந்தன. குறிப்பாக, அந்தப் பகுதிகளைச் சேர்ந்தவர்களுக்கு அதே தோட்டப் பகுதிகளுக்கு appointment கொடுப்பது சம்பிரதாயமாக இருந்து வந்தது. இது சந்திரிகா பண்டாரநாயக்க, மஹிந்த ராஜபக்ஷ ஆகியோருடைய ஆட்சிக் காலம் உட்பட எல்லா அரசாங்க காலத்திலும் இருந்தது. இப்போது அவ்வாறு இல்லையென்று நீங்கள் சொல்கிறீர்கள். இதனால் பெருந்தோட்டப் பாடசாலைகளின் கல்வி நடவடிக்கை ஸ்தம்பிதமடையும். அன்று நடைபெற்ற கல்வி பற்றிய கூட்டத்திலும் நான் உங்களிடம் இது பற்றி சொன்னேன். தயவுசெய்து, நீங்கள் இதனை மறுபரிசீலனை செய்து, தோட்டப் பகுதிகளுக்கென வேறாக 3,000 அல்லது 4,000 ஆசிரிய நியமனங்களை வழங்குவதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். பெருந்தோட்டப் பகுதியிலுள்ள மக்கள் 30 வருடங்கள் கல்வியில் பின்னடைந்த சமூகத்தினராக இருக்கின்றார்கள்.

අවුරුදු 30ක් අපි backward. ඒ අවුරුදු 30 අපට ඉදිරියේදී අල්ලන්න බැහැ. ඒ නිසා කරුණාකරලා plantation areasවලට teachersලා appoint කිරීම සඳහා කටයුතු කරන්න කියලා ගරු අගමැතිතුමියගෙන් ඉල්ලා සිටිමින්, මට කථා කරන්න වේලාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Prime Minister, you have 15 minutes to speak on the Motion.

[අ.භා. 3.01]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Thank you, Hon. Deputy Speaker. ගරු රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා මතු කළ ප්‍රශ්නයට මම උත්තර දීලා ඉන්නම්, එතුමා සෘජුවම ඒ ප්‍රශ්නය අහපු නිසා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එදා රැස්වීමේදීත් ඔය කාරණය මතු කළා. මම හිතන්නේ අප සියලුදෙනාම දන්නවා, මලෙයහම් ප්‍රජාව තුළ අධ්‍යාපනය සම්බන්ධ ප්‍රශ්න ගණනාවක් තිබෙන බව. ගුරු පුරප්පාඩු ඒ සඳහා බරපතළ විධියට බලපා තිබෙන බවත් අපි හොඳින් දන්නවා. මේ වතාවේදී විසිතුන්දහස් ගණනකට ටිකක් වැඩියෙන් අපි මේ බඳවා ගැනීම් කරන්නේ අධිකරණ තීන්දුවක් එක්කයි. ඒ අධිකරණ තීන්දුව - Court Determination - අනුව තමයි අපි බඳවා ගැනීම් සිදු කරන්නේ. නමුත්, ඔබතුමා ඔය කියපු කාරණය අපි තේරුම් අරගෙන තිබෙනවා. ඒ නිසා මලෙයහම් ප්‍රජාවේ අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් විශේෂ මැදිහත්වීමක් විය යුතුයි කියන එක අපි පිළිගන්නවා. අපි ළඟදී දවසකත් ඒ පළාතේ පවතින නිශ්චිත ගැටලු ගැන අධ්‍යාපන අමාත්‍යාංශයේ ඊට අදාළ Division එකේ නිලධාරීන් ගෙන්වලා කථා කළා. අපි ඒ ගැටලු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරනවා, ගරු මන්ත්‍රීතුමනි. මේ බඳවා ගන්නා ගුරුවරුන්ගෙන් පිරිසක් ඒ ප්‍රදේශවලට යවන්නත්, ගුරු පුහුණුව ලබා දෙනකොට ඒ ප්‍රජාවට විශේෂ අවධානයක් ලබා දෙන්නත් අපි බලාපොරොත්තු වෙනවා. මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ඒ ප්‍රශ්නය නිරන්තරයෙන් අපේ අවධානයට යොමු කිරීම ගැන, ගරු මන්ත්‍රීතුමනි.

Hon. Deputy Speaker, it is actually quite disappointing to be in Parliament listening to some of the things that our Members of the Opposition say. අපි මේ වෙලාවේදී මුහුණ දෙන තත්ත්වය මොකක්ද කියන එක ගැන අපට හොඳ අදහසක් තිබිය යුතුයි. මේක ගෝලීයව ඇති වෙලා තිබෙන අර්බුදයක්. ආර්ථික අර්බුදයකටත් මුහුණ දීලා, දේශපාලන අර්බුදයකටත් මුහුණ දීලා හුස්මක් ගන්න උත්සාහ කරමින් ඉන්න අපේ රට නැවත වතාවක් මෙවන් අර්බුදයකටත් මුහුණ දෙනකොට වග කිව යුතු විපක්ෂයක් හැටියට ඊට කෙසේ ප්‍රතිචාර දැක්විය යුතුද කියන එක ගැන මීට වඩා ගැඹුරින් හිතන්න ඕනෑ කියලා මම හිතනවා.

නමුත්, අපේ රටේ අවාසනාවට මේ සභාවේ ඉන්න බහුතරයක් විපක්ෂ මන්ත්‍රීවරුන් සහ පක්ෂ උත්සාහ කරන්නේ මොකක් හෝ අවස්ථාවකින්, මොකක් හෝ විධියකින්, මොනවා හරි ගේමක් ගහලා නැවත වතාවක් බලයට එන්නයි. ඒක කරන්න නම් අවුරුදු පහට කලින් මොනවා හරි විධියකින් මේ ආණ්ඩුව වට්ටන්න ඕනෑ කියායි ඔවුන් හිතන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ සඳහා තමයි ඔවුන් මේ මුළු උත්සාහයම දරන්නේ. ඒ සඳහා තමයි ආණ්ඩුවේ නොහැකියාව, ආණ්ඩුවේ රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාවල තිබෙන දුර්වලතාව කියන දේවල් මතු කරමින්, ජනතාව බිය වද්දමින්, ජනතාවගේ ප්‍රශ්න exaggerate කරමින් - උලුප්පා දක්වමින් - කටයුතු කරන්නේ; කොහොම හරි නැවත වතාවක් මොනවා හරි විධියකින් ආණ්ඩුව වට්ටලා බලය ලබා ගන්න කටයුතු කරන්නේ. ඒ කියන්නේ, ප්‍රජාතන්ත්‍රවාදීව මැතිවරණයකට ඉදිරිපත් වෙලා, එම මැතිවරණයේදී ඔවුන්ගේ තිබෙන ප්‍රතිපත්ති මත ජනතාවගේ හිත දිනා ගන්න නොවෙයි, පවතින ආණ්ඩුව කෙසේ හෝ වට්ටලා, රට විනාශ වුණත් කමක් නැහැ, මිනිස්සුන්ට මොනවා වුණත් කමක් නැහැ කියලා බලය ලබා ගන්නයි ඔවුන් උත්සාහ කරන්නේ.

දැන් එහෙම බලය ලබා ගන්න උත්සාහ කරන්නේ ඇයි? ඔවුන්ට දැනට පවතින රජයට - ආණ්ඩුවට - වඩා මේ රට ගොඩ දමන්න මොකක් හෝ විශිෂ්ට සැලසුමක් තිබෙනවාද? අපි ක්‍රියාත්මක කරන විධියට වඩා වෙනස්, ඉතාම බුද්ධිමත් මොනවා හෝ සැලැස්මක්, දැනුමක් සහ හැකියාවක් තිබෙනවාද, එතුමන්ලාට මේ රට මේ වෙලාවේදී තිබෙන තත්ත්වයෙන් ගොඩ ගන්න? ඒ වුවමනාවත් එක්කද මේ ආණ්ඩුව අපහසුතාවට පත් කරන්න මේ උත්සාහ කරන්නේ? එහෙම නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි දන්නවා, අප මේ රට භාර ගන්නකොට තිබුණු තත්ත්වය පිළිබඳව. මේ රට කොහොමද තිබුණේ සහ රට එතැනට ගෙන ඒමට වගකිව යුත්තේ කවුද කියන එකත් අපි හොඳින් දන්නවා. දැන් ඒ අයම තමයි මේ රටේ ජනතාව ප්‍රජාතන්ත්‍රවාදීව තෝරා ගත් ආණ්ඩුව මේ විධියට මොකක් හෝ ගේමක් ගහලා වට්ටලා, නැවත වතාවක් බලයට එන්න උත්සාහ කරන්නේ.

එහෙම කරන්නේ ඇයි කියන එක ගැනත් අපි හොඳට දන්නවා. අපි විතරක් නොවෙයි, මම හිතන විධියට මේ රටේ ජනතාවත් ඒ ගැන හොඳින් දන්නවා. මේ වනවිට ඔවුන්ට එරෙහිව තිබෙන චෝදනා පිළිබඳව විමර්ශන කඩිනමින් සිද්ධ වනකොට, ඔවුන්ගේ දේශපාලන පැවැත්ම පිළිබඳ බරපතළ ගැටලු නිර්මාණය වෙමින් යනකොට, ඔවුන් දැන් ඕනෑ එකකින් දමලා ගහන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒක ඇත්තටම බොහොම කනගාටුදායකයි. ඒක නොවෙයි, මේ වෙලාවේදී මේ රටට අවශ්‍ය. බලන්න, ඒගොල්ලන් හැම වෙලාවේදීම මතු කරන්න හදන්නේ මොකක්ද කියලා. අලුත් අවුරුද්දත් හරියට සමරන්න බැරි වෙයි, ඉදිරියට විදුලිය කප්පාදු වෙනවා, තෙල් නැති වෙනවා කියා මිනිස්සුන්ව භය කරන්න ඒගොල්ලන් උත්සාහ කරනවා. ඒ වාගේම ඒ තත්ත්වය තව තවත් උත්සන්න කරන්න තුඩු දෙන විධියේ ප්‍රකාශ කරනවා. මේ තත්ත්වය පාලනය කරන්න වගකිව යුතු විපක්ෂයක් හැටියට මේ වෙලාවේදී පවතින අර්බුදය හරියට තේරුම් අරගෙන ඒ වෙනුවෙන් මැදිහත් වෙනවා වෙනුවට ඉතාම පටු, ආත්මාර්ථකාමී න්‍යාය පත්‍රයක ඉඳගෙනයි ඔවුන් හැසිරෙන්නේ. අඩුම තරමින් රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවලට හානි නොවන විධියේ ප්‍රකාශ සිදු නොකර ඉන්නවත් බැහැ, මේ විපක්ෂයට. ඔළුවට එන ඕනෑ දෙයක් කියනවා. මොකද, ඔවුන්ගේ එකම අරමුණ වෙලා තිබෙන්නේ කෙසේ හෝ මේ ආණ්ඩුව වට්ටන එක. ඡන්දයකින් පරාජය කරලා, ඒ ක්‍රමවේදයෙන් ගිහිල්ලා හරියට කටයුතු කරන්න නොවෙයි ඔවුන් උත්සාහ කරන්නේ. ඔවුන්ගේ සිහිනය මොකක්ද? 2022දී සිද්ධ වුණු අරගළය වාගේ අරගළයක් ආපසු එයි කියලා තමයි ඔවුන් සිහින මවමින් ඉන්නේ. මම මේ විපක්ෂයට කියන්නේ, very sorry, ඒක වෙන්නේ නැහැ කියන එකයි.

එහෙම නොවෙයි, ඔබට ආයෙත් බලයට එන්න ඕනෑ නම් පාරක් තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තිබෙනවා. මැතිවරණ එනවා. ඒ මැතිවරණවලදී ඔබව තෝරා ගන්න ජනතාවට අවස්ථාවක් තිබෙනවා. ඒ හරහා ඔබතුමන්ලා එන්න. ඒ ගැන අපිට කිසිම ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මේ අර්බුදකාරී මොහොතේදී මෙහෙම පටු විධියට හැසිරෙන්න එපා කියන ඉල්ලීම මම නැවත වතාවක් කරනවා. බොරුවට ජනතාව අවුස්සන්න උත්සාහ කරන්න එපා කියාත් මම යෝජනා කරනවා, ගරු නියෝජ්‍ය

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

කථානායකතුමනි. බලන්න, දැන් මේගොල්ලන් මොකක්ද මේ කියන්නේ කියලා. ඔවුන් උත්සාහ කරනවා, ආණ්ඩුවේ නොහැකියාව නිසා එහෙම නැත්නම් ආණ්ඩුව කරපු වැරදි නිසා මේ තත්ත්වය ඇති වෙලා තිබෙනවාය කියලා මතු කරන්න. හැබැයි, අපි සියලුදෙනාම දන්නවා, මේ ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව. මේ මොහොතේදී තෙල් අර්බුදය, පෝලිම් කියන සියල්ලම ඇති වෙලා තිබෙන්නේ ඇයි? ලෝකයේ වෙනත් රටවල් දිහා බැලුවත් පෙනෙනවා, ඔවුනුත් මේ විධියේ ප්‍රශ්නවලට මේ වනවිට මුහුණ දෙමින් ඉන්නේ කියන එක. බඩු මිල ඉහළ ගිහින් තිබෙනවා. තෙල් මිල ඉහළ ගිහින් තිබෙනවා. දකුණු ආසියාවේ අනෙක් රටවල් එක්ක සාපේක්ෂව බලනකොට අපේ රටේ තමයි අඩුවෙන්ම තෙල් මිල වැඩි වෙලා තිබෙන්නේ.

වෙන රටවල මීට වඩා වැඩි වෙලා තිබෙනවා. වෙන රටවලත් වැඩ කරන දින ප්‍රමාණය අඩු කරලා තිබෙනවා. මේක කර්මාන්තවලට බලපාලා තිබෙනවා. අපනයන-ආනයනවලට, supply chain එකට බලපාලා තිබෙනවා. තෙල් අර්බුද ඇති වෙමින් පවතිනවා. මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නේ අපි විතරක් නොවෙයි. මේ තත්ත්වයට සියලුදෙනා මුහුණ දෙන්න ඕනෑ. එතකොට මේකට මුහුණ දෙන්න අපි උත්සාහ කරන්නේ කොහොමද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැදපෙරදිග යුද්ධය පටන්ගෙන අදට දින 20යි. මේ කාලය තුළ අපි තීන්දු තීරණ ගණනාවක් ගත්තා. තෙල් සැපයුම පිළිබඳව ඉතාම කිට්ටුවෙන් අපි නිරීක්ෂණය කරමින්, ඒක අධ්‍යයනය කරමින් තෙල් සැපයුම නොකඩවා පවත්වාගෙන යෑමට අපි සැලසුම් කරමින් සිටින්නේ. තෙල් මිල ඉහළ යාමත් සමඟ වෙළෙඳ පොළේ ඇතිවෙලා තිබෙන චලනයන් එක්ක අපි කොහොමද ඒකට මැදිහත් විය යුත්තේ කියන එක පිළිබඳව අපි සාකච්ඡා කරමින් යනවා. අපේ රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා හරහා මේ තෙල් සැපයුම නොකඩවා පවත්වාගෙන යෑමට අපි කටයුතු කරමින් සිටියා. අපේ විජිත හේරත් විදේශ ඇමතිතුමා ඒ පිළිබඳව කිව්වා. මොනවා කළත් තෙල් සැපයුමේ අඩුවක් වෙන්න පුළුවන් කියලා අපි දන්නවා. ඒ නිසා තමයි ඒ පරිභෝජනය - consumption - පැත්තෙන් මේක පාලනය කිරීමට අපි කටයුතු කරමින් යන්නේ. ඒ නිසා තමයි QR code එක හඳුන්වා දී තිබෙන්නේ. ඔව්, QR code එක සියයට සියයක් අවශ්‍යාම විධියට මේ මොහොතේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අපි QR code එක නැවත හඳුන්වා දීලා මම හිතන විධියට අදට දින 5යි. මේ වෙනකොටත් ඒකට මිලියන 5කට වඩා වැඩි ප්‍රමාණයක් register වෙලා තිබෙනවා. ඒත් ප්‍රශ්න තිබෙනවා කියන එක අපි දන්නවා. නමුත්, ඒ ප්‍රශ්න අපි විසඳමින් යන්නේ. අපි ඒවා අතහැරලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ QR code එක පළමුවැනි වතාවට හඳුන්වා දෙනකොට මාසයක්, මාස එකහමාරක් විතර ගියා මේක හරියට වැඩ කරන්න. අපි මේක පටන් අරන් තවම දින 5යි. *[බාධා කිරීමක්]* ඔව්, මාස 3ක් විතර ගියා මේක හරියට ක්‍රියාත්මක වෙන්න. අවුරුදු 3කට පස්සේ තමයි අපි මේක නැවත ගේන්නේ. එතකොට ප්‍රශ්න තිබෙනවා. නමුත්, අපි ඒවා නිවැරදි කරමින් ඒ අනුව ක්‍රියාත්මක වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තෙල් සැපයුම පිළිබඳව වන අර්බුදය හේතුවෙන් බලශක්ති අර්බුදයක් ඇති වෙන්න පුළුවන් නිසා අපේ අත්‍යවශ්‍ය සේවාවන්, අපේ කර්මාන්ත නොකඩවා පවත්වාගෙන යාමට බාධා ඇති වන්න පුළුවන්. අපි 2025 වර්ෂය තුළ ආර්ථික වර්ධනය සියයට 5 දක්වා ඉහළට ගත්තා. ඒ අවශ්‍ය ආර්ථික සාධක අපි හොඳින් කළමනාකරණය කළා. එතකොට ඒක 2026දී අඩාළ වෙනවා දකින්න, පසුබෑමකට යනවා දකින්න අපි කැමැති නැහැ. ජන ජීවිතය සාමාන්‍ය අතට පත්වීගෙන ආවා. ඒක නොකඩවා පවත්වාගෙන යෑමටත්, මේ ලැබුණු ආර්ථික ස්ථාවරත්වය පවත්වාගෙන යෑමටත්, අත්‍යවශ්‍ය සේවාවන් නොකඩවා පවත්වාගෙන යෑමටත් අපි සැලසුම් කරගෙන යනවා. අපි මේ සියල්ල වෙනුවෙන් කැබිනට් අනුකමිටු පත් කරලා, ඒ පිළිබඳව දිනපතා රැස්වෙමින් සාකච්ඡා වෙමින් ක්‍රියාත්මක වෙනවා. එන ප්‍රශ්නවලට අපි උත්තර දෙනවා. එන ප්‍රශ්නවලට අපි solutions හොයමින් යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මොනවා කළත් මේ ආර්ථික තත්ත්වය තුළ යම්කිසි චලනයන් සිද්ධ වෙනවා කියලා අපි දන්නවා. එතකොට ආදායම් මාර්ගවලට අභියෝග එන්න පුළුවන්. විශේෂයෙන්ම අවිධිමත් ක්ෂේත්‍රයේ වැඩ කරන අයට, කුඩා පරිමාණයේ කර්මාන්ත, ව්‍යාපාර කරන අයට ප්‍රශ්න එන්න පුළුවන්. එතකොට එවැනි ප්‍රජාවන් මේකට මුහුණ දෙන්නේ කොහොමද කියන ඒ සුබසාධනය පැත්තෙන්, සමාජ ආරක්ෂණය පැත්තෙන් බලන්නත් අපි වෙනම කමිටුවක් පත් කරලා තිබෙන්නේ. ගරු උපාලි පන්නිලගේ අමාත්‍යවරයාගේ සභාපතිත්වයෙන් අපි ඒ වැඩකටයුතු කරගෙන යනවා. එතකොට රාජ්‍ය සේවාවන් නොකඩවා පවත්වාගෙන යෑම සඳහාත් අපි අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. ඒක ගැන බලන්නත් අපි වෙනම වැඩ කරමින් යන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ජනතාවට පොරොන්දුවක් දුන්නා. 2024දී මේ ආණ්ඩුව පත් වෙනකොට අපි පොරොන්දුවක් දුන්නා, අපි වැඩ කරන්නේ ජනතාව වෙනුවෙන් කියලා.

අපි ජනතාවාදී ආණ්ඩුවක්. අපි මේ සියල්ලම කරන්නේ මේ රටේ ජනතාව වෙනුවෙන්. අපි බලය ලබා ගත්තෙත් ඒ ජනතාව වෙනුවෙන් සේවය කරන්න. බලයට තිබෙන කෑදරකම වෙනුවෙන් නොවෙයි. ඕනෑම ගේමක් ගහලා බලය ලබාගෙන, තමන්ගේ දේවල් ආරක්ෂා කරගෙන, තමන්ගේ හොරකම් ඔක්කෝම වහ ගෙන ඉන්න නොවෙයි, අපි බලයට ආවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දැක්කා මාධ්‍යවල කොතැන හරි කථා වෙනවා, විපක්ෂයට වඩා ඉදිරියෙන් අද ජනතාව ඉන්නවා කියලා. එහෙම ලිපියක් මම කියෙව්වා. ඒක ඇත්තටම හරි. මේ රටේ ජනතාව එක්ක කථා කරනකොට අපට ඇත්ත තත්ත්වය තේරුම් ගන්න පුළුවන්, රටේ ජනතාව කොතැනද ඉන්නේ කියලා. ඔබතුමා ඊයේ ඉෆ්තාර් එක සංවිධානය කළා. අපිත් ආවා, ඒකට. එතැන හිටපු ව්‍යාපාරිකයෝ මොකක්ද අපට කිව්වේ? විපක්ෂය කියන දේවල් ගණන් ගන්න එපා; ඔබ ඔය කරගෙන යන වැඩේ කරගෙන යන්න; ජනතාව ඔබ සමඟයි කියලා එතැන ඉෆ්තාර් එකට ඇවිල්ලා හිටපු ඒ ව්‍යාපාරිකයෝ අපිත් එක්ක කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අවබෝධය සහ අපේ වගවීම තිබෙන්නේ මේ රටේ ජනතාව එක්ක. එතකොට ජනතාවගේ සුබසිද්ධිය, සුබසාධනය, ආරක්ෂාව මේ සියල්ල වෙනුවෙන් තමයි අපි කැප වෙලා ඉන්නේ සහ ඒක ගැන කිසිම සැකයක් මේ රටේ කවුරුත් තියාගත යුතු නැහැ. ඒ වෙනුවෙන් අපි කැප වෙනවා. අපි විපක්ෂයට ආරාධනා කරන්නේ මේ ගැන අපි රටක් හැටියට හිතමු කියායි. පාර්ලිමේන්තුවේ සියලු දෙනා මේ ගැන හිතමු. කෙටිකාලීනව බලයට එන්න දඟලන්න එපා. මේ රට තුළ ඇති වෙලා තිබෙන වෙනස, පරිවර්තනය තේරුම් අරගෙන ජනතාව ඔබෙන් අපේක්ෂා කරන ඒ කාර්ය භාරය හරියට ඉෂ්ට කර ගන්න මේ වෙලාවේ ඔබට අවස්ථාවක් තිබෙනවා. ඔබේ රාජ්‍ය තාන්ත්‍රීය භාවය පෙන්නුම් කරන්න, ඔබේ political maturity එක පෙන්වන්න මෙන්න අවස්ථාව. අන්න ඒ විධියට කටයුතු කරන්න. කෙටි කාලීනව, shortcuts හරහා බලයට එන්න හදනවා නම්, එතැනදී ඔබ ෆේල් වනවා. ඒක මතක තියා ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලය ලබා දීම පිළිබඳව බෙහෙවින්ම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Anuradha Jayaratne. You have six minutes.

[අ.භා. 3.17]

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආරම්භයේම මම එක කාරණයක් සඳහන් කරන්නට ඕනෑ. ඒ තමයි ගරු අගමැතිතුමිය දිගින් දිගටම කිව්වා, විපක්ෂයේ අදහස තිබෙන්නේ මේක මතින් හරි කමක් නැහැ බලයට එන්නයි කියලා. අපි එතැන නම් නැහැ, අගමැතිතුමිය. එහෙම මේ රට අගාධයකට දාලා, විනාශ කරලා, නැවත වතාවක් අර තිබිච්ච මහා ඛේදවාචකයට තල්ලු කරලා බලයක් ලබා ගැනීම පිළිබඳ අපේ බලාපොරොත්තුවකුත් නැහැ; එහෙම හීන මවන්නෙත් නැහැ; එහෙම හිතන්නෙත් නැහැ. ඒක පළමුවෙනියට මේ සභාවේදී කියන්න ඕනෑ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණාවේදී විශේෂයෙන්ම ක්ෂණිකව සහ මධ්‍යකාලීන ඒ වාගේම දිගු කාලීනව,-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

What is your point of Order, Hon. Member?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථික ලැයිස්තුවේ තුන්වෙනි කථිකයා මේ සභා ගර්භයේ ඉන්නවා. එතකොට කථික ලැයිස්තුවේ හතරවෙනි කථිකයා තමයි දැන් කථා කරන්නේ. අපි දන්නා විධියට කථික ලැයිස්තුව විධියට තමයි මුලසුන විසින් කථා කරන්න අවස්ථාව දෙන්න ඕනෑ. එතකොට අපේ කථාව තිබෙන්නේ හයවෙනියට. දැන් අපේ කථාවට බාධා වෙනවා. මොකක්ද, නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැඩේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon Chaminda Wijesiri, that particular Member had made a request to the Assistant Secretary-General that he needed some time.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

කථිකයා ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කථිකයා පාර්ලිමේන්තුව ඇතුළේ නැත්නම්-*[බාධා කිරීමක්]* එහෙම වෙනස් කරන්න පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඒ මන්ත්‍රීතුමා වෙලාවක් ඉල්ලුවා. එතුමා දැන් එන්න ඇති. *[බාධා කිරීමක්]* එතුමාට මොනවා හරි හදිසි කාරණයක් තිබෙන්න ඇති, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

අහගෙන හිටියාට කථා කරන්න බැරි නම් මෙතැන ඉඳගෙන ඉඳලා වැඩක් නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එළියට යන්න ඕනෑ.*[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, Hon. Member, you may continue.

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතකොට මේකට ක්ෂණිකව සහ මධ්‍ය කාලීන ඒ වාගේම දිගු කාලීන වැඩ පිළිවෙළක් තියෙන්න ඕනෑ. ඒකේදී පළමුවෙනි කාරණාව තමයි අපි බලශක්ති භාවිතය පිළිබඳව යම් අවම කිරීමක් සහ එය ආරක්ෂා කරගෙන පාවිච්චි කිරීමේ වැඩ පිළිවෙළකට යා යුතුයි. ඒකේදී එක දෙයක් තමයි ජනාධිපතිතුමා අර bunkeringවලට දීපු අවසරය. වෙන private ආයතනවලට, companiesවලට මෙහේ ගෙනැල්ලා store කරලා tourismවලට හනික දීපු එක ගැන අපි අගය කරනවා. ඒක ක්ෂණිකව ගත්ත තීන්දුවක්. ඒක හරියටම හරි. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනික් පැත්තෙන් තේරුම් ගන්න ඕනෑ, එක පැත්තකින් ගල්අඟුරු පිළිබඳව, ලක් විජය බලාගාරය පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

ලක්විජය බලාගාරයට බාල ගල් අඟුරු ලබා ගැනීම නිසා නැවත වතාවක් ඉන්ධන භාවිත කරලා බලශක්ති සැපයුම කරන්න අපට සිද්ධ වෙනවා. මේ වනකොට ඒක පැහැදිලිවම එළිවෙලා ඉවරයි. මේ වනකොට අපි ඒ පිළිබඳව සාකච්ඡා කරනවා. එහෙම නම්, අපි රජයට යෝජනා කරන්නේ පැයක දෙකක විදුලි කප්පාදුවකට යන්න කියලායි. එසේ යෝජනා කරන්නේ මීට කලින් වෙච්ච ප්‍රශ්නයක් නිසා මිස වෙන මොකවත් නිසා නොවෙයි. ඒක 2022දී වෙච්ච දෙයක්. එදා වතුර තිබෙන ප්‍රමාණය දැකලා, ඉවර වනකල්ම ඒ වතුර ටික කොත්මලේ ඉඳලා යවලා, රටට සම්පූර්ණයෙන් current සැපයුම කරන්න උත්සාහ කරලා, අවසානයේ පැය 8, 10, 12 කරන්ට් කපලා තමයි නතර වුණේ. අද වනකොට ලක්විජය බලාගාරය සම්බන්ධයෙන් ආණ්ඩුව යම් අපහසුතාවකට පත් වෙලා ඉන්නවා නම්, අඛණ්ඩව විදුලි සැපයුමක් දෙන්නත් බැරි නම්, තෙල් ලබා ගැනීම පිළිබඳව, ලෝකයේ තෙල් සැපයුම්කරුවන් පිළිබඳව ගැටලුවකුත් තිබෙනවා නම්, දැන් හරි කමක් නැහැ පැයක, දෙකක විදුලි කප්පාදුවකට යන්න. එසේ කිරීම කාලෝචිතයි කියලා මම මේ සභාවට යෝජනා කරනවා. මොකද, එහෙම නොකර, "අපි කලින් ආණ්ඩුවලට වඩා අඛණ්ඩව විදුලිය දීපු ආණ්ඩුවක්, අඛණ්ඩව ඛනිජ තෙල් දීපු ආණ්ඩුවක්" කියලා පම්පෝරි ගහන්න ගියොත් නැවත වතාවක් 2022ට වඩා බරපතළ තත්ත්වයකට වැටෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එම නිසයි මම ආණ්ඩුවට බොහොම සද්භාවයෙන් ඒ යෝජනාව කළේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තෙල් සැපයුම පිළිබඳව තිබෙන ප්‍රශ්න ටිකත්, ලක්විජය බලාගාරයේ සැපයුමට සම්බන්ධ කරන්න පුළුවන් ප්‍රමාණයත් කියන සියලු කාරණා ටික ගැන බලලා හරි තීන්දුවකට එන්න වෙයි කියන කාරණයත් මම විශේෂයෙන් මේ වෙලාවේදී සඳහන් කරනවා.

[ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා]

ඊයේ දිනයේදී tea auction එක තිබුණා. ඊයේ දිනයේ තිබුණු tea auction එකේදී ගැටලුවක් ඇති වුණේ නැහැ. මා හිතන්නේ තිබුණු ඉල්ලුමත් එක්ක අපට වැඩි මිලකුත් ලැබුණා. හැබැයි, මේක මේ විධියටම පවතියි කියලා අනුමාන කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉරානය කියන්නේ අපි ප්‍රධාන වශයෙන්ම තේ අපනයනය කරන රටක්. ඒ වාගේම අනෙකුත් අරාබි රටවලටත් අපි වැඩියෙන් තේ අපනයනය කරනවා. මේ තේ අපනයනය යම් විධියකට බලපෑමකට ලක් වුණොත් ඒක කෙලින්ම බලපාන්නේ ගම්වල ප්‍රාථමික වශයෙන් තේ වගා කරගෙන ඉන්න කණ්ඩායමටයි. එම නිසා රජය හැටියට මේ කාරණා පිළිබඳව යම් අවධානයක් යොමු කරන්න ඕනෑ කියන කාරණාව බොහොම ඕනෑකමින් මේ වෙලාවේදී සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අවධානය යොමු කළ යුතු කාරණයක් තමයි, විදේශ ප්‍රේෂණ. අද විදේශ ප්‍රේෂණ සපයන අපේ විදේශගත ශ්‍රමිකයන් මිලියනයකට වැඩි ප්‍රමාණයක් සේවය කරන්නේ මැද පෙරදිග කලාපයේ. හැබැයි, යම් හෙයකින් මේ යුද්ධමය තත්ත්වය මීට වඩා බරපතළ තැනකට තල්ලු වුණොත්, විදේශ ප්‍රේෂණ පිළිබඳවත් අපට ගැටලුවක්, ප්‍රශ්නයක් මතු වෙන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණාව කියන්නේ එක පැත්තකින් සංචාරක ක්ෂේත්‍රය ගැනත් හිතලා. 2025 වසර ගත්තාම, සංචාරක ක්ෂේත්‍රයේ විතරක් remittances තිබිලා තියෙනවා, ඩොලර් බිලියන 3.2ක් - US Dollars 3.2 billion. හැබැයි, අද වනකොට එය එක මට්ටමකින් බැහැගෙන බැහැගෙන එනවා. ඔබතුමන්ලා, අපි දැක්කා, ඩුබායි සංචාරය කරන්න හිටපු කණ්ඩායම් ටිකත් Spain වැනි රටවල් ටිකක් තෝරාගෙන තිබෙන බව. එතකොට ඩුබායි, කටාර්වලට ආපු කණ්ඩායම් තමයි එහෙමම transit එකෙන් වැඩි හරියක් - බහුතරයක් - ලංකාවට පැමිණෙන්නේ. හැබැයි, ඒ රටවල සංචාරය කර ගන්නත් බැරි නම්, ඒ වාගේම airport එක හරියට function වෙන්නෙත් නැත්නම් පැහැදිලිවම අපේ ලංකාවේ සංචාරක කර්මාන්තය පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් පැන නඟිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණා පිළිබඳ අවධානය යොමු කරන්න ඕනෑ කියන කාරණාව විතරක් නොවෙයි කියන්නේ. අනෙක් පැත්තෙන් මේ තුළ ක්ෂණික සැපයුම් සම්බන්ධයෙන් යම්කිසි විධියක විවිධාංගීකරණයකට යා යුතුයි කියලා අපි ආණ්ඩුවට යෝජනා කරනවා. ඒ කියන්නේ ගල්ෆ් කලාපීය රටවලින් විතරක් අපි තෙල් ලබා ගන්නවා කියලා කියන්න බැහැ. අනෙකුත් රටවලටත් ගිහිල්ලා තෙල් මිල දී ගැනීම පිළිබඳව අපට හොයන්න වෙනවා, අපේ ඉන්ධන සැපයුම අඛණ්ඩව පවත්වාගෙන යන්න නම්. ඒ වාගේම තමයි ඩොලර් බිලියන 6.8ක් පමණ වන -දැන් වන විට බිලියන 7කට වාගේ ආසන්න වුණු- සංචිත, බෙහෙත් වේවා, ආහාර වේවා; අත්‍යවශ්‍ය දේවල් සඳහා වියදම් කරනවා මිස අද අපට වෙනත් කිසිම දෙයකට වියදම් කරන්න පුළුවන් කියලා අපි විශ්වාස කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණාව තමයි ආහාර සුරක්ෂිතභාවය. ඒක, අංක එක. ඒ වාගේම තමයි යූරියා ගෙන ඒම, අවශ්‍ය fertilizer ටික ගෙන ඒම කියන සියලු කාරණාවල ප්‍රශ්නයක් ඇති වුණොත් ඒක බලපාන්නේ ඊළඟ කන්නයට. එහෙම නම්, ආණ්ඩුව ආහාර සුරක්ෂිතතාව පිළිබඳව මීට වඩා සැලසුමක් ඉදිරිපත් කරලා ඒ වෙනුවෙන් කටයුතු කළ යුතුයි කියන එක විශේෂයෙන් මේ ගරු සභාවට සිහිපත් කරනවා.

ඒ වාගේම බදාදා දිනය නිවාඩු දිනයක් කළා. ඒක හොඳයි. හැබැයි, දීර්ඝ කාලීනව work from home concept එක ඩිජිටල්කරණයත් එක්ක යා යුතු වෙනවා, මේක ඉදිරියට පවත්වාගෙන යනවා නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, අද මේ තිබෙන තත්ත්වයත් එක්ක දවසින් දවස තෙල් සැපයුමත් කෙරෙන්නේ නැත්නම්, එය අර්බුදකාරී, ප්‍රශ්නකාරී තැනකට යනවා නම්, තිබෙන සංචිත ප්‍රමාණය අත්‍යවශ්‍ය කාරණාවලටම පමණක් යොදා ගත්තේ නැත්නම් ඒක ගැටලුවක්, අර්බුදයක් බවට පත් වෙනවා. අද අපට එක පැත්තකින් අර්බුද එනකොට අනෙක් පැත්තෙන් සුබවාදී කාරණාත් තිබෙනවා. ඒ තමයි පුනර්ජනනීය බලශක්තිය මීට වඩා හොඳ තැනකට ගේන්න අපට පුළුවන් වීම. අද ඉන්දියන් සාගරයේ පිහිටි අපේ port එක මීට වඩා හොඳ තත්ත්වයකට ගෙනෙන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණා පිළිබඳව අවධානයෙන් බලන්න කියන ගමන් මම කියනවා, හේලිස් එකේ ඉන්න අධ්‍යක්ෂවරුන් SriLankan Airlines ගුවන් සේවයේ සභාපතිවරුන් කරලා, British Airways ආදිය මෙහේට ගෙනැල්ලා අපේ ගුවන් සේවය නැති කරලා, මරලා විනාශ කරන්නේ නැතිව හරි විධියට කටයුතු කළ යුතුයි කියලා. මේ වෙලාවේ කලාපීය රටවල ඒවාට fly කරන්න බැරි නම් SriLankan Airlines එකට ලොකු අවස්ථාවක් එනවා. එම නිසා තවත් පෞද්ගලික සමාගම් ඒ හරහා පෝෂණය කරනවා වෙනුවට SriLankan Airlines එක ගැන අවංකවම හිතලා කටයුතු කරන්න ඕනෑ. මේ වෙලාවේ අපට වඩාත් ලොකු opportunity එකක් SriLankan Airlines එකෙන් ගන්න පුළුවන්. ඒ පිළිබඳව රජයේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Anura Karunathilaka. You have 14 minutes.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Member, what is your point of Order?

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව කපිල චන්ද්‍රසේන මහතාට තර්ජනය කරලා, බලපෑම් කරලා, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ

මහතාගේත්, නාමල් රාජපක්ෂ මහතාගේත් නම් කියන්න කියලා බලපෑම් කළ බව සඳහන් දිවුරුම් ප්‍රකාශය අද දින මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර තිබෙනවා. මම මේ වෙලාවේ එහි පිටපතක් **සභාගත*** කරනවා.

මොකද, මරණීය තර්ජනය කරලා බලපෑම් කරපු නිසා තමයි මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේත්, නාමල් රාජපක්ෂ මැතිතුමාගේත් නම් සඳහන් කරලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Anura Karunathilaka, your time starts now.

[අ.භා. 3.25]

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තැබීමේ විවාදයේ ප්‍රස්තුත කාරණයට එන්න කලින් මම එක් කරුණක් පැහැදිලි කරලා ඉන්නම්. මෙතැනදී කථා කරපු සමහර මන්ත්‍රීවරු කිව්වා, කලාපයේ අනෙකුත් රටවල් බලශක්ති කළමනාකරණය හොඳින් කර ඇති බව. ඉන්දියාව quote කරලාම කිව්වා, ඉන්දියාව බලශක්ති කළමනාකරණය ඉතාම හොඳින් කර තිබෙනවා කියලා. මම දැන් ඉදිරිපත් කරන්න යන මේ තොරතුර ලබා ගත්තේ "The Times of India" කියන online පුවත් පතෙන්. එහි සෑම පැයකට සැරයක්ම ඉන්දියාවේ fuel crisis එකේ live update එකක් යනවා. මේකෙන් පෙන්වන්නේ මොකක්ද? අවසානයට ආපු එකේ සඳහන් වන්නේ, "14 held as violence erupts between customers, LPG agency staff in Uttar Pradesh;1000 cylinders seized in 200 raids in Chhattisgarh" කියලායි. ඔය ඉහතින් කියපු අවට තිබෙන රටවල fuel crisis එක කොච්චර දුරට පැතිරී ගිහින් තිබෙනවාද කියනවා නම්, ඒගොල්ලෝ හැම පැයකටම වරක් update එකක් දෙනවා, crisis එකේ ස්වභාවය සම්බන්ධයෙන්. හැබැයි, ලංකාව තවම ඒ තත්ත්වයට ඇවිල්ලා නැහැ. ඒ නිසා සමහර දේවල් ගැන කථා කරන කොට, ඒ ගැන හොඳින් දැනගෙන කථා කරන්න කියා මා සඳහන් කරන්න කැමැතියි.

අද මේ ඉදිරිපත් කර තිබෙන සභාව කල් තැබීමේ යෝජනාවේ පළමු වාක්‍යයම සාවද්‍යයි කියලා තමයි මට හිතෙන්නේ. ඇයි, මම එහෙම කියන්නේ? මෙහි කියනවා, "රට තුළ උද්ගතව ඇති අර්බුදකාරී වාතාවරණය තුළ රටේ ජන ජීවිතය සෑම අංශයකින්ම අභියෝගයට ලක්ව ඇත" කියලා. එහෙම නම්, තිබෙන තත්ත්වය අතිශයෝක්තියට ලක් කරලා තමයි මේ කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටක් අර්බුදයකට පත්වීම ආකාර කිහිපයකින් සිද්ධ වෙන්න පුළුවන්. එකක් තමයි, රටේ ආදායම වියදමට වඩා වැඩි වීම. අපේ රටේ ණයවල ප්‍රාග්ධන ගෙවීම හැරුණාම ප්‍රාථමික ගිණුමේ ශේෂය 2022දී - අපේ රටේ crisis එකක් තිබූ කාලයේ - GDP එකට සාපේක්ෂව සෘණ 3ත්, 4ත් අතර තමයි තිබුණේ. එය, 2024දී GDP එකට සාපේක්ෂව 1.78යි; 2025දී එය 5.3යි. ඇත්තටම ප්‍රාථමික ගිණුමේ ශේෂයේ වර්ධනයක් පෙන්වනවා මිස එහි අර්බුදයක් පෙන්වා නැහැ. ප්‍රාථමික ගිණුමේ ශේෂයේ ට්‍රිලියන 1.78ක අතිරික්තයක් - surplus එකක් - තිබෙනවා. එහෙම නම්, රටේ ආදායම සහ මූලික වියදම අතර ප්‍රාථමික ගිණුමේ අර්බුදයක් පැන නැඟිලා නැහැ.

ඒ වාගේම, විදේශ විනිමය ගෙන බලමු. එහි ප්‍රධාන විභවයන් තිබෙනවා. සංචාරක ව්‍යාපාරය ගත්තොත්, 2025 අවුරුද්දේ ඩොලර් බිලියන 3.2ක් ලැබී තිබෙනවා. ඒක, පෙර අවුරුද්දට සාපේක්ෂව සියයට 1.6ක වර්ධනයක්. 2025 අවුරුද්දේ විදේශ ප්‍රේෂණ ඩොලර් බිලියන 8.076ක් ලැබී තිබෙනවා. ඒක පෙර අවුරුද්දට සාපේක්ෂව සියයට 22.8ක වර්ධනයක්. ඒ වාගේම අපනයන අදායම ගත්තොත්, පසුගිය අවුරුද්දේ -2025 වර්ෂයේ- ඩොලර් බිලියන 17.2ක් වනවා. එය, පෙර අවුරුද්දට සාපේක්ෂව සියයට 5.6ක වර්ධනයක්. එහෙම නම් මේක, විදේශ විනිමය පිළිබඳ අර්බුදයක් නිසා පැන නැඟිච්ච ප්‍රශ්නයකුත් නොවෙයි. ඊළඟට Foreign Reserves ගත්තොත්, Official Foreign Reserves ඩොලර් බිලියන 7.284ක් වනවා. එය, 2022 crisis එක ඇති වෙච්ච වෙලාවේ එය තිබුණේ 1.9ක් හැටියටයි. එහෙම නම්, මේක විදේශ විනිමය නිසා ඇති වෙච්ච අර්බුදයකුත් නොවෙයි.

ඊළඟට, මුදල් මුද්‍රණය, එහෙම නැත්නම් උද්ධමනය වාගේ දේවල් නිසාත් රටක අර්බුදයක් පැන නඟින්න පුළුවන්. 2022දී සියයට 49.72ක උද්ධමනයක් තිබුණා. එය 2023දී සියයට 16.54යි; 2025දී සියයට 2.1යි. අපි ඇත්තටම බලාපොරොත්තු වුණා, සියයට 5ක විතර උද්ධමනයක් එයි කියලා. හැබැයි, දැන් මේ තිබෙන තත්ත්වය තුළ තිබෙන්නේත් සියයට 5යි. එහෙම නම්, මුදල් මුද්‍රණය නිසා හෝ උද්ධමනය නිසා හෝ ඇති වෙච්ච ව්‍යාකූලත්වයක් පිළිබඳව නොවෙයි අද දවසේ අප මේ සාකච්ඡා කරන්නේ. බලශක්ති ක්ෂේත්‍රයේ ඉන්ධන හැරුණාම වෙනත් ක්ෂේත්‍රවල අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල හිඟයක් ඇති වෙලා නැහැ. සමහර භාණ්ඩවල මිල වැඩි වීමක් යම්කිසි විධියකට සිදු වුණත්, භාණ්ඩ හිඟයක් ඇති වෙලා මිනිසුන් විශාල වශයෙන් පෝලිම්වල ඉන්නවා පේන්නේ නැහැ.

එහෙනම් ඒ ද්‍රව්‍යමය හිඟයක් ඇති වෙලා නොවෙයි, මේ අපි කථා කරන අර්බුදය පැන නැඟිලා තිබෙන්නේ. අනෙක් පැත්තෙන්, කාලෙන් කාලයට රජයන් විසින් ගන්නා වැරදි ආර්ථික ප්‍රතිපත්ති නිසා සමහර ආර්ථික අර්බුද පැන නඟින්න පුළුවන්. උදාහරණ හැටියට, රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර සංකල්පය ඉතා ඉක්මනින් - එක රැයකින් - ක්‍රියාත්මක කිරීම, 2022දී VAT සීමාව හා PAYE Tax එක විශාල ලෙස අඩු කිරීම නිසා රාජ්‍ය ආදායම විශාල ලෙස අඩුවීම ගන්න පුළුවන්. මේ වාගේ වැරදි ආර්ථික ප්‍රතිපත්ති එක්ක සමහර රටවල් අර්බුදයට ලක් වන බව පෙනෙනවා, ලංකාව වාගේ රටවල් උදාහරණයට ගත්තාම. හැබැයි, අපි අද පාර්ලිමේන්තුව තුළ කථා කරන මේ ආර්ථික අර්බුදය, රජය විසින් ගත්ත ඒ වාගේ වැරදි ආර්ථික ප්‍රතිපත්තිමය තීරණයක් නිසා ඇති වුණු තත්ත්වයක් නොවෙයි.

ඒ වාගේම, ආදායම් උත්පාදනය නොකරන වත්කම් විශාල ලෙස ජනනය කිරීම නිසා අර්බුදයට ලක් වන අවස්ථා තිබෙනවා. විශාල ණය අරගෙන මහාමාර්ග, වරාය, යටිතල පහසුකම් හදනවා. හැබැයි, ඒවාට සාපේක්ෂ ලෙස ආදායම් උත්පාදනය නොවනවා නම්, අපි විශාල ලෙස ණය උගුලක හිර වෙලා රට අර්බුදයට යන අවස්ථා තිබෙනවා. නමුත්, මෑත කාලයේ එවැනි දෙයක් සිදු වූ නිසා නොවෙයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ.

ඒ වාගේම තමයි දේශපාලන අස්ථාවරත්වය. පාලනයේ තිබෙන දුර්වලතා නිසා රටක් අර්බුදයට ලක් වෙන්න පුළුවන්. නමුත්, අපි කථා කරන මේ අර්බුදයත් එහෙම අර්බුදයක්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අනුර කරුණාතිලක මහතා]

නොවෙයි. ශක්තිමත් ආර්ථිකයක් තිබෙනවා වාගේම, indicators හැම එකකින්ම පෙනෙන්නේ ආර්ථිකය එන්න එන්න ශක්තිමත් වනවා මිසක් තව තවත් දුර්වල වනවා කියන එක නොවෙයි. ආයෝජන ආකර්ෂණ ඇති වීම, "දිට්වා" සුළි කුණාටුවෙන් පස්සේ ඇති වූ තත්ත්වයට රටක් හැටියට අපි මුහුණ දුන් ස්වභාවය ආදි කරුණුවලින් අපට පෙනෙන්නේ නොසැලෙන ආර්ථිකයේ තත්ත්වයයි. ඒ අවස්ථාවල ජනතාවට සහන ලබා දීම සඳහා ගත් පරිපාලන තීන්දු වාගේ කාරණා දිහා බැලුවාම, දේශපාලන ස්ථාවරය සහ පාලනය තුළ තිබෙන ශක්තිමත්භාවය ඉතා පැහැදිලිව පෙනෙනවා. එහෙනම් අද කථා කරන මේ අර්බුදය පැන නඟින්නේ කොහොමද? ඇත්තටම ඒක පැන නඟින්නේ බාහිර බලපෑම් නිසා.

අපට මතකයි, කොවිඩ් වසංගතය ඇති වුණු කාලයේ ලෝකය පුරාම රටවල්වල ආර්ථිකයත්, ඒ මතම ගොඩ නැඟුණු සමාජ ආර්ථික කරුණුත් මත ඒ ඒ රටවල් කිසියම් අර්බුදයකට ලක් වෙච්ච අවස්ථා තිබුණු බව. ලංකාව හැටියට අපිත් ඒ තත්ත්වයට මුහුණ දුන්නා. ඒ වාගේම රටකට පාලනය කරන්න බැරි බාහිර යුදමය තත්ත්ව නිසා ආර්ථිකයට යම් බලපෑමක්, ව්‍යාකූලත්වයක් ඇති වෙන්න පුළුවන්. අද අපි මේ කථා කරන අර්බුදය ඒ විධියට අපට පාලනය කරන්න බැරි, මැදපෙරදිග යුද්ධය නිසා සැපයුම් දාම, විශේෂයෙන් ඉන්ධන ඇතුළු බලශක්ති ක්ෂේත්‍රයේ සැපයුම් දාමය අවහිර වීම නිසා ඇති වෙලා තිබෙන අර්බුදයක් නිසායි. ඒ මත තමයි අද මේ කථා කරන තත්ත්වය පැන නැඟිලා තිබෙන්නේ. ඒ නිසා මේක අපට පාලනය කරන්න පුළුවන් තත්ත්වයක් නොවෙයි. ඒ වාගේම, මේ ගැටුමට - යුද්ධයට - මැදිහත් වෙච්ච පාර්ශ්වවලටත් පාලනය කරන්න බැරි මට්ටමට, ඒ අයත් අපේක්ෂා නොකළ මට්ටමට දික් ගැස්සුණු යුද්ධයක් බවට මේක පරිවර්තනය වෙලා තිබෙනවා. ඇත්තටම ඇති වන මේ තත්ත්වය මඟින් රටට ඇති කරන පීඩනය, රටේ ආර්ථිකයට ඇති කරන පීඩනය, ඒ හරහා සමාජයට ඇති වන පීඩනය, මහජනයාට ඇති වන පීඩනය අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම තමයි අපි වාගේ රටකට කරන්න පුළුවන්කම තිබෙන්නේ. ඒ නිසා මේ තිබෙන තත්ත්වය තුළ වගකිව යුතු රජයක් හැටියට අපි එක පැත්තකින් කල්පනා කරන්නේ අත්‍යවශ්‍ය මහජන සේවා පවත්වාගෙන යෑම සඳහා කටයුතු කරන්නේ කොහොමද කියලායි. සෞඛ්‍යය,පොදු මඟී ප්‍රවාහනය, අධ්‍යාපනය වාගේ දේවල්වලට දැඩි ලෙස බලපෑමක් සිද්ධ වෙන්නේ නැතිව, - සියයට සියයක බලපෑමක් ඇති නොවන විධියට කටයුතු කරන්න අමාරුයි - හැබැයි, දැඩි බලපෑමක් ඇති නොවන විධියට අත්‍යවශ්‍ය මහජන සේවා පවත්වාගෙන යෑම සඳහා කටයුතු කරන්නේ කොහොමද කියන කාරණයට අවධානය යොමු කරලා තමයි වගකිව යුතු රජයක් හැටියට අපි කටයුතු කරන්නේ.

අනෙක් පැත්තෙන්, සමහර රටවල් උපක්‍රමිකව - අපි දන්නවා, අපේ රටේත් ඉතිහාසයේ ඒ වාගේ තිබුණා - කල්පනා කරනවා, ආර්ථිකය හකුළලා, ආර්ථික ක්‍රියාකාරකම් අඩු කරලා, එතැනින් මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න. නමුත්, අපි වාගේ රටකට ඒ ආර්ථික ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යමින්ම තමයි මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න පුළුවන්කම තිබෙන්නේ.

ඒ නිසා ඒ ආර්ථික ක්‍රියාකාරිත්වය පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය වන බලශක්ති සැපයුම සන්තතිකව ලබාදීම සඳහා අත්‍යවශ්‍ය නොවන යම් යම් ක්‍රියාකාරකම්වලට කිසියම් සීමා පනවමින්, නමුත් අත්‍යවශ්‍ය ආර්ථික ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය වන බලශක්ති සැපයුම සන්තතිකව පවත්වා ගනිමින් තමයි ඇත්තටම අපට මේ අර්බුදයට මුහුණ දෙන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා කෘෂිකර්මය, කර්මාන්ත, වරාය හා ගුවන් තොටුපොළ ඇතුළු ආර්ථික ක්‍රියාකාරිත්වය පවතින ක්ෂේත්‍රවලට අවශ්‍ය වන බලශක්තිය, ඉන්ධන ඇතුළු අනෙක් බලශක්තිය සැපයීම සහතික කරලා -හැබැයි අත්‍යවශ්‍ය නොවන සමහර ක්‍රියාකාරකම්, සමහර වෙලාවට ඒවා මහජන ක්‍රියාකාරකම් වෙන්න පුළුවන්- යම් විධියකට සීමා කිරීම තමයි QR system වාගේ quota එකක් හඳුන්වාදීමෙන් අපි බලාපොරොත්තු වෙන්නේ. මේ වෙලාවේ පවතින තත්ත්වයත් එක්ක, ලෝකයේ පවතින අර්බුදයත් එක්ක, ලෝකයේ හැම රටකටම බලපාන අර්බුදයත් එක්ක මේ වෙලාවේ නැගම් යන එකට, විනෝද ගමන් යන එකට යම් යම් සීමා පනවන්න පුළුවන්. මහජනතාවත් එක්ක වන කිසියම් සමාජ ගිවිසුමකින් තමයි අපට ඒක කරන්න පුළුවන්කම තිබෙන්නේ. ඉන්ධන සඳහා තිබෙන QR system එක ඒ සඳහා කිසියම් පෙළඹවීමක් ඇති කරන්න සමත් වෙනවා.

මෙන්න මේ ආර්ථික ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යෑමටත්, අත්‍යවශ්‍ය මහජන සේවා පවත්වාගෙන යෑමටත් රජය විසින් අරගෙන තිබෙන පියවර මොනවාද කියලා අපි බලමු. අපේ අගමැතිතුමියත් පැහැදිලි කළා අපි ඒ සඳහා ප්‍රධාන කමිටු 4ක් පත් කර තිබෙන බව. විශේෂයෙන් අවශ්‍ය වන බලශක්ති සම්පාදනය නිරන්තරව පවත්වාගෙන යෑම සඳහා බලශක්ති කමිටුවක් හදලා තිබෙනවා. ඉන්ධන, ගෑස් සහ ගල් අඟුරු සැපයුම ස්ථාවරව පවත්වා ගැනීමට සහ ඒවා ක්ෂණිකව මිලදී ගැනීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු කිරීම, සැපයුම් මූලාශ්‍ර සහ නව සැපයුම්කරුවන් හඳුනා ගැනීම ආදී කරුණු සඳහා අපේ විජිත හේරත් ඇමතිතුමාගේ මූලිකත්වයෙන් කමිටුවක් හදලා, ඒ හරහා ඒ පිළිබඳව නිරන්තර අවධානය යොමු කරලා, දවසක් දෙකක් තුනක් කාලය තුළ නිතර මුණ ගැහිලා ඒ පිළිබඳව සාකච්ඡා කරලා අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය සේවය ක්‍රමානුකූලව පවත්වා ගෙන යෑම සඳහා, විශේෂයෙන් රාජ්‍ය සේවය අඛණ්ඩව, කාර්යක්ෂමව සහ ක්‍රමානුකූලව පවත්වා ගනිමින් ආර්ථික කටයුතු පවත්වා ගැනීමට මෙන්ම මහජනතාව සඳහා අවශ්‍ය සේවා නොමසුරුව පවත්වාගෙන යෑමට අවශ්‍ය කඩිනම් තීන්දු ගැනීම සඳහා ගරු අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් හදලා අපි ඒ සඳහා පියවර අරගනිමින් ඉන්නවා.

අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදා හැරීම අධීක්ෂණ සඳහා වන කමිටුවක් ද තිබෙනවා. අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදා හැරීමේදී රාජ්‍ය හා පෞද්ගලික සැපයුම් දාම, ආර්ථික ක්‍රියාකාරිත්වය නිරන්තරයෙන් පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය පියවර ගැනීම සඳහා ගරු බිමල් රත්නායක ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් හදලා තිබෙනවා.

ඒ වාගේම මේ අර්බුදය හේතුවෙන් පීඩාවට පත් වන විවිධ සමාජ ස්ථර සඳහා සුබසාධන සැලසීම සඳහාත් කමිටුවක් ගරු උපාලි පන්නිලගේ ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් හදලා, ඒ අනුව කටයුතු කරමින් සිටිනවා. ඒ අනුව මේ අර්බුදයට මුහුණ දීම සඳහා ක්‍රමානුකූල සැලැස්මක්, ඒ සැලැස්ම මත ගොඩ නැඟුණු ක්‍රියාදාමයක් එක්ක තමයි රජයක් හැටියට අපි කටයුතු කරමින් ඉන්නේ.

මේ පීඩාව මහ ජනතාවට එකවර මුදා හරින්නේ නැතිව සීරුවෙන් මුදා හරින්නත්, අවශ්‍ය මොහොතක ඉලක්කගත කණ්ඩායම් සඳහා සහන ලබාදීම සඳහාත් අපි කටයුතු කරනවා. ඔබතුමන්ලාට මතක ඇති ජනාධිපතිවරයා එක වෙලාවක සඳහන් කළා අවශ්‍ය මොහොතක ඉන්ධන මත පනවා තිබෙන බදු අඩු කිරීමට කටයුතු කරන්නත් අපි සූදානම් කියන එක. ඒ අනුව අපට නිශ්චිත සැලැස්මක්, ඒ සැලැස්ම මත ගොඩ නැඟුණු ක්‍රියාකාරි සැලැස්මක් තිබෙනවා. ඒ සැලැස්ම මත ඉඳගෙන තමයි ඇත්තටම අපට කටයුතු කරන්න වෙන්නේ.

අපි දන්නවා, අර්බුදයක් පැන නැඟුණු අවස්ථාවක සමහර විට ඒ සමඟම අපට වෙනත් අවස්ථා පැන නැඟෙන වෙලාවලුත් තිබෙන බව. උදාහරණයක් හැටියට ගත්තොත්, අපි දන්නවා ආරක්ෂිත හා විශ්වාසදායක සංචාරක ගමනාන්ත විධියට

හඳුනාගෙන තිබෙන නගර මේ මොහොතේ මරණීය නගර බවට පත් වෙලා තිබෙනවා කියන එක. හැබැයි ලංකාව ස්ථාවර, ආරක්ෂිත, ඒ වාගේම විශ්වාසදායී විකල්ප සංචාරක ගමනාන්තයක් බවට ප්‍රවර්ධනය කිරීම සඳහා අපට මේ අවස්ථාව උපයෝගී කර ගන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි, මේ යුද කලාපයේ තිබෙන ඇතැම් ගුවන් තොටුපොළවල් ආසියාව හා යුරෝපය සම්බන්ධ කරන අතරමැදි ගුවන් මධ්‍යස්ථාන ලෙස ක්‍රියා කරනවා.

ලංකාවේ උපාය මාර්ගික පිහිටීම භාවිත කරලා ගුවන් සම්බන්ධතා සඳහා අතරමැදි මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කරන්න අපට පුළුවන්. ඒ වාගේම වරාය ක්ෂේත්‍රය ගත්තොත්, ලංකාවේ පිහිටීම අනුව ගෝලීය සැපයුම් දාමයේ ඉතා කඩිසර නාවික ගමනාගමනයට ආසන්නව තමයි පිහිටලා තිබෙන්නේ. ඒ තත්ත්වයත් උපයෝගී කරගෙන, ලංකාවේ වරායන් transit hubs බවට පරිවර්තනය කරන්න අපට පුළුවන්. විශේෂයෙන්ම අපනයන හා ප්‍රතිඅපනයන එකතු කරන්න පහසුකම් සලසන මධ්‍යස්ථාන බවට පරිවර්තනය කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. එක පැත්තකින්, රටක් හැටියට මේ අර්බුදයට මුහුණ දෙන්නේ කොහොමද කියලා මේ පාර්ලිමේන්තුව තුළත්, මහජනතාවටත් අදහසක් ඉදිරිපත් කරන්න මේ වාගේ විවාදයක් තුළින් අපට අවස්ථාවක් හදනවා. ඒ වාගේම අපේ විපක්ෂය කොයි තරම් ළදරු විධියටද මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නේ සහ මේ සම්බන්ධයෙන් කථා කරන්නේ කියන එක පිළිබඳවත්, පාර්ලිමේන්තුව තුළත් පිටතදීත් කොයි තරම් දුරට සාවද්‍ය ප්‍රකාශ කරනවාද කියන එක පිළිබඳවත් අදහසක් ඉදිරිපත් කරන්න මේ තුළින් අවස්ථාවක් හැදෙනවා. අර කථාවක් තිබෙනවා නේ, "True colours will always come out" කියලා. මේ විවාදයට සහභාගී වෙන විපක්ෂයේ සමහර කථික මහත්වරුන්ගෙන් අන්න ඒ විපක්ෂයේ සැබෑ ස්වරූපය තමයි අපට පෙනෙන්නේ. නමුත්, මේ මොන සාවද්‍ය ප්‍රකාශ කළත්, මොන අවලාද නැඟුවත්, මේක රජයක් හැටියට අමාරු කාලයක්. අපට පාලනය කළ නොහැකි කරුණු තමයි බොහෝ තිබෙන්නේ කියන එක අපි දන්නවා. නමුත්, සැලසුම් සහගත විධිමත් සැලැස්මක් සහ ඒ සැලැස්ම මත තිබෙන ක්‍රියාකාරී පියවර අනුගමනය කරමින් අපි රටක් හැටියට මේ අර්බුදයට, මේ තත්ත්වයට මුහුණ දෙනවා කියන එක සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) Elayathamby Srinath. You have eight minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Chanaka Madugoda to the Chair?

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

Sir, I propose that the Hon. Chanaka Madugoda do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[පි.ප. 3.42]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வணக்கம்! தற்போதைய உலக நிலைமை தொடர்பான இன்றைய ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் எனக்கும் உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி!

இன்று எமது நாடு மிகவும் நெருக்கடியான சூழ்நிலையில் இருக்கின்றது என்பதை நாம் ஏற்றுக்கொண்டுதான் ஆகவேண்டும். பொருளாதார நெருக்கடியில் சிக்கிய நாட்டைப் படிப்படியாக மீட்டெடுப்பதற்கான நடவடிக்கைகள் இடம்பெற்று வருகின்ற வேளையில், கடந்த வருடம் ஏற்பட்ட 'தித்வா' புயலாலும், அதற்குப் பின்னர் மத்திய கிழக்கில் ஏற்பட்டுள்ள யுத்தத்தாலும் நாட்டில் எரிபொருள் பிரச்சினை உட்பட பல பிரச்சினைகள் ஏற்பட்டிருக்கின்றன. இவற்றை நிவர்த்தி செய்வதற்காக அரசாங்கம் எடுக்கின்ற முயற்சிகளுக்கு எமது ஆதரவை வழங்குவதற்கு நாம் தயாராக இருக்கின்றோம்.

பல இடங்களில் பல்வேறு திட்டங்கள் முன்வைக்கப்பட்டு இருந்தாலும், நடைமுறைகளில் பாரிய பிரச்சினைகள் இருக்கின்றன என்பதை ஏற்றுக்கொண்டுதான் ஆகவேண்டும். பிரதானமாக விவசாயத்தையும் கடற்றொழிலையும் நம்பியிருக்கின்ற மட்டக்களப்பு மாவட்டத்தில் தொழிற்றுறைகள் நெருக்கடிகளைச் சந்தித்துக்கொண்டு இருக்கின்றன. தற்போது அங்கு உழவு நடவடிக்கைகள் ஆரம்பிக்கப்பட்டு இருக்கின்றன. பாரியளவு நெற்செய்கையில் ஈடுபடுகின்ற அந்த மாவட்ட விவசாயிகளுக்கு தொடர்ச்சியாக எரிபொருளை விநியோகிப்பதற்கான ஏற்பாடுகளைச் சிறப்பாகச் செய்வதற்கான ஒரு நடைமுறை பின்பற்றப்பட வேண்டும். தற்போது QR குறியீட்டு முறைமை நடைமுறைப்படுத்தப்பட்டு, அது தொடர்பான செயற்பாடுகள் முன்னெடுக்கப்பட்டு வருகின்றபொழுதும், எரிபொருள் இல்லாமல் போய்விடுமோ என்ற அச்சம் காரணமாக பல இடங்களில் மக்கள் அதனைப் பெற்றுக்கொள்வதில் பாரிய நெருக்கடிகளைச் சந்தித்து வருகின்றார்கள். அத்தோடு, பல இடங்களில் தேவைக்கு அதிகமாக எரிபொருளைச் சேமித்து வைக்கின்ற நிலையும் இருக்கின்றது. இவற்றைச் சிறந்த முறையில் நிருவகிப்பதன் மூலம்தான் எதிர்காலத்தில் இந்த நாட்டில் நெல் உற்பத்தியில் பாரிய பங்குவகிக்கின்ற மட்டக்களப்பு மாவட்டத்தில் மட்டுமல்லாது, எல்லாப் பிரதேசங்களிலும் உற்பத்தியைப் பெருக்க முடியும்.

நெல் மற்றும் ஏனைய விவசாய உற்பத்திகளைக் கிரமமாகப் பெற்றுக்கொள்வதற்கு உரம் மிக முக்கியமானது. உரம் பாரியளவில் பதுக்கப்படுவதாக அறிய முடிகின்றது. அரசாங்கம் கூறுகின்றது, போதியளவு உரம் கையிருப்பில் இருப்பதாக. ஆனால், பல இடங்களில் தட்டுப்பாடான நிலைமை செயற்கையாக உருவாக்கப்பட்டு இருக்கின்றது. இவற்றைச் சீர்செய்வதற்கும், சிறந்த முறையில் முன்னெடுப்பதற்கும் ஒரு திட்டம் வகுக்கப்பட வேண்டும்.

[ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා]

மட்டக்களப்பு மாவட்டத்தில் இயந்திரப் படகுகளை இயக்குவதற்குச் சீரான முறையில் எரிபொருளை வழங்குவதற்குரிய ஏற்பாடுகளைச் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். இந்த நாட்டில் பிரச்சினைகள் ஏற்படுகின்ற ஒவ்வொரு முறையும் அவற்றை எதிர்கொள்வதற்கான நடைமுறைகள் பின்பற்றப்படுகின்றன. இருந்தபொழுதும், அவை நீண்டகால, குறுகிய கால, இடைக்கால திட்ட வரைவுகள்மூலம் செயற்படுத்தப்பட வேண்டும்.

வெளிநாட்டலுவல்களுக்குப் பொறுப்பான அமைச்சர் அவர்கள், "நாங்கள் நீண்ட காலமாக இவ்வாறான சூழ்நிலைகளை எதிர்கொள்வதற்கான திட்டங்களைப் பாரியளவில் கொண்டிருக்கவில்லை" என்று சொன்னார். கடந்த காலங்களில் ஏற்பட்ட கசப்பான நிகழ்வுகள் குறிப்பாக, இந்த நாட்டில் ஓர் இனத்தை ஒடுக்குவதற்காக மேற்கொள்ளப்பட்ட யுத்தத்துக்குத் தீட்டப்பட்ட திட்டங்கள் மற்றும் அதற்காகச் செலவழிக்கப்பட்ட பாரிய நிதி என்பன காரணமாகத்தான் நாடு நீண்டகால வங்குரோத்து நிலைக்குச் சென்றது. இவற்றை எல்லாம் களைந்து, நாட்டின் எதிர்கால அபிவிருத்திக்காக நீண்டகால செயற்றிட்டங்களை முன்னெடுக்க வேண்டும். மிக முக்கியமாக, நாங்கள் எரிபொருளில் மட்டும் தங்கியிருக்கின்ற நிலைமையை மாற்ற வேண்டும். எமது நாட்டில் மாற்று வலுசக்திக்கான திட்டங்கள் பாரியளவில் முன்னெடுக்கப்பட்டு இருக்கவில்லை. குறிப்பாக, இயற்கை எரிசக்திக்கான பாரியளவு திட்டங்கள் தீட்டப்பட்டு இருக்கவில்லை. மேலும், இயற்கையாகக் கிடைக்கின்ற வலுசக்தியை வலுப்படுத்தும் நோக்கில் திட்டங்கள் பாரிய அளவில் முன்னெடுக்கப்பட்டு இருக்கவில்லை. இவ்வாறான சூழ்நிலைகள் மாற்றியமைக்கப்பட்டு, நாட்டிலுள்ள எல்லோருக்கும் - எல்லா இனங்களுக்கும் - சீரான முறையில் வலுசக்தி கிடைப்பதற்குரிய முயற்சிகள் எடுக்கப்பட வேண்டும்.

இன்று வலுசக்தித் துறை பாரிய நெருக்கடிக்கு உள்ளாகியுள்ளது. உண்மையிலேயே இது எதிர்பாராத வகையில் ஏற்பட்டது. அதாவது, எங்களது கட்டுப்பாட்டுக்கு அப்பாற்பட்ட வகையில், மத்திய கிழக்கில் நிலவும் யுத்த சூழ்நிலையால் ஏற்பட்டுள்ள நிலைமை ஆகும். இதை நாங்கள் ஏற்றுக்கொண்டாலும், எதிர்காலத்தில் இவ்வாறான சூழ்நிலைகள் ஏற்படும்பொழுது மேற்கொள்ளப்பட வேண்டிய நீண்ட கால ஏற்பாடுகள் என்ன என்பது திட்ட வரைவு அடிப்படையில் இருக்க வேண்டும். பல இடங்களில் இந்த விடயங்களைக் கையாள்வதற்கு அரசாங்கம் பல முயற்சிகளை எடுக்கின்றது. மக்கள் பாதிக்கப்படாத வகையிலும், சீரான முறையில் மக்களைச் சென்றடையக்கூடிய வகையிலும், நடைமுறைக்குச் சாத்தியமான செயற்றிட்டங்கள் வகுக்கப்பட வேண்டுமென நான் கேட்டுக் கொள்கின்றேன். ஏனெனில், QR குறியீட்டு முறைமை கொண்டுவரப்பட்டாலும்கூட, எரிபொருளைப் பெற்றுக்கொள்வது என்பது இன்றும் பாரிய சவாலாக இருக்கின்றது. நாளை தொழிற்றுறையை எவ்வாறு மேற்கொள்வது என்பதும் கேள்விக்குறியாக இருக்கின்றது. தொழிற்றுறை சார்ந்த நிறுவனங்கள் வருவாயை இழக்கும்பொழுது, அதற்கான மாற்றுத் திட்டம் என்ன? கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஒருவர் சொன்னதுபோன்று, வங்கிகளில் கடன்பெற்றவர்கள் பாரியளவு நெருக்கடிகளை எதிர்கொள்ளவேண்டி இருக்கின்றது. இந்த நிறுவனங்களுக்கு அல்லது தொழிற்றுறைகளுக்கு மாற்றுத் திட்டங்களை வகுத்துக் கொடுக்கவேண்டிய பொறுப்பு அரசாங்கத்துக்கு இருக்கின்றது.

அடுத்து, இன்றைய விவாதத் தலைப்புக்கு அப்பாற்பட்ட இரண்டு விடயங்களைச் சொல்ல வேண்டும். மிக முக்கியமாக, யாழ். பல்கலைக்கழக மாணவர் ஒன்றியத்தின் தலைவர் குற்றப் புலனாய்வுப் பிரிவுக்கு அழைக்கப்பட்டமை நெருடலான ஒரு விடயமாக இருக்கின்றது. சுதந்திர தினத்தை அவர்கள் கரிநாளாக அனுஷ்டித்தமையால் பாரிய பிரச்சினைக்கு உள்ளாகி இருக்கிறார்கள். அவர்கள் அந்தக் காலப்பகுதியில் பல்கலைக்கழக சமூகத்தினரை போராட்டங்கள் மற்றும் நெருக்கடிகளுக்கு உள்ளாக்கி இருந்தாலும், அவற்றை மிக இலகுவான முறையில் இந்த அரசாங்கம் கைக்கொள்ள வேண்டும். பல்கலைக்கழக மாணவர் ஒன்றியத்தின் தலைவரை இந்த விடயத்திலிருந்து விடுவித்து, நெருக்கடியற்ற சூழ்நிலையை உருவாக்குவதற்கு அரசாங்கம் ஏற்பாடு செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, 10 வருடங்களுக்கும் மேலாகப் பணிபுரிகின்ற அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கு இதுவரை உரிய சம்பள அளவுத் திட்டமோ, வேலைப் பட்டியலோ இல்லை. அரசாங்கமானது இந்த நிலைமையை மாற்றி, கல்வித் தகைமையின் அடிப்படையில் அவர்களுக்குப் பதவி உயர்வுகளை வழங்க வேண்டும் என்பதோடு, உரிய சம்பளத் திட்டத்தையும் வகுத்துக் கொடுக்க வேண்டும். எரிபொருள் பிரச்சினையைத் தீர்ப்பதில் மிகுந்த சிரத்தையுடனும் பொறுப்புடனும் நீங்கள் நடந்து கொள்கின்றீர்கள். அதனை நடைமுறைச் சாத்தியமாக்கி, மக்களுக்குச் சேவைகள் உரிய முறையில் சென்றடையச் செய்ய வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රුවන් රණසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[3.50 p.m.]

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

Hon. Presiding Member, since several Members of the Opposition tried to mislead this House about our Foreign Policy and our stance on the Middle East war, I would like to reiterate what the Hon. Minister of Foreign Affairs, Foreign Employment and Tourism explained.

Sir, we are a nation which had suffered from a war for decades. So, I think the people of this country know how painful the wounds of war are. Therefore, we never encourage any type of war in the world. That is our stance, as a nation. We are a sovereign nation and we categorically condemn any kind of attack on any nation in the world. That is our stance. As a developing economy which is heavily dependent on petroleum resources from the Middle East, we also condemn any type of attack on petroleum resources of any country. I need to make it very clear. Some Members of the Opposition, particularly those who support different camps, tried to manipulate our stance on this occasion and criticize how we had acted during some incidents.

The Hon. Minister of Foreign Affairs explained them very clearly. We follow a non-aligned Foreign Policy and do not endorse or encourage any kind of war. That is our stance in this case.

Having said that, I would like to suggest some corrections to the terminology of this Adjournment Motion that had been moved and we are debating right now.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රට තුළ උද්ගතව ඇති අර්බුදකාරී වාතාවරණය තුළ රටේ ජන ජීවිතය සෑම අංශයකින්ම අභියෝගයට ලක්ව ඇති බව සහ තවත් කරුණු කාරණා මෙම කල් තැබීමේ යෝජනාවේ තිබෙනවා. මම හිතන විධියට, රට තුළ අර්බුදයක් ඇති වෙලා නැහැ. රට තුළ අර්බුදයක් ඇති වුණා, මීට කාලයකට කලින්. ඔබතුමා මූලාසනයේ සිටියදී මට මේ කාරණය කියන්න සිදුවීම ගැන හරි කනගාටුයි. නමුත් මම දැක්කා, එක අවස්ථාවකදී ඔබතුමා යම් කිසි කාරණයක් පැහැදිලි කරන්න උත්සාහ කරනවා.

අද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් අධිකරණයට දැනුම් දෙනවා, එවකට හිටපු ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි කපිල චන්ද්‍රසේන මහතා දැනුම් දීලා තිබෙනවා කියලා, රුපියල් ලක්ෂ 200 බැගින් අවස්ථා තුනකදී රුපියල් ලක්ෂ 600ක් තංගල්ල නිවසේදී සහ බෙලිඅත්තේ නිවසේදී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට ලබා දුන්නා කියලා. මට හරි කනගාටුයි, ඊළඟ පරපුරේ මන්ත්‍රීවරුන්ට හිටපු දූෂිත දේශපාලකයින්වත් සුද්ද කරන්න අද සිදුව තිබීම පිළිබඳව.

එදා කරපු දේවල්වල ප්‍රතිඵලයක් විධියට මේ රටේ අර්බුදයක් ඇති වුණා. තෙල් නැව් ඇවිල්ලා අපේ රට වටේට තිබුණා. නමුත් අපට තෙල් ගන්න එදා ඩොලර් තිබුණේ නැහැ. ඒවාට ප්‍රමාද ගාස්තු විධියට අපට ඩොලර් මිලියන තුන, හතර ගෙවන්න වුණා. හැබැයි, ඒ වෙලාවේ තමන් කොමිස් ගත්ත, අල්ලස් ගත්ත අසූචි නැව් ආවාම ඒවාට ඩොලර් ගෙව්වා. අන්න ඒවා තමයි අර්බුද කියන්නේ. ඒ නිසා තමයි මේ රටේ ආර්ථිකය බංකොලොත් වුණේ. ඒ නිසා තමයි පෝලිම් ඇති වුණේ. ඒ නිසා තමයි ජනතාව පාරට ඇවිල්ලා ඒ පාලකයින්ව ගහලා පැන්නුවේ. ඒවා අර්බුද.

හැබැයි, දැන් ඇති වෙලා තිබෙන්නේ එහෙම එකක් නොවෙයි. මේක ලෝකයේ ඇති වෙච්ච යුද තත්ත්වයක්. අන්න ඒ යුද්ධයේ ප්‍රතිඵලයක් විධියට යම් යම් බලපෑම් අපේ රටටත් ඇති වෙලා තිබෙනවා. අපේ විදේශ කටයුතු ඇමතිතුමා කලිනුත් කිව්වා, ලෝකයේ ඛනිජ තෙල් සැපයුමට යම් කිසි බලපෑමක් ඇති වෙලා තිබෙනවා කියලා.

අපේ රට ගත්තොත්, අපේ රටේ ආර්ථිකය 2025 වසරේ සියයට 5කින් වර්ධනය වුණා කියලා දැන් වාර්තා ඇවිත් තිබෙනවා. හැබැයි ඔබට මතක ඇති, නොවැම්බර් මාසයේ අග අපේ රටේ ඇතිවෙච්ච "දිට්වා" සුළි කුණාටුව නිසා ඩොලර් බිලියන 4.1ක මහා පරිහානියක් සිද්ධ වුණා කියලා ලෝක බැංකුව තක්සේරු කළ බව. එහෙම තිබියදීත් මේ ආර්ථිකය තුළ සියයට 5ක වර්ධනයක් වෙලා තිබෙනවා. එහෙම නම් මම යෝජනා කරනවා, මේ Adjournment Motion එකේ වචන නිවැරදි කරන්න අවශ්‍යයි කියලා. මේ රට තුළ අර්බුදයක් නැහැ. හැබැයි, ජාත්‍යන්තර වශයෙන් පවතින යුදමය තත්ත්වය නිසා අපේ රටට ඇති වෙලා තිබෙන බලපෑම කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය මැදිහත්වීම කරන්න ඕනෑය කියලා අපි රජයක් හැටියට පිළිගන්නවා. අපි ඒ වෙනුවෙන් පියවර ගනිමින් ඉන්නවා.

ඒ අනුව මම පැහැදිලි කරන්න කැමැතියි, අපි මේ වනකොට සංචාරක ක්ෂේත්‍රයට අදාළව අරගෙන තිබෙන පියවර කිහිපයක් ගැන. අපි දන්නවා, මේ වනකොට සංචාරකයින් 77,000ක් පමණ අපේ රටේ රැඳිලා ඉන්න බව. ඒ සමහර අයට නැවත තමන්ගේ රටවලට යන්න අවශ්‍ය ගුවන් ගමන වෙන් කර ගන්න බැරිව තවම මෙරට තුළ රැඳිලා ඉන්නවා. ඒ අයට අවශ්‍ය පහසුකම් සලසන්න අපි පැය 24 පුරාම ක්‍රියාත්මක වන hotline එකක් දාලා ඒ අයගේ තොරතුරු ලබා ගනිමින් ඉන්නවා. අපට මේ වනකොට 170කගෙන් විතර පැමිණිලි ලැබිලා තිබෙනවා. විශේෂයෙන් මේ පැමිණිලි ලැබෙන්නේ ගුවන් ගමන් වෙන්කර ගැනීම සම්බන්ධවයි. ඊළඟට, ඒ අයට අවශ්‍ය වීසා පහසුකම් ගත්තාම, අපි රජයක් විධියට මුලින්ම ඒ අයට සති දෙකක වීසා පහසුකම් දීර්ඝ කිරීමක් ලබා දුන්නා, කිසිම අමතර ගාස්තුවක් අය නොකර. ඊට පසුව එම කාලය අපි තවත් සති දෙකකින් නැවත දීර්ඝ කරලා තිබෙනවා.

ඒ වාගේම මේ වනකොට සංචාරකයින් විශාල පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණෙන්න - මේක සංචාරක season එක - වීසා ලබාගෙන තමන්ගේ ගුවන් වාරය එනතෙක් බලාගෙන ඉන්නවා, තමන්ගේ රටවලට වෙලා. අන්න ඒ අයට මාසයකින් වීසා දීර්ඝ කිරීමට රජයක් විධියට අපි කටයුතු කළා. ඒ මොකද? ඒ සංචාරකයින් අපේ රටට පැමිණෙන්න අවශ්‍යයි, ඒ සඳහා අපි පහසුකම් සලසන්න අවශ්‍යයි. අපේ රටට පැමිණෙන්න, සංචාරය කරන්න බලාපොරොත්තුවෙන් ඉන්න සංචාරකයින්ට අමතර ගාස්තු අය කිරීමකින් තොරව තව මාසයකින් අපි වීසා කාලය දීර්ඝ කරනු ලැබුවා.

ඒ වාගේම අපේ රටේ දැනට පවතින ඉන්ධන ගැටලුව සංචාරක කර්මාන්තයට ගැටලුවක් නොවී කර්මාන්තය ඉදිරියට මෙහෙයවන්න අවශ්‍ය පියවර ගණනාවක් අප විසින් ගනු ලැබුවා. මම **table*** කරනවා, අපේ සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා විසින් පසුගිය දිනක නිකුත් කරන ලද ලිපි කිහිපයක්.

මෙතැනදී අපි විශේෂයෙන් QR system එකක් හඳුන්වා දුන්නා. ඊයේ සවස වනකොට අපේ ශ්‍රී ලංකා සංචාරක අධිකාරියේ ලියාපදිංචි සංචාරක සේවා සපයන්නන් 1,200ක් විතර එහි register වෙලා තිබුණා.

ඊයේ රාත්‍රිය පුරා අපේ කණ්ඩායම් එකතු වෙලා ඒ අය වෙනුවෙන්, විශේෂයෙන්ම සංචාරක ක්ෂේත්‍රය වෙනුවෙන් තවත් QR system එකක් හදලා ඒගොල්ලන්ට ඉදිරිපත් කරලා, ඒක අපි Ceylon Petroleum Corporation එකට ලබා දුන්නා. ඊට පස්සේ CPC එකේ තිබෙන සියලුම ඉන්ධන පිරවුම්හල් හරහා ඒ අයට ගැටලුවකින් තොරව තමන්ගේ සංචාරය සම්පූර්ණ කරන්නට වුවමනා සම්පූර්ණ ඉන්ධන ප්‍රමාණය ලබා දෙන්න අවශ්‍ය උපදෙස් අපි මේ වන විට ලබා දීලා තිබෙනවා.

අපි දන්නවා, සංචාරකයින් paramotoring භාවිත කරන බව. ඒ වාගේම ඔවුන් බෝට්ටු සේවාත් භාවිත කරනවා. අපි දන්නවා, මාදු ගඟේ බෝට්ටු ගමන් කරන්නේ භූමිතෙල්වලින් බව. ඒ වාගේ විවිධ ඉන්ධන වර්ග මෙම සේවා සඳහා අවශ්‍යයි. Generatorsවලට ඉන්ධන අවශ්‍යයි, හෝටල්වලට ගෑස් අවශ්‍යයි. මේ තත්ත්වය අපි දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් එක්ක සාකච්ඡා කරලා, ඒ අයට එම පහසුකම් සලසා දෙන්න අවශ්‍ය උපදෙස් ලබා දීලා තිබෙනවා. ඊට අමතරව, safari driversලාට මාසයකට

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා]

ඉන්ධන 265,000 litres ඕනෑය කියලා අපට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් දැනුම් දීලා තිබෙනවා. ඒ අනුව අපි දිස්ත්‍රික් ලේකම්වරුන්ට හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් ලබා දීලා තිබෙනවා, අදාළ දිස්ත්‍රික්කවලට ඒ සඳහා පහසුකම් සලසන්න කියලා. ඒ වාගේම ඊට අවශ්‍ය උපදෙස් අපි CPC එකටත් ලබා දීලා තිබෙනවා. මේ ක්ෂේත්‍රයට සම්බන්ධිත අනෙකුත් ආයතන හා විශේෂයෙන්ම සංචාරකයින් කුලී පදනම මත වාහන අරගෙන ඔවුන්ගේ සංචාරයේ නිරත වනවා. ඒ අය තමන්ගේ passport එක, valid visa එක ඉදිරිපත් කරනවා නම්, ඒ අයටත් එම පහසුකම් සලසන්න කියලා අපි පොලීසියට සහ අපේ ඉන්ධන පිරවුම්හල්වලට උපදෙස් ලබා දීලා තිබෙනවා.

ඊළඟට ගෑස් සැපයුම ගත්තොත්, පෞද්ගලික සමාගමක් තමයි විශාල වශයෙන් හෝටල්වලට ගෑස් සපයමින් සිටියේ. නමුත්, ඒ අයගේ යම් ගැටලුකාරී තත්ත්වයක් නිසා ලිට්‍රෝ ගෑස් සමාගම විසින් ඒ වගකීම භාරගෙන, හෝටල්වලට ගැටලුවකින් තොරව ගෑස් ලබා දෙන්න අවශ්‍ය වැඩ කටයුතු කරමින් ඉන්නවා. ඒ විධියට සංචාරක කර්මාන්තය කිසිම ගැටලුවකින් තොරව ඉදිරියට පවත්වා ගෙන යන්න අවශ්‍ය වැඩ කටයුතු අපි මේ වනකොට සම්පාදනය කර තිබෙනවා.

මම මුලින් කිව්වා වාගේ, මේ වාගේ බාහිර තත්ත්වයක් ඇති වෙලා එහි බලපෑම අපේ රටට එනකොට, විපක්ෂ නායකතුමා මහා භයානක තත්ත්වයක් ඇති වෙලා කියලා ලොකු වචන ටිකක් දාලා හැමදාම උදේට මෙතැනට ඇවිල්ලා මොනවා හරි කියනවා. අන්න ඒ කියන දේවල් නිසා, ඇත්තටම මේ විපක්ෂය මවන බිල්ලෝ නිසා, ඒගොල්ලන් මවන මේ අස්ථාවරත්වය නිසා තමයි යම් කිසි ගැටලුකාරී තත්ත්වයක් ඇති වනවා නම් ඇති වන්නේ.

විශේෂයෙන්ම අපේ රටේ ඇති වෙන්න ඉන්ධන තොග තිබෙනවා. හැබැයි, පසුගිය සතිය ගත්තොත්, අපේ රටේ ඉන්ධන අළෙවිය දෙගුණයකින්, තෙගුණයකින් වැඩි වෙලා තිබෙනවා.

මම හිතන්නේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට fuel stations ඇති, ඒ අයට check කරලා බලන්න පුළුවන්. ඒකට හේතුව තමයි, ඔබ මේ සභාවට ඇවිල්ලා මවන බිල්ලෝ, මේ සභාවට ඇවිල්ලා ඉදිරිපත් කරන බොරු කාරණා. එතකොට ජනතාව බියට පත් වෙනවා. ඒ වාගේම ඒ තුළින් යම්කිසි කුට, කළු වෙළෙඳ පොළවල් ඇති වෙනවා. අපි දන්නවා, මේ වනකොටත් වැටලීම් කිහිපයක් සිදු කරලා ඒ අය කොටු කර ගන්න සමත් වෙලා තිබෙන බව. විපක්ෂය විසින් තමයි ඒ කළු වෙළෙඳ පොළවල් නිර්මාණය කරන්නේ, මේ වාගේ අස්ථාවරත්වයක් නිර්මාණය කරන්නේ. නමුත්, රජයක් විධියට අපි මේ තත්ත්වය පාලනය කරන්න අවශ්‍ය මැදිහත් වීම කරලා තිබෙන්නේ. ඒ නිසා තමයි අපට නැවතත් QR system එකට යන්න සිද්ධ වුණේ. ලෝකයේ ඇති වෙලා තිබෙන අස්ථාවර තත්ත්වය, විශේෂයෙන්ම ඉන්ධන සැපයුමේ ඇති වෙලා තිබෙන ගැටලුකාරී තත්ත්වය වාගේම මේ යුදමය තත්ත්වය පහව ගිහිල්ලා එය සාමාන්‍ය තත්ත්වයට පත් වනකල් මම හිතන විධියට අපට මේ පාලනය කරගෙන යන්න වෙනවා.

අපි දන්නවා, petroleum resources එක්ක තමයි අනෙක් සියලුම කර්මාන්ත වාගේම සැපයුම් ජාල රැඳී පවතින්නේ කියන එක. මේ වාගේ යම් යම් ගැටලුකාරී තත්ත්වයන් මතු වෙන්න පුළුවන්. නමුත්, රජයක් විධියට සහ අමාත්‍යාංශය විධියට අපේ වගකීම තමයි මේ දේවල් නිසියාකාරයෙන් කළමනාකරණය කිරීම. රජයක් විධියට අපි ඒ වෙනුවෙන් මැදිහත් වෙනවා; මහන්සි වෙනවා. තමන්ගේ බල ලෝභීකම වෙනුවෙන්, එහෙම නැත්නම් බලය ලබා ගැනීම වෙනුවෙන් මේ ආණ්ඩුව පෙරළන්න මේ වාගේ ව්‍යසනකාරී අවස්ථාවක් පාවිච්චි කරන්නේ නැතුව තමන්ගේ වගකීම හඳුනාගෙන කටයුතු කරන්න. ජාත්‍යන්තර අභියෝගයකට මුහුණ දීලා තිබෙන අවස්ථාවේදී රටක් විධියට ඒකට මුහුණ දෙන්න අවශ්‍ය ශක්තිය ලබා ගන්න අපි ඔක්කෝම එකතු වෙලා වැඩ කරමු කියන ආරාධනාව කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.02]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, රටේ අර්බුදයක් නැහැය කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පුළුවන් නම් ඔබතුමා Ella Police Station එක ළඟට ගිහිල්ලා කියන්න, දැන් අර්බුදයක් නැහැ කියලා. එච්චර දුර යන්න ඕනෑ නැහැ, මගේ කථාවෙන් පසුව පාර්ලිමේන්තුව පිටුපස තිබෙන පෙට්‍රල් ෂෙඩ් එක ළඟට යමුකෝ. එතකොට අර්බුදයක් නැද්ද කියලා පෙන්වන්න පුළුවන්. නින්දෙන් නැඟිටලා වාගේ කථා කරන්න එපා, නියෝජ්‍ය ඇමතිතුමනි. ඔබතුමාත් නරක පැත්තට ගිහිල්ලා තිබෙන්නේ. සාමාන්‍යයෙන් ඔබතුමා ඉදිරි පෙළේ ඉන්න පචකාරයෝ වාගේ පච කියන්න යන්න එපා. විනාශ වෙලාම යනවා. අර්බුදයක් නැහැ කියන්න එපා.

දැන් අන්තර්ජාතික ගුවන් යානාවලින් සංචාරකයෝ අපේ රටට එන්නේ නැහැ. ඔබතුමා ටිකට්වල වලංගු කාලය දීර්ඝ කළා කියලා ගුවන් යානා එන්නේ නැත්නම් වැඩක් නැහැ නේ. දැන් safari tours කරන අයට තෙල් දෙනවා කියනවා. ඒවා දෙන්න. ඒක හොඳයි. නමුත්, සංචාරකයෝ එන්නේ නැත්නම් තෙල් දීලා වැඩක් නැහැ. කරන්න ඕනෑ දේ මම කියන්නද? ණය අරගෙන hotel හදපු ව්‍යාපාරිකයෝ ඉන්නවා. ඇල්ලට ගිහිල්ලා ඒ අයට moratorium එකක් දෙන්න කථා කරන්න. ත්‍රී වීලර් රථ රියැදුරන් ඉන්නවා. ණය අරගෙන ඒ ව්‍යාපාර ක්ෂේත්‍රය කරගෙන යන කට්ටියට ඒ කාලයේ කෑ ගැහුවේ ඔබතුමන්ලාගේ නායකයා, ඔය moratoriums ගැන කියලා. එහෙම නේද, කබීර් හෂීම් මැතිතුමනි? සැහෙන්න ඒ ගැන කථා කළා. අන්න ඒවා කරන්න. ඒවා තමයි කාලීන වැඩ පිළිවෙළවල්. අලුත් අවුරුදු සමය එනවා, පරිප්පු මිල වැඩි වෙනවාද, සීනි මිල වැඩි වෙනවාද, හාල් මිල වැඩි වෙනවාද, ගමන් බිමන් ටික යන්න පුළුවන්ද කියන කාරණය තමයි මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඇහුවේ. කෝ, ඒවාට උත්තර? ඔබතුමන්ලාගේ වෙළෙඳ ඇමතිතුමා මොකක්ද කියන්නේ? ඒවායේ මිල වැඩි වෙන්න පුළුවන් කියනවා. ඔබතුමන්ලා කියනවා, අර්බුදයක් නැහැ කියලා. ඔබතුමන්ලාට අර්බුදය පෙනෙන්නේ නැහැ, ඔබතුමන්ලා ඒක දකින්නේ නැහැ. ඒ, ඇයි? ඔබතුමන්ලා එදා හිටපු කට්ටිය නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමා කියනවා, එතුමාව විශ්වාස කරන්නය කියලා. එතුමාව විශ්වාස කරන්න ජනතා විමුක්ති පෙරමුණට - ජේවීපීකාරයින්ට - පුළුවන්ද කියලා මම අහනවා. හැත්තෑ හය අවුරුද්දක් තිස්සේ ජනතා විමුක්ති පෙරමුණේ cadre එකට මොකක්ද කිව්වේ? විජේවීර මහත්මයා නායකයා හැටියට මොකක්ද කිව්වේ? අද ඔබතුමන්ලාගේ

සමාජවාදය කෝ? රෙද්ද පල්ලේ. ඔබතුමන්ලා සමාජවාදය අවුරුද්දයි මාස හයෙන් අයින් කරපු උදවිය. ඔබතුමන්ලා ගිහිල්ලා ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන ජනතාවට සපථ කරන්න, ඔබතුමන්ලා සමාජවාදය රකිනවා; ආරක්ෂා කරනවා කියලා. ඔබතුමන්ලා එදා එහෙම කිව්වේ නැද්ද? හැබැයි, ජනාධිපතිතුමා කියනවා, එතුමාව විශ්වාස කරන්න කියලා. අපි නම් විශ්වාස කරන්නේ නැහැ. ඔය 159 හදපු කට්ටිය විශ්වාස කරනවා නම් විශ්වාස කර ගනීවි. ඒක අපට අදාළ නැහැ. හැබැයි, ජනාධිපතිතුමා විශ්වාස කරන්න කියන කාරණය සාධාරණද කියලා අපි ජේවීපීකාරයින්ගෙන් අහනවා. 60,000ක විතර තරුණයින් පිරිසක් මැරෙනකොට, ඉන්දියාවට විරුද්ධව උසිගන්වලා, ඒ යුද ව්‍යාප්තවාදයට විරුද්ධව කෑ ගහලා, අපේ සහෝදරයෝ මහ පාරේ මරලා දාපු අය අද ඉන්දියාවට ගිහිල්ලා කරට අත දමාගෙන, සාටක දමාගෙන කථා කරනකොට ජේවීපීකාරයෝ ඔයගොල්ලන්ව විශ්වාස කරනවා කියන එකත් පුදුමයි.

ඊළඟට, මම තව කාරණයක් අහනවා. අධ්‍යාපනය පෞද්ගලීකරණය කරන්න හදනවා කියලා මේ අය එදා මහ පාරේ සටන් කළා. බලයට ඇවිල්ලා අවුරුද්දයි මාස 6ක් ගත වනකොට අධ්‍යාපනය පෞද්ගලීකරණය කළේ නැද්ද? ඉතින්, විශ්වවිද්‍යාලයේ දරුවෝ විශ්වාස කරයිද? ජනාධිපතිතුමා රටේ ජනතාවට කියනවා, එතුමාව විශ්වාස කරන්නය කියලා.

ඊළඟට, ලංකා විදුලිබල මණ්ඩලය ඇතුළු තවත් ආයතන ගණනාවක් විකුණන්නේ නැහැ, ඒ රාජ්‍ය ව්‍යාපාර ටික විකුණන්නේ නැහැ කියලා වෘත්තිකයෝත් එක්ක පේළි ගැහිලා, හැත්තෑ හය අවුරුද්දක් තිස්සේ සටන් කළා. කෝ, ඒ සටන් පාඨ? ඒ සටන් අයිතිය අද ඒ වෘත්තිකයාට අරගෙන දීලා තිබෙනවාද? ජනාධිපතිතුමා පපුවට ගහගෙන කියනවා, එතුමාව විශ්වාස කරන්න කියලා. එතුමාව විශ්වාස කරන්න කියලා වේදිකාවල අඬ අඬා කියනවා. අන්න ඒවා වෙනුවෙන් සටන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. බදුල්ලේ ජනතාව ඔබතුමාව ජාතික ජන බලවේගයෙන් පාර්ලිමේන්තුවට එව්වේ ඒ නිසායි.

කෝ, ජාතික ජන බලවේගයේ ක්‍රියාකාරකම්? උගතා, වියතා, බුද්ධිමතා අද හොරකම් ටික අපුල්ලනවා. ඔබතුමන්ලා වෘත්තිය දමලා, ඔබතුමන්ලාගේ තනතුරු සියල්ල දමා ආවේ ඇයි? රට හදන්න. හැබැයි, ඔබතුමන්ලා රට හදනවාද? ජාතික ජන බලවේගයේ එක් කෙනෙක්වත් කොන්ද කෙළින් තියාගෙන ඒවාට විරුද්ධව මෙතැන නැඟිටලා කථා කරනවාද?

අද ඔබතුමන්ලාගේ නායිකාව කථා කළා. එතුමිය මොකක්ද කිව්වේ? ලෝක අර්බුදයක් තිබෙන වෙලාවක විපක්ෂයට එහෙම හැසිරෙන්න එපා ලු. ඔබතුමන්ලා එහෙම හැසිරුණාද? ඔබතුමන්ලා කොරෝනා වසංගතය පැවති වෙලාවේ හිටියේ විපක්ෂයේ නේ. ඒ වෙලාවේදී ඔබතුමන්ලා හැසුරුණු විධිය පිළිබඳව හැන්සාඩ් වාර්තා සටහන් ගෙනැල්ලා පෙන්වන්න පුළුවන්. ඒ අර්බුද ඇති වුණු වෙලාවේදී ඔබතුමන්ලා හරියට හැදිලා හිටියා නම් ඒ වෙලාවේදී තිබුණු ආණ්ඩුවලට මුකුත් කියන්නේ නැහැ. ඒ කියපු කතන්දර ඉවසා ගන්න බැහැ නේද, එදා කියපු ඒවා දැන් Facebook එකේ දමනකොට?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඩොලර් එවන්න එපා කිව්වා ලු.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අපේ මන්ත්‍රීතුමෙක් කියනවා, ඩොලර් එවන්න එපා කිව්වාය කියලා. සුනිල් හඳුන්නෙත්ති මහත්මයා කිව්වා, ඩොලර් එවන්න එපා කියලා. අපි එහෙම කියලා තිබෙනවාද? ඔන්න, ඔබතුමන්ලා විපක්ෂයේ සිටියදී කරපු කාර්යභාරය. ඔබතුමන්ලා විපක්ෂයේ සිටියදී හරියට හැදිලා මේ ආර්ථික අර්බුද, පීඩන එනකොට එදා හිටපු ආණ්ඩුවලට ඒවා කළමනාකරණය කරගන්න අතහිත දීලා තිබුණා නම් කැත නැතුව ඕවා කිව්වාට කමක් නැහැ. නමුත්, ලජ්ජා නැතුව අද ඒවා කියනවා. අපි එහෙම කවදාවත් කරලා නැහැ. ආර්ථික අර්බුදයක්, පීඩනයක් තිබෙන වෙලාවේදී බලය ගන්න අපි සූදානම් නැහැ. අපි කරපු දේවල් තමයි අද ඔබතුමන්ලා කරගෙන යන්නේ කියන එක හොඳට මතක තියා ගන්න. එදා රනිල් වික්‍රමසිංහ මහත්මයා විපක්ෂයට ආපු වෙලාවේදී එතුමා IMF එක පිළිබඳව කථා කළේ නැහැ. අනුර කුමාර මහත්මයා IMF එකට යන එකට අද කැමති වුණාට එදා විරුද්ධ වුණා. එතුමන්ලා දිනපු සැණින් ඒ ගිවිසුම් ඉරලා, වීසි කරලා, කුණු කූඩයට දමලා IMF එකට පයින් ගහනවාය කිව්වා. හැබැයි, සමගි ජන බලවේගයේ හර්ෂ ද සිල්වා මහත්මයා, සජිත් ප්‍රේමදාස මහත්මයා තමයි ඒ මඟ පෙන්නුවේ. අද වනකොට ඒ මඟ තමයි තමුන්නාන්සේලා යන්නේ. ඒ නිසා අනුන්ගේ දරුවන්ට උප්පැන්න දෙන්න ඔබතුමන්ලා හරි සූරයෝ. ජනාධිපතිතුමා අපිට ඉවසන්න කියනවා. වෘත්තිකයන්ට අවශ්‍ය වැඩ පිළිවෙළ ගැන කියලා ජනතා විමුක්ති පෙරමුණේ cadre එකට බොරු කියලා දැන් ඉවසන්න කියනවා.

ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඊළඟට කියනවා, "අපි හොරු නොවෙයි" කියලා. එතකොට අපිට කියන්නේ ජනතා විමුක්ති පෙරමුණ තුළ අවුරුදු 76ක් තිස්සේ තිබුණු සටන් පාඨ සියල්ල පාවා දීලා අද ටයි, කෝට් දමාගෙන සුද්දෝ වාගේ, "හොරා කන්නේ නැහැ" කිව්වාම ඒක පිළිගන්න කියලාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඔබතුමා ඇහුවාද, ඒ කථාව? නැව් 3ක් එන්නේ නැහැ ලු. හැබැයි කොහේ හරි යන ඕනෑම නැවක,- මේක අඬ අඬා කියන්නේ; අඬ අඬා කියන්නේ. ඒවා ඔබතුමන්ලාගේ චැනල්වල දැම්මොත් ඔබතුමන්ලාට මොනවා හරි කියයි. ඒක තේරුණේ නැද්ද? මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කිව්වා, මෙතුමන්ලා ගසා කන විධිය හොයා ගන්න කියලා. මරුම වැඬේ! දැන් ඒ නැව් 3 නැහැ ලු. නැව් 3 ඇති. කොහේ හරි යන එකක් ගන්නවා ලු. ඒ වෙනුවට නැව් 3ක් ගන්නවා. ඒවා ගන්නේ වැඩි මිලට. කොහොමද ටිකිරි මොළේ? මොකද, දැන් අඬලා ජනතාව අමතලාම කියලා ඉවරයි නේ. එතුමන්ලා එදාත් හොරා කෑවේ ඔහොමමයි. අන්න අතැන ඉඳගෙන බෙරිහන් දුන්නා, හොරු ඉන්නවා, හොරා කනවා, මහ බැංකුව කනවා කියලා. ටිකක් වෙලා යනකොට ඒ හොරාත් එක්ක එහා පැත්තේ කරට අත දමා ගෙන. පාර්ලිමේන්තුවේ වැඩ කරන සේවකයන්ගෙන් අහන්න, අපි බොරු කියනවා නම්.

දිලිත් ජයවීර මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා බණින මලික් සමරවික්‍රමත් එක්ක තමයි කැන්ටින් එකේ දවල්ට කෑවේ මේ ඉදිරි පෙළේ ඉන්න හතරදෙනා. මම මේක හැම දාම කියනවා. හැබැයි, එතුමා රනිල් වික්‍රමසිංහගේ ගෝලයා, රනිල් වික්‍රමසිංහගේ ඩීල්කාරයා කියලා මෙතැන කෑ ගැහුවා. අනේ! දැන් ඒ ඩීල්කාරයාත් එක්ක කනවා. ජාතික ජන බලවේගයේ ගරු මන්ත්‍රීතුමන්ලාට මම මේ කියන්නේ, ජේවීපීකාරයන්ට නොවෙයි.

[ගරු චමින්ද විජේසිරි මහතා]

මොකද, ජේවීපී කට්ටිය මේවා ගැන හොඳට දන්නවා. එතුමන්ලා එහෙමයි එදා හොරා කෑවේ. අද ජනාධිපතිතුමා මොකද කියන්නේ? තෙල් නැව් එන්නේ නැහැ, හැබැයි සමුද්‍රයේ තිබෙන ඕනෑම නැවක් ගන්න අපි සූදානම් කියලා ජාතිය අමතා කියනවා. දැන් ඒකට ගණන් කථා කරගෙන තිබෙන්නේ. ඒ නිසා එතුමන්ලාගේ ටිකිරි මොළේ රටේ ජනතාව තේරුම් ගන්න.

කන්ටේනර් 323න් හොරා කාපු එක හොරකමක් නොවෙයිද? අද ගල් අඟුරුවලින් හොරා කාලා තිබෙනවා, වංචා කරලා තිබෙනවා කියලා ඔප්පු වෙලා තිබෙනවා. අද වනකොට සියලු ආයතන ඒ වංචාව හෙළි කරලා තිබෙනවා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට ඉන්නේ වෛද්‍ය වෘත්තිකයෙක්. ජාතික ජන බලවේගයේ කියලා ඇවිල්ලා එතුමා, එතුමාගේ චරිතය ඝාතනය කර ගන්නවා. මම මේ ඒ සම්බන්ධයෙන් කනගාටු වෙනවා. ආයතන සියල්ල මේක හොරකමක්, වංචාවක්, දූෂණයක් කියලා ඔප්පු කරලා තිබෙනවා.

දැන් කියනවා, චීන පොහොර නැව ගැන. ඒ කාලයේ ඒ පොහොර නැව ගෙනැල්ලා තිබෙන්නේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරියටම කරලා. එහි ප්‍රසම්පාදනය හරි. පොහොර නැවට මිල ගණන් කැඳවා තිබෙනවා. ඒක හරි. ඔබතුමන්ලා කියන විධියට ගල් අඟුරු ප්‍රසම්පාදනයත් හරි නම්, පොහොර නැවේ ප්‍රසම්පාදනයත් හරි නම් ඒක හොරකමක් නොවෙයි නේ. ඒක හොරකමක් වෙන්න බැහැ නේ. ඒ ප්‍රසම්පාදනය සියයට සියයක් හරි නම් පොහොර ගෙන්වන්න අවශ්‍ය මිල ගණන් කැඳවා, ඒකට අඩුම ලංසුව තබපු ආයතනය කැඳවා තිබෙනවා නම් ඒක බාල වෙලා තිබෙනවා, ඒක අසූචි බවට පත් වෙලා තිබෙනවා කියන කාරණය කියන්න බැහැ. මොකද, එහෙනම් ප්‍රසම්පාදනය හරි නේ. ඒ න්‍යාය අනුව ගල් අඟුරු වංචාව, වංචාවක් නොවෙන්නත්, පොහොර වංචාව වංචාවක් වෙන්නත් හේතුව මොකක්ද? ඒක, කබරගොයා තලගොයා කර ගැනීමේ ඔබතුමන්ලාගේ න්‍යාය. ඒ නිසා මතක තියා ගන්න, ඕවාට ආයුෂ නැහැ කියන එක. රටේ ජනතාව අද අහනවා, අපි මොනවාද කරන්නේ කියලා. අපි මොනවා කරන්නද? අපි ගල් අඟුරු වංචාව සම්බන්ධයෙන් බලශක්ති ඇමතිට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් භාර දුන්නා. නමුත් අපිට ඒක ජයග්‍රහණය කරන්න බැහැ. ඇයි, ඒ? ඔබතුමන්ලාගේ 159දෙනා ඒ විශ්වාස භංග යෝජනාව පරාජය කරනවා.

හැබැයි අපි රටට පෙන්වනවා, NPP එක නොහොත් ජාතික ජන බලවේගය ඇතුළේ උගතා, වියතා, බුද්ධිමතා කියලා ඇවිල්ලා, තනතුරු දාලා ඇවිල්ලා, රට හදනවා කිව්වාට ගල් අඟුරු හොරකමට ලජ්ජා නැතුව අත ඔසවනවා කියන කාරණය. ඒක පෙන්වන එක තමයි අපේ ජයග්‍රහණය, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට විශ්වාස භංගයෙන් දිනන්න බැහැ. හැබැයි අපි පෙන්වනවා, විපක්ෂය පැත්තේ පසු පෙළේ ඉන්න, ආණ්ඩු පක්ෂය පැත්තේ ඉදිරි පෙළේ ඉන්න ජාතික ජන බලවේගයේ උගත්, වියත්, ආචාර්යවරු, මහාචාර්යවරු ඒ හොරකමට, වංචාවට ලජ්ජා නැතුව අත ඔසවනවාය කියන කාරණය. එය පෙන්වීම තමයි අපේ ජයග්‍රහණය. පාර්ලිමේන්තුව තුළ මේ 159දෙනා පරාජය කරන්න ව්‍යවස්ථානුකූල බලයක් අපට දීලා නැහැ. හැබැයි, සජබයේ නායකතුමා බලය ලබා ගන්න තිබුණු බොහෝ වෙලාවේදී බලය ලබා ගත්තේ නැහැ. ඒ අර්බුදවලදී බලය ලබා ගත්තේ නැහැ. යහ පාලන ආණ්ඩුව ඇතුළේ අර්බුද එනකොට බලය දෙන්න කථා කළ වෙලාවේ ගත්තේ නැහැ, එතුමාගේ නිහතමානීත්වය තුළ.

ඊළඟට, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා අයින් වනකොට බලය දෙන්න කථා කරපු වෙලාවේ එතුමා බලය ගත්තේ නැත්තේ ඇයි? එතැන හිටපු නිසා මම දන්නවා. ඒ වෙලාවේ පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරු වන්දි ලෙස ලොකු දීමනාවක් ඉල්ලපු බව. "අපේ ගෙවල් ගිනි තබා තිබෙනවා. ඒ සියලු දේ වෙනුවෙන් වන්දි දෙනවා නම්, අපි ඔබට අත ඔසවනවා" කිව්වා. හැබැයි, අපේ නායකතුමා එදා ඒකට එකඟ වුණේ නැහැ. අපේ නායකතුමා එකඟ වුණේ නැහැ. අපේ නායකත්වය ඊට එකඟ නොවීම තුළ එතුමාට ජනාධිපතිකම නොලැබුණාට ජනාධිපතිකම ගත්ත කට්ටිය ඒවා නොදුන්නාද කියලා අපි අහනවා. අපේ නායකයාට කරන්න පුළුවන් දේ, අපේ පක්ෂයට කරන්න පුළුවන් දේ අපි පෙන්වනවා. මම ඉන්න පේළියෙන් පටන් ගත්තාම අපේ ඉදිරි පේළියට යන කල් විදේශ ඇමතිකම දුන්නත්, මුදල් ඇමතිකම දුන්නත්, වෙන ඕනෑම ඇමතිකමක් දුන්නත් කරන්න පුළුවන් හයිය, ශක්තිය තිබෙන්නේ සමගි ජන බලවේගයට බව අපි භය නැතුව කියනවා. ඇයි, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට බැරිද? ඉරාන් වික්‍රමරත්න හිටපු මන්ත්‍රීතුමාට බැරිද? අපේ රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාට බැරිද? අපේ ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමාට බැරිද? සමගි ජන බලවේගයේ අපේ මේ ඉන්න කණ්ඩායමට බැරිද? අපි හොරුද? අපි හොරු නොවන බව ඔබතුමන්ලා ඔප්පු කරලායි තිබෙන්නේ. මන්ත්‍රීවරු 159යේ ආණ්ඩුව මේ වනකොට සමගි ජන බලවේගයේ කිසි කෙනෙක් හොරෙක් නොවෙයි, වංචනිකයෙක් නොවෙයි, දූෂිතයෙක් නොවෙයි කියලා ඔප්පු කරලා ඉවරයි. ඇයි, අපට විරුද්ධව ඔබතුමන්ලාට නඩු දාන්න බැරි වෙලා තිබෙනවා. අපට විරුද්ධව චෝදනා ඉදිරිපත් කරන්න ඔබතුමන්ලාට බැරි වෙලා තිබෙනවා.

රටේ ජනතාව තේරුම් ගන්න, විපක්ෂයේ කාර්යභාරය එදා ජාතික ජන බලවේගය, ජේවීපී එක කළා වාගේ කරන්නේ නැත්තේ, ජනතාව පත් වෙලා තිබෙන මේ අපහසුතාව තුළ තවත් අපහසුතාවට පත් නොකරන්නයි. අරගළයක් මතු කරලා, ගෙවල් ගිනි තියලා, මිනී මරලා, ආර්ථික අර්බුදයක් ගොඩනගලා සමගි ජන බලවේගය බලයට එන්නේ නැහැ. එහෙම බලය ගන්නේ නැහැ. ඔබතුමන්ලා බලය දාලා යනවා. ඔබතුමන්ලාට බලය දාලා යන්න සිද්ධ වනවා. එය සිදු කරන්නේ, එදා බලය ලබා දීලා එම තනතුරේ වගකීම ඉටු නොකළ නායකයෝ එළෙව්වා වාගෙයි. එලෙස එළවන්න පෙළ ගැහෙනකොට, මම නැවතත් කියනවා ජාතික ජන බලවේගයේ උගතා, වියතාට, ජේවීපී එකට කඩේ ගිහිල්ලා ඔබතුමන්ලාගේ තනතුර, ගෞරවය කෙළෙසා ගන්න එපා කියලා. ඒ කාරණය මතක් කරමින්, මම නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු ආචාර්ය කෞෂල්‍යා ආරියරත්න නියෝජ්‍ය අමාත්‍යතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.12]

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**

(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා කිව්වා, අරගළයක් කරන්නේ නැහැ කියලා. අරගළයක් කරන්න බැහැ කියමින් මගේ කථාව පටන් ගන්නම්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇයි, බැරි?

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
ගිහිල්ලා කරන්නකෝ, බලන්න. අර පෙට්‍රල් ෂෙඩ් ළඟ ඉන්න, plan කරලා mike එකට කථා කරන අය එක්ක නම් අරගළයක් කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය මොන වාගේ අවස්ථාවක්ද කියලා පැහැදිලි කරමින් මම කථාව පටන් ගන්නම්. මෙය ගෝලීයව අපි මුහුණ දුන් ඉතා බැරෑරුම් අවස්ථාවක්. මේක ගොඩක් අය සමාන කරන්න උත්සාහ කරනවා, 2022දී ඇති වුණු තත්ත්වයට. නමුත්, 2022දී සිදු වුණේ ඇත්තටම අපට මිලදී ගැනීමේ ශක්තිය නැති වීම. තෙල් මිලදී ගැනීම සඳහා LCs open කර ගන්න බැරිව අපට තිබුණා මූල්‍යමය අර්බුදයක්. මේ රට බංකොලොත්භාවයට පත් කරලා තිබුණේ. හැබැයි, අපි පැහැදිලිව තේරුම් ගන්න අවශ්‍යයි, මේ අවස්ථාවේ ඇති වෙලා තිබෙන්නේ ගෝලීය අර්බුදයක් බව. ගෝලීයව තෙල් සැපයුම් දාමයේ - supply chain එකේ - අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. මම පුවත්වල දැක්කා, අද වෙද්දි බොර තෙල් බැරලයක මිල ඩොලර් 112 දක්වා ඉහළ ගිහින් තිබෙනවා කියලා. තව කට්ටිය කියලා තිබුණා, කාන්තා දිනයට බස්වලින් සෙනඟ ඇදලා තමයි රටේ තෙල් නැති වුණේ කියලා. මේ අවස්ථාවේ ඇති වෙලා තිබෙන අර්බුදය අපි එහෙම නොවෙයි තේරුම් ගන්න ඕනෑ.

ලංකාව පසුගිය අවුරුද්දේ - 2025 අවුරුද්දේ - ආර්ථිකමය වශයෙන් යම්කිසි ස්ථාවරත්වයකට පත් වුණා. මේ වන විට රටේ විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 7.28ක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අය වැය හිඟය අඩු කර ගනිමින්, හැකිළිලා තිබුණු ආර්ථිකය ප්‍රසාරණය කරමින්, සංවර්ධනයේ පදනම - foundation එක - හදා ගනිමින් අපි හිටියේ. එහෙම වෙලාවක ආපු "දිට්වා" සුළි කුණාටුව නිසා ඇති වුණු තත්ත්වයත් කළමනාකරණය කළා. ඒ කියන්නේ, අභ්‍යන්තරව ආපු shock එකට අපි සාර්ථකව මුහුණ දුන්නා.

නමුත්, මේ වාගේ අපේ පාලනයෙන් බැහැරව එන බාහිර shock එකකදී අපි රට හසුරුවන්නේ කොහොමද, ජනතාවට එහි බර අවම වශයෙන් දැනෙන විධියට මේ අවස්ථාවට මුහුණ දෙන්නේ කොහොමද, අපේ මධ්‍යස්ථභාවය අපි රැක ගන්නේ කොහොමද කියන පරිපාලනමය සහ රාජ්‍ය තාන්ත්‍රික හැකියාව අපි මේ වෙලාවේ පෙන්වමින් තිබෙනවා. මොකද, මේ වෙලාව කියන්නේ ඉතා බැරෑරුම් මොහොතක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනමාධ්‍ය නියෝජ්‍ය ඇමතිවරිය ලෙස මම කැමැතියි, මේ මොහොතේ වැඩිය කථා නොකරපු දෙයක් ගැන කථා කරන්න. මෙහිදී, අපේ ජනමාධ්‍යවල සහ මාධ්‍ය භාවිතය තුළ ජනතාවගේ හැසිරීම පිළිබඳව, ඔවුන්ගේ වගකීම පිළිබඳව පොඩ්ඩක් සාකච්ඡා කරන්න කැමැතියි. මෙවැනි මොහොතක ජනමාධ්‍ය සතුව විශේෂ වගකීමක් තිබෙනවා. එකක් තමයි, නිවැරදි පුවත් වාර්තා කිරීම. ඒ වාගේම ජනතාව කලබල වන, ප්‍රකෝප වන සහ බොරු ප්‍රවෘත්ති - fake news - වාර්තා නොකළ යුතුයි. ජනතාව කලබලයට පත් කරන පුවත් වාර්තා නොකර සිටීම සහ නිවැරදි දත්ත මත පදනම් වෙලා වාර්තා කරන්න පෙළඹීම ජනමාධ්‍යවල වඩාත් වැදගත් වගකීමක්. අපි කියන්නේ නැහැ, එතැනදී overconfident වෙලා, ඔක්කෝම හරි කියලා ජනමාධ්‍ය වාර්තා කරන්න ඕනෑය කියලා. එහෙම ඕනෑ නැහැ. අපි මේ වෙලාවේ ඇත්තටම මුහුණ දීලා තිබෙන අභියෝගය නියමිත තොරතුරු, සත්‍ය තොරතුරු ඇසුරෙන් නිවැරදිව වාර්තා කිරීම, සමබරව වාර්තා කිරීම තමයි මේ මොහොතේ ජනමාධ්‍යවල වගකීම. එහෙම නැතිව ආණ්ඩුව කරන හැම දේම හොඳයි කියන්න ඕනෑය කියා බලාපොරොත්තු වෙන්නේ නැහැ, නිවැරදි ජනමාධ්‍ය කලාවක් තුළ. හැබැයි, පැහැදිලිව ජනමාධ්‍ය සතු වගකීමක් තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් දීලා තිබෙන භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස, අයිතිවාසිකම අවභාවිත නොකර පුවත් වාර්තා කරන්න. මොකද, මූලික අයිතිවාසිකම් යටතේ, භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස, අයිතිවාසිකම දීලා තිබෙන්නේ මහජන සෞඛ්‍ය සදාචාරය, ජාතික ආරක්ෂාව වාගේ විවිධ සීමාකම් එක්කයි. එහෙම නැතිව අත්තනෝමතික ලෙස පාවිච්චි කිරීමේ අසීමාන්තික නිදහසක් කොහේවත් දීලා නැහැ. ඒ නිසා ජනමාධ්‍යයත් ඒ නිදහස සහ ඒ සීමාවන්ට අනිවාර්යයෙන්ම යටත් විය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 මාර්තු 18 දින "Daily Mirror" පුවත් පතේ මුල් පිටුවේ සඳහන් කර තිබෙන කාරණයක් මේ අවස්ථාවේ උපුටා දක්වන්න මා කැමැතියි. ලොකු අකුරෙන් - පොල් ගෙඩි අකුරෙන් - සඳහන් කර තිබෙනවා, "Power cuts - Coming soon?" කියලා. ලොකු ප්‍රශ්නාර්ථ ලකුණකුත් එක්කයි එය තිබෙන්නේ. එහි මෙසේ සඳහන් කර තිබෙනවා:

> "night-time blackouts of up to an hour could soon become routine, while daytime electricity may also face pressure."

> "daily outages could stretch to three or four hours."

දැන් මේගොල්ලන්ගේ තිබෙන මූලාශ්‍රය - source එක - මොකක්ද?

> "An official involved in power generation..."

"An official", එච්චරයි. ඊළඟට මෙසේ කියනවා:

> "experts caution that uninterrupted electricity cannot be guaranteed..."

කවුද, මේ "experts"ලා? කවුරුත් නැහැ. ඕනෑම බොරු ප්‍රවෘත්තියක් හදන්න පුළුවන් මේ experts සහ officials කියන එක යටතේ. වග කිවයුතු ජන මාධ්‍යයක් විධියට මෙහෙම භය කරලා, පොල්ගෙඩි අකුරෙන් මුල පිටුවේ "power cuts" කියලා පළ කිරීම තුළින් බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? විශේෂයෙන් ඉංග්‍රීසි පුවත් පත් මාධ්‍ය භාවිත කරන විදේශීය ආයෝජකයින් ඉන්නවා, වෙනත් රටවලින් අපේ පුවත් බලන අය ඉන්නවා, තානාපති කාර්යාල තිබෙනවා. මේ, භය කරන්නයි මේවා කරන්නේ. වෙන මොනවාටවත් නොවෙයි. හෙට අනිද්දා ලොකු power cut එකක් එනවා. ඒ නිසා අපේ සියලු කර්මාන්ත බිඳ වැටිලා, ආයෝජන නැවතිලා අපේ රට අගාධයට යයි කියන භය ඇති කිරීමේ අරමුණ ඇතිවයි මෙහෙම පුවත් පළ කරන්නේ කියන එක මේ පාවිච්චි කරපු font එකේ size එකෙන්ම පෙනෙනවා. හැබැයි, කිසියම් ආකාරයකට අපිට විදුලිබල ප්‍රශ්නයක් එන්න පුළුවන් කියලා තර්ක කිරීමේ සාධාරණ හැකියාවක් තිබෙන්න පුළුවන්. අපි ඒක පිළිගන්නවා. හැබැයි, එහිදී කාගේ හෝ, experts කියන මේ අඥාත විශේෂඥයින්ගේ - expertsලාගේ - තොරතුරු මත නොවෙයි, ඇත්ත තොරතුරු මත පදනම් වෙලා සත්‍ය වාර්තාකරණයකදී එහෙම argue කරන්න අයිතියක් තිබෙනවා. නමුත්, මේ කරලා තිබෙන්නේ පැහැදිලිවම තමන්ගේ ජඩ මාධ්‍ය භාවිතාවයි කියන එක මා මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කරන්න කැමැතියි.

[ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම සමාජ මාධ්‍ය ගැනත් කථා කරන්න ඕනෑ. මම ඉස්සෙල්ලා කියපු පත්තරය අපේ රටේ ප්‍රධාන මාධ්‍යයක්. ඇත්තටම ඒවා පත්තර නොවෙයි, කැලෑ පත්තර විධියට තමයි අපට පෙනෙන්නේ.

සමාජ මාධ්‍ය ගත්තොත්, සමාජ මාධ්‍යවල දැන් post එකක් දිගටම share වෙනවා. ඒක map එකක්. එහි පෙන්නුම් කරන ආකාරයට ලංකාව වටේ රතු තිත් ගොඩක් - දහස් ගණනක් - තිබෙනවා, ඒ ඔක්කෝම තෙල් නැව්, ලංකාවට සල්ලි නැහැ තෙල් නැව් ටික ගන්න, හැබැයි තෙල් නැව් රට වටේම දහස් ගණනක් තිබෙනවා. මේවා කියන කට්ටිය හිතනවාද දන්නේ නැහැ, බීතෝවන්ගේ music එකක් දාගෙන චුන් පාන් වෑන් යනවා වාගේ තෙල් නැව් ඇවිත් අපේ රට වටේ ඉන්නවා, අපි ඒවාට කථා කරලා "එන්න, එන්න, අපිට තෙල් ටිකක් දෙන්න" කියලා තෙල් ගන්නවා කියලා. මෙවැනි සම්පූර්ණ අසත්‍ය, ද්වේෂසහගත ප්‍රවෘත්ති පළ කරනවා. සමහර අය මේවා copy-paste කරලා උස්සාගෙන යනවා.

ඔක්කෝම කට්ටිය එකතු වෙලා ඊයේ මධ්‍යම රාත්‍රි 12.00ට post එකක් දානවා. අපි හොයලා බැලුවාම, ඒවා කරන්නේ දේශපාලන පක්ෂවලට සම්බන්ධ අය; ඒවායේ තනතුරුත් දරපු අය. "ප්‍රබල ඇමතිවරයෙක් ආරක්ෂක රථ පෙළපාළියක යන කොට ගල් පහරකට ලක් වෙලා" කියලායි ඒ post එකේ දමලා තිබුණේ. පැයක්වත් තියාගන්න බැරි ඒ වාගේ බොරු ගහන්න එපා කියලා අපි ඉල්ලනවා. මොකද, ප්‍රබල ඇමතිවරු ආරක්ෂක රථ පෙළපාළිවල ගිය කාලය තිබුණේ 2024 වර්ෂයට කලින්. 2024 සැප්තැම්බර්වල ඒ සංස්කෘතිය නැවතිලා ඉවරයි. ඇත්තටම මේවා fake news. මහජන කැලඹීමක් ඇති විය හැකි, ප්‍රචණ්ඩත්වය ඇවිස්සිය හැකි මේ වාගේ news ගහලා බලාපොරොත්තු වන අරමුණ කුමක්දැයි අපි හොඳටම දන්නවා.

මේ වෙලාවේ මාධ්‍යවලට තිබෙන වගකීම අතිවිශාල බව මා කියනවා. පෝලිම් ළඟ මයික් අල්ලන එක විතරක් නොවෙයි කළ යුත්තේ. ඊට එහා ගිහින් මධ්‍යස්ථ රටක් ලෙස අප කොහොමද මේ අර්බුදය මේ අවස්ථාවේ කළමනාකරණය කරන්නේ කියන එක ගැන සාකච්ඡා කළ යුතුයි. ආර්ථික ආවේක්ෂණ කමිටුවට අමතරව පසුගිය දවස්වල පත් කර තිබෙනවා, බලශක්ති සුරක්ෂිතතාව, රාජ්‍ය සේවය සහ මෙහෙයුම්, සැපයුම් දාම සහ ආර්ථික වෙළඳ පොළ ස්ථාවරත්වය, ආන්තික සමාජ කණ්ඩායම්වලට ඇති විය හැකි බලපෑම කියන කාරණා හතර අධ්‍යයනය කරන්න කමිටු හතරකුත්. අපි ඒ කාරණා සම්බන්ධයෙන් සමීපව නිරීක්ෂණය කරමින් යනවා; ගෝලීයව ඇති විය හැකි හැම දේශපාලනික සහ ආර්ථික වෙනස්කමක්ම අවධානයට ගන්නවා. අපි දන්නවා, ආර්ථිකයේ යම් හැකිළීම් ඇති වෙන්න පුළුවන් බව. මේ වසර ඇත්තටම ආර්ථිකයේ ලොකු පිම්මක් ගන්න හිටපු වසරක්. 2025 වසරේ "දිට්වා" සුළි කුණාටුව ආවා වුණත් අපි ආර්ථික වර්ධන වේගය සියයට 5 ඉක්මවා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමියනි, කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
මම ඉක්මනින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙවැනි තත්ත්වයන් හමුවේ කිසියම් බලපෑමක් අපේ ආර්ථිකයට එනවා. ඒ නිසා අපි ජනතාවගෙනුත් ඉල්ලනවා, මේ මොහොතේ තමන් සතු වගකීම තේරුම් ගන්න, පෙට්‍රල් ෂෙඩ් හිමියන්ට විතරක් නොව ඔබටත් වගකීමක් තිබෙනවා, තිබෙන තෙල් ටික ඔක්කෝම ගහගන්නේ නැතුව QR code එක පාවිච්චි කරලා අරපිරිමැස්මෙන් තෙල් ටික පරිහරණය කරන්න. අපි system එකක් හදා දීලා තිබෙනවා. ඒ system එක හරියට ක්‍රියාත්මක කරමින්, කලබල නොවී, මේ මොහොතේ ඇති විය හැකි අවදානම, අභියෝගය ගැන තේරුම් ගනිමින් හැසිරෙන්න කියලාත් අපි ජනතාවගෙන් කාරුණිකව ඉල්ලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසන් කරන්න මට තව තත්පර 10ක් දෙන්න. The true measure of a society is not how it behaves in times of comfort, but how it stands together during a crisis.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එරංග වීරරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.24]

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විපක්ෂය විසින් ගෙනෙන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට අදාළ විවාදයේ ප්‍රධාන මාතෘකාව වෙලා තිබෙන්නේ අපේ රට අර්බුදකාරී තත්ත්වයකට පත් වෙලා තිබෙනවා කියන එකයි. නමුත් මම පැහැදිලිව කියන්න කැමැතියි එය එසේ නොවන බව. මීට ඉස්සෙල්ලා කථා කළ අපේ කථිකයන් බොහෝ දෙනෙකුත් එය පැහැදිලිව කිව්වා. මේ රට මේ වන විට අර්බුදයකට ලක් වෙලා නැහැ. අර්බුදයකට ලක් වෙලා නැහැ කියන්නේ, මෙන්න මේ හේතුව නිසා. අපි දැක්කා 2022 වර්ෂයේදී මේ රට අර්බුදයකට පත් වුණු බව. එහෙම වුණේ, මේ රටේ පාලනයේ තිබුණු බොහෝ අක්‍රමිකතා නිසා. ඒ නිසාම එදා මේ රටේ තිබුණු විදේශ විනිමය ප්‍රමාණය නැති වෙලා ගියා. ඒ වාගේම, දේශීයව තිබුණු සංචිතත් නැති වෙලා ගිහිල්ලා, භාණ්ඩාගාරය හිස් වෙලා කර කියා ගන්න දෙයක් නැති තත්ත්වයට පත් වුණා. ඒ ඔස්සේ ආපු තවත් යෝජනා නිසා රට තවත් අගාධයට යන තත්ත්වයට පත් වුණා. උදාහරණයක් විධියට ගන්න පුළුවන්, මුදල් අච්චු ගැසීම. මුදල් අච්චු ගැසීම නිසා අපේ inflation එක ගොඩක් වැඩි වුණා. ඒ වාගේ වැරදි තීරණ නිසා ඕනෑම රටක් අර්බුදයට ලක් වෙන්න පුළුවන්. නමුත් මේ වෙලාවේ අපේ රට තිබෙන්නේ එහෙම වැරදි තීරණ අරගෙන රට බංකොලොත්භාවයකට පත් වෙච්ච තත්ත්වයක නොවෙයි. මේ වෙලා තිබෙන්නේ, ලෝකයේ යම්කිසි අර්බුදකාරී තත්ත්වයක් මතු වෙලා තිබීමයි.

මොකද, මැද පෙරදිග තිබෙන යුද්ධමය වාතාවරණය ඔස්සේ ලෝකයේ තෙල් ප්‍රවාහනයට බාධා ඇති වෙලා තිබෙනවා; තෙල් නිෂ්පාදනයට, බෙදා හැරීමට සහ සපයන්නන්ට බාධා ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම, ලෝකයේ හැම රටකම තෙල් ඉල්ලුම වැඩි වීම නිසා තෙල් මිල ගණන්වල සැහෙන වෙනසක් වෙලා තිබෙනවා. ඉතින් අපේ රටටත් එය බලපානවා. නමුත් අපේ රටට

මේ වෙලාවේ තෙල් මිල දී ගන්න බැරි ප්‍රශ්නයක් නැහැ. මොකද, අපේ රටේ විදේශ විනිමය අවශ්‍ය ප්‍රමාණයට තිබෙනවා. අපේ රටේ භාණ්ඩාගාරයට රුපියල් තිබෙනවා. අපට තෙල් ලබා ගැනීමේ අපහසුවක් නැහැ. එකම ප්‍රශ්නය වී තිබෙන්නේ, අප තෙල් ලබා ගන්න කොට දැන් ගන්න ප්‍රමාණයට වඩා කොච්චර ප්‍රමාණයක් premium විධියට දීලාද ගන්නේ කියන එකයි. තිබෙන තෙල් සංචිත පුළුවන් තරම් ඉතිරි කරගෙන, අපේ ආර්ථිකයට ඒකෙන් බලපෑමක් ඇති නොවන විධියට කළමනාකරණය කර ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ තමයි රජය මේ ගෙනැල්ලා තිබෙන්නේ.

කවුරු හරි කියනවා නම්, අර්බුදයක් ඇවිල්ලා තිබෙනවා, මේ රට කඩාගෙන වැටෙන්න යනවා කියලා, නිෂ්පාදනය සහ ආර්ථිකය නැවතිලා කියලා, ඒක තනිකරම වැරැදි විග්‍රහයක්. එහෙම තත්ත්වයක් ඇති වෙලා නැහැ. නමුත් මා හිතන විධියට, ඒක තමයි සමහරුන්ට පෙන්වන්න ඕනෑ වෙලා තිබෙන්නේ. මොකද, ඔවුන් සසඳන්න හදන්නේ 2022දී උද්ගත වෙච්ච තත්ත්වය සමඟයි. 'ඒ තත්ත්වයම අදත් උද්ගත වෙලා තිබෙනවා, අපි වාගේම තමයි මෙයාලත්' කියනවා වාගේ දෙයක් තමයි විපක්ෂය අද පෙන්වන්න හදන්නේ. නමුත් ඒක එහෙම නොවෙයි. අපි මේ තත්ත්වය කළමනාකරණය කරනවා. මොකද, මේ වත්මන් ලෝක අර්බුදය මතු වෙලා දැනට සති දෙකයි දවස් කිහිපයක් විතරයි ගත වෙලා තිබෙන්නේ. මේ තත්ත්වය මුලින්ම දැකපු වෙලාවේ ඉඳන් අපි යම්කිසි කාලයක් නිරීක්ෂණය කළා, මේ ලෝකයේ වාතාවරණය ඉදිරියට කොහොමද නිර්මාණය වෙන්නේ කියලා. ඒක ගැන අප කාටවත් සියයට 100ක් කියන්න බැහැ. මේ ලෝකයේ රටවල් අතර යුද්ධයක් ඇති වුණාම ඒක ලෝක ආර්ථිකයට කොහොම බලපායිද, ඒ වාගේම ඒ රටවල් අතර තිබෙන යුද්ධය කොච්චර කාලයක් ඉස්සරහට යයිද, එය ඉක්මනට ඉවර වෙයිද කියන එක හරියටම කියන්න බැහැ. නමුත් ඒ ගැන හරියාකාරව නිරීක්ෂණය කරලා, අපේ රටට අවශ්‍ය තීරණ අරගෙන, ඒකට වැඩ පිළිවෙළක් ගෙනෙන එක තමයි රජයකින් වෙන්න ඕනෑ. ඒක අපේ රජය මේ දක්වා ඉතා හොඳින් කරලා තිබෙනවා. මින් ඉදිරියටත්, පවත්නා තත්ත්වය හරි හැටි නිරීක්ෂණය කරමින්, අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යෑම තමයි අපේ බලාපොරොත්තුව වී තිබෙන්නේ.

ලෝකයේ තෙල් ප්‍රවාහනයට සහ තෙල් සැපයුමට යම්කිසි බාධාවක් වෙලා තිබෙන නිසා අපි දැන් යම්කිසි ක්‍රමවේදයක් ගෙනැල්ලා තිබෙනවා මේ වෙලාවේ තෙල් ටික කළමනාකරණය කර ගන්න. මම ඉස්සර වෙලාත් කියපු විධියට අපට සංචිත ප්‍රමාණවත්ව තිබෙනවා. නමුත් අපි ඒවා සුරක්ෂිතව, නිසි ක්‍රමවේදයක් ඔස්සේ, අරපිරිමැස්මෙන් පාවිච්චි කරන්න ඕනෑ. අපි ඒ සඳහා දැන් QR Code එක ගෙනැල්ලා තිබෙනවා. ඒක ගෙනැල්ලා දැන් පස්වැනි දවස යන්නේ. පස්වැනි දවස වනකොට අපි එහි තිබුණු සියලු ගැටලු නිරාකරණය කරලා, එය හොඳට ක්‍රියාත්මක කරන තත්ත්වයට අරගෙන තිබෙනවා. මම පිළිගන්නවා, පසුගිය දවස් කිහිපයේ එහෙත් මෙහෙත් යම්කිසි අඩුපාඩු තිබුණා කියලා. නමුත් විශාල පිරිසක් system එක පාවිච්චි කරලා තෙල් ලබා ගත්තා. අද වනකොට ඒ තිබුණු අනෙකුත් අඩුපාඩුකම් ටිකත් නැති කර දමලා, අපි ඒ පද්ධතිය ඉතාම හොඳ මට්ටමට ගෙනැල්ලා තිබෙනවා.

මම දැන් යම්කිසි දත්ත ටිකක් ඉදිරිපත් කරන්නම්. අද පස් වරු 12.50 වනකොට ඒ පද්ධතිය තුළ එක එක විධියේ වාහන 5,505,732ක් register කරලා තිබෙනවා. ඒ අනුව ඒ යටතේ ලියාපදිංචි වන වාහන සංඛ්‍යාව ඉතාම ශීඝ්‍රයෙන් වැඩි වෙමින් යනවා. ඒ අය මේ පද්ධතිය හරහා තෙල් සපයා ගැනීම කරනවා. මාර්තු 15වන දා අලුතෙන් ලියාපදිංචි වෙච්ච වාහන සංඛ්‍යාව 42,899ක් වුණා. ඒක ක්‍රමයෙන් වැඩි වෙලා ගියා. 17වන දා, වාහන 395,349ක් ලියාපදිංචි වෙලා තිබුණා. ඒ වාගේම ඊයේ -ඒ කියන්නේ 18වන දා- වාහන 301,463ක් ලියාපදිංචි වෙලා තිබුණා. ඒ වාගේම අද ගත්තාම, මධ්‍යම රාත්‍රී 12.00 ඉඳලා දහවල් 12.50 වනකොට වාහන 302,168ක් අලුතෙන් register කරලා තිබෙනවා. ඉතින් මේකෙන් පෙනෙන්නේ මොකක්ද? අද දවස ඇතුළත අලුතෙන් වාහන ලක්ෂ පහක හයක ප්‍රමාණයක් register කරනවා කියන එකයි. ඒ වාගේම ඒකෙන් පෙනෙන්නේ, තිබුණු ගැටලුත් නිරාකරණය වෙලා දැන් පද්ධතිය හරියට වැඩ කරනවා කියන එකයි.

මෙහි තිබුණු ගැටලුව මොකක්ද? මම ඊයේත් ඒ ගැන සඳහන් කළා. ඩිජිටල් පද්ධති විශාල ප්‍රමාණයක් සම්බන්ධ වෙලා තමයි මේ QR පද්ධතිය ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා ඒ පද්ධතියේ ඉස්සර වෙලා register වෙච්ච QR කේත ඒ විධියටම පාවිච්චි කරන්න අපි තීරණය කළා. නමුත්, සමහර කේත තිබුණා, ඒවා නිර්මාණය කළ පුද්ගලයන්ට වාහනයේ වර්තමාන අයිතිකරු එක්ක දැන් වන විට කිසිම සම්බන්ධයක් නැති.

ඔහු ඈත් වෙලා ඉන්නේ. ඒ නිසා කිසිම විධියකට අලුත් අයිතිකරුට අලුත් කේතයක් හදාගන්න හැකියාවක් තිබුණේ නැහැ. නමුත්, අපි අද පාන්දර 12.00 සිට ඒකට අලුත් වැඩ පිළිවෙළක් ගෙනැත් තිබෙනවා. වාහනයේ අලුත් අයිතිකරුට - වර්තමාන අයිතිකරුට - තමන්ගේ වාහන අංකයත්, චැසි අංකයත් system එකට ඇතුළත් කළාට පස්සේ ඒ දත්ත නිවැරදි නම් පැරණි දත්ත - ඒ කියන්නේ 2023දී ඇතුළත් කළ දත්ත - මකලා තමන්ගේ නමට මේ QR කේතය update කරගන්න පුළුවන්. ඒ හරහා ඔහුට අද දවස ඇතුළත ඉන්ධන ලබාගන්න කටයුතු කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපි ගෙනැත් තිබෙනවා ඔත්තේ, ඉරට්ටේ අංක අනුව ඉන්ධන නිකුත් කිරීමේ ක්‍රමය. මොකද, මේ වාගේ තත්ත්වයක් ආවාම සාමාන්‍ය සිරිතක් හැටියට අපේ ජනතාව කලබලයට පත් වෙනවා. ඔවුන් පුළුවන් තරම් ඉක්මනට පෝලිමේ ඉස්සරහටම ගිහිල්ලා තෙල් ලබා ගන්න හදනවා. අපේ ඉන්ධන ටැංකියේ අඩු ලීටර් 5ක් නම්, තව දවස් 2ක් ගිහිල්ලා ඒක ගහගන්නවා කියලා ඔවුන් හිතන්නේ නැහැ. ඔවුන් බලන්නේ, අදම පෙට්‍රල් ෂෙඩ් එකට ගිහිල්ලා ඒ ලීටර් 5ත් ගහගන්න. මොකද, ඔවුන්ට යම් කිසි බයක් තියෙන්න පුළුවන්. ඒ නිසා ඔවුන් හිතනවා, අපේ වැඩකටයුතු කරගෙන යන්න ඕනෑ, තව කාටවත් ඒකෙන් හිරිහැරයක් වුණාට කමක් නැහැ කියලා. නමුත්, අපි මේ ඔත්තේ ඉරට්ටේ විධියට ඉන්ධන නිකුත් කිරීම නිසා ෂෙඩ්වලට එන පිරිස දෙකට බෙදෙනවා. එතකොට ඔත්තේ දවස්වල එක් කණ්ඩායමක් එනවා, ඉරට්ටේ දවස්වල අනෙක් කණ්ඩායම එනවා. නමුත්, මම අර ඉස්සරවෙලා කියපු විධියට යම්කිසි පුද්ගලයෙකුට තමන්ගේ QR කේතය හදාගන්න බැරිකමක් තිබුණා නම්, ඔත්තේ ද, ඉරට්ටේ ද කියන එක බලන්නේ නැතිව අද දවසේ ඔවුන්ට ඉන්ධන ලබා දෙනවා කියන එකත් අපි සහතික කරලා තිබෙනවා. ඒ අනුව, කාට හෝ මේ දක්වා QR කේතය හදාගෙන ඉන්ධන ලබාගන්න බැරි වුණා නම්, අද දවස ඇතුළත ඔවුන්ටත් ඉන්ධන ලබාගන්න පුළුවන්. අද දවස ඔත්තේ දවසක් නිසා කලින් ඉන්ධන ලබාගත් ඉරට්ටේ දවසට අදාළ කෙනෙක් නම් අනිවාර්යයෙන් ඔහුට හෙට වෙනකල් ඉන්න වෙනවා ඉන්ධන ලබාගන්න. කවුරු හෝ මීට පෙර ඉන්ධන ලබා නොගත් කෙනෙක් ඉන්නවා නම්, ඔහු ඉරට්ටේ දවසට අදාළ කෙනෙක් වුණත් අද දවස ඇතුළත ඉන්ධන ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. මේ දවස්වල මේ කේතයට register වෙනකොට සාමාන්‍යයෙන් පැයකට 33,000ක් වාගේ තමයි අලුතින් register වෙන්න ආවේ. අද දවස ගත්තාම, පැයකට 55,000කට වැඩි වාහන ප්‍රමාණයක් register වෙනවා. ඒ අනුව, ඒ පද්ධතිය ඉතාම හොඳට වැඩ කරන ආකාරයට අපි හදලා තිබෙනවා.

[ගරු එරංග වීරරත්න මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ තත්ත්වයක් තුළ අපි දකින දෙයක් තිබෙනවා. ඒ කියන්නේ, ඉන්ධන ලබා දීමට මේ වාගේ ක්‍රමානුකූල සැලැස්මක් ගෙනැල්ලා තිබෙන අවධියක වුණත්, සමහර පුද්ගලයන් ඉන්නවා මේ අවස්ථාවෙන් වාසි ගන්න උත්සාහ දරන. අපි දැක්කා, ඔවුන් එක් එක් fake websites හදාගෙන වාහනවල තොරතුරු එක්රැස් කරන්න හදනවා. උදාහරණයක් විධියට කිව්වොත්, fuelpass.invitation.online කියන website එක හදාගෙන පුද්ගලයෙක් හෝ යම් කණ්ඩායමක් උත්සාහ දරමින් සිටියා, වාහන අංක, chassis numbers, වාහන අයිතිකාරයන්ගේ mobile numbers වාගේ දේවල් එකතු කරන්න. අපි ඒක නිරීක්ෂණය කළා. අපි පුළුවන් තරම් ඉක්මනට ඒ website එක වහන්න කටයුතු කළා. ඒ වාගේම, ඒ website එක ක්‍රියාත්මක කළ පුද්ගලයන්ගේ දත්ත පවා අපි දැන් එකතු කරගෙන තිබෙනවා. ඔවුන් කොහේ සිටද වැඩ කරන්නේ කියලා හොයාගෙන තිබෙනවා. ඒ අයට අපි නීතිමය ක්‍රියාමාර්ග ගන්නවා. මේ වාගේ අවස්ථාවාදීන්ට, අවස්ථාවෙන් ප්‍රයෝජන අරගෙන අනෙක් මනුෂ්‍යයන්ට කරදර කරන, දත්ත සොරාගෙන මේ වාගේ QR කේත හදාගෙන තවත් කෙනෙකුට අයිති ඉන්ධන ලබාගන්න උත්සාහ දරන්නන්ට විරුද්ධව අපි දැඩි නීතිමය ක්‍රියාමාර්ග ගන්නවා.

ඒ වාගේම අපි විශ්ලේෂණය කරලා තිබෙනවා දැන් වෙනකොට සමහරු QR කේත හදලා තිබෙනවා කියලා. අපි ඒ වාගේ අයගේ list එකක් අරගෙන තිබෙනවා. ඒ වාගේ වැරදියට QR කේත හදපු කණ්ඩායම් මේ වාගේ තත්ත්වයකදීත් උත්සාහ කරන්නේ කුමක් සඳහාද? ඉන්ධන අරගෙන, ඉන්ධන පිරිමසාගෙන වැඩ කරන්න ඕනෑ අවස්ථාවක, ඉන්ධන ක්‍රමානුකූලව බෙදාහරින්න ඕනෑ අවස්ථාවක සුළු පිරිසක් ඒ විධියට ඉන්ධන ලබාගෙන ගබඩා කරගෙන වැඩි මිලට විකුණන පරිසරයක් හදාගන්න උත්සාහ ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වන විට අපි ඔවුන්ගේ numbers ඔක්කෝම පොලීසියට දීලා තිබෙනවා, මේ ගැන investigate කරන්න කියලා. ඔවුන් සම්බන්ධවත් දැඩි ක්‍රියාමාර්ග ගන්නවා. මොකද, අපට අවශ්‍ය මේ රටේ පුරවැසියන්ගේ ජීවිකාව සාමාන්‍ය ආකාරයට ගෙනයන්න, ඔවුන්ගේ ව්‍යාපාර හරියට ගෙනියන්න අවශ්‍ය වන ආකාරයට ඉන්ධන බෙදා හැරීම් කටයුතු සිදු කිරීමටයි. එහෙම නැතිව මේ ආකාරයට අවස්ථාවාදීව කටයුතු කිරීමට අපි ඉඩ ප්‍රස්ථා නොදිය යුතුයි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.35]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ கல்வி அமைச்சர் அவர்களே, தற்போது அரசாங்கம் முன்னெடுத்துவரும் கல்வி மறுசீரமைப்பு வரவேற்கத்தக்க ஒரு விடயமாகும். நிருவாக மறுசீரமைப்பும் கல்வியில் அவசியமாக ஏற்படுத்தப்பட வேண்டிய ஒன்றாகும். அவ்வாறானதொரு நிருவாக மறுசீரமைப்பு மேற்கொள்ளப்படுவதற்கு முன்னர், பொத்துவில் மக்களின் நீண்டகாலக் கோரிக்கையான தனியானதொரு வலயக் கல்வி அலுவலகம் அமைக்கப்படுதல் வேண்டும். இலங்கையில் மொத்தமாக 100 கல்வி வலயங்கள் காணப்படுகின்றன. இந்நிலையில் இக்கோரிக்கையானது, வெறுமனே கட்டடங்களாலான அலுவலகம் ஒன்றைப் பொத்துவிலில் அமைப்பதற்கான கோரிக்கை அல்ல. பல்லாயிரக்கணக்கான மாணவர்கள் சார்பாகவும் நூற்றுக்கணக்கான ஆசிரியர்கள் சார்பாகவும் மூவின மக்கள் சார்பாகவும் இதயசுத்தியோடு முன்வைக்கின்ற மிகவும் நியாயபூர்வமான கோரிக்கையாகும். இரு தசாப்தங்களாக குறித்த கோரிக்கை முன்வைக்கப்பட்டு வருகின்றது.

பொத்துவில், கிண்ணியா, கோமரங்கடவல ஆகிய கோட்டங்கள் நிதி கையாளுகையுடன் செயற்பட்டன. பின்னர் 2008 காலப்பகுதியில் கிண்ணியா கோட்டமும் கோமரங்கடவல கோட்டமும் வலயங்களாகத் தரமுயர்த்தப்பட்டன. ஆனால், பொத்துவில் கோட்டம் இன்னும் வலயமாகத் தரமுயர்த்தப்படவில்லை. இது ஏற்கனவே வழங்கப்பட்ட நிதி கையாளுகை அதிகாரமும் இழந்த கோட்டமாகவே செயற்பட்டுக்கொண்டு இருக்கின்றது. கல்வியின் நோக்கம், தேசிய ஒருமைப்பாட்டை ஏற்படுத்துவதும் இனங்களுக்கிடையே ஐக்கியத்தைக் கட்டியெழுப்புவதும் ஆகும். ஆனால், எமது பொத்துவில் பிரதேசத்தில் அமைந்திருக்கின்ற பாடசாலைகள் இன ரீதியாக வேறுபடுத்தப்பட்டிருப்பது எனக்கு மிகவும் மனவேதனையை அளிக்கின்றது.

முஸ்லிம் பாடசாலைகள் அக்கரைப்பற்று வலயத்துக்கும் தமிழ் பாடசாலைகள் திருக்கோவில் வலயத்துக்கும் சிங்களப் பாடசாலைகள் அம்பாறை வலயத்துக்கும் பிரித்தெடுக்கப்பட்டுள்ளன. ஒரு கிலோமீற்றர் தூர எல்லைக்குள் அமைந்திருக்கின்ற முஸ்லிம் பாடசாலைகள் அக்கரைப்பற்று வலயத்தைச் சேர்ந்ததாம். அதன் அருகாமையிலுள்ள தமிழ் பாடசாலைகள் திருக்கோவில் வலயத்தைச் சேர்ந்ததாம். அதன் அருகாமையிலுள்ள சிங்களப் பாடசாலைகள் அம்பாறை வலயத்தைச் சேர்ந்ததாம். மூன்று வகையான பாடசாலைகளும் ஒரு கிலோமீற்றர் தூரத்துக்குள் அமைந்திருக்கின்றபோது, ஏன் மூன்று வலயங்களுக்குப் பிரிக்கப்பட்டன? பொத்துவில் மற்றும் லகுகல பிரதேச செயலக எல்லைக்குள் அமைந்திருக்கின்ற முஸ்லிம், தமிழ், சிங்களப் பாடசாலைகள் அனைத்தையும் புவியியல் ரீதியாக இணைத்து, தனியான வலயக் கல்வி அலுவலகம் ஒன்றை பொத்துவிலில் அமைப்பதன்மூலம் மூவின மாணவர்களும் ஆசிரியர்களும் பயன்பெற முடியும். இன, மத ரீதியில் பிரிக்கப்பட்டுள்ள வலயக் கட்டமைப்புகளை தற்போதைய அரசாங்கம் பரிசீலித்து, பொத்துவிலுக்கான தனியான வலயக் கல்வி அலுவலகத்தை வழங்குமாறு கௌரவ கல்வி அமைச்சரிடம் மன்றாட்டமாக கேட்டுக் கொள்கின்றேன்.

2008ஆம் ஆண்டு பொத்துவிலுக்கான தனியான வலயக் கல்வி அலுவலகத்துக்கான கோரிக்கை முன்வைக்கப்பட்டு இன்னும் நிறைவேற்றப்படாத நிலையில், இடைப்பட்ட காலப் பகுதியில் பல வலயக் கல்வி அலுவலகங்கள் உருவாக்கப்பட்டுள்ளமை எவ்வகையில் நியாயமாகக் கருத முடியும்? பொத்துவிலில் காணப்படுகின்ற சிங்களப் பாடசாலைகள் சேவைகளைப் பெற்றுக்கொள்ள 70 கிலோமீற்றர் தூரத்துக்கு அப்பாலுள்ள அம்பாறை வலயத்துக்குச் செல்கின்றன. அதேபோல், பொத்துவிலில் காணப்படுகின்ற முஸ்லிம் பாடசாலைகள் சேவைகளைப்

பெற்றுக்கொள்ள 45 கிலோமீற்றர் தூரத்துக்கு அப்பாலுள்ள அக்கரைப்பற்று வலயத்துக்குச் செல்கின்றன. அதேபோல், பொத்துவிலில் காணப்படுகின்ற தமிழ் பாடசாலைகள் சேவைகளைப் பெற்றுக்கொள்ள 35 கிலோமீற்றர் தூரத்துக்கு அப்பாலுள்ள திருக்கோவில் வலயத்துக்குச் செல்கின்றன. பொத்துவில் பிரதேசத்தில் தனியான வலயக் கல்வி அலுவலகம் ஒன்று அமைக்கப்படும்போது, மூவினப் பாடசாலைகளும் உச்ச பயன்பெறும். மேற்படி வலயக் கல்வி அலுவலகங்களின் கல்விசார் உத்தியோகத்தர்களின் நெருக்கமான மேற்பார்வையையும் வழிகாட்டலையும் பொத்துவிலில் அமைந்திருக்கின்ற பாடசாலைகள் பெற்றுக்கொள்வதில் வலயக் கல்வி அலுவலகம் அமைந்திருக்கின்ற தூரம் தடையாக அமையும். இது எமது மாணவர்களின் கல்வி அடைவில் பாதிப்பை ஏற்படுத்துகின்றது.

அரசியலுக்கு அப்பால், எமது நீண்டகால கோரிக்கையிலுள்ள நியாயங்களை ஆராய்ந்து, பொத்துவிலுக்கான தனியான வலயக் கல்வி அலுவலகத்தை அமைத்துத் தருமாறு அன்பாகக் கேட்டுக் கொள்கின்றேன். பாடசாலைகள் குறைந்த எண்ணிக்கையில் காணப்படுகின்றன என்ற நியதியைச் சுட்டிக்காட்டி, எமது நியாயமான கோரிக்கையை நிராகரித்துவிடாமல், எமது கோரிக்கையின் பின்னால் இருக்கின்ற விசேட நியாயங்களைக் கருத்திற்கொண்டு, இக்கோரிக்கையைச் சாதகமாகப் பரிசீலிக்குமாறு தயவாகக் கேட்டுக் கொள்கின்றேன். இவ்வாறு பொத்துவில் பிரதேசத்தை மையப்படுத்தி உடனடியாகத் தனியான வலயக் கல்வி அலுவலகம் ஒன்றை அமைக்கும்போது, அதனை நடாத்திச் செல்வதற்கு எமது பிரதேசத்தில் காணப்படுகின்ற பௌதிக மற்றும் மனித வளத்தைப் பயன்படுத்த முடியும்.

கௌரவ கல்வி அமைச்சர் அவர்களிடம் தனியான வலயக் கல்வி அலுவலகத்துக்கான கட்டிடத்தை நான் ஒருபோதும் கோரவில்லை. எமது பிரதேசத்தின் கல்வி மறுமலர்ச்சிக்காகவும், எமது சமூகத்தின் நீண்டகால நியாயமான கோரிக்கைக்காகவும், அனைத்து இன மக்களும் ஒன்றாகக் கற்க வேண்டுமெனும் கல்வியின் உன்னத நோக்கத்துக்காகவும், எமது பொத்துவில் பிரதேசத்துக்கென தனியான வலயக் கல்வி அலுவலகத்தை அவர் வழங்குவாரென உறுதியாக நம்புகின்றேன். இந்தக் கோரிக்கையை கௌரவ கல்வி அமைச்சர் அவர்கள் நிறைவேற்றும்போது, பொத்துவிலில் வாழுகின்ற அனைத்து இனத்தைச் சேர்ந்த மாணவர்களினதும் அழகிய எதிர்காலத்துக்கு அத்திவாரமிட்ட பெருமை என்றும் அவரைச் சாருமென இவ்வுயரிய சபையில் பதிவுசெய்து கொள்கின்றேன்.

பொத்துவிலின் புத்திஜீவிகளான, (V.C.) M.L.A. Cader, Dr. Z.A. Habeeba, Dr. Saheed, Eng. Seguthavuthu Abthul Carder, Dr. Sifaya Cader, M.M. Ibrahim, M.L.M.A. Cader, A.A. Azeez, A.M. Azeez, S.A.A. Munasudeen - Lawyer, Dr. M.H. Haroon, K.R.M Saheed - Engineer, A.M. Nijamudeen, A.A. Mohamed, M.C.M. Samsudeen, P.M. Meeralevvai, M.L. Kalander Levvai, M.I.M. Sheriff, S.H. Sheriff, A.M. Casim Khan, M.M. Hanifa, A.L.M.S. Arifeen, A.C. Latheef, S.A. Cader, J. Kalander, M.I.M. Hanifa, M.H. Nawaz, A.L.M. Nizar ஆகியோருக்கு அப்பிரதேச மக்கள் சார்பாக இந்த உயரிய சபையில் எனது நன்றிகளைத் தெரிவித்துக்கொள்கின்றேன். மேலும், Pottuvil Townஇலுள்ள ரஹ்மானிய்யா பள்ளிவாசலை புதிதாகக் கட்டுவதற்கு ஆர்வம் காட்டியிருக்கின்ற Alhaj M.S.M. Anzar, A. Badurkhan, Y.B. Aliyar, M.B.M. Ismail, Rizwan, U.P. Azanar, M.L. Imran உட்பட குழுவினருக்கும் எனது மனமார்ந்த நன்றிகளை இந்த உயரிய சபையில் தெரிவித்துக் கொள்கின்றேன்.

ஆலையடிவேம்பு பிரதேச செயலாளர் பிரிவில் பொது மக்களுக்குச் சிறப்பான சுகாதார சேவையை வழங்கி வருகின்ற பனங்காடு வைத்தியசாலையில் பாரிய ஆளணிப் பற்றாக்குறை ஏற்பட்டுள்ளது. காரணம், புதிய ஆளணி ஏற்படுத்தப்பட்டு அனுமதிக்கப்படாமையே ஆகும். எனவே, அரசானது விரைவாக பனங்காடு வைத்தியசாலைக்கான ஆளணியை ஏற்படுத்தி, சிறந்த சுகாதார சேவையை வழங்குவதற்கு ஆவன புரிய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். பொத்துவில் ஆதார வைத்தியசாலையில் சீன அரசாங்கம் மூலமான கட்டிடத்தை அமைப்பதற்கு தனது சொந்த நிலத்தின் ஒரு பகுதியை இனாமாக வழங்கிய M.I.M. Lafeer, M.L.M. Siyath, M.S.A. Wareeth, M.S.M. Ashraff ஆகியோருக்கு பொது மக்கள் சார்பில் எனது நன்றியை இந்த உயரிய சபையில் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தற்போது நடைமுறைப்படுத்தப்பட்டுள்ள QR குறியீட்டு முறைமைமூலம் விவசாயிகள் பயன்படுத்துகின்ற machinesக்கு per weekக்கு 30 லீற்றர் டீசல் மாத்திரமே வழங்கப்படுகின்றது. இது ஓர் ஏக்கர் நிலத்தைப் பண்படுத்த மட்டுமே போதுமானது. தினமும் சுமார் 75 லீற்றர் டீசல் தேவையாக இருக்கின்றது. கரையோரப் பிரதேசங்களில் பொத்துவில் உட்பட அநேகமான பகுதிகளில் விவசாய நடவடிக்கைகள் ஆரம்பிக்கப்பட்டு இருப்பதால், இது விடயமாக அரசு தீர்மானங்களை மேற்கொண்டு, டீசலின் அளவை அதிகரித்து வழங்குவதற்கு ஆவன புரிய வேண்டும். மேலும், கிருமிநாசினி, பசளை என்பவற்றையும் அரசானது விரைவாக இறக்குமதி செய்து வழங்குவதன்மூலம் எமது நாட்டின் விவசாய உற்பத்தியை அதிகரிக்க முடியுமென நம்புகின்றேன்.

பொத்துவில் பிரதேச செயலாளர் பிரிவின் கோமாரி 60ஆம் கட்டை எனும் இடத்தில் பல ஆண்டுகளாகப் பயிர்ச்செய்கை செய்துவந்த சுமார் 75 குடும்பங்களது காணிகள் யுத்தம் காரணமாக செய்கை பண்ணப்படாமல் விட்டதால், ஒவ்வோர் ஆண்டும் வனப் பகுதியினரது அனுமதியைப் பெற்றே பயிர்ச்செய்கை செய்யவேண்டி உள்ளது. எனவே, அரசானது பிரதேச செயலக மட்டத்தில் இது விடயமாக கலந்துரையாடி, குறித்த காணிகளில் மேட்டு நிலப் பயிர்ச்செய்கையை மேற்கொள்ள நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். அப்பகுதியின் சபை உறுப்பினர்களான ரீ. சுபோதரன், ரீ. புனிதன், எம். துரைரட்ணம், ஏ.எஸ். மஹ்ரூப் ஆகியோருக்கு அப்பகுதி மக்கள் சார்பாக எனது நன்றிகளை இந்தச் சபையில் தெரிவித்துக் கொள்கின்றேன்.

1990ஆம் ஆண்டு காலப் பகுதியிலும் அதன் பின்னரும் பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் கடமைபுரிந்து மக்களுக்குப் பூரணமான சேவைகளைச் செய்து மரணித்த மற்றும் தற்போது ஓய்வுபெற்றுள்ள பின்வரும் கிராம உத்தியோகத்தர்களுக்கு இந்த உயரிய சபையில் அப்பிரதேச மக்கள் சார்பாக என்னுடைய மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன். A.H.A. Wahhab, Z.A.M. Hanifa, M.C.M. Aboobucker, M.I.A. Jabbar, N.M. Ishak, M.I.M. Samsudeen, Y.M.S.A. Moulana, M.A.M. Moosalebbe, A. Sathanantham, P. Kanthasamy, H.M. Hanifa, M.I.M. Samsudeen, M.M.A. Majeed, M.I.A Azeez, M.A.C.A. Azeez, A. Alifkhan, A.R.S. Faiz Aly, A.M. Jamaldeen, M.L. Abul Hasan, K.R.M. Hasim, M.I. Thajudeen, I.L. Subair, M.S.M. Rizvy, R. Gunaseelan, M.H.A. Azeez, S. Sivenesan, N. Jayakumar, M. Manoharan, M.A.A. Kuthoose.

[ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා]

கடந்த காலங்களில் கிராம உத்தியோகத்தர்களுக்கு மாதாந்தம் 20 லீற்றர் petrol வழங்கப்படுமென கூறப்பட்டிருந்தது. ஆனால், அது நடைமுறைப்படுத்தப்படவில்லை. 2019ஆம் ஆண்டு கிராம உத்தியோகத்தர்களுக்கான விண்ணப்பம் கோரப்பட்டபொழுது, தரம் IIக்கு என்றே அறிவிக்கப்பட்டிருந்தது. ஆனால், நியமனமானது தரம் III என்ற அடிப்படையில் வழங்கப்பட்டதால் சம்பளம், கொடுப்பனவுகளில் அநீதி இழைக்கப்பட்டுள்ளது. களப் பணிகளில் அதிகம் ஈடுபடும் இவர்களுக்கு மோட்டார் சைக்கிள்களை வழங்குவதற்கு அரசு நடவடிக்கை எடுக்க வேண்டும். கிராம உத்தியோகத்தர்களது சேவைப் பிரமாணக் குறிப்பில், சேவையின் அடிப்படையில் SLAS பரீட்சைக்குத் தோற்றும் ஏலவே இருந்த நடைமுறை மீண்டும் ஏற்படுத்தப்பட வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். அதுமாத்திரமன்றி, ஏற்பட்டிருக்கின்ற கிராம உத்தியோகத்தர் வெற்றிடங்களையும் அவசரமாக நிரப்புவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව සුළු වෙලාවක් දෙන්න.

நாவிதன்வெளி பிரதேச செயலாளர் பிரிவில் ஒரு மைதானத்தை அமைக்கவேண்டிய அரச நிலமானது அத்துமீறிப் பிடிக்கப்பட்டுள்ளது. பிரதேச செயலாளர்மூலம் அதனை இனங்கண்டு, அந்த நிலத்தை மீளப்பெற்று, விளையாட்டு மைதானத்தை அமைத்து வழங்க நடவடிக்கை எடுக்க வேண்டுமென இந்தச் சபையில் கேட்டுக் கொள்கின்றேன்.

உல்லாசப் பிரயாணத்துறையைக் கவரும் முகமாக, beach volleyball மைதானம் அமைக்கப்பட வேண்டும். சகல வசதிகளுடனான beach entertainment parkஐ அமைத்துக் கொடுப்பதன்மூலம் உல்லாசப் பிரயாணத்துறையினரிடம் இருந்து வருமானத்தை ஈட்டிக்கொள்ள முடியும். இதற்குப் பொருத்தமான இடமாக P/20, Hithayapuram Chairman Children Park அமைந்துள்ள அரச நிலம் காணப்படுகின்றது. உல்லை சிங்கள வித்தியாலயத்தின் மைதானம் பூரணப்படுத்தப்பட்டு, அப்பகுதி மாணவர்களது விளையாட்டுத்துறை நிகழ்வுகள் ஊக்குவிக்கப்பட வேண்டும். அங்கு சிறிய தொகை மாணவர்கள் இருப்பதால் தொலைதூரம் சென்று விளையாட முடியாமல் உள்ளதெனத் தெரிவித்து, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අර්කම් ඉල්යාස් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.44]

**ගරු අර්කම් ඉල්යාස් මහතා (බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அர்கம் இல்யாஸ் - வலுசக்தி பிரதி அமைச்சர்)
(The Hon. Arkam Ilyas - Deputy Minister of Power)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ දවස්වල සාකච්ඡා වන මාතෘකාවක් තමයි අපේ බලශක්ති ක්ෂේත්‍රයේ සිද්ධ වෙන්නේ මොකක්ද කියන එක. ඒ සම්බන්ධයෙන් විශේෂ උත්තර ටිකක් දෙන්න බැඳිලා ඉන්නවා කියලා මම හිතනවා. විශේෂයෙන්ම අපේ රටේ ජනතාව වෙනුවෙන් මම ඒ සම්බන්ධයෙන් පිළිතුරු දෙන්න ඕනෑ. මේ දවස්වල විපක්ෂයේ මන්ත්‍රීවරු වැඩියෙන්ම කථා වන දෙයක් තමයි, විදුලිබලය නිපදවීම සඳහා වෙනදාටත් වඩා වැඩියෙන් ඩීසල් පුච්චන්න සිද්ධ වෙලා තිබෙනවා කියන එක. ඉන්ධන නැවකින් සියයට 80ක්ම විදුලි බලය නිපදවීම සඳහා වැය වෙනවා කියලා ඔවුන් කියනවා. ඒ නිසා තමයි ඩීසල් අඩුපාඩුවක් ලංකාව තුළ ඇතිවෙලා තිබෙන්නේ කියලා ලොකු මහජන මතයක් හදන්න, එහෙම නැත්නම් වැරදි මතයක් හදන්න මේ අය උත්සාහ කරනවා. එම නිසා ඒ පිළිබඳව විශේෂයෙන්ම පැහැදිලි කරන්න ඕනෑ කියලා මම හිතුවා. සාමාන්‍යයෙන් ඩීසල් මෙට්‍රික් ටොන් 35,000ක, 40,000ක ප්‍රමාණයක ඉන්ධන නැව් තමයි අපේ ලංකාවට එන්නේ. ලංකාවේ දවසක ඩීසල් පරිභෝජනය ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් 4,500ත්, 5,000ත් අතර ප්‍රමාණයක් වෙනවා. අද වෙනකොට විදුලිය උත්පාදනය සඳහා උපරිමයෙන් ගන්නේ දවසකට මෙට්‍රික් ටොන් 500ක් වාගේ ප්‍රමාණයක්. ඒ කියන්නේ, දවසේ පරිභෝජනයෙන් සියයට 10ක් වාගේ ප්‍රමාණයක් තමයි විදුලිය උත්පාදනය සඳහා ඩීසල් ගන්නේ. ඇත්තටම මෙට්‍රික් ටොන් 500 ගණනේ බැලුවොත්, නැවක ඩීසල් මෙට්‍රික් ටොන් 35,000ක් එනවා නම්, එක නැවක සම්පූර්ණ ඩීසල් පරිභෝජනය තුළින් දවස් 70කට විදුලිය උපයන්න අපට පුළුවන්. ඒ විධියට දවස් 70ක් පුළුවන් එක තමයි දවස් 5කින්, දවස් 10කින් ඉවර කරනවා කියලා බොරු කථා ටිකක් දිගින් දිගටම අරගෙන යන්නේ.

ඒ වාගේම, නොරොච්චෝලේ බලාගාරය නිසා තමයි මේක සිද්ධ වෙන්නේ කියලා ලොකු කථාවක් අරගෙන යනවා. ඒ පිළිබඳවත් මම පැහැදිලි කරන්න ඕනෑ. විශේෂයෙන්ම නොරොච්චෝලේ බලාගාරයෙන් උපරිම වශයෙන් peak එකේදී අපට ගන්න පුළුවන් ධාරිතාවෙන් මෙගාවොට් 100ත්, 150ත් අතර ප්‍රමාණයක් night peak එකේදී අපට නැති වෙනවා. අපි ඒක දන්නවා. Night peak එකේදී මේක නැති වෙන නිසා අපට ආසන්න වශයෙන් ඒ වෙනුවෙන් ඩීසල් පුච්චන්න සිද්ධ වෙනවා කියන එක අපි පිළිගන්නවා. ඒත් මෙතුමන්ලා කියන ගණන් නම් සම්පූර්ණයෙන්ම වැරදියි. ආසන්න වශයෙන් ගත්තොත්, උපරිමයෙන්ම මෙගාවොට් 150ක් විතර night peak එකේදී අපට නැති වෙනවා. අපිට රාත්‍රී 6-10 අතර පැය 4ක් තුළ night peak එකේදී ගන්න සිද්ධ වුණොත්, ආසන්න වශයෙන් දවසකට megawatt-hours 600ක වාගේ ප්‍රමාණයක් තමයි අපට අවශ්‍ය වෙන්නේ. අපි සාමාන්‍යයෙන් ගණන් හදන්නේ rule of thumb අනුව. එක megawatt-hour එකකට සාමාන්‍යයෙන් අපට ඩීසල් මෙට්‍රික් ටොන් ඝනමීටර් 0.2ක් විතර අවශ්‍යයි. එතකොට මෙගාවොට් 600කට අපට ඝන මීටර් 120ක් අවශ්‍ය වෙනවා. ඒ ඝන මීටර් 120 අපි මෙට්‍රික් ටොන්වලට හැදුවොත්, ආසන්න වශයෙන් දවසකට ඩීසල් මෙට්‍රික් ටොන් 100ක් තමයි අපට අවශ්‍ය වෙන්නේ, ගල් අඟුරු බලාගාරයේ night peak එකේදී අඩු වන අදාළ ශක්තිය නිපදවීම සඳහා. ඒක අපි ඩීසල් නැවක එන ප්‍රමාණය අනුව ගණන් හදලා බැලුවොත්, ඩීසල් නැවක මෙට්‍රික් ටොන් 35,000ක් එනවා. ඒක සියයෙන් බෙදුවොත් දවස් 350කට එක ඩීසල් නැවක් ඇති. අපිට මේ ප්‍රශ්නය විසඳන්න නම් ආසන්න වශයෙන් අවුරුද්දකට එක නැවක් ඇති. එම නිසා මේ වාගේ බොරු කථා කියන්න එපා.

ගල් අඟුරු ප්‍රශ්නය නිසා තමයි ඩීසල් නැති වෙන්නේ කියමින් මහජනතාව රවට්ටන්න දිගින් දිගටම මේ කථා ඉස්සරහට අරන් යනවා. අපි මේ ගල් අඟුරු ප්‍රශ්නය සම්බන්ධයෙන් දිගින් දිගටම උත්තර ලබා දුන්නා. විනාඩියක් අරගෙන ඒ සම්බන්ධයෙනුත් උත්තර දෙන එක අනිවාර්යයෙන්ම වැදගත් වෙයි කියලා මම හිතනවා. මොකද, මේ ප්‍රශ්නය විපක්ෂයෙන් දිගින් දිගටම අදින නිසා. අපි කිව්වා, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කිසිම වරදක් සිද්ධ වෙලා නැහැ කියලා. අපි ඒක මුල ඉඳලාම කිව්වා. අද වෙනකම් ඒකේ තිබෙන වැරැද්ද මොකක්ද කියලා කවුරුවත් කියන්නේ නැහැ. "වංචාව, වංචාව" කියලා කියනවා. ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී වෙච්ච වරද මොකක්ද, ඒ වරද සිද්ධ වෙච්ච තැන කොතැනද කියලා විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙකුට කියන්න බැරි වුණා. හෙට දවසේදීවත් විපක්ෂයේ කවුරු හරි මන්ත්‍රීවරයෙක් ඇවිල්ලා කියනවා නම්, මේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කොතැනක හරි වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා ද කියලා අපට බලාගන්න පුළුවන්. නමුත්, අපි මේක පිළිගන්නවා. අපි supplierගෙන් ඉල්ලපු පිරිවිතරවලට සමහර shipments ඔවුන්ට ලබා දෙන්න බැරිවෙලා තිබෙනවා.

විශේෂයෙන්ම පළමුවෙනි නැව reject වෙලා තිබෙනවා. ඒකට ආසන්න වශයෙන් ඩොලර් මිලියන 2ක විතර දඩයක් impose වෙලා තිබෙනවා. දෙකේ ඉඳන් අට දක්වා වූ නැව් සම්බන්ධයෙන් lab reports අද වනකොට ඇවිල්ලා තිබෙනවා. ඒවා lab resultsවලින් pass වෙලා තිබෙන්නේ. ඉතින් ඇත්තටම අපට ප්‍රශ්නයක් තිබෙනවා, lab results pass වුණාට plant එකේ performance අඩු වෙලා තිබෙනවා. මොකද, මම කලින් කිව්වා වාගේ, ආසන්න වශයෙන් මෙගාවොට් 100ක, 150ක විතර ප්‍රමාණයක් ගන්න බැරි වෙලා තිබෙනවා. Lab results pass වෙලා තිබුණත්, plant එකේ performance අඩු වෙලා තිබෙනවා. ඉතින් අපට මේකට කරන්න පුළුවන් දෙයක් තිබෙනවා. මේ සාම්පල් ගන්නකොට ඉතිරි වෙච්ච umpire samples තිබෙනවා; ඒ umpire samples check කරන්න ඕනෑ. අපි දැනට ඒක යොමු කරලා තිබෙනවා, විශේෂයෙන්ම තුන්වෙනි පාර්ශ්වයේ lab එකක් විධියට ඕස්ට්‍රේලියාවේ verified accredited lab එකකට. ඒ සාම්පල් යවලා අපි බලනවා, ඒ සාම්පල්වලින් ඇත්තටම ප්‍රශ්නයක් වෙලා තිබෙනවාද, එහෙම නැත්නම් plant එකේ performance එක අඩු වෙලා තිබෙන්නේ වෙන මොකක් හරි කාරණයක් නිසාද කියලා. එහෙම බලලා තමයි අපට ඇත්තටම කියන්න පුළුවන් වෙන්නේ, plant එකේ මෙච්චර performance එක අඩුවීම මොකක් හින්දාද සිද්ධ වුණේ කියලා.

ඒ වාගේම තවත් සමහරු කියනවා, මේ ගල් අඟුරු ප්‍රශ්නය හින්දා අද වනකොට රුපියල් මිලියන 8,000ක විතර පාඩුවක් වෙලා තිබෙනවා කියලා. මම හිතන විධියට, ඒකත් සම්පූර්ණයෙන්ම බැහැර කරන්න ඕනෑ. විශේෂයෙන්ම ඒක worst-case scenario එක, ඒ කියන්නේ ගල් අඟුරුවලින් අපට අඩු වන විදුලිය ප්‍රමාණය වැඩිම මුදලක් වැය වන ඩීසල්වලින් සම්පූර්ණයෙන්ම ගන්න විධියට ගණන් හදලා තමයි මේගොල්ලන් මේ ගණන් ටික කියන්නේ. ඉතින් මම ජනතාවට කියන්න කැමැතියි, එහෙම එකක් ලංකාව තුළ සිද්ධ වෙන්නේ නැහැ කියන එක. දහවල් කාලයේ සාමාන්‍යයෙන් අපේ රටේ නිපදවන විදුලිය ප්‍රමාණය ගත්තොත්, පසුගිය මාස කිහිපයේම දහවල් කාලයේ අපට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩියෙන් විදුලිය නිපදවුණා. ඇත්තටම ගත්තොත්, දහවල් කාලයේ peak එක යන්නේ මෙගාවොට් 2,600ක් විතර. අපේ රටේ rooftop solar powerම තිබෙනවා, මෙගාවොට් 2,000ක විතර ධාරිතාවක්. ඇත්තම කථාව කිව්වොත්, මීට මාස කිහිපයකට කලින් වුණත් සාමාන්‍යයෙන් නොරොච්චෝලේ බලාගාරයෙන් අපට එළියට ගන්න පුළුවන් වුණා, මෙගාවොට් 810ක්. නමුත් අපි ගත්තේ මෙගාවොට් 520යි. ඉතිරි මෙගාවොට් 300ට යන්න පුළුවන් වුණත් අපි මෙගාවොට් 520න් තමයි කරගෙන ගියේ. පළමුවෙනි plant එකෙන් මෙගාවොට් 270ක් ගන්න පුළුවන් එක, අපි දහවල් කාලයට මෙගාවොට් 200ට deload කරනවා. දෙවෙනි plant එක මෙගාවොට් 160ට deload කරනවා. තුන්වෙනි plant එකත් මෙගාවොට් 160ට deload කරනවා. මොකද, ඒවා වහන්න බැහැ. වැහුවොත් දවස් තුනක් යනවා, නැවත start කරන්න. ඉතින් අපි ඒක පවත්වාගෙන යන්න ඕනෑ. එම නිසා පවත්වාගෙන යන්න පුළුවන් අවම සීමාව යටතේ අපි ඒක පවත්වාගෙන යනවා. දැන් වුණත් අපි දහවල් කාලයේදී deload කරනවා. ඒ වාගේම අපේ නැප්තා plant එක මෙගාවොට් 150කට පවත්වාගෙන යන්න පුළුවන්. ඒකත් එහෙම නවත්වන්න පුළුවන් plant එකක් නොවෙයි. ඒක අපි මෙගාවොට් 90ට deload කරනවා. එහෙම deload කරලා තමයි අපි සූර්ය බලයෙන් එන ශක්තිය අපේ system එක ඇතුළට ගන්නේ. ඉතින්, මේගොල්ලන් ගණන් හදනවා, පැය 24ම ඩීසල් පුච්චලා රුපියල් මිලියන 8,000ක් පාඩු වෙනවා කියලා. මම කියනවා, ගණන් හදලා බලනකොට පොඩ්ඩක් සාධාරණ වෙන්න, ජනතාවට බොරු කියන්න එපා කියලා.

ඒ වාගේම තවත් විශේෂ දෙයක් තමයි, විදුලි කප්පාදුවකට යන්න අපි ලෑහැස්ති වෙනවා වාගේ කථාවකුත් දිගින් දිගටම කියාගෙන යන එක. එහෙම තත්ත්වයක් ඇති වීමට අවස්ථාවක් නැහැ. මොකද, අද වනකොට අපට මෙගාවොට් 1,500ක විතර ජල විදුලි ධාරිතාවක් රට තිබෙනවා. ඒකෙන් ඊයේ වනකොටත් අපි මෙගාවොට් 1,400ට වැඩි ගණනක් අපේ system එක ඇතුළට ගත්තා. ඒ වාගේම අපි මෙගාවොට් 160ක බැටරි පද්ධති සඳහා වූ ටෙන්ඩරය award කරලා තිබෙනවා. ඒකත් පුළුවන් තරම් ඉක්මනට අපේ system එක ඇතුළට ගන්නවා. මෙගාවොට් 100ක බැටරි පද්ධති සඳහා වූ ටෙන්ඩර් එකකුත් දැන් evaluation එකේ තිබෙනවා. ඉදිරි සති කිහිපය ඇතුළත අපි විශේෂයෙන්ම බලාපොරොත්තු වනවා, දහවල් කාලයේ වැඩිපුර නිපදවෙන විදුලිය ගබඩා කරලා, night peak එකේ ගන්න පුළුවන් විධියට මෙගාවොට් 300කට හෝ 400කට ආසන්න ප්‍රමාණයක ටෙන්ඩර් එකක් යොමු කරන්න. ඒකත් එක්ක අපට විදුලි කප්පාදුවකට යන්න සිදු වනවා කියන එක සම්පූර්ණයෙන්ම බැහැර කරන්න වෙනවා. විශේෂයෙන්ම ඉදිරියේදී අපේ උත්සව කාලය එනවා. හෙට හෝ අනිද්දා රාමසාන් උත්සවයත් එනවා. ඒ වාගේම අපේ සිංහල අවුරුදු උත්සවය ලබන මාසයේ එනවා. ඉතින් මේගොල්ලන් මොකක් හරි මතයක් අරගෙන යන්න හදනවා නම්, මේ නිවාඩු කාලයේදී, එහෙම නැත්නම් අපේ උත්සව කාලයේදී විදුලි කප්පාදුවකට අපි යන්න හදනවා කියලා, ඒක සම්පූර්ණයෙන්ම බැහැර කරන්න ඕනෑ. මම අද අපේ නොරොච්චෝලේ බලාගාරයේ නිලධාරින්ගෙන් ඇහුවා, කොච්චර ගල් අඟුරු ප්‍රමාණයක් අපි ළඟ තිබෙනවාද කියලා. අද වනකොට ගල් අඟුරු මෙට්‍රික් ටොන් ලක්ෂ 6ක් පමණ තිබෙනවා. ඒක බැලුවොත්, ආසන්න වශයෙන් දවස් 80කට විතර අපට දැනට ප්‍රමාණවත්. ඒ වාගේම තවත් නැව් එන ගමන් තිබෙන්නේ.

පසුගිය 17වෙනි දා අපි ටෙන්ඩර් එකක් open කළා, ඉන්ධන සඳහා. ඉතින් එතැනදී අපට එම තොග ලැබෙන බව confirm වෙලා තිබෙනවා, විශ්වාසවන්ත suppliersලාගෙන්. විශේෂයෙන්ම අපේ රටට දිගින් දිගටම දෙන suppliersලාගෙන් tenders ඇවිල්ලා තිබෙනවා. ඒ අනුව මේ අවුරුද්දේ මැයි මාසයේ අන්තිම වෙනකම් දැනට අපට ඩීසල් තොග ලැබෙන බව confirm කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. පෙට්‍රල්ුත් මැයි මාසයේ අන්තිම වෙනකම් ලැබෙන බව confirm කර ගන්න පුළුවන්. ඒ වාගේම විදුලි බලය උත්පාදනය කරන්න අවශ්‍ය furnace oil ටෙන්ඩර් එකකුත් අපට ඇවිල්ලා තිබෙනවා. ඉතින්, මේ අනුව අපේ බලශක්තියේ තිබෙන විදුලි බලය කියන ක්ෂේත්‍රය අපට අනිවාර්යයෙන්ම සුරක්ෂිත කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා,

[ගරු අර්කම් ඉල්යාස් මහතා]

මැයි මාසයේ අන්තිම දක්වා. ඊට පස්සේත් term tendersවලින් confirm වෙච්ච ඒවා තිබෙනවා. අපි හිතනවා, අනිවාර්යයෙන්ම අපට මේ තත්ත්වය කළමනාකරණය කර ගන්න පුළුවන් කියලා, විශේෂයෙන්ම පසුගිය දිනවල අපට ආපු ටෙන්ඩර් එක්ක.

ඊළඟට අපි ජනතාවට කියන්න ඕනෑ, ලෝක වෙළෙඳ පොළේ පවතින මිලත් එක්ක ගළපාගෙන තමයි අපට මේ කටයුතු කරගෙන යන්න සිද්ධ වෙන්නේ කියන එක.

ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, tenders දිගින් දිගටම, ඉක්මනින් යොමු කරන්න. ඒ වාගේම අපි දැනට තීරණයක් අරගෙන තිබෙනවා, විශේෂයෙන්ම බලශක්ති ක්ෂේත්‍රයට අදාළ ගෑස්, ඉන්ධන වාගේ සියලු දේවල් ගෙන්වීම පිළිබඳව unsolicited proposals හරහාත් සලකා බලන්න. ඒ අනුව අපි හිතනවා, මේ අභියෝගාත්මක අවස්ථාවේ අපි ඒක හොඳට maintain කරගෙන යනවා කියලා.

මට තව කාරණයක් කියන්න තිබෙනවා. අපි QR code එක implement කළා. QR code එක implement කිරීමේ තවත් වැදගත්ම හේතුවක් තිබෙනවා. අපි දන්නේ නැහැ, මැද පෙරදිග ගල්ෆ් කලාපයේ තිබෙන යුද්ධය කවදා ඉවර වෙයිද කියලා. මාස දෙකක ඉන්ධන සංචිත අපට තිබෙනවා නම් අපි බලන්න ඕනෑ, අඩුම තරමින් මාස හතරකට, පහකට වැඩිපුර තියාගන්න. ඉතින් මම හිතනවා, මේ QR code එක හරහා අපට ඒක කරගන්න පුළුවන් වෙයි කියලා. මොකද, අපේ රටේ ජනතාවට ඔවුන්ගේ එදිනෙදා ජන ජීවිතය බාධාවක් නැතිව කරගෙන යන්නත්, බලශක්ති සුරක්ෂිතතාව තබා ගන්නත්, ඉන්ධන පිළිබඳව තිබෙන කාර්යක්ෂමතාවත් අපි අනිවාර්යයෙන්ම තියාගන්න ඕනෑ. මේ තුළින් අපට පුළුවන් නම් තව මාසයකට, දෙකකට වැඩිපුර සංචිත තියාගන්න, මම හිතනවා QR code එක introduce කිරීම ඇත්තටම වැදගත් දෙයක්, ඕනෑ දෙයක්, ඒ වෙනුවෙන් අපි කටයුතු කළා කියලා.

අවසාන වශයෙන් මේ අවස්ථාවේදී අපට ජනතාවගෙන් දෙයක් ඉල්ලන්න තිබෙනවා. අපේ එදිනෙදා ජීවිතයේ අත්‍යවශ්‍ය දේවල් සඳහා පමණක් අපි බලශක්තිය වැඩිපුර පාවිච්චි කරමු. අනවශ්‍ය, එහෙම නැත්නම් අත්‍යවශ්‍ය නොවන දේවල් සඳහා බලශක්තිය වැය කිරීම පුළුවන් තරම් සීමා කරමු. පුළුවන් නම් පොදු ගමනාගමනය සඳහා වැඩි වශයෙන් යොමු වෙන්න. අපේ පෞද්ගලික වාහන පාවිච්චිය පුළුවන් තරම් අඩු කර ගන්න උත්සාහ කරමු. අත්‍යවශ්‍ය නොවන උත්සව සහ ගමන් පුළුවන් තරම් අපි සීමා කරන්න උත්සාහ කරමු.

ඒ වාගේම විදුලි පරිභෝජනය ගත්තොත්, අත්‍යවශ්‍ය නොවන, ඒ කියන්නේ වැඩිපුර දල්වා තිබෙන ලයිට් එකක් හරි නිවන්න පුළුවන් නම් ඒකෙන් අපට ලොකු වාසියක් ගන්න පුළුවන් වෙයි. විශේෂයෙන්ම රාත්‍රි කාලයේදී විදුලි පරිභෝජනය අඩු කරන්න පුළුවන් measures ඒ විධියටම අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. අපේ ජනාධිපතිතුමාත් ඉල්ලුවා වාගේ රාත්‍රි කාලයේදී EVs charge කරන එක සම්පූර්ණයෙන්ම නවත්වමු. දහවල් කාලයට ඒක අරගෙන එමු. අපි smart meters එක්ක අලුත් tariff policy එකකුත් ගෙනැල්ලා දෙන්නම්. ඉතාම අඩුවෙන් EVs charge කර ගන්න පුළුවන් ක්‍රමයකුත් අපි ළඟදීම හඳුන්වා දෙන්නම්. එතැනිනුත් අපට ලොකු වැඩක් කර ගන්න පුළුවන් වෙයි කියලා හිතනවා.

අවසාන වශයෙන් ජනතාවගෙන් විශේෂයෙන්ම ඉල්ලනවා, අනවශ්‍ය ලෙස ඉන්ධන තොග එකතු කිරීමෙන් වැළකී ඉන්න කියලා. එතකොට අපට බලශක්තිය මේ මාස කිහිපයට හොඳටම කළමනාකරණය කරගන්න පුළුවන් වෙයි කියලා හිතනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 4.56]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් මේ සභාව තුළ අදහස් දක්වනකොට ආර්ථිකය කළමනාකරණය කරගන්න පුළුවන් දක්ෂම, ඒ වාගේම විශිෂ්ටම කණ්ඩායම තමන් සතුව ඉන්නවා කියන කථාව කිව්වා. ඔවුන්ගේ විශිෂ්ටත්වය අපි දැක්කා, 2015 සහ 2019 කාලය අතරතුර මේ රට කොතැන ඉඳලා කොතැනට තල්ලු කළාද කියන එකෙන්. ඒක මේ රටේ ජනතාවත් හොඳින්ම දන්නවා. එතුමා ප්‍රශ්න කරනවා, එළඹෙන උත්සව සමය තුළ බඩු මිල ඉහළ යන්න පුළුවන්ද, ඉන්ධන මිල ඉහළ යන්න පුළුවන්ද කියලා. මට ඇත්තටම මේ ගැන කනගාටුයි. ලෝක අර්බුදයක් ඇති වෙලා තිබෙන වෙලාවක, යුදමය තත්ත්වයක් ඇති වෙලා තිබෙන වෙලාවක, සාමාන්‍යයෙන් අපි හැම කෙනෙකුම දන්නවා, එවැනි අර්බුදකාරී තත්ත්වයන් තුළ ලෝකයේ ආර්ථිකයට කොතරම් බලපෑමක් ඇති වෙනවාද, ඒ බලපෑම නිසා ලෝකයේ තිබෙන රටවල් ඒක කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් ඉන්නවා කියන එක. මෙවන් අවස්ථාවකදී සමහර විට පෙර පාසල් දරුවෙකුට පවා ඒ අවබෝධය ඇති වනවා. ඒ කරුණ පවා තේරුම් ගන්න බැරි තරමට මේ අය පහතට වැටීම පිළිබඳව අපට ඇත්තටම කනගාටුවක් දැනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව මේ සභාව තුළදී සමහරු හඬ නඟා කෑ ගහමින් ඉඳලා මෙතැනින් නික්ම ගියා. විශේෂයෙන් මෙවන් ඉතාම අභියෝගාත්මක අවස්ථාවකදී, රටවල් කිහිපයක් අතර තිබෙන යුදමය අවස්ථාවකදී පවා මනුෂ්‍යත්වයේ දෑත දිගු කරමින් අපි

හැමවිටම හිටගන්නේ මනුෂ්‍යත්වය සමඟයි කියන පණිවුඩය ලෝකයට දෙන්න අපට පුළුවන් වුණා. ඒ පණිවුඩයත් එක්ක ලෝකයේ තිබෙන බොහෝ රටවල් අපේ ආදරණීය මාතෘ භූමිය සම්බන්ධව ප්‍රශංසාත්මකව කථා කරන තත්ත්වයකට පත් වුණා. මේ මොහොතේ ඒ යුද කලාපය තුළ ඉන්න ජනතාව සයිරන් නළාව වදිනකොට බිංගෙවල් ඇතුළට ගිහිල්ලා ඉතාම බියෙන්, සැකයෙන්, ඒ වාගේම චකිතයකින්, පීඩාවකින් ජීවත් වෙන තත්ත්වයකට පත් වෙලායි ඉන්නේ. අපේ ප්‍රාර්ථනාව විය යුත්තේ, ඒ ප්‍රදේශවල තවදුරටත් එවැනි තත්ත්වයක් ඇති නොවේවා යන්නයි. සාමාන්‍යයෙන් ලෝකයේ ජීවත් වන ඕනෑම කෙනෙක් කැමැතියි, බියෙන්, සැකයෙන් තොරව සාමයෙන්, සැනසීමෙන්, සතුටින් ජීවත් වෙන්න. හැම විටම අපේ ප්‍රාර්ථනාව විය යුත්තේත් සියලුදෙනාට සාමයෙන් සහ සතුටින් ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් ලැබේවා කියන එකයි.

நேற்று முன்தினம் இங்கு பாராளுமன்ற உறுப்பினர் ஒருவர், மாண்புமிகு சனாதிபதி அவர்கள் ஏற்பாடு செய்த இப்தார் நிகழ்வைப் பகிஷ்கரிக்க வேண்டுமெனச் சொன்னார். ஆனால், துரதிருஷ்டவசமாக அவர் சார்ந்த கட்சியின் தலைவர் உட்பட இன்னும் பல உறுப்பினர்கள் அந்தக் கோரிக்கையைத் துச்சமாக மதித்து, நேற்றைய தினம் இடம்பெற்ற அந்த நிகழ்வில் கலந்துகொண்டார்கள். மார்க்க நிகழ்வுகளில் அரசியலைப் புகுத்தாது, நியாயமாக நடந்துகொண்ட எதிர்க்கட்சியைச் சேர்ந்த அனைத்துப் பாராளுமன்ற உறுப்பினர்களுக்கும் இந்தச் சந்தர்ப்பத்தில் எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

අපි දන්නවා, ආදරණීය මිනිස්සු හැමදාමත් ප්‍රාර්ථනා කරන්නේ යුද්ධය නොව සාමයයි කියලා. මැද පෙරදිග කලාපය තුළ ආර්ථිකමය වශයෙන් බලපෑම් ඇතිවනකොට ඒක බලපාන්නේ ඒ කලාපයට විතරක් නොවෙයි. එය අනෙක් කලාපවල ආර්ථිකයටත් විශාල ලෙස බලපානවා.

நான் இந்தச் சந்தர்ப்பத்தில் இன்னுமொரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். மத்திய கிழக்கு நாடுகளில் இருக்கின்ற பொருளாதார முக்கியத்துவம் வாய்ந்த இடங்களோ, சிறுவர்களோ பாதிக்கப்படும் வகையில் எந்தவொரு சந்தர்ப்பத்திலும் தாக்குதல்கள் மேற்கொள்ளப்படுவதை அனுமதிக்க முடியாது என்பதுதான் எமது அரசாங்கத்தின் நிலைப்பாடாகும். இன்று அந்தப் பிரதேசத்தில் மேற்கொள்ளப்படுகின்ற அத்தகைய தாக்குதல்களை இந்த அரசாங்கம் ஒருபோதும் அனுமதிக்காது. குறிப்பாக, பொருளாதார ரீதியாக முக்கியத்துவம் வாய்ந்த இடங்களை, மக்களுடைய உயிர்களை இலக்குவைத்து மேற்கொள்ளப்படுகின்ற தாக்குதல்களை எந்தவொரு சந்தர்ப்பத்திலும் எங்களுடைய அரசாங்கம் அனுமதிக்காது. இந்த அரசாங்கம் மக்களது உயிருக்கு மதிப்பளிக்கும் அரசாங்கம் என்பதற்கு மிகச் சிறந்த உதாரணம்தான், யுத்த சூழ்நிலையிலும் பல சவால்களுக்கு மத்தியில் பல உயிர்களைக் காப்பாற்றுவதற்கு முயற்சி எடுத்தமை.

இத்தகைய சூழ்நிலையில், உணவுப் பாதுகாப்பு, எரிபொருள் பாதுகாப்பு மற்றும் ஏனைய பாதுகாப்பு பற்றி சிந்திக்க வேண்டியவர்களாக நாங்கள் இருக்கின்றோம். இது அரசியல் செய்கின்ற தருணமல்ல. எதிர்க்கட்சியினர் மக்களது உள்ளத்தில் பீதியை ஏற்படுத்தி, ஏற்கனவே பாதிக்கப்பட்ட மக்களைத் தொடர்ந்தும் பாதிப்புக்கு உள்ளாக்கி வருகின்றார்கள். இதற்காக அவர்கள் ஊடகங்களைப் பயன்படுத்துகின்றார்கள். இந்த நாட்டில் சில ஊடகங்கள் வழமையாகவே இனவாதத்தைப் பரப்பி, மக்களிடத்தில் பீதியையும் சந்தேகங்களையும் உருவாக்கி வருகின்றன. அந்த ஊடகங்களைப் பற்றி எனக்குக் கவலை கிடையாது. ஆனால், முஸ்லிம் சமூகத்தின் பெயர் தாங்கிய சில ஊடகங்கள் அதே இழிசெயலில் ஈடுபட்டு, மக்களைத் தொடர்ந்தும் பீதிக்குள்ளாக்கி வருகின்றன. இந்த நிலைமை மாற வேண்டும்; உலகில் சமாதானம் ஏற்பட வேண்டும் என்பதுதான் எமது அவா எனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[5.01 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Hon. Presiding Member, today, I rise with a deep sense of responsibility to address on the grave escalation of conflict unfolding in the Middle East.

What we are witnessing today is not just an isolated confrontation. How did it start? On the 28th of February, 2026, a coordinated military operation was launched by the United States and Israel against Iran. I am happy that the Hon. Deputy Minister Arkam Ilyas is here. I have a few things to say to him. He is one Member of Parliament whom I really honour. I will come to your point later, Hon. Ilyas. So, it was not targeting just a military installation. Do you admit it? Do you agree? Was the first attack on a military target? No. It was aimed at the duly and constitutionally elected President of Iran and it killed him. Just touch your conscience and ask, Hon. Members, did any one of you had the gut or the backbone - a proper spinal cord - to condemn that? If you say you have done it, I will surrender, say sorry and stop it at that. But, you all did not do it; your President did not do it; your Minister of Foreign Affairs did not do it. Do you all not feel ashamed about it, I am asking you. Of course, if you do not know the language, I cannot help it.

Did you not condemn it when President Nicolas Maduro was taken into custody by the US? Your Secretary did; the Minister of Foreign Affairs made a statement. They said it was "interfering with an internal matter". Sometimes, you all love to stand like deaf Members of Parliament, as if you have not heard what I am saying. It suited this Government to condemn the US's intervention in Venezuela and taking President Nicolas Maduro into custody when, in fact, the US and Donald Trump denied their involvement. But, on the 28th of February, 2026, Donald Trump went on to make the statement, "We have eliminated a threat and now, it is time for the people of Iran to elect their own President". That is a complete violation of the International Humanitarian Law - IHL. He made a fool out of himself, violating the International Humanitarian Law. Now, what is the problem in condemning that? Is it because Iran is a Muslim State? If you all had the guts to stand up against US intervention in Venezuela, you should have the guts to do the same when it happened to Iran. So, who brought pressure on you? That is my problem.

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

There is time till tomorrow. I am expecting the Hon. President to come here and answer my question. Why did he not condemn it? Why was not condolences expressed by the Government? That is the reason why we felt very bad about the attitude of this Government towards the attack on Iran.

Maybe, you all, too, would have thought like Donald Trump, that things would finish in two weeks. Now, what is happening? You all would have thought that the war is just in the Middle East. "What does it matter, Iran could get attacked. We will get oil from Singapore and there is no need to worry. The Strait of Hormuz is not a problem for us", is what you would have thought. But, that is not so. Now, we are worried.

දැන් තමයි තෙල් අර්බුදය පටන් ගන්නේ. මා හිතවත් සහෝදර, මම ගරු කරන අර්කම් ඉල්යාස් නියෝජ්‍ය ඇමතිතුමා මීට කලින් කථා කළා. දැන් තෙල් අර්බුදය පටන් ගත්තා නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා බොහොම වැදගත් කරුණු කිහිපයක් කිව්වා. ඔබතුමන්ලාට මතකද, ආර්ථික අර්බුදය ඇති වුණු කාලයේදී සියලුම PickMe සහ Uber bicycles electric batteriesවලින් operate කරන්න සූදානම් වුණා? නමුත්, ඒ project එක එහෙමම නැවතුණා. ඒගොල්ලන් විශාල සේවයක් කරනවා. මම හිතනවා, ඔබතුමාට තමයි මේක හරියටම තේරෙන්නේ කියලා since you are an engineering graduate. අපට දවල් කාලයේදී තමයි තෙල් නැතුව, තනිවම අපේ energy එක supply කර ගන්න පුළුවන් අවස්ථාව ලැබෙන්නේ. අපිට ඕනෑ කාරණා දෙකයි. ත්‍රී වීලර් සියල්ලක්ම බැටරියෙන් ධාවනය වන ත්‍රී වීලර් බවට පත් කරන්න. බයිසිකල් සියල්ලක්ම බැටරියෙන් ධාවනය වන බයිසිකල් බවට පත් කරන්න. ඒ සඳහා රජයෙන් විශේෂ වැඩ පිළිවෙළක් ගෙනෙන්න. දැන් electric three-wheeler එකක් රුපියල් ලක්ෂ 19යි. දැනට තිබෙන ත්‍රී වීලර් සියල්ලටම විශේෂ සහනයක් ලබා දෙන්න. මොකද, මේ ප්‍රශ්නය ඊළඟ අවුරුද්දේත් එනවා. ඊට පසුව එන අවුරුද්දේත් ඒ ප්‍රශ්නය එනවා. මොනවා හරි වලියක් දමා ගන්නවා, ඔය ඊශ්‍රායලකාරයෝ. ඒ නිසා කරන්න තිබෙන වැඩේ මේකයි. ආණ්ඩුවේ අනුග්‍රහය යටතේ දවල් කාලයේදී හැම three-wheeler park එකක්ම battery-rechargeable solar-powered shed එකක් කරන්න. You will understand it far better than anyone. දවල් කාලයේදී ඒ ත්‍රී වීලර්වල බැටරි සියල්ලම charge කරගෙන -ගෙවී ගිය බැටරිය ඉවත් කරලා අලුතින් බැටරිය දමාගෙන- මහජනතාවට ප්‍රවාහන සේවාව ලබා දෙන්න පුළුවන් වෙන්න ඕනෑ. මොකද, ඒක බොහොම වැදගත්. මම ඊයේ පෙරේදා පෙට්‍රල් ෂෙඩ් එකකට ගියාම ඒ අය කිව්වා, අපි ඔබතුමා කියන කථාව සම්පූර්ණයෙන්ම පිළිගන්නවා කියලා. Sir, I know that my time is going to be over. I need just a few seconds more; මට තව පොඩි වෙලාවක් දෙන්න.

ජපන්කාරයෝ වාගේ අපිත් බයිසිකලයෙන් යමු. පුළුවන් නම් බැටරියක් සවි කරගෙන අපිත් බයිසිකලයෙන් පාර්ලිමේන්තුවට එමු. පාර්ලිමේන්තුව ළඟ ඉන්න කට්ටියට, මාදිවෙල ඉන්න කට්ටියට එහෙම එන්න පුළුවන්. මමත් මේ ළඟ, බොරැල්ලේ ඉන්නේ. ලොකු වාහනයකට පාවිච්චි කරන තෙල් ටික අපි පුළුවන් තරම් අඩු කර ගනිමු. එතකොට අපට පුළුවන් වෙයි, chargeable batteries උපයෝගී කරගෙන මේ රටේ පොදු ප්‍රවාහනය වෙනුවෙන් වැඩ පිළිවෙළක් ගෙනෙන්න. රුපියල් ලක්ෂ 19ක් වන ත්‍රී වීලරයකට සියයට 50ක ලාභයක් ලබා දෙන්න. ආපහු මැද පෙරදිග ප්‍රශ්නයක් මතු වෙනකොට අපේ ප්‍රවාහන සේවය බැටරි මඟින් ක්‍රියාත්මක වන ප්‍රවාහන සේවයක් බවට පත් කරන්න පුළුවන් කියන යෝජනාව ඉදිරිපත් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
ගරු කාරියප්පර් මන්ත්‍රීතුමනි, ඇත්තටම ඔබතුමා ඒ යෝජනාව ඉදිරිපත් කළාට බොහොම ස්තුතියි. බලශක්ති අමාත්‍යාංශය සහ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය එකතු වෙලා ඉහළ පෙළේ කමිටුවක් පත් කරලා තිබෙනවා, අපේ ගමනාගමනය renewable energyවලින් electrify කරන්නේ කොහොමද කියන එක පිළිබඳව සොයා බලන්න. ඔබතුමා ඉදිරිපත් කළ යෝජනා පිළිබඳව ඒ කමිටුව තුළින් සලකා බලන්නම්. සමහර යෝජනා practical ද, නැද්ද කියන එක ගැනත් අපිට හිතන්න වෙනවා. අපි පුළුවන් තරම් ඒ කටයුත්ත කරන්න උත්සාහ ගන්නවා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Thank you very much.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.11]

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ වනවිට අර්බුදයක් තිබෙනවා. ආණ්ඩු පක්ෂය කියනවා, විපක්ෂය තමයි මේ අර්බුදය ගෙනෙන්නේ කියලා. විපක්ෂයෙන් කියනවා, ආණ්ඩු පක්ෂයෙන් අර්බුද ගෙනෙනවා කියලා. ඇත්තටම ඇමෙරිකාවේ ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් තමයි ලෝකයටම මේ අර්බුදය ඇති කළේ. ඊශ්‍රායලය සහ ඇමෙරිකාව එකතු වෙලා පලස්තීනයේ 50,000කට වඩා ජනතාව ඝාතනය කළා. සාමකාමීව තිබුණු ලෝකය ඇත්තටම ලොකු අර්බුදයකට ගෙන ගියේ ඇමෙරිකාව

සහ ඊශ්‍රායලය. ඔවුන් තමයි ඉරානයේ අධ්‍යාත්මික නායක අයතුල්ලා අලි කමේනිව ඝාතනය කළේ. ඒ වාගේ ප්‍රශ්න ඇති කළා. ඉන්දියාවට ගිහිල්ලා ආපහු යමින් සිටියදී ඉරානයේ නාවික හමුදාවේ නිලධාරින් රැගත් නැවකට ලංකාවට ආසන්න මුහුදු සීමාවේදී ඇමෙරිකාව විසින් පහර දුන්නා. ඒ සම්බන්ධයෙන් විශේෂයෙන්ම ඉරාන ජනතාවට මගේ ශෝකය ප්‍රකාශ කරනවා. මේ සිද්ධි ඇති වුණු නිසා තමයි අද අපේ රටත් ලොකු අර්බුදයකට මුහුණ දීලා තිබෙන්නේ. ඒක සියලු දෙනාම පිළිගන්න ඕනෑ.

ඇත්තටම තෙල් -පෙට්‍රල්, ඩීසල්- නැත්නම් රටක් පවත්වා ගෙන යන්න බැහැ. එය ඕනෑම රටකට අත්‍යවශ්‍ය සේවාවක්. ඒ නිසා මේක කළමනාකරණය කරගන්න යම්කිසි වැඩ පිළිවෙළක් යෙදිය යුතුයි. ඒ වගකීම ආණ්ඩුවට තිබෙනවා. ආණ්ඩුව මේ කටයුත්ත යම්කිසි මට්ටමකින් කළමනාකරණය කළ යුතුයි. අද කුඹුරුවල ගොයම් කපනවා. ඒ සඳහා යන්ත්‍රවලට ඩීසල් අවශ්‍යයි. ධීවර ජනතාවටත් ඩීසල් අවශ්‍යයි. එළවලු වර්ග, මාළු වර්ග විශාල වශයෙන් transport කරන අයටත් ඩීසල්, පෙට්‍රල් දෙන්න ඕනෑ. අද බලන්න, කල්පිටිය ප්‍රදේශයේ නොරොච්චෝලේ කෘෂි ආර්ථික මධ්‍යස්ථානයෙන්, දඹුල්ලෙන් එළවලු ගෙනියන්න ඕනෑ. ඒ වාගේම කල්පිටිය ජැටියෙන් මාළු රට පුරා ගෙනියන්න ඕනෑ. ඇත්තටම මේ කටයුත්ත කළමනාකරණය කරලා අවශ්‍ය ඩීසල්, පෙට්‍රල් දුන්නේ නැත්නම් ආර්ථිකය කඩා වැටෙනවා. ඒ නිසා ආර්ථිකය හරියට කළමනාකරණය කරන්න ඕනෑ. එහාට මෙහාට දොස් කියලා හරියන්නේ නැහැ. ආණ්ඩුව ඒ වගකීම භාරගෙන කටයුතු කරන්න ඕනෑ.

අද මැද පෙරදිග ඉන්නවා, අපේ රටේ ජනතාවගෙන් ලක්ෂ 10කට වඩා වැඩි පිරිසක්. ඒ ජනතාව කොච්චර ප්‍රශ්නවලට මුහුණ දෙනවාද? මෙහේ ඉන්න ඔවුන්ගේ දෙමව්පියන් දුක් වෙනවා, "අපේ දරුවන් එහේ ඉන්නවා. එයාලට මොනවාද වෙලා තිබෙන්නේ, කොයි මොහොතේ මොනවා වෙයිද?" කියලා. මේ ලෝකයේ සාමය ඇති වෙන්න ඕනෑ කියන එකයි අපි බලාපොරොත්තු වන්නේ. ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමාත් මේ ගැන කථා කළා. ඇමෙරිකාව, වෙනිසියුලාවේ ජනාධිපතිතුමාව අත්අඩංගුවට ගත්තා. ඒවා සාධාරණද? රටක රාජ්‍ය නායකයෙක් නිදහසේ වැඩකටයුතු කරන්න ඕනෑ වුණත් ඔවුන්ට නිදහසේ වැඩකටයුතු කරන්න ඉඩ දෙන්නේ නැහැ. ඇමෙරිකාව කරන මෙවැනි වැඩ නිසා ලෝකයම ලොකු අමාරුවකට වැටෙනවා. විශේෂයෙන්ම මම ඔබතුමන්ලාට කියනවා, ආණ්ඩුවක් හැටියට මේක විවේචනය කරන්න ඕනෑ කියලා. ඇත්තටම, ඇමෙරිකාව මේ කරන අසාධාරණ වැඩවලට ආණ්ඩුව ප්‍රතිචාර දක්වන්න ඕනෑ.

ගරු ධීවර ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ධීවර ඇමතිතුමනි, මට ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. ඔබතුමා, අපේ රටේ ධීවර ඇමතිතුමා. මේ කාරණය මම ඔබතුමාට පෞද්ගලිකවත් කථා කර කිව්වා. ගරු ඇමතිතුමනි, කල්පිටිය ප්‍රදේශයේ ට්‍රෝලින් බෝට්ටු මඟින් ධීවර කටයුතු කරන ධීවරයින් 23දෙනෙක් ඉන්නවා. යාපනය හා මන්නාරමේත් ඒ රස්සාව කරන අය ඉන්නවා. නමුත්, කල්පිටිය ධීවර ජනතාවට ඒ රස්සාව කරන්න ඔබතුමා ඉඩ දුන්නේ නැහැ. කල්පිටියටත් ඒ උසාවි නියෝගය තිබෙනවා; නඩුව තිබෙනවා. යාපනයේත් තිබෙනවා. නමුත්, ඒ 23දෙනාට ඔබතුමන්ලා ට්‍රෝලින් බෝට්ටු මඟින් ධීවර කටයුතු කරන්න දෙන්නේ නැහැ. පෞද්ගලිකව, විටින් විට මේ ගැන කථා කළත් ඒ මිනිස්සුන්ට සහනයක් ලැබුණේ නැහැ. ගරු ඇමතිතුමා මේ සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරය දන්නවා. මේක නවත්වනවා නම් සම්පූර්ණයෙන්ම නවත්වා දමන්න. රටකට එක නීතියක් තිබෙනවා කියලා ගරු ජනාධිපතිතුමා කියනකොට ඔබතුමාගේ ධීවර අමාත්‍යාංශයේ නීති දෙකක් ක්‍රියාත්මක වෙනවා. මම මේක ඔබතුමාත් එක්ක තරහට කියනවා නොවෙයි. ඔබතුමා මේ ධීවර ක්ෂේත්‍රයේ සිටින සියලුම දෙනා ගැන දන්නවා. ඇත්තටම, අපේ රටේ ට්‍රෝලින් බෝට්ටු මඟින් කටයුතු කරන කට්ටිය ඉන්නවා. නමුත්, එක කට්ටියකට එක නීතියක්, තවත් කට්ටියකට තව නීතියක් තිබෙන්නේ. ඒ නිසා ධීවර ඇමතිතුමා මේ සම්බන්ධයෙන් මැදිහත් වෙලා ඒ ජනතාවට තාවකාලිකව හරි රස්සාව කරගෙන යන්න අවසර ලබා දෙන්න කියලා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මේ සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරය පෞද්ගලිකව ඔබතුමාත් දන්නවා.

මේ QR code ක්‍රමය හොඳ ක්‍රමයක්. ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, මේක යම් මට්ටමකින් හොඳට හදාගෙන යනවා කියලා. අපි ඒක පිළිගන්නවා. නමුත්, මේ QR code ක්‍රමය දෙනකොට යම් ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම පොඩි දුර යන අයට මේකෙන් ප්‍රශ්නයක් මතු වෙන්නේ නැහැ. නමුත්, ලොකුවට transport කටයුතු කරන කට්ටිය ඉන්නවා. සාමාන්‍යයෙන්, යාපනයේ ඉඳලා කොළඹට එන අය ඉන්නවා. ඒ ආකාරයට transport කටයුතු කරන කට්ටියට වැඩිපුර ඩීසල් ප්‍රමාණයක් දෙන්න ඕනෑ.

ඒ වාගේම කල්පිටියේ ඉඳලා කොළඹට එනවා. ඒ විධියට රට පුරා පළාත් 9ටම පැතිරිලා යන එක එක ප්‍රශ්න තිබෙනවා. එක එක ව්‍යාපෘති තිබෙනවා. ගොවිතැන් කරන කට්ටිය ඉන්නවා. ධීවර කර්මාන්තයේ නියුතු අය ඉන්නවා. ඒ අයට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කළා නම් හොඳයි. ඒක තමයි අර්බුදය. ඒ අර්බුදයට විසඳුමක් ලබා දෙන්න ඕනෑ ආණ්ඩුවක් විසින්. ආණ්ඩුව ඒ විසඳුම ලබා දුන්නා නම් අපි සතුටු වනවා. අර්බුදයක් එනකොට රටේ මිනිස්සු අපට, -මහජන නියෝජිතයන්ට- රටේ නිලධාරින්ට මෙහෙම අර්බුදයක් කියලා කියනවා. ඒ නිසා ඔබතුමන්ලාට කියනවා මේකට යම් කිසි මට්ටමෙන් විසඳුමක් දෙන්න කියලා. කවුරු ආණ්ඩු කළත්, කවුරු හිටියත් කාලයෙන් කාලයට එක එක ප්‍රශ්න එනවා. එක කාලයකදී කොවිඩ් වසංගතය ආවා, ඊට පස්සේ "දිට්වා" සුළි කුණාටුව ආවා. අද තෙල් අර්බුදය ඇවිල්ලා තිබෙනවා. ඒකට අපි කියන්නේ නැහැ, මේගොල්ලන් තමයි වග කියන්න ඕනෑ කියලා. නමුත්, ඉදිරියේදී මේවා ඔක්කොම කළමනාකරණය කරලා සියලු ජනතාවට සහනයක් ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

මට වෙලාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.18]

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැදගත් විවාදයට සම්බන්ධ වෙලා අදහස් පළ කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වනවා. අසද දින කල් තැබීමේ විවාදයේ යෝජනාව ගෙනාවේ විපක්ෂයෙන්. එය ස්ථිර කළේත් විපක්ෂයයි. දැන් අපට සභා ගැබ දිහා බලලා අහන්න තිබෙන්නේ, "විපක්ෂය කෝ?" කියලායි. මේ වැදගත් විවාදය කරන්නේ කාත් එක්ක ද කියලා

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

තමයි බලන්න වෙන්නේ. මේක තමයි ඇත්තටම විපක්ෂයේ ඇත්ත. රටේ ප්‍රශ්නයක් ගැන මතු කළාම,- *[බාධා කිරීමක්]* ඔව්, දවස් දෙකක් විවාදයට ඉල්ලුවා. මම ඉතාම කනගාටු වෙනවා, මේ තත්ත්වය ගැන. ඔවුන් ඒ ප්‍රශ්නයට අවංක නම්, ඒ ප්‍රශ්නය අහන්නේ ඇත්තටම අවංකව නම්, ඊට වඩා කැපවීමක් ඒ සම්බන්ධව පෙන්වන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මැදපෙරදිග කේන්ද්‍ර කරගෙන ඇති වුණු -ජනිත වුණු- මේ යුදමය තත්ත්වය පරිධියේ රටවලට බරපතළ විධියට බලපාමින් තිබෙන බව අපි හැමෝටම නොරහසක්. මොකද, අපේ සියලු රටවල් අතර තිබෙන්නේ අන්තර් සම්බන්ධිත ලෝකයක්. හුදෙකලා රටවල් නැහැ. බලපෑමට ලක් වීම ස්ථිරයි. මම අමුතුවෙන් කියන්නට අවශ්‍ය වෙන්නේ නැහැ, අපේ රජය මේ රට ස්ථිර මාවතකට අරගෙන ආපු හැටි. ජංගම ගිණුමේ අතිරික්තයේ ඉඳලා ආදායම් රැස් කිරීම, අපේක්ෂිත ආදායම් ඉලක්කය ඉක්මවා යෑම, ආයෝජන වැඩිවීම ඇතුළු තිරසර මාවත ගැන මා වැඩිපුර කරුණු කියන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. බිඳ වට්ටපු හැම ක්ෂේත්‍රයකම පාර්ශ්වකරුවන් - විද්වතුන් වෙන්න පුළුවන්, කොටස්කරුවන් වෙන්න පුළුවන්,- වෙන වෙනම කැඳවලා, විශ්ලේෂණය කරලා, ඒ ක්ෂේත්‍රය හරි පීල්ලට දමාගෙන තිබෙනවා. ඒ හරි පීල්ලට දමා ගන්න ගත්ත උත්සාහයටත් විශාල වැය බරක් දරන්න අපේ රජයට සිද්ධ වුණා. ඒකත් ආර්ථිකයට පීඩනයක් හැටියට මේ වෙලාවේ තිබෙනවා.

නිදර්ශනයක් හැටියට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ගත්තොත් - අපි කථා කරන්නේ තෙල් ගැන - තෙල් සංස්ථාවේ පාඩුව රුපියල් කෝටි 90,000ක්. ඒක භාණ්ඩාගාරයට පවරාගෙන තමයි මේ කටයුතු කරමින් යන්නේ. ඒ පීඩනයත් එතැන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකා විදුලිබල මණ්ඩලය හරියට ප්‍රතිව්‍යුහගත කළේ දැන්, මේ ආණ්ඩුව. ඒගොල්ලන් තමයි ප්‍රශ්නය හරියට තේරුම් අරගෙන විසඳුවේ. ඒ ආකාරයට රට නිසි මඟට අරගෙන යන ගමනේදී තමයි අපි මේ අර්බුදයට මුහුණ දෙන්නේ. කල් තැබීමේ යෝජනාවේ වචනවල තිබෙන තත්ත්වය අපේ ගරු මන්ත්‍රීවරු, ඇමතිවරු විග්‍රහ කළා. ඒක අපි ඇති කර ගත්ත ව්‍යසනයක් විධියට, අප සිද්ධ කරපු අඩුපාඩුවක ප්‍රතිඵලයක් හැටියට ඒත්තු ගන්වන්න විපක්ෂය හැම තිස්සෙම උත්සාහ කරනවා, මෙතැනදීත්, එළියේදීත්, මාධ්‍ය තුළදීත්.

මේ සුළු කාලය ගත කරන්න මම අපේක්ෂා කරන්නේ, මේ අර්බුද සමයේ විපක්ෂයේ ප්‍රවේශය, ඒගොල්ලන්ගේ අපේක්ෂාව ගැන යම් අදහසක් පළ කරමින්. අපේ ආර්ථිකය හා රට ස්ථාවර වෙමින් තිබෙන අතරේ ප්‍රශ්නය බාහිරව තමයි ජනිත වුණේ. විපක්ෂය උත්සාහ කරන්නේ දිගටම බිය සහ අවිනිශ්චිතතාව හදන්න. ගරු අගමැතිතුමිය පැහැදිලි කළා වාගේ, ජනතාව භය ගන්වමින්, ජනතාව අවිනිශ්චිතතාවට පත් කරලා, ඒ හරහා පොටක් පාදා ගන්න තමයි උත්සාහ කරන්නේ. මේ රට බංකොලොත් වුණේ පවුල් දෙක තුනක හොරකම් නිසා නම් ඒ මත එල්ලිලා පහර දෙන්න පුළුවන්.

2022දී ඇති වූ තෙල් පෝලිම්, ගෑස් පෝලිම් නම් අන්න ඒ ජාතියේ ව්‍යසනයක ප්‍රතිඵලයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ 2026 අර්බුදය එහෙම එකක් නොවෙයි කියලා විපක්ෂයේ අය හොඳාකාරවම දන්නවා. එහෙම දැන දැනත් මේක ඒ හා සමාන ව්‍යසනයක් හැටියට පෙන්වන්න විපක්ෂය හැම තිස්සේම උත්සාහ කරනවා; ප්‍රයත්න දරනවා. ඒක සාහසික වැරැද්දක්, වැරැදි ප්‍රයත්නයක්. ඒ විතරක් නොවෙයි, මේ විවාදයට සම්බන්ධ වන විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාම සමහර වෙලාවට ෂෙඩ්වල තිබෙන තෙල් තත්ත්වයන් විස්තර කරමින් මේ යථාර්ථය හාස්‍යයට ලක් කිරීම ඉතාම කනගාටුදායක තත්ත්වයක්. ඒගොල්ලන්ට ඒවා විහිළු. ඒ තත්ත්වය ඉතාම අශිෂ්ටයි; කනගාටුදායකයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා කළ ප්‍රකාශයක් ජනමාධ්‍ය උපුටා දක්වා තිබෙනවා මම දුටුවා. "ලෝකයේ ඛනිජ තෙල් සම්පත තිබෙනතුරු එය ඇණවුම් කරන්න, මිල දී ගන්න සම්පත් දැන් ලංකාවට තිබෙනවා, ආර්ථිකය දැන් සුරක්ෂිත වෙලා තිබෙන්නේ" කියලා එතුමා කියා තිබෙනවා. කොයි කාලයකද එහෙම ප්‍රකාශයක් කරන්න පුළුවන්කම තිබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

පිළිගන්න ඕනෑ දේවල් ගෞරවය සහිතව පිළිගන්න විපක්ෂය පුරුදු වෙන්න ඕනෑ. නමුත්, එතුමන්ලා දැන් පුරුදු වෙලා ඉන්නවා අපේ ප්‍රකාශ විකෘති කරන්න. මාර්තු මස 02, 03 වාගේ දිනවල අප කළ ප්‍රකාශ, විශේෂයෙන් තිබෙන ඉන්ධන සංචිතවල ශේෂය පිළිබඳව, දින කීයක් ඉස්සරහට යන්න පුළුවන්ද කියන එක පිළිබඳව ආණ්ඩුව කළ ප්‍රකාශ විකෘති කරමින් දැන් විපක්ෂයේ අය අහනවා, "මෙච්චර දුරක් යන්න පුළුවන් කියලා කිව්වත් කෝ දැන් ඒ තෙල්? පුළුවන්ද එච්චර දුරක් යන්න? බොරු නේද කිව්වේ?" කියලා. මෙතැනදී තමයි ඒ වාක්‍ය තක්කඩි වාක්‍ය බවට, ඉතාම අශිෂ්ට වාක්‍ය බවට පත් වන්නේ. තෙල් පරිභෝජනය දෙගුණ තෙගුණ වෙලා තිබෙනවා. ඇත්තටම පරිභෝජනයත් නොවෙයි, ජනතාව තෙල් තොග රැස් කරන්න කටයුතු කරන නිසා ඇති වෙච්ච තත්ත්වයක්, මේක. ජනතාව එසේ තෙල් තොග රැස් කරන්න යොමු වන්නේම විපක්ෂය බිය හදන නිසා; අවිනිශ්චිතාව හදන නිසා. සත්‍ය තොරතුරු ජනතාව කරා ගියා නම් ජනතාව ගෙවල්වල ඉන්නවා මිස මේ වාගේ පෝලිම්වල රැස් කන්නේ නැහැ. අපේ ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන් හේතු සහිතව, තර්ක සහිතව ඛනිජ තෙල් ක්ෂේත්‍රයට අදාළව පෙන්වපු කරුණු තමයි ජනතාව අතරට යන්න ඕනෑ. විපක්ෂයේ ඔබත් ඒවා විමසා බලන්න. එහෙම නොකර ඒවා විහිළුවට අරගෙන බිය සහ අවිනිශ්චිතකම හදන එක ඉතාම නරක පුරුද්දක්. මෙන්න මේ තත්ත්වයට, මේ සත්‍යය දැන දැනම බොරු කීමට කියන්න පුළුවන්, "නරුමකම" - cynicalness - කියලා. විපක්ෂය සම්බන්ධයෙන් ඒක කොච්චර දුරදිග ගෙන ගිය තත්ත්වයක්ද කිව්වොත්, ඒ අය ඒක නරුමවාදයක් දක්වා අරගෙන ගිහින් තිබෙනවා. අපි යෝජනා කරන්නේ ඒකෙන් මිදෙන්න කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී ජනමාධ්‍ය හිතවතුන්ගෙන් ඉල්ලීමක් කරන්න තිබෙනවා. ගරු ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමියත් මේ සම්බන්ධයෙන් කරුණු දැක්වූවා. ඔබ බොහෝදෙනෙකු රුචි කරන්නේ හැම තිස්සේම පෝලිම් පෙන්වන්න, අසහනය පෙන්වන්න. මේක රජයේ අත්තනෝමතික ක්‍රියාවක් නිසා හටගත්තු තත්ත්වයක් නම්, එහෙම පෙන්වන්න. ඒත් මේක එහෙම එකක් නොවෙයි. ඇතැම් ජනමාධ්‍ය ඇයි ආණ්ඩුවට සතුරු ආකල්ප හදන්නේ? මේ සත්‍යය යටපත් කරලා විකෘතියක් ඉස්සරහට අරගෙන, සතුරු ආකල්පයක් හදලා ජනතාව බිය ගන්වන එක ඉතාම සාහසික මාධ්‍ය භාවිතයක් බව කියන්න සිද්ධ වෙනවා. ඒ වෙනුවට ඒ අයට ඒ ගුවන් කාලයත් එක්ක කරන්න පුළුවන් වෙනත් වටිනා දේවල් තිබෙනවා. විද්වතුන් කැඳවලා විකල්ප බලශක්තිවලින් වැඩ කරන හැටි, මේ ප්‍රශ්නය ධෛර්යයෙන් යුතුව භාරගෙන ඒකට මුහුණ දෙන හැටි සාකච්ඡා කරන්නයි ගුවන් කාලය දෙන්න ඕනෑ. ඒ වෙනුවට පෝලිම්වලට මයික්‍රෝෆෝන අල්ලන්නේ නැතිව, ජනතාවට බිය හා සැකය නොසාදා ජන මනස ශක්තිමත් කිරීමටයි මාධ්‍ය ආයතන කටයුතු කළ යුත්තේ. ඒ බව විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ආදරණීය පුරවැසි ප්‍රජාවගෙනුත් අපට ඉල්ලීමක් කරන්න තිබෙනවා. මේ ඇති වෙලා තිබෙන තත්ත්වය විශේෂිත තත්ත්වයක්. ජනතාව බිය සැකවලට ගොදුරු නොවී සත්‍ය තොරතුරු හඹාගෙන ගිහින් ඇත්ත තේරුම් අරගෙන ඒ ඇත්තට මුහුණ දෙන්න ඕනෑ; දුෂ්ට අරමුණු සහිත voice-cuts හඳුනා ගන්න ඕනෑ. ඒක ජනතාවගේ වගකීමක්. ඒක

කරන්න පුළුවන්. ගරු අගමැතිතුමිය අද උදේ මතක් කළා එක අතකට අපේ රටේ විපක්ෂයට වඩා මහ ජනතාව ඉන්නේ ඉදිරියෙන් කියලා. අප ඒක වටහා ගත යුතුයි.

අපේ පාලනයෙන් තොර මෙවැනි ලෝක යුද තත්ත්වයකදී අපේ ජීවිතවල රිද්මය, ජීවන විලාස වෙනස් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ මොහොතක තමයි අපට අවශ්‍ය වන්නේ, පොදු හැඟීමක්. ඒ හැඟීම බොහොම බරපතළ විධියට වගා කර ගන්න ඕනෑ; ඒ බව හොඳින් තේරුම් ගන්න ඕනෑ. මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ බලය හොබවන රජයේ අත්තනෝමතික කටයුත්තක් නිසා නම්, අන්න ජනතාව කලබල වුණාට කමක් නැහැ. මේක එහෙම නොවන තත්ත්වයක් නිසා අප ආදරණීය ජනතාවට යෝජනා කරන්නේ, ඔබේ සැප සම්පත්, දෛනික ජීවිතය ගත කරමින් හිටපු රිද්මය, රටාව පිළිබඳව කලබල නොවී මේ පවතින තත්ත්වයට සාපේක්ෂව ඒවා ගැන කල්පනා කරන්න කියලායි.

සමහර වෙලාවට ගත කරමින් හිටපු ජීවිතය වෙනස් වෙලා යම් කැප කිරීමක් කරන්න අපට සිද්ධ වෙනවා. මේක රටක මහ ජනතාව හැටියට පොදුවේ ඇති කර ගන්න ඕනෑ හැඟීමක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම පොදු හැඟීමෙන් කටයුතු කළා නම් අපට ආරංචි වෙන්නේ නැහැ, ඉන්ධන තොග රැස් කරපු ගෙවල් දොරවල් තිබෙනවා කියලා. පසුගිය දිනවල ජනමාධ්‍ය තුළින් මම දැක්කා, ඉන්ධන ලීටර 19,000ක් එක්ක දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන තිබුණු ආකාරය. එතැන තිබෙනවාද පොදු හැඟීම? නැහැ. එහෙම නම්, අපි ඉතා ප්‍රවේසමට මෙබඳු ජාතික ගැටලුවක් වටහා ගන්නට ඕනෑ. මා අද උදේ ජනමාධ්‍යයෙන් දුටුවා, බදාදා නිවාඩු දින දීමනාව නැති නම් වෘත්තීය සමිති ක්‍රියාමාර්ග ගන්නවා කියලා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කණ්ඩායමක් දැනුම් දීලා තිබුණා. ඒ ප්‍රවෘත්තිය මාධ්‍යයේ පළ වී තිබුණා. මේකද වගකීම? ඒ නිසා අප ඒ සියලුදෙනාගෙන් ඉල්ලා සිටින්නේ, ඉතාම කල්පනාකාරීව, ඉතාම විශ්වාසවන්තව මේ තත්ත්වය වටහා ගන්න, තේරුම් ගන්න කියලායි.

මේ යෝජනාව ඉදිරිපත් කරපු ගරු මන්ත්‍රීතුමා අවුරුදු කාලය ගැන කථා කළා, උත්සව සමය ගැන කථා කළා. මට වාක්‍ය දෙකතුනක් කථා කරන්න තිබෙනවා, අවුරුදු සමයට අදාළව නැකැත් සීට්ටුව සම්බන්ධව පසුගිය කාලයේ විපක්ෂයේ අය කලින් වාගේම ඇති කරපු බිය සහ සැකය ගැන. එල්ලෙන්න පිදුරු ගහක් සොයන විපක්ෂය මේ වතාවේ අවුරුදු නැකතේත් එල්ලුණා; හැබැයි, වැරැදුණා. ඒ නිසා ඇත්තටම ඒගොල්ලන්ට වෙලාව බලවා ගන්න තමයි වෙන්නේ. ඉතිහාසයේ පළමුවැනි වතාවට එක දේශපාලන පක්ෂයක් වැරැදි පූර්වාදර්ශයක් දුන්නා. ඒගොල්ලෝ තමන්ගේ දේශපාලන පක්ෂයේ නමින් නැකැත් සීට්ටුව නම් කළා, "සර්වජන නැකැත් සීට්ටුව" කියලා. කොහේද තිබෙන්නේ, එහෙම නැකැත් සීට්ටු? ඒක තමයි ඒගොල්ලන්ගේ තත්ත්වය. ඒ වාගේම මම දුටුවා, තවත් කණ්ඩායමක් "ආණ්ඩුවට දුන්නු කාලය ඉවරයි. අපි හෙට අපේ නැකැත් සීට්ටුව එළියට දමනවා" කියලා ප්‍රකාශයක් කරලා තිබුණා. "ආණ්ඩුවට දුන්නු කාලය ඉවරයි" කියලා කියන්න පුළුවන් එකම පිරිසයි මේ රටේ ඉන්නේ. ඒ තමයි අපේ රටේ ආදරණීය ජනතාව. එහෙම කියපු අය කවුද කියලා බැලුවාම, කාමරයක microphones දෙකතුනක් ඉස්සරහා පස්දෙනෙකු විතර වාඩි වෙලා ඉන්නවා පෙනුණා. ඒ පස්දෙනා තමයි කියන්නේ, ආණ්ඩුවට දුන්නු කාලය ඉවරයි කියලා. මේවා කනගාටුවට කාරණා. මේ හඳන්නේ, අවිනිශ්චිතතාව. මෙවැනි කාලයක වග කිය යුතු විපක්ෂයක් හැටියට කටයුතු කරන්න ඕනෑ බව තමයි මා නැවතත් මතක් කර දෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසන් වශයෙන් මට කියන්න තිබෙන්නේ මෙයයි. රජය ලෙස අපි මේ තත්ත්වය කළමනාකරණය කරගෙන මුහුණ දෙනවා; ආර්ථිකය හකුළන්නේ නැතිව එම තත්ත්වයට මුහුණ දෙනවා. අප විපක්ෂයෙන් ඉල්ලා සිටින්නේ අඩුම තරමින් මේ වාගේ මොහොතක උදවු කරන්න බැරි නම්, බලාගෙන ඉන්න කියලායි. උදවු කරන්න බැරි නම්, අප මේ වැඩේ කළමනාකරණය කර ගන්නා හැටි නිහඬව බලාගෙන ඉන්න. මොකද, ඔබ මේ රටේ මිනිසුන් තුළ බිය සහ සැකය හැදුවොත්, මේ ජාතික ගැටලුකාරී අවස්ථාව ජය ගැනීම තවදුරටත් පස්සට යනවා. ඒ බාධා කරන්නේ තමන්ගේ රටේ ආදරණීය ජනතාවටම තමයි. ගරු ජනාධිපතිතුමා අවශ්‍ය කමිටු පත් කරලා, ඒ කමිටු නිසි විධියට රැස් කරමින් කටයුතු කරගෙන යනවා. ඒ නිසා ආර්ථික ආවේක්ෂණ කමිටුව, එකී කමිටුවල උපකමිටු ආදියෙහි සියලුදෙනා පැයෙන් පැය වෙනස් වන මේ ලෝක යුද තත්ත්වය අර්ථකථනය කර ගන්නවා. ඒ නිසා අපේ ඉන්ධන තොග පිළිබඳව අප අද කරන ප්‍රකාශය හෙට වනකොට තාර්කිකව වෙනස් වෙන්න පුළුවන්. ඒ වාගේම අද අර්ථකථනය කර ගන්නා තර්ජනය නොවෙයි, හෙට වනකොට අපට තාර්කිකව වටහා ගන්න වෙන්නේ. ඒ නිසා මේක විහිළුවට නොගෙන, හාස්‍යයට නොගෙන ජාතික වැදගත්කමක් සහිතව මුහුණ දෙන්න ඕනෑ තත්ත්වයක් හැටියට වටහා ගෙන, මුහුණ දෙමු කියන යෝජනාව මම සියලුදෙනාට කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධෛර්යයෙන් යුතුව මේ අභියෝගයට මුහුණ දීලා, මේ අමාරු මොහොත අප ස්ථිර වශයෙන්ම පියමං කරන බව අවසාන වශයෙන් සඳහන් කරමින්, මට කාලය ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[පි.ව. 5.31]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உலகில் நடைபெற்றுக்கொண்டு இருக்கின்ற யுத்தம் காரணமாக ஏற்பட்டுள்ள நிலைமை தொடர்பான இன்றைய ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சியடைகின்றேன். இஸ்ரேலும் அமெரிக்காவும் கூட்டாக இணைந்து ஈரான்மீது தாக்குதல்களை மேற்கொண்டு வருகின்றன. இந்நிலை 20 நாட்களை எட்டியுள்ள நிலையில், ஈரானும் தனது இராணுவச் செயற்பாடுகளை முன்னெடுத்து வருகின்றது. இதன் காரணமாக, மத்திய கிழக்குப் பிராந்தியத்தில் அமைதியற்ற சூழ்நிலை ஏற்பட்டுள்ளது.

கௌரவ புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர் யதார்த்தத்தைப் பேசினார். எமது நாடு பொருளாதாரச் சிக்கலில் இருந்தது. அதனைத் தொடர்ந்து நாட்டில் ஏற்பட்ட சூறாவளி, வெள்ள அனர்த்தத்தால் பாரிய வீழ்ச்சியைக் கண்டது. அதிலிருந்து மீண்டு வரும்பொழுது எங்கேயோ ஏற்பட்ட யுத்தத்தால் நமது நாட்டிலும் பாதிப்புகள் ஏற்படுகின்றன. குறிப்பாக, எமது நாட்டில் பொருளாதார ரீதியான பாதிப்புகள் ஏற்பட்டுள்ளன. வெளிநாட்டு வருமானம்

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

மாத்திரமல்ல, வெளிநாடுகளில் வாழுகின்ற ஏறத்தாழ 12 இலட்சத்துக்கும் மேற்பட்ட இலங்கையர்களுடைய வாழ்க்கையும் கேள்விக்குறியான சூழலிலே இருந்துகொண்டு இருக்கின்றது. எனவே, நாங்கள் எல்லோரும் சேர்ந்து ஒற்றுமையாக எமது நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புகின்ற பணியில் ஈடுபட வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

உண்மையிலேயே இந்த யுத்தத்தை யார் ஆரம்பித்தார்கள்? என்ற கேள்வி இருக்கின்றது. அதற்கு மனச்சாட்சியுள்ள எல்லோரும் பதிலளித்துத்தான் ஆகவேண்டும். இதில் அரசியல் இல்லை. பேச்சுவார்த்தை நடந்துகொண்டு இருந்தபோது, அமெரிக்காவும் இஸ்ரேலும் இணைந்து, ஒரு நாட்டின் இறையாண்மையை மீறி அந்நாட்டின் ஆன்மீகத் தலைவரையும் அவருடைய பாதுகாப்பு உயர் அதிகாரிகளையும் கொன்றதனால்தான் இன்று உலகமே போர்க்களமாக மாறியிருக்கின்றது. இதனை நாம் ஏற்றுக் கொண்டுதான் ஆகவேண்டும். யார் யுத்தத்தை ஆரம்பித்தார்கள்? அமெரிக்காவும் இஸ்ரேலும்தான்! இதனைச் சொல்வதற்கு நாம் பயப்படவேண்டிய தேவையில்லை. அதற்குப் பிறகு, அவர்களும் அடித்தார்கள்; இவர்களும் அடித்தார்கள். இதனால் வளைகுடா பகுதி முழுவதும் யுத்த சூழ்நிலை ஏற்பட்டு இருக்கின்றது. அதை நாங்கள் ஏற்றுக் கொள்கின்றோம். எங்களுடைய புனித ரமழான் மாதம் என்றும் பாராமல் - நோன்பு காலத்தில் - ஓர் ஆன்மீகத் தலைவரை அதுவும் ஜனநாயக ரீதியில் ஆட்சிக்கு வந்தவரை மிருகத்தனமாகக் கொலைசெய்து இருக்கிறார்கள். இந்தப் படுகொலையை நாங்கள் கண்டிக்க வேண்டும். அதுதான் எங்களுடைய நோக்கம்!

நமது நாட்டின் கடற்பரப்புக்கு அண்மித்த பகுதியில் ஈரான் நாட்டுக்குச் சொந்தமான கடற்படைக் கப்பல் தாக்குதலுக்கு உள்ளானபோது, அமெரிக்க அரசாங்கத்தின்மூலம் மேற்கொள்ளவேண்டிய பல்வேறு தேவைகள் எமது நாட்டுக்கு இருந்தபோதிலும், நமது நாட்டின் சனாதிபதி அவர்கள் அக்கப்பலில் இருந்த கடற்படை அதிகாரிகளை எங்களுடைய நாட்டுக்கு அழைத்து வருவதற்கும், அவர்களில் காயப்பட்டவர்களுக்குச் சிகிச்சை அளிப்பதற்கும் நடவடிக்கை எடுத்திருந்தார். மேலும், இதன்போது மரணமடைந்தவர்களின் ஜனாஸாக்களை ஈரான் நாட்டுக்கு அனுப்பி வைத்ததுடன், இரண்டாவது கப்பலில் வந்தவர்களையும் மீட்டுப் பாதுகாத்தார். இதற்காக மாண்புமிகு சனாதிபதி அவர்களுக்கும் நமது கடற்படையினருக்கும் இந்த நாட்டு மக்கள் சார்பாக நன்றி சொல்லக் கடமைப்பட்டு இருக்கின்றேன்.

அமெரிக்காவும் இஸ்ரேலும் ஈரான் நாட்டுக்குள் அத்துமீறி தாக்குதலை நடத்தி, அந்நாட்டின் மதத் தலைவரைக் கொலை செய்தமைக்கு எதிராக எதிர்கட்சித் தலைவர் கௌரவ சஜித் பிரேமதாஸ அவர்களும் எங்களுடைய கட்சியின் தலைவரும் எதிர்க்கட்சியில் இருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்களும் குரல்கொடுத்தார்கள். நாங்கள் அரசாங்கத்துக்கும் அழுத்தத்தைக் கொடுத்தோம். இங்கு காலையில் உரையாற்றிய ஆளுங்கட்சியைச் சேர்ந்த பெண் பாராளுமன்ற உறுப்பினர் ஒருவர், பொருளாதார நிலைமை காரணமாகத்தான் இந்த யுத்தத்தில் நடுநிலைமை வகிப்பதாகச் சொன்னார்.

மறைந்த ஈரான் நாட்டு ஆன்மீகத் தலைவர் ஆயதுல்லா அலி கமேனி அவர்களைப் பாதுகாப்பான பதுங்குழிக்குள் போகுமாறு அவருடைய பாதுகாப்பு அதிகாரிகள் சொல்லி இருக்கிறார்கள். அதற்கு அவர், தான் பதுங்குகுழிக்குள் சென்று தப்பித்துக் கொண்டால், ஈரான் நாட்டில் வாழும் 93 மில்லியன் மக்களும் பதுங்கு குழியில் வாழவேண்டிய நிலைமை ஏற்படுமெனக் கூறியிருக்கிறார். எனவே, அவர் வீர மரணம் அடைந்திருக்கிறார். அதை நான் உங்களுக்குத் தெளிவாகச் சொல்ல விரும்புகின்றேன். தனக்கு மரணம் நிச்சயிக்கப்பட்டுவிட்டது என்பதை அவர் சொல்லாமல், தான் மரணித்தாலும் பரவாயில்லை என்ற எண்ணத்துடன் யுத்த சூழ்நிலையில் செயற்பட்டு இருக்கிறார் என்பதை நான் இந்தச் சபையில் சொல்ல விரும்புகின்றேன்.

அமெரிக்காவும் இஸ்ரேலும் இணைந்து ஈரான் நாட்டின் உச்ச பாதுகாப்புச் செயலாளர் அலி லாரிஜானியைப் படுகொலை செய்திருக்கிறது. அதன் பின்னர், ஈரான் நாட்டின் உளவுத்துறை அமைச்சர் இஸ்மாயில் கதீப் அவர்களையும் படுகொலை செய்திருக்கிறது. இவ்வாறு ஈரான் நாட்டுத் தலைவர்களைப் படுகொலை செய்து வருகின்றனர். ஈரான் நாட்டின் புதிய உச்ச ஆன்மீகத் தலைவர் முஜ்தபா கமேனி பற்றிய தகவல்களை வழங்குவோருக்கு 10 மில்லியன் அமெரிக்க டொலர்கள் - இலங்கை ரூபாயின் மதிப்பில் சுமார் 300 கோடி - வெகுமதியாக வழங்கப்படுமென அமெரிக்க அரசாங்கம் அறிவித்திருக்கின்றது. அமெரிக்காவும் இஸ்ரேலும் ஈரானின் எத்தனை தலைவர்களைப் படுகொலை செய்தாலும், 7,000 வருடங்கள் பழைமையான நாகரிகத்தைக் கொண்ட ஈரான் நாட்டை அவர்கள் நினைப்பதுபோல் அவ்வளவு விரைவாக வீழ்த்திவிட முடியாது என்பதை நான் இந்தச் சபையில் சொல்ல விரும்புகின்றேன். ஈரான் நாட்டின் தலைவர்களைப் படுகொலை செய்யும் செயற்பாடுகளுக்கு அமெரிக்காவும் இஸ்ரேலும் பெரும் விலை கொடுக்கவேண்டி வரும் என்பதை எதிர்காலம் உங்களுக்குத் தெரிவிக்கும்.

அமெரிக்காவும் இஸ்ரேலும் மூன்றாம் உலக மகா யுத்தத்தை உருவாக்குவதற்கான கொடூரமான செயற்பாடுகளில் ஈடுபட்டு வருகின்றன. இதனால் முழு உலகமுமே பாதிக்கப்பட்டு இருக்கின்றது. இதனை நாங்கள் கண்டிக்க வேண்டும். அமெரிக்காவுக்கும் இஸ்ரேலுக்கும் தலையசைக்கும் தலைவர் ஒருவரை ஈரானுக்கான புதிய தலைவராகக் கொண்டுவருவதற்கு நீண்டகாலமாக இவ்விரு நாடுகளும் முயற்சிகளை மேற்கொண்டு வருகின்றன. ஈரான் நாட்டு மக்களால் நிராகரிக்கப்பட்ட முன்னாள் மன்னர் ஷாவின் மகனான ரெசா பஹ்லவியை ஈரானின் புதிய தலைவராகக் கொண்டுவருவதற்கு அமெரிக்காவும் இஸ்ரேலும் பகல் கனவு கண்டுவருகின்றன.

தற்போது மத்திய கிழக்கில் யுத்த நிலைமை தீவிரமடைந்து செல்வதால், அரசாங்கம் அதற்கேற்ற வகையில் தேவையான நடவடிக்கைகளை மேற்கொண்டு, இராஜதந்திர செயற்பாடுகளைத் தெளிவான முறையில் சர்வதேச நாடுகளுக்கு விளங்கப்படுத்தக்கூடிய பொறிமுறைகளை உருவாக்க வேண்டும். மேலும், எமது நாட்டின் செயற்பாடுகளை ஏனைய நாடுகளுக்குத் தெளிவான முறையில் விளங்கப்படுத்தக்கூடிய வகையிலான செயற்பாடுகளையும் முன்னெடுக்க வேண்டும். யுத்த நிறுத்தம் செய்யப்பட்டு, மத்திய கிழக்கில் அமைதியான சூழல் ஏற்படுவதற்கு ஆக்கபூர்வமான செயற்பாடுகளை முன்னெடுக்க வேண்டுமென சகல நாட்டுத் தலைவர்களிடமும் அரசாங்கம் வேண்டுகோள் விடுக்க வேண்டும்.

உலகத்தில் போர்க் குற்றவாளிகளாக இனங்காணப்பட்டுள்ள அமெரிக்க சனாதிபதி டொனால்ட் டிரம்ப், இஸ்ரேலியப் பிரதமர் பெஞ்சமின் நெத்தன்யாஹு

ஆகியோருக்கு எதிராக சர்வதேசமே ஒன்றாகச் செயற்படவேண்டிய காலகட்டம் உருவாகி வருகின்றது. இஸ்ரேலும் அமெரிக்காவும் இணைந்து கொடூரமான முறையில் பாடசாலை ஒன்றின்மீது குண்டுவீசி, 160க்கும் மேற்பட்ட மாணவிகளை மிலேச்சத்தனமாக கொலை செய்ததற்கு எதிராக ஸ்பெயின் மனிதாபிமான ஆதரவுக் கட்சிப் பாராளுமன்ற உறுப்பினர் அந்நாட்டுப் பாராளுமன்றத்தில் குரல்கொடுத்து இருக்கிறார்.

கத்தார் நாட்டின் பாதுகாப்பு அமைச்சர்கூட, "எங்களுக்கு உதவுவதாகக் கூறிக்கொண்டு நீங்கள் எங்களைத் துன்புறுத்துவதை நிறுத்துங்கள்" என கோரிக்கை விடுத்துள்ளார். மேலும், "எங்களை எங்கள் போக்கிலே தனியாக வாழ விடுங்கள்; நாங்கள் சிறப்பாகவும் அமைதியாகவும் வாழ்வோம்" எனச் சொல்லியிருக்கிறார். சவூதி அரேபியா அரசாங்கம்கூட, எதிர்காலத்தில் இஸ்ரேல் நாட்டைச் சேர்ந்தவருக்கு அங்கு காணிகளைக் கொள்வனவு செய்ய தடைவிதித்துள்ளது. மேலும், " இவ்வளவு காலமும் எமது மக்களைப் பாதுகாப்பதாக அமெரிக்கா எங்களை நம்பவைத்துச் செயற்பட்டது; இப்போதுதான் எங்களுக்குப் புரிகிறது, இஸ்ரேலைப் பாதுகாப்பதற்காகத்தான் அமெரிக்கா சவூதி அரேபியாவில் தங்கியிருந்தது" என அந்நாடு தெரிவிக்கிறது.

மத்திய கிழக்கிலுள்ள பெரும்பாலான அரபு நாடுகள், அமெரிக்கா மற்றும் இஸ்ரேலின் செயற்பாடுகளைக் கண்டித்து வருகின்றன. ஸ்பெயின் நாட்டின் பிரதமர் அவர்கள், அமெரிக்க சனாதிபதி டொனால்ட் டிரம்ப் மற்றும் இஸ்ரேலியப் பிரதமர் பெஞ்சமின் நெத்தன்யாஹுவின் கொடூரமான செயற்பாடுகளைக் கடுமையாகக் கண்டித்துள்ளார். இவர்கள் உலகத்தையே தீயிட்டுக் கொளுத்திவிட்டு, பின்னர் அதில் எழும் புகை பற்றி புகார்செய்ய முடியாதென ஸ்பெயின் நாட்டின் பிரதமர் பெட்ரோ சன்செஸ் கடுமையாகக் கண்டித்துள்ளார். இதேவேளை, ஈரானுக்கு எதிராக அமெரிக்காவும் இஸ்ரேலும் மேற்கொண்ட கூட்டு இராணுவ நடவடிக்கைகளுக்கு இத்தாலி நாடு ஆதரவு வழங்காதெனச் சொல்லியிருக்கிறது. ஈரானிய புதிய ஆன்மீகத் தலைவரைக் காட்டிக் கொடுத்தால், 10 மில்லியன் அமெரிக்க டொலர் வழங்குவதாக அமெரிக்கா அறிவித்துள்ளது. அதாவது, ஈரானின் உச்ச தலைவர் முஜ்தபா கமேனியைப் பற்றிய தகவல்களை வழங்குவோருக்கு இலங்கை ரூபாயில் 300 கோடி வழங்குவதாக அறிவித்துள்ளது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ஈரானின் முன்னாள் உச்ச தலைவரும் முஜ்தபா கமேனியின் தந்தையுமான ஆயதுல்லா அலி கமேனி படுகொலை செய்யப்பட்டதைத் தொடர்ந்து, ஈரான் நாட்டு மக்கள் மிகுந்த ஆவேசத்துக்குள்ளாகி உள்ளதாகவும், ஈரானிய மக்கள் தற்போது "இரத்தத்துக்கு இரத்தம்" என்ற அடிப்படையில் பழிவாங்குவதையே எதிர்பார்க்கின்றார்கள் எனவும், அந்த நாட்டின் தூதுவர் சொல்லியிருக்கிறார். யப்பான், அவுஸ்திரேலியா போன்ற நாடுகளும் இந்தக் கொடூரமான செயலைக் கண்டிக்கின்றன. இந்த நிலையில், ஈரானின் இறையாண்மையை மீறி, அந்த நாட்டுக்குள் அத்துமீறி தாக்குதல் நடத்தி, அந்நாட்டின் உச்ச ஆன்மீகத் தலைவர், அவரது குடும்பத்தினர் மற்றும் பாதுகாப்பு அதிகாரிகளைப் படுகொலை செய்த அமெரிக்கா மற்றும் இஸ்ரேலின் செயல்களைக் கண்டித்து நமது நாட்டின் சனாதிபதி அவர்களும் அரசாங்கமும் அறிக்கை வெளியிடாமல் இருப்பது, முஸ்லிம்களாகிய எங்களுக்குப் பெரும் வேதனையாக இருக்கின்றது. அரசாங்கம் நடுநிலைமை வகிப்பதாக பாராளுமன்ற உறுப்பினர் ஒருவர் சொன்னார்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
කරුණාකරලා මට විනාඩියක් දෙන්න.

විදේශ කටයුතු අමාත්‍ය අපේ විජිත හේරත් මැතිතුමා මෙතැන ප්‍රකාශ කළා, இரண்டு தரப்பினரும் பிழையென அவர் சொன்னார். அதாவது, ஈரானும் பிழை, அமெரிக்காவும் பிழை என்று சொன்னார். அவ்வாறல்ல, ஈரான்மீது பிழையில்லை. சும்மா இருந்த ஈரானைத்தான் அமெரிக்காவும் இஸ்ரேலும் மிலேச்சத்தனமாகத் தாக்கின. அதனைக் கண்டிக்கின்றேன் எனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.41]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මේ සාකච්ඡාව, නැත්නම් මේ විවාදය පැවැත්වෙන්නේ විපක්ෂය විසින් ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධවයි. නමුත්, මේ වනවිට විපක්ෂයේ එක්කෙනෙක්වත් මේ සභා ගර්භය තුළ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විපක්ෂය මේ යෝජනාව ඇත්තටම ගෙනාවාද, නැත්නම් රටේ ජනතාව අවුල් කිරීම සඳහා ගෙනාවාද කියන එක ඒ හරහා පේනවා. රටේ ජනතාව අවුල් කිරීම සඳහා ගෙනෙල්ලා, අන්තිමට දැන් විපක්ෂය අවුල් වෙලා "සෙත්තපෝච්චි" වෙලා තිබෙනවා. ඒ හරහා පෙන්නුම් කරන්නේ වෙන මොකුත් නොවෙයි, මේ මොහොත වෙනකොට විපක්ෂය පරාජය වෙලා ඉවරයි කියන එකයි. විපක්ෂය ජනතාව කුලප්පු කරන්න හැදුවා. මේ තෙල් ප්‍රශ්නය මතුකරගෙන ජනතාව කුලප්පු කරන්න හැදුවා. නමුත් දැන් අන්තිමට විපක්ෂය කුලප්පු වෙලා ඉවරයි.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எதிர்க்கட்சியினரால் கொண்டுவரப்பட்டு இருக்கின்ற இந்த ஒத்திவைப்புப் பிரேரணையானது, மிகவும் முக்கியமான பிரேரணையென அவர்களுடைய தரப்பினரே கூறினார்கள். இன்று நாட்டில் தோன்றியுள்ள நெருக்கடி நிலைமை

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

காரணமாக நாட்டு மக்கள் முற்றுமுழுதாகப் பாதிக்கப்பட்டு இருப்பதாகவும் அந்த நெருக்கடி நிலைமையிலிருந்து நாட்டை மீட்டெடுக்க வேண்டுமெனவும் அதற்காகவேதான் இவ்வாறானதொரு பிரேரணையைக் கொண்டுவந்ததாகவும் அவர்கள் கூறினார்கள். இதன்மூலம் அரசாங்கத்துக்கு விழிப்புணர்வை ஏற்படுத்த வேண்டும் என்ற தோரணையில்தான் அவர்கள் காலையிலிருந்து பேசினார்கள். ஆனால், இப்பொழுது இந்தச் சபையில் எதிர்க்கட்சிப் பக்கம் ஒருவர்கூட இல்லை. அந்தளவுக்கு எதிர்க்கட்சியினர் பின்னுக்குச் சென்றிருக்கிறார்கள் என்பது எங்களுக்குத் தெரிகின்றது.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
Sir, I rise to a point of Order.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
ஒரேயொருவர் இருக்கிறார்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைக்கு எதிர்க்கட்சியினரால் கொண்டுவரப்பட்டு இருக்கின்ற இந்தப் பிரேரணை எந்தவித அர்த்தமும் இல்லாத ஒன்றாக மாறியிருக்கின்றது. கடந்த காலங்களில் ஏற்பட்ட பல்வேறு பிரச்சினைகள் பற்றி இவர்கள் கூறினார்கள். நான் கடற்றொழிலுக்குப் பொறுப்பான அமைச்சர் என்ற வகையில், முதலில் இந்த இடத்தில் ஒரு விடயத்தைச் சொல்லியாக வேண்டும். குறிப்பாக, எங்களுடைய மீனவர்கள் கடற்றொழிலுக்குச் செல்ல வேண்டும். அவர்களுடைய படகுகளுக்கு மண்ணெண்ணெய் தேவைப்படுகின்றது. எனவே, மீன்பிடியுடன் சம்பந்தப்பட்ட அனைத்துச் செயற்பாடுகளையும் நாங்கள் நேர்த்தியான முறையில் முகாமைத்துவம் செய்திருக்கின்றோம். எந்தவித சிக்கலுமில்லாது கடற்றொழிலாளர்கள் அனைவருமே கடலுக்குச் சென்று தங்களுடைய தொழிலை முன்னெடுப்பதற்குப் போதுமான எரிபொருளை பெற்றுக்கொடுப்பதற்கு நாங்கள் ஏதுவான நடவடிக்கை எடுத்திருக்கின்றோம்.

வடக்கை எடுத்துக்கொண்டாலும் சரி, முழு நாட்டையும் எடுத்துக்கொண்டாலும் சரி, தற்போது விவசாயிகள் நெல் அறுவடை செய்கின்ற காலம் என்பதால், அவர்களுக்குக் கூடுதலான மண்ணெண்ணெய், பெற்றோல் தேவைப்படுகின்றது என்பது எங்களுக்குத் தெரியும். அவர்களுக்குப் போதுமானளவு எரிபொருட்களை வழங்க நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதாக எங்களுடைய விவசாய அமைச்சர் மிகத் தெளிவாகக் குறிப்பிட்டிருக்கின்றார். அதுமாத்திரமல்ல, முன்னுரிமை அளிக்கப்பட வேண்டிய அனைத்துச் செயற்பாடுகளுக்கும் தேவையான எரிபொருளைப் பெற்றுக்கொடுப்பதற்கு ஏதுவான நடவடிக்கைகளை மிகத் தெளிவாக எங்களுடைய அரசாங்கம் முன்னெடுத்திருக்கின்றது. அதனால் நாட்டு மக்கள் எந்தவிதமான கலவரமும் அடையவேண்டிய அவசியமில்லை என்பதை நாங்கள் சொல்ல விரும்புகின்றோம். எதிர்க்கட்சியினர் கலவரம் அடைந்திருக்கின்றார்கள். கடந்த காலங்களில் ஏற்பட்ட பிரச்சினையை மையப்படுத்தியே அவர்கள் இதனைக் குறிப்பிடுகிறார்கள்.

கடந்த 2022ஆம் ஆண்டு காலப்பகுதியில் ஏற்பட்ட பிரச்சினை பற்றி எங்கள் எல்லோருக்கும் தெரியும். அது வேறெதுவுமல்ல, இந்த எதிர்க்கட்சியைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற கட்சியினர் எல்லோருமாகச் சேர்ந்து அன்றைய காலகட்டத்தில் எமது நாட்டைச் சுத்தப்படுத்தினார்கள். அதாவது, எமது நாட்டில் இருக்கின்ற வளங்களைச் சூறையாடினார்கள்; அதன்மூலமாகத் தங்களுடைய மடியை நிறைத்துக் கொண்டார்கள். சுனாமி பேரவலம் ஏற்பட்டது. அதன் நிவாரண நிதியைக் கொள்ளையடித்தார்கள். அதை வைத்துத் தங்களுடைய பைகளை நிரப்பிக் கொண்டார்கள். பாரிய வெள்ளப்பெருக்குகள் ஏற்பட்டபோதும்சரி, மண்சரிவுகள் ஏற்பட்டபொழுதும்சரி, அதிலும் கொள்ளையடித்துக் குபேரர்களாக மாறினார்கள். அவர்கள் எல்லோருமாகச் சேர்ந்து நாட்டைச் சூறையாடியதன் விளைவுதான் 76 வருட கால சாபக்கேடு! அதன் காரணமாகத்தான் கடந்த 2022 ஆம் ஆண்டு 'வரிசை யுகம்' ஏற்பட்டது. அந்த வரிசை யுகத்துக்கு காரணகர்த்தாக்கள் வேறு யாருமல்லர், அன்றைய ஆட்சியாளர்கள்! அன்றைய ஆட்சியாளர்கள் எல்லோருமாகச் சேர்ந்து நாட்டைச் சுத்தப்படுத்தியதன் காரணமாக, நாட்டைச் சூறையாடியதன் காரணமாக நாட்டில் நெருக்கடி ஏற்பட்டது. இன்றைக்கு இந்த யுத்தத்தால் நாட்டில் நெருக்கடி ஏற்பட்டிருக்கின்றது. இந்த யுத்தம் என்பது எங்களால் தோற்றுவிக்கப்பட்ட ஒன்றல்ல! எமது நாட்டு மக்களால் தோற்றுவிக்கப்பட்ட ஒன்றல்ல! எல்லாவற்றுக்கும் அப்பாற்பட்ட வகையில், சர்வதேச ரீதியான ஓர் உலக நெருக்கடியாக அது மாறியிருக்கின்றது. அதனால் எதிர்க்கட்சியினர் கொண்டுவந்த இந்தப் பிரேரணையை முதலில் அவர்கள் விளங்கிக்கொள்ள வேண்டும்.

விசேடமாக, இன்றைக்கு ஏற்பட்டிருக்கின்ற இந்த நெருக்கடி என்பது அமெரிக்கா, இஸ்ரேல் மற்றும் ஈரானுக்கு இடையிலான போரின் காரணமாக ஏற்பட்டிருக்கின்ற நெருக்கடி ஆகும். இந்த நெருக்கடி எங்களுக்கு மாத்திரமானதல்ல, இன்றைக்கு உலகமே ஓரளவுக்கு அச்சம் கொள்கின்ற நிலைக்குச் சென்றிருக்கின்றது. உலகத்தில் இருக்கின்ற எல்லா நாடுகளும் இன்றைக்கு எரிபொருள் தட்டுப்பாட்டால் தவிக்கின்றன. எல்லா உலக நாடுகளும் இன்றைக்கு எரிபொருள் பிரச்சினைக்கு முகங்கொடுத்திருக்கின்றன. அதன் காரணமாக அனைத்து நாடுகளும் தங்களுக்குள் பல்வேறுவிதமான கட்டுப்பாடுகளை விதித்திருக்கின்றன என்பதனை எங்களை அண்மித்துள்ள ஏனைய நாடுகளைப் பார்க்கின்றபொழுது தெரிய வருகின்றது. அபிவிருத்தியடைந்த நாடுகளான ஐரோப்பிய மற்றும் ஏனைய உலக நாடுகளை எடுத்துக்கொண்டாலும்கூட இவ்வாறான பிரச்சினைகள் இருக்கின்றன.

கௌரவ உறுப்பினர் அவர்களே, 2022ஆம் ஆண்டு எங்களுடைய நாடு வங்குரோத்து அடைந்த நாடென உத்தியோகபூர்வமாக அறிவிக்கப்பட்ட நிலையில்தான், எங்களிடம் ஒப்படைக்கப்பட்டது. ஆனால், வீழ்ந்திருந்த பொருளாதாரம் இன்றைக்கு உயர்ந்திருக்கின்றது. அதாவது, மொத்த தேசிய உற்பத்தி 5 சதவீதமாக அதிகரித்திருக்கின்றது. இன்றைய காலகட்டத்தில், கைத்தொழிற்றுறை 7.8 சதவீதத்தால் அதிகரித்திருக்கின்றது. சேவைத்துறை 3.3 சதவீதத்தால் அதிகரித்திருக்கின்றது. அதேபோன்று, விவசாயத்துறையும் அதிகரித்திருக்கின்றது. இதுவரை காலமும் மீன்பிடித்துறை கூடுதலான வருமானமாக ஈட்டியிருப்பது 285 மில்லியன் டொலராகும். ஆனால், இந்த வருடம் 300 மில்லியன் டொலரை வருமானமாக ஈட்டியிருக்கிறது. அந்த வகையில், நாங்கள் எல்லோருமே மகிழ்ச்சி அடைகின்றோம்.

கடந்த காலங்களில் வீழ்த்தப்பட்ட, நாசமாக்கப்பட்ட நாடு இன்று படிப்படியாக கட்டியெழுப்பப்பட்டு வருகின்றது.

அவ்வாறு கட்டியெழுப்பப்பட்டு வருகின்றபொழுது, இன்றைக்கு எதிர்க்கட்சியினர் போக்கிடமின்றித் தவிக்கின்ற பரிதாபகரமான நிலைக்குத் தள்ளப்பட்டு இருக்கின்றனர். இதனாலே இவர்கள் இவ்வாறான ஒத்திவைப்புப் பிரேரணைகளைக் கொண்டுவருகின்றார்கள். இன்று ஒத்திவைப்புப் பிரேரணையைக் கொண்டுவந்த உறுப்பினரை தற்போது இச்சபையில் காணவில்லை. நாளைக்கு அவருடைய பெயரையும் காணாமல்போனோருடைய பெயர்ப்பட்டியலில் சேர்த்துத் தேடவேண்டிய நிலை வருமோ தெரியாது.

நாங்கள் இந்த இடத்தில் ஒரு விடயத்தைக் குறிப்பிட்டாக வேண்டும். எங்களுடைய அரசாங்கமானது தற்போது நிலவும் பிரச்சினைகளை நல்ல முறையில் முகாமைத்துவம் செய்து வருகின்றது. அதன் காரணமாகவே இன்றைக்கு எமது அரசாங்கத்தை உலக நாடுகள் போற்றிப் புகழ்கின்றன. இங்கிருக்கின்ற ஒருசில முஸ்லிம் உறுப்பினர்கள், முஸ்லிம் மக்கள் தொடர்பான பிரச்சினைகள் வரும்பொழுது, வீறுகொண்டு எழுந்து வீரர்கள் போன்று பேசுகின்றார்கள். ஆனால், கடந்த காலங்களில் ராஜபக்ஷவுடைய ஆட்சியில் முஸ்லிம் மக்கள் அடித்து விரட்டப்பட்டபோது, முஸ்லிம் மக்கள் கூனிக்குறுகி அடிமைகள் போன்று வாழவேண்டிய நிலைக்குத் தள்ளப்பட்டபோது, பள்ளிவாசல்கள் மற்றும் அவர்களுடைய ஊர்கள் தீ வைத்து எரிக்கப்பட்டபோது இவர்கள் வாய்மூடி மௌனிகளாக இருந்தார்கள். அப்போது அவர்களில் அமைச்சர்களும் இருந்தார்கள். அன்று முஸ்லிம் மக்கள் தங்களுடைய உயிரைப் பாதுகாத்துக்கொள்வதற்குத் தஞ்சம்புகுந்த இடம் வேறெங்குமல்ல, எங்களுடைய கட்சிக் காரியாலயமாகும். அதனால்தான் அன்றிலிருந்து இன்றுவரை நாங்கள் முஸ்லிம் மக்களுடைய உரிமைகளுக்காக கூடுதலாகக் குரல்கொடுத்து வருகின்றோம்.

ஈரான் நாட்டுக்குச் சொந்தமான கடற்படைக் கப்பலொன்று எங்களுடைய கடற்பரப்புக்கு அண்மித்து வந்தது பற்றி உங்கள் எல்லோருக்கும் தெரியும்! அப்போது யாருமே பேசவில்லை. எல்லோருமே வாய்மூடி மௌனிகளாக இருந்தார்கள். இங்கிருக்கின்ற ரஊப் ஹகீம் அவர்கள் பச்சைப் பொய்யொன்றைச் சொன்னார். நான் நினைக்கவில்லை, அவர் அவ்வாறு பொய் சொல்வார் என்று. அவருக்குச் சிறந்த பதிலை எங்களுடைய வெளிநாட்டலுவல்கள் அமைச்சர் கௌரவ விஜித ஹேரத் அவர்கள் அளித்தார். இதிலிருந்து தெரிகிறது, இவர்களுக்குப் பேசுவதற்கு வேறு எதுவுமே கிடையாது என்று. அரசாங்கத்தின்மீது காழ்ப்புணர்ச்சிகொண்டு அரசுக்கு எதிராகச் செயற்படுவதைத் தவிர, வேறு எந்தவிதமான ஆரோக்கியமான செயற்பாடுகளையும் இவர்கள் மேற்கொள்வதில்லை.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று முழு நாடுமே பாதிக்கப்பட்டிருப்பது உண்மை! இன்றைக்கு முழு உலகமுமே போர்ச் சூழலால் பாதிக்கப்பட்டு இருக்கின்றது. அந்தப் போர்ச் சூழலிலிருந்து மீண்டு, சமாதான பூமியாக இந்த உலகம் மாற வேண்டும் என்பதுதான் இலங்கை உட்பட உலக வாழ் மக்களின் எதிர்பார்ப்பாகும். இன்று யுத்த சூழ்நிலை காரணமாக பாதிக்கப்பட்டு இருக்கின்ற மக்களுடைய வாழ்க்கையை மேம்படுத்துவதற்காகவும் அவர்களுடைய வாழ்க்கையை சுமூக நிலைக்குக் கொண்டுவருவதற்காகவும் அரசாங்கமானது தன்னால் இயன்ற அனைத்து அர்ப்பணிப்புகளையும் செய்து வருகின்றது. அந்த அர்ப்பணிப்புமிக்க பயணத்துக்கு இடையூறு விளைவிக்கும் வகையிலான நடவடிக்கைகளை இன்றைக்கு கேடுகெட்ட எதிர்கட்சியினர் செய்துவருவதை எங்களால் கண்கூடாகக் காணக் கூடியதாக இருக்கின்றது. எது எவ்வாறு இருந்தபோதிலும், ஒரு விடயத்தை நாங்கள் இந்த இடத்தில் சொல்லியாக வேண்டும். "போற்றுவோர் போற்றட்டும், தூற்றுவோர் தூற்றட்டும், நாம் செல்லும் வழி நேர்வழியாகட்டும்" என்பதற்கு அமைய, எவர் எதைச் சொன்னாலும், தற்போது நாட்டில் ஏற்பட்டிருக்கின்ற நெருக்கடியான நிலைமையிலும்கூட, எமது அரசாங்கமானது மக்களுக்கு எந்தவிதமான பாதிப்பையும் ஏற்படுத்தாது, அதிலிருந்து அவர்களை மீட்டெடுப்பதற்கான நடவடிக்கை மேற்கொண்டு, நல்லதொரு திசையை நோக்கி நகர்ந்துகொண்டு இருக்கின்றதெனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මේ වෙලාවේ point of Order එකකට අවස්ථාව දෙන්න බැහැ, කාලය ඉක්ම ගොස් තිබෙනවා.

අද දින ආරම්භ කළ සභාව කල් තබන අවස්ථාවේ විවාදය 2026 මාර්තු 20වන දින තවදුරටත් පැවැත්වීම පිණිස කල් තබනු ලැබේ.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 5.56ට, 2026 මාර්තු 20වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.56க்கு, பாராளுமன்றம் 2026 மார்ச் 20, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.56 p.m. until 9.30 a.m. on Friday, 20th March, 2026.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් අංක 1851/2026 දරන ප්‍රශ්නයට පිළිතුර දීමට ආරක්ෂක අමාත්‍ය ගරු අනුර කුමාර දිසානායක මහතා කල් ඉල්ලා ඇත.

மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்களால் கேட்கப்பட்ட, இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 1851/2026ஆம் இலக்க வினாவுக்கு விடையளிப்பதற்கு, பாதுகாப்பு அமைச்சர் மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள் கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. Anura Kumara Dissanayake, Minister of Defence, requested for time to reply to Question No. 1851/2026 raised by the Hon. Ajith P. Perera appearing in today's Order Paper.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.